Ruwan. W. Dahanayake

**Background :-** When there is enough exposure to addictive substances, it is very difficult to prevent from using it. Based on this principle we decided to minimize the availability of cigarettes to the customers and to reduce the accessibility .Our ultimate goal was to make cigarette free trade community and to increase the number of cigarette free shops, hotels up to 95% by the end of the year 2016.

**Methodology :-** Invited school children and the health officers to trade shops and appeals to withdraw from tobacco. Used leaflet, posters, stickers, large street advertising boards and night scenes of street dramas for educate them. Used state officials, religious leaders, mothers and housewives support to making the above request. After two months we commended flowers to the trade community through school children. We invite mothers to make a sweet treats and to bless the local monks. Broadcasted a 30 minute documentary program by Shraddha Buddhist channel.

**Challenges :-** Submission of office and home remittances to purchase public attitudes and awareness programs for public servants. Tobacco Company sell cigarettes by their members and make cigarettes available in bars and raise the price of a cigarette. Authorities asked the sellers to continue their cigarette business without interrupting the peace and law. Provincial council failed to control unauthorized cigarette selling by street vendors. There is no control over the price of cigarettes The files opened for the shop owners who were evacuated from the cigarettes and the exemption of the super smokers. Publishers are dissatisfied with the program because it is not functioning in nearby areas. Tobacco Company used new technology to act against the officers within the courts by setting up legal proceedings, providing legal assistance and paying fines.

**Results :-** This year, a 70% sales community has stopped selling cigarettes.

**Follow up :-** Frequent observatio of shops.

**Conclusion :-** Addressing retailars strategically can create a cigarette selling free trade community.

OP

06

අ

## බද්දේගම දකුණ ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන ගොවි ජනතාව මුලා කර දුම්කොළ සමාගමේ අපකීර්තිමත් ක්‍රියාවලියට සමාජ සාධාරණත්වයත් ලබා ගැනිමට දරන උත්සාහය පරාජය කරලීම

කතෘ :- සරත්. කො. ගමගේ, ගිහාන් මධුෂංක එදිරිසිංහ, රෝහණ ලියනගේ

**පසුබිම** :- කෘෂි ආර්ථිකය මුල්කරගත් ජනතාවක් වෙසෙන බද්දේගම ප්‍රදේශයේ දිප්පිටියාය යනු සෑම කන්නයකයම ඉහළ අස්වැන්නක් දෙන, කෘෂි රසායනික සමාගම් තම ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගනු ලබන අක්කර 54 කින් යුක්ත යල මහ දෙකන්නයේම වගා කරන කුඹුරු යායකි. දුම්කොළ සමාගම සහ හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක් වන හේමකුමාර නානායක්කාරගේ මව්බිම ලංකා පදනම සමග බද්දේගම දකුණ ගොවි සමිතිය මගින් මෙම කුඹුරු යායට අනුග්‍රහය ලබාදෙයි. බන්දුල විතානගේ සහ කොඩිකාර යන කෘෂි උපදේශකවරුන් දිප්පිටියාය කුඹුරු යාය බාරව ක්‍රියා කළහ. මෙයට පෙර අක්මීමණ මෙවැනි වැඩසටහනක් පටන්ගත්තද ඒ පිළිබඳ දැනුවත්වීමක් නොවුණි. බද්දේගමට පසු වෙනත් ස්ථානයක මෙවැනි වැඩසටහන් නැවැත්වීම මෙහි අරමුණය.

**ක්‍රමවේදය** :- 2008 වර්ෂයේ මහ කන්නයේ මව්බිම ලංකා පදනම් කාර්යාලයේ පැවැති කුඹුරු වගා කිරීමේ ආරම්භක උත්සවයේදී දුම්කොළ සමාගමේ නිලධාරීන් වන චතුර සහ නුගවෙල, දුම්කොළ සමාගම මතු කර දැක්වීමට කටයුතු කිරීම මෙන්ම ඔවුන් යටතේ ගෙවතු වගා 300 ක්ද ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කිරීම. දුම්කොළ සමාගමේ අපකීර්තිය දැක්වෙන පෝස්ටරයක් පළමුව ඇලවීම්. ඉන්පසු අත් පත්‍රිකා මගින් හා රැස්වීම් මගින් ජනතාව දැනුවත් කිරීම අනතුරුව රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලඥයන් හමුවී සාකච්ඡා කළෙමි. ගාල්ල දිස්ත්‍රික්කයේ සියලු සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ අත්සන් කළ ලිපියක් ගාල්ලේ පැවැති රැස්වීමකදී එවකට ඇමැති-වරයෙක්ව සිටි බැසිල් රාජපක්ෂ මහතාට බාරදුණි.

**අභියෝග** :- මෙය පටන් ගැනීමට පෙර සිටම මත් නිවාරණ පෝස්ටර් අලවන විට දුම්කොළ සමාග මේ නුගවෙලට අයත් වාහනයක් හඹා ඒම. දේශපාලඥයන් මැදිහත්ව පෝස්ටර් විනාශ කිරීම. දුම්කොළ සමාගමට එරෙහි පෝස්ටර් ඇලවීමට ඉඩ නොදෙන ලෙස හේමකුමාර ඇමැතිවරයා පොලිසියට දැන්වීම් ප්‍රාදේශීය සභා මන්ත්‍රී බුවනෙක නානායක්කාර බලපෑම් කිරීම. ආරම්භයේදී බොහෝදෙනාගේ සහය නොලැබීම.

**ප්‍රතිඵලය** :- සැබෑ තත්ත්වය තේරුම් ගත් ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු රාජ්‍ය නිලධාරීන් සහ අමාත්‍ය චන්දිම වීරක්කොඩි මහතා සෘජුවම දුම්කොළ සමාගමට විරුද්ධව වීම. ගොවින් සහය දීමට ඉදිරිපත්වීම. දුම්කොල සමාගම විසින් ළමා වැඩසටහනක් කිරීමට දැරූ උත්සාහය අසාර්ථකවීම. ගිනිමැල්ලගහ පටන් ගැනීමට දැරූ උත්සාහය අසාර්ථකවීම. දුම්කොළ ඇටයක්වත් නොගෙනෙන බවට සහතිකවීම. ජනතාවගෙන් දුම්කොළ සමාගමේ පිරිසට අප්‍රසාදය ඇතිවීම. ජනතාවගේ අප්‍රසාදය මතුවීම නිසාවෙන් හේමකුමාර ඇමැතිවරයා අසනීප බව පවසා 2010 මැතිවරණයට ඉදිරිපත් නොවීම. ගාල්ල දිස්ත්‍රික්කයේ අනෙක් කොට්ඨාශවල ක්‍රියාවට නැගීමට නොහැකිවීම මෙහි ප්‍රතිඵලය විය.

**පසු විපරම** :- ගොවියන් සහ මෙයට උනන්දුවක් දක්වන පිරිස්වලින් නිරතුරුව සිදුවෙන දේ ගැන තොරතුරු ලබාගැනීම.

**නිගමනය** :- නොසැලෙන උත්සාහයකින් ක්‍රියාත්මකවීම තුල කළ. නොහැක්කක් නොමැති බව

**To act against the inappropriate activities of the tobacco companies targeting the farmers**

Authors :- Sarath Gamage, Gihan Madhushanka Edirisinghe, Rohana Liyanage.

**Background :-** Majority of the community in the Baddegama area used to do agriculture based occupations. Dippitiyaya is a village which was used to get a huge harvest from paddy cultivation. It is a area of 54 arcs and used to cultivate in both Yala, Maha periods. Farmers' associationof Baddegama south and the former minister of agriculture gave the sponsorship to this paddy fields with the help of tobacco company.the two agricultural instructors of the area were Mr Bandula Withanage and Kodikara. Earlier there was a similar program in Akmemana area but there was no any proper awareness regarding the program. Our aim was to stop this type of programs again.

**Methodology :-** In 2008 the members of Tobacco Company tried to emphasize the activities of Ceylon Tobacco Company during the paddy cultivation commencing function. They told that there were 300 functioning home gardening projects. We displayed some posters which discourage the activities of the tobacco company. We were able to distribute the leaflets and make the community aware. We tried to gather more people to conduct awareness programs and we were able to meet government officers and some politicians to discuss this problem. We were able to hand over a letter with signatures of all the development officers in the area to the minister; Mr Basil Rajapakshe.

**Challenges :-** There were many objections to the poster campaign and they tried to destroy the posters. Ministers have informed the police not to allow displaying posters in the area. At the beginning we couldn't able to get enough support.

**Results :-** Provincial secretary understood the real situation in the area and he started to give his support to us. Farmers decided to give their support. Childrens' program which was organized by the tobacco company has become unsuccessful. Community has started to ignore the activities done by tobacco companies. We were able to stop these type programs in other areas in Galle.

**Follow up :-** We continued to get details from farmers and other parties.

**Conclusion :-** We can do anything with the unstoppable courage

OP
07
අ

**දුම්කොළ දුමාරයෙන් නිදහස් සොඳුරු මහකුඹුක්කඩවල පුරවරයක්**

කතෘ :- එච්.එම්. ලලිත් අශෝක, බුද්ධික විජේගුණරත්න, පද්මිණි. කේ. අබේසංහ,
ආර්. පී. අබේරත්න

**පසුබිම** :- මහකුඹුක්කඩවල, පුත්තලම් දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකි. ප්‍රජාවගේ ජීවිකාව ගොවිතැන, සත්ව පාලනය, කුලී වැඩ වේ. ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළු අතර දුම්කොළ නිෂ්පාදන භාවිතය ඉතා ඉහල අගයකි. වියදම් කරන මුදල නගරය අවට වෙළඳසැල්වල පමණක් දිනකට රු.20000ක් ඉක්මවන අතර එය වසරක් සඳහා රු.6700000ක් ඉක්මවයි. ග්‍රාමනිලධාරී වසම් 05ක පමණක් වසරක් සඳහා වෙළඳමහතුන් විකිණීම කරන ලද සිගරට් බීඩි සුරුට්ටු වල වටිනාකම රු. කෝටි 02 ඉක්මවයි. ඉලක්ක කණ්ඩායම වෙළඳමහතුන් වන අතර එමගින් සුලබතාවය අවම කිරීම ප්‍රධාන පරමාර්ථය විය.

**ක්‍රමවේදය** :- මහකුඹුක්කඩවල නගරය පාදක කරගනිමින් වෙළඳමහතුන් දෙතුන් දෙනෙකු සමඟ වෙළඳසැල් වසාදමන රාත්‍රීකාලයේදී සුහදව සාකච්චාව සිදුකළෙමි. ඔවුන්ගේ ඒකමතික තීරණය වූයේ සියළු වෙළඳසැල් මෙම කටයුත්තට එකඟවන්නේ නම් ඔවුන්ද එකහෙලා කැමතිබව හා සහයෝගය ලබාදෙන බවයි. ඔවුන්ගේ යෝජනාවලට ඇහුන්කම් දුන්නෙමි. ප්‍රදේශයේ පිළිගැනීමකට ලක්වුනු අවශ්‍යතාවය ඇති කිහිපදෙනෙක් මේ සඳහා යොදා ගත්තෙමි. තර්ජන ඇතිවූ අවස්ථාවල නීතිමය ක්‍රියාමාර්ග වලට අමතරව ප්‍රජාව, තර්ජනයකල පුද්ගලයන් වෙත දැඩි විරෝධයක් එල්ලකරන ලදි. ප්‍රධාන සාකච්චාව පැවැත්වූ දිනයේදීම සිගරට්, බීඩි, සුරුට්ටු නැවත මිලදී ගැනීම නවතා දමන්නට වෙළඳ මහතුන් විසින්ම තීරණය කල අතර තමන් සතුව ඇති එම තොග විකුණා හමාර කිරීමට දිනයක් යෝජනාකර ගන්නා ලදි. එක් එක් ග්‍රාමනිලධාරී වසමෙන් වසමට මෙම ව්‍යාපෘතිය ඉතා සාර්ථකව ව්‍යාප්ත කළෙමු. ප්‍රජාව විසින් බුලත් හුරුළු දී වෙළඳ මහතුන්ට ආරාධනා කොට ඔවුන්ව ඇගයීමේ උත්සවයක් සංවිධානය කොට වෙළඳසැල් අගයකොට සහතිකපත් ප්‍රධානය කිරීමක්ද සිදුකරන ලදී.

**අභියෝග** :- මරණ තර්ජන පත්‍රිකා කාර්යාලයේ ගේට්ටුවේ ඇලවීම. විවිධ අවස්ථාවල කඩාකප්පල් ක්‍රියා කිරීමට තැත් කිරීම. යම්යම් පුද්ගලයන් නිවෙස් ආශ්‍රිතව සිගරට් විකිණීම ආරම්භ කළ අතර පෞද්ගලිකවම ඔවුන් සමග සාකච්ඡා කිරීම හා ප්‍රජාව ඔවුන්ව ගනන් නොගෙන සිටීම සිදුවුනි.

**ප්‍රතිඵල** :- ග්‍රාම නිලධාරී වසම් 05ක වසරකුත් මාස දෙකක් සියලු වෙළඳසැල්(45), කිසිඳු දුම්කොළ නිෂ්පාදනයක් විකිණීමෙන් බැහැරවීම. සහතිකපත් වෙළඳසැල්වල ප්‍රදර්ශනය කොට තිබෙන අයුරු අදටත් දක්නට ලැබේ. ඔවුන් සිගරට් සඳහා වියදම් කල මුදල් දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා යොදවන බව දැකීමට තිබීම. පෞද්ගලිකව දහස් ගණනක් ප්‍රජාව ස්තුතිකිරීම. ''සිගරට් නැතිව වෙළඳාම කරන්න බෑ" සංකල්පය පට්ටපල් බොරුවක් බවට පත්කරමින් ක්ෂේත්‍රයේ එක් වෙළඳමහතෙකු බලකරණය කර ඔහුගේ වෙළඳසැල තුල සිගරට් අලෙවිය නවතා දමා තොග ලබාදෙන ප්‍රදේශයේ විශාල වෙළඳසැළක් බවට පත්වීම. 2016 වසරේදී මේ වෙනුවෙන් ජනාධිපති සම්මාන ලැබීම

**පසුවිපරම** :- ව්‍යාපෘතිය ග්‍රාමනිලධාරී වසමෙන් වසමට ව්‍යාප්ත කිරීම. වෙළඳසැල් හිමියන් ඇගයීමකට ලක්කිරීම. මේවනවිට සිදුව ඇති වෙනස මැනබැලීම ආරම්භකර තිබේ.

**නිගමනය** :- බලපෑම් කිරීම, නඩු පැවරීම, වැනි තිරසාරබවට බාධා පැමිණෙන ක්‍රියාවලින් ඈත්වී වෙළඳුන් චර්යාත්මක වෙනසක් සඳහා මෙහෙයවීම සාර්ථක බවට හේතු විය.

OP

07

A

**Mahakumbukkadawala; an area free of cigarettes smoke.**

Author :- H.M. Lalith Ashoka, Buddhika Wijegunarathna, Padmini. K. Abesinghe, R. P. Aberathna

**Background :-** Mahakumbukkadawala is a rural area situated in Puttalm district. Majority used to do farming, animal hosting and labor work. Using tobacco related products was a main problem of the area. Huge amount of money have been wasted to buy those products in each and every day. It was around Rs 20000 per day and Rs 6700000 for a year. Within 5 Grama niladhari areas, the amount of money that has been earned by a seller in a year was more than 2 crores. Our target group was the shop owners and the aim was to minimize the availability of the cigarettes and tobacco related products.

**Methodology :-** We had few discussions with 2-3 shop owners in Mahakumbukkadawala town in their free time. They expressed their willingness to stop selling cigarettes if all the shop owners have agreed to stop. We listened to their proposals. We thought of joining some respectable personals in the area. When we had some troublesome situations, majority of the community gave the support to us. Following the main discussion day the members of the trade union decided to stop buying tobacco related products. They appointed a date to clear their remaining stocks. We were able to organize same program in all the grama niladhari areas successfully. Members of the trade unions were invited and appreciated by the community and they were given certificates.

**Challenges :-** There were some warning to our lives and attempts to disrupt the program. Some people have started to sell cigarettes near to the houses, but we talked to them directly. Villagers didn't pay their attention to them and they started to ignore them.

**Results :-** All the shops (45) in 5 grama niladhari areas didn't sell any tobacco related products for more than year. Certificates have been displayed in the shops even at present. Villagers could have able to spent more money on children's' education. Many people in the area appreciate the program and the effort that we made. In 2016 we were able to win presidents' award.

**Follow up :-** Introduce the program to other grama niladhari areas. Appreciate the attitudes of the shop owners who have stopped the cigarette business. We have started to measure the outcome and the changes by now.

**Conclusion :-** Changing the attitudes of the shop owners seem to be more effective than taking legal actions against them.

OP

08

අ

**ප්‍රජා මූලිකත්ව දුම්වැටි නිවාරණ ක්‍රියාවලියක අත්දුටු දුම්කොළ කර්මාන්තවල මැදිහත්වීම් උපක්‍රම සහ ප්‍රජාවේ ප්‍රතිචාර.**

කතෘ :- එස්.එච්. පියසුමන, ඊ. කේ. පී. එම්. ප්‍රියදර්ශන

**පසුබිම** :- දුම්කොළ කර්මාන්තකරුවන් දුම්වැටි සහ දුම්කොළ නිෂ්පාදනයෙන් අතිශය ලාභ ලබන අතර ලොවපුරා තම නිශ්පාදන ප්‍රචලිත කරමින් ලාභය වර්ධනය කරගැනීමට කටයුතු කරයි. සාර්ථක දුම්වැටි නිවාරණ ක්‍රියාදාමයක් හේතුවෙන් කර්මාන්තකරුවන්ට එම ලාභය අහිමිවීමේ අවධානමක් පවතින බැවින්ද එවැනි සාර්ථක වැඩසටහන් උදාහරණයට ගැනීමට ලොව ඇතිවී තිබෙන ප්‍රවනතාවය නිසාද කාර්මාන්තකරුවන් මැදිහත්වී එවැනි ක්‍රියාවලි අසාර්ථක කිරිමට කටයුතු කරයි

**ක්‍රමවේදය** :- ව්‍යාපෘතිය ආරම්භයේදිම මෙම සියළු සිදුවීම් අපේක්ෂා කොට ඒ පිළිබඳ සියළු ව්‍යාපාරික සහ ක්‍රියාකාරි කණ්ඩායම් දැනුවත් කොට තිබීම සහ එවැනි හඳුනාගත් ක්‍රියාවන් බලාපොරොත්තුවෙන් සිටීම නිසා එවැනි සිදුවීමක් සිදුවන විටම එය වටහා ගැනීමට සියළු දෙනාටම හැකිවීමෙන් එම උපක්‍රමය සාර්ථක නොවීය. ප්‍රතිඋපක්‍රම ලෙස නගරයේ දුම්වැටි අලෙවියට නතුවූ වෙලඳසැලකට ව්‍යාජ සංචාරක කන්ඩායම් ගොඩබස්වා දුම්වැටි අලෙවි කිරිම නිසා ඔවුන් ආහාරපාන නොගන්නා බව පවසා පිටවයාම කරන ලදි. දුම්වැටි අලෙවියට නතුවූ ව්‍යාපාරිකයින්ගේ ඇදහිලි විශ්වාස අවබෝධකර ගැනීම එම ස්ථාන ඉදිරිපිට පොල් ගැසීම හදිහූනියම් කිරීම ආදි ක්‍රමවලටද ප්‍රජාව කටයුතු කරන ලදි.

**අභියෝග** :- වෙළඳුන් දුම්වැටි විකිණීමෙන් ඉවත් වූ වැල්ලවාය නගරයේ සමාගම මැදිහත්වී සිල්ලරට දුම්වැටි අලෙවිසැලැක් පිහිටුවීම, එම වෙළඳසැලට යාබදව කුඩා දරුවන් සඳහා වූ බඩු විකුණන වෙළඳසැලක් විවෘත කිරීමෙන් දුම්වැටි සුලභව දක්නට නොලැබූ අවස්ථාව දරුවන්ට ලබා දීම, වෙළඳසැල්වලට පෞද්ගලිකව ගොස් තොරතුරු විමසා ස්ටිකරයක් සවිකිරීම මගින් මානසික බලපෑමක් සිදුකිරීම, විවිධ ප්‍රතිලාභ ලබාදුන් වෙළඳුන් සුළුතරයක් නැවත දුම්වැටි වෙළඳාමට නතුකර ගැනීමට කටයුතු කිරීම, නිවාරණ ව්‍යාපෘතියේ නියුතු නිලධාරීන් කාර්යාලය සහ නිවාස අසල රැදී සිටිමින් මානසිකව බලපෑම් කිරීම, බැනර් ප්‍රචාරක පුවරු ආදී විනාශ කිරීම සහ විකෘති කිරීම, ව්‍යාජ සංචාරක කන්ඩායම් ආපන ශාලා වලට ගොඩ බස්වා දුම්වැටි නොමැති නම් ආහාරපාන ප්‍රතිෂේප කරමින් පිටවයාම, නගරයේ දුම්වැටි අලෙවි නොකරන වෙළඳසැල් දුම්වැටි අලෙවි කරන බව පවසමින් වෙළඳුන් නොමග යවා නතුකර ගැනීම, ක්‍රියාකාරකයින්ගේ දුරකථනවලට නිර්නාමික ඇමතුම් ලබාදීම, වෙළඳසැල සඳහා ණයට දුම්වැටි තොග ලබාදීම සහ රාජ්‍ය යාන්ත්‍රනයට ක්‍රියාකාරීන් පිළිබඳ අසත්‍ය තොරතුරු සැපයු අවස්ථාද දැනගත හැකිවිය.

**ප්‍රතිඵල** :- මෙම අවබෝධය සහ ප්‍රතිචාර නිසිකලට සිදුකිරීම හේතුවෙන් කර්මාන්තකරුවන්ගේ උපක්‍රම බිඳ හෙලමින් දුම්වැටි නොමැති නගරයක් වැල්ලවායේ බිහිකිරීමට හැකිවිය.

**පසුවිපරම** :- ප්‍රජා කණ්ඩායම් විසින් අඛන්ඩව පසුවිපරම් කරනු ඇත

**නිගමනය** :- ප්‍රජාව ශක්තිමත් කිරීමෙන් දුම්වැටි නිවාරණ ක්‍රියාවලියක ශක්තිමත් බව හා තිරසාර බවද රුදෙනු ඇත

OP 08 A

**Interference and strategies of tobacco industry experienced by a community based tobacco prevention programme and the response of the community.**

Author :- S. H. Piyasumana, E. K. P. M. Piyadarshana

**Background :-** Tobacco industrialists while making huge profits from cigarettes and tobacco products, try to raise their profits further by popularizing their products around the world. Since there is a threat of losing this profit due to successful tobacco prevention programmes and the trend towards taking those successful programmes as examples, industrialists try to interfere and make such programmes unsuccessful.

**Methodology :-** From the start of the project, these types of incidents were anticipated and all the active groups and the traders were well informed and those strategies of the industry were not successful since everyone could identify such anticipated incidents from the beginning. As a counter action, groups of fake tourists were made to reject food and leave the restaurants which started to sell cigarettes. After identifying the beliefs of the vendors who sell cigarettes, the people started doing resentful spiritual deeds eg- 'Pol gaeseema, Hadi huniyam' in front of their shops.

**Challenges :-** Starting a retail stall for cigarettes with the interference of the company in Wellawaya town when the vendors quit selling cigarettes, starting a toy shop next to that stall to give children a chance to expose themselves to cigarettes since they were not used to see cigarettes freely, visiting shops personally and inquiring information and pasting a sticker to cause mental influence, making a minority of vendors to start selling cigarettes again by giving various concessions, mentally disturbing the officers involved in the tobacco prevention programme by loitering around their offices and homes, destroying and deforming the banners and advertising boards, making groups of fake tourists to reject food and leave restaurants which did not sell cigarettes, trying to make vendors start selling cigarettes again by misleading them telling that the other shops which do not sell cigarettes are now selling cigarettes, giving anonymous telephone calls to the officers, lending stocks of cigarettes to the shops and instances of giving false information about the officers to the authorities were known.

**Results :-** A town free of cigarettes was created in Wellawaya since the strategies of the industrialists were defeated because of this understanding and the timely responses.

**Follow up :-** Community groups will continuously conduct the follow ups.

**Conclusion :-** Strengthening the community will lead to strenghthe process of tobacco prevention and its sustainability.

OP

09

අ

**දුම්වැටිවලින් නිදහස් නගරයක් බවට බද්දේගම දියුණු කරලීම**

කතෘ :- සරත්. කේ. ගමගේ, ශාලිත වික්‍රම සෙනෙවිරත්න

**පසුබිම :-** ප්‍රධාන පාසල් 4ක, පිරිවෙන් දෙකක, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 3ක, ළමයින් 6000 - 6500ත් අතර සංඛ්‍යාවක් සතියේ දිනවල බද්දේගම නගරයට පැමිණෙයි. රාජ්‍ය ආයතන 10ක හා පෞද්ගලික ආයතන කිහිපයක සේවකයන් මෙන්ම වෙනත් නගර කරා යෑම සඳහා පැමිණෙන පිරිසක් ගැවසෙන බද්දේගම නගරය තුළ සිගරට් අලෙවි කල ආපනශාලා සහ සිල්ලර වෙළෙඳසැල් ගණන 58කි. 2014 වර්ෂයේදී දවසකට රුපියල් ලක්ෂයක සිගරට් මෙම වෙළඳසැල්වලින් අලෙවි විය. සදාචාරාත්මක බවකින් තොරව ඇතැම් වෙළෙඳසැල් පාසල් ළමයින්ට සිගරට් අලෙවි කරන අතර බහුතරයකට අපහසුවක් වන ආකාරයට නගරය තුළ දුම්වැටි භාවිතා කරනු ලැබීය.

**ක්‍රමවේදය :-** 2014 වර්ෂයේදී එවකට සිටි ප්‍රාදේශීය ලේකම්තුමියට තත්ත්වය පැහැදිළි කරදීම. පසුව අවස්ථා දෙකකදී නිලධාරීන් දැනුවත් කිරීම ප්‍රජාව සහ වෙළෙන්දන් ඉලක්ක කරගත් පෝස්ටර් ඇලවීම සිදු කළේය. ඉන්පසු නිලධාරීන් කණ්ඩායමක් සමග නගරයේ වෙළෙඳසැල් ප්‍රජාව දැනුවත් කිරීම, මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් සහ පොලීසිය දැනුවත් කිරීම සහ සියලු දෙනා එක්ව වෙළෙඳසැල්වලින් 2016 මැයි 31 සිගරට් විකිණීම නවත්වන මෙන් ඉල්ලීමක් කලේය. 2017.07.19 ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීර මහත්මිය සමග නැවත නගරයේ සියලු වෙළෙඳසැල්වලට කතා කරනු ලැබීය.

**අභියෝග :-** වෙළඳසැල් දැනුවත් කිරීම ඇරඹි අවස්ථාවේම මූලික අයිතිවාසිකම් නඩුවක් පවරන ලෙසට දුම්කොළ සමාගම සන්දරවල ප්‍රදේශයේ වෙළෙඳසැලකට පවසා තිබුණි. අලෙවිය නතර කළ ගොතටුවෙ වෙළෙඳසැලක් දින දෙකක් තුළ නැවත ඇරඹුවා පමණක් නොව පාසල් ළමයින්ට පවා අලෙවි කරන්න පටන් ගෙන ඇත. බස්නැවතුම් පොළ අසලම වෙළෙඳසැලක් පාසල් ළමුන්ට සිගරට් අලෙවි කරන විට පොලීසියට හසුවී තිබේ. එම වෙළෙඳසැල වෙනුවෙන් දුම්කොළ සමාගම නඩුවේ සියලු වියදම් දරන බව ඒ මොහොතේම පවසා ඇත.

**ප්‍රතිඵල :-** වෙළෙඳසැල් 58 කින් 30ක් දැනට සිගරට් අලෙවියෙන් ඉවත් වීම. තවත් 05ක අලෙවිය සීමා වීම. තොග අලෙවි කරන වෙළෙඳසැලක් වෙනත් භාණ්ඩ මිළදී ගන්නා පැරණි ගනුදෙනු කරුවන්ට පමණක් ලබාදෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ රාජකාරි වගකීමකින් තොරව සංවර්ධන සම්බන්ධිකාරක ශාලිත සහ ග්‍රාම නිලධාරි අමල් මහත්වරුන් විසින් ගොඩනගා ගත් මත් නිවාරණ කණ්ඩායමකි. බද්දේගම නගරය දුම්වැටිවලින් නිදහස් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමියට අවශ්‍යතාවයක් ඇතිවීම. බස්නැවතුම් පොළ තුළ සහ මගී බස් රථ තුළ දුම්වැටි භාවිතා කිරීම නතර කර ගැනීමට හැකි විය.

**පසුවිපරම් :-** සතිපතා වෙළෙඳසැල් පිළිබඳ තොරතුරු ලබා ගැනීම. නගරය පිළිබඳ අවධානයෙන් සිටින කණ්ඩායම් මගින් තොරතුරු ලබා ගැනීම. උපාය දූතයන් මගින් ලැබෙන තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම.

**නිගමනය :-** දුම්කොළ සමාගමේ අභියෝග හමුවේ ක්‍රියාත්මක වන පිරිසගේ උනන්දුව වැඩි වන බව ඉගෙන ගතිමි.

**Converting the Baddegama area into a cigarettes free town**

Author :- Sarath Gamage, Shalitha Wickrama Seneviraththne

**Background :-** Around 6000-6500 children of 4 schools, 2 religious institutes and 3 vocational training centers are coming to the Baddegama town in week days. Thousands of people who work in 10 government institutes and private companies come to the town in daily basis. There are 58 cigarettes selling shops within the Baddegama town. In 2014, the daily income from cigarettes business was around Rs 100 000. Some sellers try to sell cigarettes for the school children for the profit. Majority of the smokers were used to smoke within the town area in problematic way.

**Methodology :-** We had a chance to explain the current situation to the provisional secretary of the area. Later we were able to conduct an awareness program to the officers in 2 occasions. We were able to organize 2 poster campaigns targeting the community and the members of the trade union. With the help of the officers, we were able to conduct an awareness program to the whole community. We were able to meet the PHIs and police officers and explained the program. With the help of all these parties, we requested from the shop owners to stop cigarette business. In 19th of July, 2017 we were able to speak to the shops with the provincial secretary Mrs Himali Rathnaweera .

**Challenges :-** Shop owner have advised by the officials of the tobacco company, to go for a legal action regarding the fundamental rights. There as a shop which had completely stopped cigarette selling have restarted to sell even to the school children. One of the shops near to the bus stand has being caught to the police while they were selling cigarettes to school children. Tobacco Company has agreed to the shop owner to pay all the expenses for the legal actions.

**Results :-** 30 out of 58 shops have stopped the cigarettes business. 5 shops have limited their business. We were able to establish an effective drug prevention group. Provincial secretary also wanted to make substance free area in Baddegama in the future. We were able to stop smoking near to the bus stand and within the buses.

**Follow up :-** We continued to collect details from shop owners weekly. Try to get data from variety of groups. We tried to make sure the details we got from the people.

**Conclusion :-** Challenges of the tobacco companies will increase the courage of the drug prevention groups.

OP

10

අ

**මත්ද්‍රව්‍ය වෙනුවෙන් පරිසරයේ ඇති සුලබතාවය අවම කිරීම හා අවදානම් රැකියාවන්ගෙන් ඉවත් කිරීම.**

කතෘ:-කුමාර.එස්. ඉරුගල් බණ්ඩාර, එල්. ජේ. එම්. ජී. සි බණ්ඩාර

**පසුබිම** :- 2007 වසරේදී කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවුල් 40 කටම එක් අයෙකු මත්ද්‍රව්‍ය අලෙවිකරුවන් වන බව ග්‍රාමීය මත් නිවාරණ කව හා ක්ෂේත්‍ර නිළධාරීන් මඟින් සිදුකළ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලදී. අලෙවිකරුවන් 136 දෙනෙකු ලෙස ප්‍රමාණය හඳුනාගත්හ. වසම් 26 කට බෙදුකළ 5/6ක සුළුතරයක් වීම නොසළකා සිටීමට හේතුවක්. මේ පිරිසෙන් වසර 18ක් මත්ද්‍රව්‍ය අලෙවිකර කිසිදා නෛතික ප්‍රවේශයකට හසු නොවූ පිරිසක් ඇත. අනාගතයේ පවතින අවදානම සළකා මොවුන් වෙනත් රැකියාවක නිරත කරවිය යුතු බව ප්‍රාදේශීය ලේකම් චන්ද්‍රසිරි බණ්ඩාර මහතාගේ අදහස විය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කළේ අවදානමක් සහිතවය. නිතී විරෝධී මත්ද්‍රව්‍ය අලෙවිකරුවන් ඉන් මුදවා වෙනත් රැකියා සඳහා යොමු කිරීම මෙහි අරමුණ වේ.

**ක්‍රමවේදය** :- එකී නිවෙස් සිතියමක සටහන් කිරීම හා රැකියාවේ අවධානම දරුපවුලට, සමාජයට බලපාන අයුරු පෙන්වීම ඒ තුලින් ස්වයං රැකියාවක අවශ්‍යතාවය හඳුනා ගැනීම. තවද මෙයට සුදානම්වීමට පරිවාස කාලයක් ලබාදීම මගින් අදාල ආයතනයේ ක්‍ෂේත්‍ර නිළධාරීන්ට සාමාජිකයින් 2/3 බලා ගැනීමට බාරදුනි . ප්‍රාදේශීය ලේකම්තුමාගේ මැදිහත්වීම මගින් යටිතල පහසුකම්, සහන සැලසීම. පොලීසිය, සුරාබදු වැනි ආයතන ඔවුන්ව බැඳ තබා ගැනීමට උත්සුක බව පෙන්වීම.

**ප්‍රතිඵල** :- පැමිණි පිරිසෙන් 20% ක් පමණ එම අවස්ථාවට මුහුණ දීමට නොහැකිව බැහැර විය. අනෙක් 50% ක් වඩු, ත්‍රීරෝද රථ, කෘෂිකර්මය, මාළු හා පොළ වෙළඳාම වැනි රැකියාවල නිරත වීමට සුදානම් විය. අපහසුතාවයන් හමුවේ කාන්තා අලෙවිකරුවන් වරද තේරුම්ගෙන ඉවත්විය.

**අභියෝග** :- අලෙවිය නතර කළ පිරිසට ද අධිකරණයට යාමට හා අල්ලස් දීමට සිදුවීම් හා කාර්යාල නිළධාරීන්ටද පොලිසීය යැයි සිතා අල්ලස් දීමට යොමුවීම.තවද අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය යළි විකිණීමට ලැබුණු අවස්ථා ද විය. මෙහිදී ප්‍රධාන ව්‍යාපාරිකයින් හා නිෂ්පාදකයින් වැඩසටහන මෙහෙයවන නිළධාරියාට බාධා/ගැටලු ඇතිකරවන ලදි.එහිදී අලෙවිය නතර කිරීමට විරුද්ධව සමහර පොලිස් නිළධාරීන් ද සිටීම ඔවුන්ට රුකුලක් විය.

**පසු විපරම** :- මුල් මාස 06 තුළ සතියකට වරක් තම සේවාදායකයා පිළිබඳව ප්‍රගතිය ගැනීමට නිළධාරීන්ට සිදුවිය. නිරන්තරයෙන් වූ මෙම ක්‍ෂේත්‍ර පරීක්ෂාව නිසා අලෙවි කිරීමේ කාලය සීමා වීම, දෛනිකව භාවිතා කරන්නන්ට හා ප්‍රවාහනයට ද බාධාවක් විය.

**නිගමනය** :- මෙයින් 8ක් වඩු වැඩ, 6ක් පොල් වෙළඳාම, දෙදෙනෙක් ත්‍රී රෝද රථ වෘත්තීන්වල නියැලී සාර්ථක විය. තවද මොවුන්ගේ අභිමානය හා නව සමාජ ඇසුර මොවුන් වෙනස් කිරීමට හේතු වූ බව කිව යුතුය.

OP

10

A

**Minimizing the availability of alcohol and liberate the villagers from risky occupations.**

Author :- Kumara. S. Irugal Bandara, L. J. M. G. C. Bandara,

**Background :-** In Karuwalagaswewa Divisional Secretariat area, 136 illegal alcohol sellers were identified during a research done in 2017 by the alcohol prevention circle of the village and field officers. There was a one seller for each and every 40 houses. This hasn't concerned much as the number is less (5/6) when the area divided into 26 divisions. There are sellers who have never get caught by law for 18 years of time. Considering the future risk, the Divisional Secretariat Mr. Chandrasiri Bandara came up with the proposal of deviating the illegal alcohol sellers to other occupation. The program was implemented with a risk to liberate the villagers from this risky job.

**Methodology :-** The houses that are selling illegal alcohol were identified and marked on a map. They were educated regarding risks and adverse outcomes to the family and society. Further, they were encouraged to deviate to self-employments other than selling illegal alcohol. They were given a probation period under the supervision of field officers, police and the Department of Excise. Infrastructure facilities were provided by the Divisional Secretariat.

**Results :-** 20% were failed to go through the whole process. 50% were able to prepare for other employments such as carpentry, farming, fish and vegetable selling. Even with the several difficulties women sellers stopped the business.

**Challenges :-** The sellers who stopped sales have faced lot of challenges such as bribing and legal issues. Field officers were given bribes as they assumed them as police officers. Some of the arrested alcohol have sent back again for sales with the support of some police officers who were against to the program. Higher level businessmen and their procedures tried to destroy the program and disturb to the officers.

**Follow up :-** The follow up was done by the field officers once a week within the first six months. This regular follow ups leads to disturb the selling and transportation of alcohol.

**Conclusion :-** At the end of the program 16 sellers have completely stopped alcohol selling and successfully involved in other occupations such as carpentry(8), coconut selling(6) and three wheeler driving(2). The dedication and better social relationships made them to get changed.

OP

11

අ

## මත්ද්‍රව්‍යවලින් නිදහස් ළමුන්ට යහපත් පරිසරයක් නිර්මාණය කිරීම

කතෘ :- රුවන් රණසිංහ

**පසුබිම** :- කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඉහල බෝමිරිය ග්‍රාමසේවා වසමේ පත්තිනිමාතාගම නම් අපේ ගමේ ක්‍රීඩාපිටියක් හා මංසංදි 8ක් සිගරට් අරක්කු භාවිතා කිරීම සදහා ගමේ තරුණ පිරිස යොදාගෙන තිබුනා. එමනිසා ළමුන්ට නිදහසේ සෙල්ලම් කිරීමට නොහැකි බව හා අනාරක්ෂිත බව නිසා පාරේ තනිව ඇවිදයාමට දීමට දෙමව්පියන් අකමැතිවූවා. පරුෂ වචන කිය කියා රණ්ඩුවන නිසා ළමුන්ට පාඩම් වැඩකර ගැනීමට අපහසුවුවා. නීතිවිරෝධීව මත්ද්‍රව්‍ය අලෙවිකරන ස්ථාන 2ක් තිබුණා. ඒ හේතුවෙන් පිට ගම්වලින් නාදුනන පිරිස් පැමිණෙන නිසා ළමුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ව පැවතුණා. එබැවින්, ළමුන්ට නිදහසේ සිටීමට සුදුසු පරිසරයක් ගොඩනගා ගැනීම අරමුණ වුණා.

**ක්‍රමවේදය** :- ADIC ආයතනය එකතුවී අපේ ගමේ ළමා සමාජයක් පිහිටුවන ලදී. සිගරට්, අරක්කු බිව්වම ලෙඩවෙන බව අපි දැනන් හිටියා. ADIC ආයතනයෙන් කියලා දුන්න විදියට අපි ළමුන් 15ක් පමණ එකතුවෙලා 'අරක්කු බිව්වම මෝඩපාටය,' වයසට වඩා කැත වයස පෙනුමක් ඇතිවෙනවා, බඩ ඉදිරියට නෙරා එනවා, සිගරට් බිව්වම තොල් කැතවෙනවා, හකුබහිනවා, ගඳ ගහනවා' වගේ පණිවිඩ ඇතුළත් පෝස්ටර් ඇදලා ගම පුරා ඇලෙව්වා. සිගරට් බොන පුද්ගලයන් සිගරට් සමාගමට මුදල් වියදම් කරන ආකාරය පිළිබඳව අත්පත්‍රිකා හදලා ගෙවල්වලට බෙදුවා.

**අභියෝග** :- අපි අලවපු පොස්ටර් ඉරාදමා තිබුණා. අත් පත්‍රිකා පොඩිකරලා බිම දමා තිබුණා. සිගරට්, අරක්කු බොන මාමලා අපට බැන වැදුණා. නීතිවිරෝධීව මත්ද්‍රව්‍ය අලෙවිකරන ස්ථාන ගමේ තිබෙන නිසා අපේ නිවෙස්වලින් මත්ද්‍රව්‍ය පිළිබඳව වැඩසටහන් ළමුන් විසින් කිරීම නුසුදුසු බවට දෙමව්පියන්ගේ මතයක් තිබීම අපට බාධාවක් වූවා.

**ප්‍රතිඵල** :- ක්‍රීඩාපිටිය හා මංසංදි 8ම සිගරට් හා අරක්කු භාවිතා කිරීමෙන් නිදහස්වීම. නීතිවිරෝධීව මත්ද්‍රව්‍ය අලෙවිකරන ස්ථාන 2 නැතිවී ගම නිදහස්වීම. මත්ද්‍රව්‍ය අලෙවිකරන ස්ථාන නැතිවීම නිසාත්, පිට ගම්වලින් නාදුනන පිරිස් නොපැමිණෙන නිසාත් ළමුන්ගේ ආරක්ෂාවට තිබූ තර්ජනය නැතිවීම. ක්‍රීඩාපිටියේ හා මංසංදිවල ළමුන්ට නිදහසේ සෙල්ලම් කිරීමට අවස්ථාව ලැබීම. ළමුන්ට නිදහසේ පාරේ ගමන් කිරීමට අවස්ථාව ලැබීම. රණ්ඩු අඩුවූ නිසා ළමුන්ට පාඩම් වැඩකරගැනීමට පහසුව ඇතිවුවා.

**පසුවිපරම** :- මාසෙකට වතාවක් ළමුන් එකතුවී නව පෝස්ටර් නිර්මාණය කර ප්‍රජාව ගැවසෙන තැන්වල ඇලෙව්වා. දෙමව්පියන් එකතුකර ඔවුන්ටද දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. ඇතිවන වෙනස්කම් මැනබැලීම. ගමේ ඇතිවූ වෙනස්කම් ගමේ අන් අයට පැවසීම.

**නිගමනය** :- ADIC ආයතනය සමග දිගින් දිගට එකතුවී සිටීම සහ දෙමව්පියන් සදහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මගින් තිබූ බාදාවන් අඩුකරගැනීමට හැකිවීම. සිගරට් හා අරක්කු වලට යන වියදම ගණනය කළ පෝස්ටර් ගමේ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමෙන් එකවර ගමේ සියලුදෙනාටම පණිවිඩය ලබාදීමට හැකිවීම හා එමගින් ඉක්මන් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවීම.

**Make a substance free better environment for the children**

Author :- Ruwan Ranasinghe

**Background :-** Paththinimathagama village is situated in Kaduwela provincial secretariat area in Colombo district. A play ground and 8 junctions were occupied by few groups of people to smoke and drink alcohol. Due to that children were not able to play in those areas and it was unsafe. So parents didn't allow their children to go there. The people who used to smoke and drink used to speak very unpleasantly, so the children were unable to their studies as well. There were 2 places where the illegal substances being selling. So many unknown people from other villages also come to buy substances. Due to this reason area has become more and more unsafe for the children. So we thought of making a free and safe area for the children in the village.

**Methodology :-** ADIC organization established a children's society in our village. So they educate us about the bad outcomes of alcohol and cigarettes. As they instructed to us, we made some posters which include the harmful effects of substances and we hang them in many places in the village. Leaflets containing the way that the tobacco companies earn money from the smokers were distributed to the houses.

**Challenges :-** The posters have being removed and the leaflets have thrown away. Smokers and alcohol users blamed to us. Due to the unsafe environment within the village, our parents didn't like to allow us to do this program.

**Results :-** We were able to transform the play ground and all the junctions in to the alcohol, smoke free area. Now there are no any illegal substance selling places in our village. As a result of this unknown people from other areas have stop coming to the village. Now the village has become a safer to the children and they can use the play ground freely. Children can do their studies well due to the peaceful environment.

**Follow up :-** Children have decided to make posters once a month and to display them again and again. We were able to conduct parents' gatherings for the awareness. We try to measure the changes that have been occurred in the village as a result of this program. We try to share and discuss our achievements with the villagers.

**Conclusion :-** Due to the support of the ADIC organization and parents we could able to minimize the difficulties. Through the posters we could able to make effective awareness program in the village. So we were able to get good results quickly.

OP

12

අ

## මත්ද්‍රව්‍යවලින් නිදහස් ළමයින්ට යහපත් පරිසරයක් නිර්මාණයවීම

කතෘ :- ඉසංකා සමනලී

**පසුබිම :-** මම කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කර්යාලයට අයත් ඉහළ බෝමිරිය ග්‍රාමයේ ඉසංකා සමනලී. මගේ තාත්තා රියදුරුවරයෙක්. පවුලේ සාමාජිකයන් 6ක් ඉන්නවා. ඉන් තිදෙනෙක් අධ්‍යාපන කටයුතු කරයි. මගේ පියා මද්‍යසාර හා සිගරට් භාවිතා කරන නිසා ආර්ථික ප්‍රශ්න ඇතිවෙනවා. අධ්‍යාපනයට මුදල් හිඟවීමද බොහෝ සිදුවෙනවා. තාත්තා දවසකට සිගරට් 5කට වඩා බොනවා. මගේ පියාගේ මද්‍යසාර හා සිගරට් භාවිතාය නතර කරගැනීමයි මගේ අරමුණ වුනේ.

**ක්‍රමවේදය :-** ADIC ආයතනය එකතුවී අපේ ගමේ ළමා සමාජයක් පිහිටෙව්වා. සිගරට්, අරක්කු බිව්වම වෙන දේවල් ගැන අපි දැනගත්තා. මම ඒ විස්තර ගෙදර අයට කිව්වා. අපිට ADIC ආයතනයෙන් කාටූන් ස්ටිකර් ලැබුණා. ඒවායේ දෙබස් නංගිලාට මම පාඩම් කෙරෙව්වා. (දෙබසේ කොටස් :- අනේ ඩොට්, පව් අර බෝයි. ඒගොල්ලන්ගෙ පැත්තට වතුර හිඟයක් වගේ, ඔයා කොහොමද එහෙම කියන්නේ? ඇයි අනේ අර ළඟින් යන හැමෝම නහය වහගන්නවනේ , එහෙනම් එයා සිගරට් බොනවා ඇති. කොච්චර නෑවත් සිගරට් ගඳ යන්නෙ නෑනෙ )ඉන්පස්සෙ ගෙදර හැමෝම ඉන්න වෙලාවල්වල නංගිලා ඒවා කියන්න පටන්ගත්තා. තාත්තාගෙ නම ඒකට එකතු කරලත් දෙබස් කියන්න ගත්තා.

මම තාත්තාට සිගරට් සදහා දවසකට මාසෙකට අවුරුද්දකට යන වියදම ගණන් හදලා පෙන්නලා දුන්නා. තාත්තාගෙ ඇස් උඩගියා. මම ඇහුවා 'අයියා බොනවාට තාත්තා කැමතිද' කියලා තාත්තාට ඒක හොඳටම දැණුන බව මට තේරුණා.

**අභියෝග :-** මුලදී මම මේ දේවල් කියද්දි තාත්තා ගණන් ගත්තෙ නෑ. මට බැන්නා. මම නංගිලා හරහා කියෙව්වා. පස්සෙ තාත්තා අපි කියන දේවල් අහන්න ගත්තා.

**පසුවිපරම :-** මම ඉහත ක්‍රමවේද දිගින් දිගටම කළා. මේ කරපු දේවල් නිසා තාත්තා ගෙදර ගෙනල්ල අරක්කු බිව්වෙ නෑ. ක්‍රමයෙන් තාත්තා වෙනස් උනා. අපි තාත්තාව අගයකළා. මම වෙනදට වඩා හොදින් අධ්‍යාපන වැඩ කළා. 'අයියා බොනවාට අපි කව්රුවත් කැමති නෑනෙ' කියලා මම තාත්තාට මතක් කළා.

**ප්‍රතිඵල :-** මේ දේවල් එක්ක ගෙදර ගොඩක් වෙනස් උනා. අපේ තාත්තා සිගරට් අරක්කු බොන එක ගොඩක් අඩුකළා. ගෙදර ගෙනල්ලා බිව්වෙම නෑ. ඒ වගේම පොත් ගන්න සල්ලි ඉල්ලපු ගමන් දෙනවා. මට හරි සතුටුයි. මම ඉස්සරට වඩා වැඩිවෙලාවක් පාඩම් කළා. ගිය අවුරුද්දෙ පන්තියේ 8 වෙනියා. මේ වසරේ දෙවනියා. මට ඉස්සර ගණන්වලට ලකුණු අඩුයි. දැන් මම ගණං පන්ති යනවා. දැන් මට ගණන්වලට ලකුණු 70ට වඩා වැඩියි. දැන් අපේ ගෙදර අරක්කු ගඳ, සිගරට් ගඳ අහලකටවත් එන්නෙ නෑ.

**නිගමනය :-** හැම ළමයෙකුටම මට වගේ එයාලගෙ තාත්තලාගෙ සිගරට්, අරක්කු බොන එක නවත්තගන්න පුළුවන්. පවුලේ අනිත් අයගෙත් සහයෝගය අරගෙන තාත්තාට දැනෙන විදියට කතා කරන්නයි ඕනෙ.

**Make the home environment free from addictive substances**

Author :- Isanka Samanali

**Background :-** I'm Isanka Samanali. I live in Bomiriya village, which is situated at Kaduwela provincial secretary area in Colombo. My father is a driver and I have 6 family members. 3 children out of 6 children are still having education. My father used to drink alcohol and to smoke more than 5 cigarettes per day. So there were many financial problems. My aim was to stop using alcohol and cigarettes of him.

**Methodology :-** Children's' society was established by the ADIC organization in our village. We learnt the harmful effects of cigarettes and alcohol. I explained them to my family members as well. From the members of the ADIC we were given cartoon stickers with dialogues. Dialogues were based on the harmful effects of the substance use and the statements discouraging its use. We tried to read them loudly when there were all the family members were present. We calculated cost for the cigarettes and alcohol for a month and for a year. Then we showed that to our father. We tried to explain it with my brother.

**Challenges :-** Initially father didn't pay attention to my explanations, so I tried to pass the messages through my sisters. Gradually he used to listen to us.

**Results :-** With these things our home situation has changed a lot. My father was able to reduce smoking and drinking alcohol. Family economy has improved. Now we can do our studies better than before and I was able to do my exams better that last year. Now our home environment is free of cigarette smoke.

**Follow up :-** I try to continue this method. Later my father stop brining alcohol to the home and he stopped drinking alcohol. He was able to change his attitudes toward smoking and alcohol so we tried to appreciate his decisions. We were able to do our studies better.

**Conclusion :-** every child can change his or her father into a non-smoker or nonalcoholic with the support of family members.

OP
13
අ

**බාලිකාවන් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සක්‍රිය කිරීම - ආනන්ද බාලිකා විද්‍යාලය හිඟුරක්ගොඩ**

කතෘ :- මිලන්ජනා විජේනන්දන, චානක සමරකෝන්

**හැඳින්වීම :-** මද්‍යසාර හා දුම්කොළ සමාගම් විසින් පාසල් දරුවන් මද්‍යසාර හා දුම්වැටි සඳහා පොළඹවා ගැනීමට විවිධ උපක්‍රම ක්‍රියාත්මක වන බැවින් හිගුරක්ගොඩ ආනන්ද බාලිකාවන් ඒවා හදුනාගැනීමටත් එවාට එරෙහිව ක්‍රියාත්මක වීමට හුරු කිරීම මෙම වැඩසටහනේ අරමුණු විය. මීට අමතරව අප පාසල කාන්තා පාසලක් බැවින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් වල යෙදීමට බාලිකාවන්ට පුරුද්දක් ඇති කිරීමද මෙම වැඩසටහනේ අරමුණක් විය.

**ක්‍රමවේදය :-** 2017 මාර්තු මාසයේදි පාසලේ ක්‍රියාකාරි දැරියන් 25 දෙනෙකු තෝරා "ආනන්දීය Youth Zone" නමින් ආකර්ෂණීය නමකින් ක්‍රියාකාරි කණ්ඩායමක් නිර්මාණය කරගන්නා ලදී. එම කණ්ඩායම සමඟ මද්‍යසාර හා දුම්කොළ සමාගම් ළමුන් ඉල්ලක කරන අකාරය පිළිබඳ දැනුවත් කළේය. පසුව ඒ පිළිබඳ අනෙක් ළමුන් දැනුවත් කිරීමට වීදි නාට්‍යක් පාසල් නිවාඩු දෙන දිනයේදී සියළු ළමුන්ට ප්‍රදර්ශණය කරන ලදී. එමෙන්ම පාසල තුල අප්‍රේල් පළමු දිනට සමගාමීව පොස්ටර් ව්‍යාපාරයක් සිදු කිරීම, පණිවිඩ ව්‍යාප්ත කිරීම සඳහා Facebook ගිණුමක් භාවිතා කිරීම, වෙසක් දින දන්සැලක් සංවිධාන කර ඒ හරහා මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ අවට ප්‍රජාවට ලබාදීම, පාසලේ බාලිකාවන් සඳහා පොස්ටර් තරගයක් පැ- වැත්වීම වැනි ක්‍රියාකාරකම් මේ වන විට බාලිකාවන් විසින් සිදු කර ඇත.

**අභියෝග :-** අප පාසලේ නවක ගුරුවන් ලෙස මෙම වැඩසටහන ආරම්භ කිරීමේදි පැරණි ගුරුවරුන්ගෙන් බාධක එල්ල විය. විදුහල්පතිගෙන් මෙම වැඩසටහන වෙත අවසර ගැනීම අසීරු විය. කණ්ඩායම ආකර්ෂණීය බව වැඩි කිරීමට t-shirt නිර්මාණය කිරීමට අවශ්‍ය වුවත් ඒ සඳහා මුලක් නොමැතිවීම අභියෝගයක් විය.

**ප්‍රතිඵල :-** මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සඳහා එකතු වීමට පාසලේ අනිත් ළමුන්ගේ කැමැත්ත වැඩිවී ඇත. දරුවන්ගේ දෙමාපියන්ගෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් වලට සහයෝගය ලැබිණි. එම හේතුවෙන් පියවරුන් දරුවන්ට පෙනෙන සේ මද්‍යසාර හා දුම්වැටි භාවිතා නොකරන බව දැනගන්නට ලැබී ඇත. ගුරු මණ්ඩලයේ පෙර මෙම වැඩසටහන්වලට අකුල් හෙලූ අය දැන් වන විට අප වැඩසටහන්වලට උදව් කරන මට්ටමට පැමිණ තිබේ. අධ්‍යාපන වැඩසටහන්වලට වැඩි කැමැත්තක් නැති ළමුන් මෙවැනි වැඩසටහන්වලට දක්වන දායකත්වය ඉහළ ගොස් තිබේ. එමෙන්ම ළමුන්ගේ නිර්මාණශීලීත්වය වර්ධනයක් පෙනෙන්නට තිබේ. කළාපය තුළ වෙනත් පාසල්වලින් වීදි නාට්‍ය පෙන්වීමට ආරාධනා ලැබුණි. ළමුන් එදිනෙදා කටයුතුවලදි මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරම්වල යෙදීම දක්නට ඇත.

**පසුවිපරම :-** ඉදිරි ක්‍රියාකාරකම් සැළසුමක් මේ වනවිටත් නිර්මාණය කරගෙන තිබේ. පාසලෙන් නික්මෙන දැරියන් වෙනුවට අළුතෙන් සාමාජිකයන් බඳවා ගැනීම සහ අළුත් සාමාජිකාවන්ට දැනුම ලබාදීම සැලසුම් කර ඇත.

**නිගමනය :-** නිවැරදි ශිෂ්‍ය කණ්ඩායම තෝරාගැනීම සහ ළමුන්ගේ යෝජනා මත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙවැනි වැඩසටහන් සාර්ථක කරගැනීමට අත්‍යාවශ්‍ය සාධක වේ.

OP

13

A

## Making the girls to actively participate in alcohol prevention – Ananda Balika Vidyalaya, Higurakgoda

Authors :- Milanjana Wijenandana, Chanaka Samarakoon

**Introduction :-** The aim of this programme is to train the girls of Ananda Balika Vidyalaya, Higurakgoda to identify the different strategies used by the alcohol and tobacco companies to attract school children to alcohol and tobacco and to act against them. Since this is a girls' school, this programme also aimed at making engaging in alcohol prevention activities a habit of the girls.

**Methodology :-** 25 active students were selected and an active team named "Anandeeya Youth Zone" was formed in March 2017. The team was educated on how the alcohol and tobacco companies target children. In order to make other students aware, a street drama was performed for all the students on the last day of the term. The students also have done activities such as a poster campaign within the school in parallel to the1st of April, using a facebook account to spread the messages using facebook account, organizing a free refreshment stall on Wesak day and spreading prevention messages to the community through it, organizing a poster
competition for the students.

**Challenges :-** When we started this programme as new teachers to the school, senior teachers interrupted. It was difficult to obtain permission for the programme from the principal. Although we wanted to print t shirts for the team to make it more attractive, finding funds was a challenge.

**Results :-** Other students were also willing more to participate in the alcohol prevention programme. Parents also gave their support for the alcohol prevention programmes of the children. Therefore we heard that the fathers stopped smoking and consuming alcohol in front of the children. The staff members who interrupted our programme, are now helping us. Even the students who did not like educational programmes much gave a better support to this programme. And also there was an increase in the level of creativity of the students. We were invited to perform the street drama in other schools in the zone. Students engage in alcohol prevention activities during their day today work.

**Follow up :-** A future action plan is already prepared. Recruiting new students to replace students who leave school and training them are planned.

**Conclusion :-** Selecting appropriate groups of students and executing programmes as proposed by the students are essential components to make this type of a programme a success.

OP
14
த

## மதுசாரம் மற்றும் சிகரட் ஆகியவற்றின் விளம்பரங்களை கட்டுப்படுத்துவதற்காக தமிழ் ஊடகங்களின் பங்களிப்பை வலுப்படுத்தியமை

எழுத்தாளர் :- மாரிமுத்து அருள்ஜோதி

**பின்னணி :-** தேசிய தமிழ் ஊடகங்களில் மதுசாரம்,சிகரட் உட்பட ஏனைய போதைப்பொருட்கள் விளம்பரப்படுத்தப் படுகின்றன என 2013ம் ஆண்டு மதுசாரம் மற்றும் போதைப்பொருள் தகவல் நிலையம் மேற்கொண்ட ஆய்வுகளிலிருந்து தெரியவந்தது. அதாவது 2013ம் ஆண்டு இறுதியில் தமிழ் அச்சு ஊடகங்களில் 43% ஆன மதுசாரம் மற்றும் சிகரட் விளம்பரங்கள் இருந்தன என்பது மேற்கொள்ளப்பட்ட ஆய்வுகளிலிருந்து தெரியவந்தது. அச்சு ஊடகங்களின் வாயிலாக வெளிவருகின்ற செய்தியை மக்கள் பின்வற்றுவது அதிகமாகும். அதனை பயன்படுத்தி மதுசாரம் மற்றும் சிகரட் தொடர்பில் பிழையான கருத்துக்களை பதிவிடுவதாலும் பல்வேறு மூடநம்பிக்கைகள் மக்கள் மத்தியில் விதைக்கப்பட்டது.

**செயற்பாடு :-** ஆய்விற்காக பிரதான 05 பத்திரிகைகள் தேர்ந்தெடுக்கப்பட்டன. ஒவ்வொரு நாளும் தேர்ந்தெடுக்கப்பட்ட அனைத்து பத்திரிகைகளும் வாசிக்கப்பட்டு அதில் மதுசாரம்,சிகரட் உட்பட ஏனைய போதைப்பொருள் தொடர்பான விளம்பரங்கள்,அவற்றை தடுக்கும் நோக்கத்தில் எழுதப்பட்ட கட்டுரைகள் மற்றும் சட்டம் தொடர்பான கட்டுரைகள் என வெவ்வேறாக பிரித்தெடுக்கப்பட்டன. குறிப்பிட்ட அச்சு ஊடக ஆய்விற்கு எழுமாறாக சில பத்திரிகைகள் தேர்ந்தெடுக்கப்பட்டு அவை ஆய்விற்கு உட்படுத்தப்பட்டது. அவற்றில் தேர்ந்தெடுக்கப்பட்ட அனைத்துபத்திரிகைகளும் ஒருவாரத்திற்குள் ஆய்விற்கு உள்ளடக்கப்படும். எந்த அச்சு ஊடகம் அதிகமான மதுசாரம்,சிகரட் மற்றும் ஏனைய போதைப்பொருள் பாவனையை தூண்டுகின்றது எனவும் எந்த அச்சு ஊடகம் மதுசாரம்,சிகரட் மற்றும் ஏனைய போதைப்பொருளை தடுப்பதற்கு உதவுகின்றது எனவும் எமது ஆய்வில் பட்டியலிடப்பட்டது. தூண்டும் வகையில் பிரசுரங்களை எழுதும் எழுத்தாளர் யார் என்பது தொடர்பில் ஆராய்ந்து அவருக்கு இதனால் ஏற்படும் விளைவுகள் தொடர்பிலும், பயன்தகு முறையில் எழுதக்கூடிய முறை தொடர்பிலும் தொழிநுட்பரீதியான உதவிகள் வழங்கப்பட்டன. ஊடகவியலாளர்களுக்கு தேவையான மூலவளங்களை பெற்றுக்கொள்ளக்கூடிய முறைகள் தெரியப்படுத்தப்பட்டன. ஏனைய இலத்திரனியல் ஊடகங்கள் மூலம் இடம்பெறும் விளம்பரங்கள் தொடர்பில் அவ்வப்போது ஊடகங்களுக்கு நேரடியாக தெரியப்படுத்தப்பட்டது.

**பெறுபேறு :-** அச்சு ஊடகங்களில் 2013ம்ஆண்டு மேற்கொள்ளப்பட்ட ஆய்வறிக்கையின் படி 43% மாக இருந்த விளம்பரங்கள் 2016ம் ஆண்டு இறுதியில் 11% ஆக குறைவடைந்திருந்தமை. அச்சு ஊடகங்களில் இளைஞர்களுக்காக கவர்ச்சிகரமான விழிப்புணர்வு செயற்றிட்டங்களுக்குத் தேவையான இலவச விளம்பரங்களும் பிரசுரிக்கப்படுகின்றன. ஆய்வுகளை மேற்கொண்ட போது 2013ம் ஆண்டு தொடக்கம் 2015ம் ஆண்டுவரை எழுதப்பட்ட அதிகவர்ச்சியான விளம்பரங்கள் 2016ம் ஆண்டு தொடக்கம் எழுதப்பட்டு பிரசுரிக்கப்படவில்லை என்பது எமது ஆய்வுகளிலிருந்து தெரியவருகின்றது. பிரதான 03 தமிழ் பத்திரிகை நிறுவனங்களில் தொழில் புரியும் அதிகாரிகள் குறிப்பாக சந்தைப்படுத்தல் பிரிவின் முகாமையாளர்கள், சிகரட் நிறுவனங்களின் விளம்பரங்களை பிரசுரிக்க வேண்டிய அழுத்தம் இருப்பதனால் பிரசுரிக்கின்றனர் ஆயினும் மனதால் வெறுக்கின்றனர். இலத்திரனியல் ஊடகங்களில் மதுசாரம்,சிகரட் உட்பட ஏனைய போதைப்பொருள் தடுப்பு தொடர்பாக ஒலி மற்றும் ஒளிபரப்பாகும் நிகழ்ச்சிகளின் அளவுமற்றும் நேரம் அதிகரித்துள்ளமை, 2016ம் ஆண்டின் இறுதியில் நேர அளவு 14 மணித்தியாலயங்களும் 30 நிமிடங்களுமாக கணிக்கப்பட்டுள்ளது.

**முடிவுரை :-** தொடர்த்தேர்ச்சியான பின்தொடரல் செயற்பாடுகள் மற்றும் புதிய நுட்ப முறைகள் மூலம் ஊடகவியலாளர்கள் மத்தியில் மாற்றங்களை ஏற்படுத்தலாம். அதனூடு ஊடகங்கள் மத்தியில் மாற்றங்களை ஏற்படுத்தலம்.

**Strengthened the contribution of Tamil media in controlling the advertisements on alcohol and cigarettes**

Author :- Marimutthu Aruljothi

**Background :-** According to the research conducted by Alcohol and Drug Information Centre in 2013 it has beenevident that national Tamil media advertise alcohol, cigarette, and other drugs. According to the research conducted it was found out that by the end of the year 2013, there had been 43% of advertisements on alcohol and cigarette on Tamil print media. According to a research conducted in America it has been found out that high percentage of youth and children get attracted to advertisements telecasted in television which uses their favourite animals, music, comedy, heroes, heroines and other idols to promote products.(http://www.tobaccofreekids.org/research/factsheets/pdf/0008.pdf) Advertisements by journalists also attract children. In addition to that, people do follow more on news in print media. Using that, publishing wrong information and myths about alcohol and cigarette had cultivated wrong ideas among people.

**Methodology :-** A research was conducted about the Tamil print media.Five main newspapers were chosen for this research. Every day the selected newspapers were read and advertisements about alcohol, cigarette and other drugs, articles written to prevent them and articles about law regarding them were chosen and categorized. In addition to the selected newspapers, some other newspapers were randomly selected and were incorporated in to the research. In that, all the selected newspapers were researched within a period of one week. A table was prepared during the research, listing which print media encourages the consumption of alcohol, cigarette and other drugs and which print media helps to stop alcohol, cigarette and other drugs. The author who wrote mostly about the encouraging articles was researched and he/she was given technical assistanceregarding the effects caused by this and about how to write useful articles. Journalists were informed about the ways by which they can get the relevant resources. Some other electronic media were directly informed about some of the advertisements they advertise. A healthy relationship was maintained with the journalists.

**Results :-** According the research conducted in newspapers, the 43% of advertisements published at the end of the year 2013 had reduced to 11% by the end of 2016.Print media published some free advertisements regarding attractive awareness programmes for the youth. The highly attractive advertisements that were published during the period of the research from the year 2013 to 2015 were not published since 2016.Higher officers, specially the marketing managers, of three main Tamil newspapers publish advertisement of cigarette companiesonly due to the pressure to do so, although they hate it personally. The quantity and time of broadcast in electronic media about prevention of alcohol, cigarette, and other drugs have increased. By the end of year 2016, it has been calculated to be 14 hours and 30 minutes.

**Conclusion** Effective follow-ups and effective prevention in media persons are essential in prevention approaches in media persons are essential in successful drug prevention.

OP
15
අ

## යුධ හමුදා සමාජිකයින් සිගරට් සහ මද්‍යසාර භාවිතයේ නිදහස් කර ගැනිමේ ක්‍රියාන්විතය

කතෘ :- එස්. අයි. ඒ.ඩී.ගුණසේකර

**පසුබිම :-** 2014/2015 වර්ෂවල ශ්‍රී ලංකා යුධ හමුදා තුළ සිදුකළ සමීක්ෂණ තුළින් 55% දෙනෙක් සිගරට් සඳහාද 65% දෙනෙකු මද්‍යසාර භාවිතා කරන බව පෙනී ගොස් ඇත. එසේම සමූහයක් වශයෙන් විශාලතම මුදලක් සිගරට්, මද්‍යසාර සඳහා ඇදි යන කණ්ඩායමක් බවට යුධ හමුදාව හඳුනාගෙන තිබුණි. උදාහරණයක් වශයෙන් යුධ හමුදා සමාජිකයෙකුගේ වසර 15ක සිගරට් වියදම ලක්ෂ 6ත් 10ත් ඉක්මවා තිබුණි.

**ක්‍රමවේදය :-** ඉහත තත්ත්වයන් අවබෝධ කරගත් යුධ හමුදා මූලස්ථානයේ මනෝවිද්‍යා මෙහෙයුම් ඒකකය ඇඩික් ආයතනයේ සහය මත දිවයිනේ සියලු බලසේනා මූලස්ථාන ඉලක්ක කර ගනිමින් වැඩසටහන් සිදුකළ අතර දේශන, වැඩමුළු සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2015-2017 වර්ෂවල ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් 2015 වසරේ සිට 2017 ජූලි මස අතර කඳවුරු ඉලක්ක කර ගනිමින් සිදුකළ වැඩසටහන් ප්‍රමාණය 60ක් පමණ වේ. ඒ තුළින් 20,000කට ආසන්න යුධ හමුදා සාමාජිකයින් ප්‍රමාණයක් දැනුවත් කරන ලදී. එසේම 2015 වසරේ සිට 2017 ජූලි මස අතර පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 9ක් සිදුකරන ලදී. ඒ තුළින් 220 දෙනෙකු පමණ පුහුණුව ලැබීය.

**අභියෝග :-** වැඩසටහන් ක්‍රියාත්මකවීමේදී භාවිතය නැවැත්වීමට යොමුවන හමුදා සාමාජිකයන්ගෙන් උපදේශන මට්ටමේ උපකාර පතන්නන්ට අවශ්‍ය පහසුකම් සැපයීම අභියෝගයක් වූ අතර එයට යුධහමුදා රෝහලෙන් සහ ADIC උපදේශන සේවාවන් ලබාදෙන ලදී.

**ප්‍රතිඵල :-** 2015 සිට 2017 දක්වා වැඩසටහන් තුළදී ඇතිකල දිරිගැන්වීම් මත කදවුරු තුළ සිගරට්, මද්‍යසාර නැවැත්වීමේ ප්‍රතිශතය සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර සිගරට් 36% ක්ද මද්‍යසාර 41%ක්ද වශයෙන් ඉහළ අගයක් ගනී. උදාහරණයක් වශයෙන් බත්තරමුල්ල ඉදිකරන හමුදා මූලස්ථාන වැඩබිමේ පමණක් මසකට සිගරට් 50000ක අලෙවිය නැවති තිබුණි. එසේම 2016 දී හමුදා පරිශ්‍රය තුළ සිගරට් අලෙවිය සතියට දින 2ක් ලෙස පමණක් සීමා කල අතර 2017 දී සම්පූර්ණයෙන් නවතා දමනු ලැබීය. එසේම සිගරට්,මද්‍යසාර භාවිතයෙන් නිදහස් වූ සාමාජිකයින් අගය කිරීමේ ක්‍රියාවලියක් ද කඳවුරු තුළ ක්‍රියාත්මක විය. ඉහත වැඩසටහන්වලින් පුහුණුකරුවන් වශයෙන් පුහුණු කල නිලධාරීන් 220 දෙනෙකු පමණ රටපුරා කඳවුරුවල ක්‍රියාත්මකවීම සහ වැඩසටහනේ තිරසාරභාවය පවත්වාගෙන යාමට සහය වීම. පසුගිය වසරවල මද්‍යසාර මිලදී ගැනිමට පහසු ක්‍රමයක් වශයෙන් වැටුපෙන් අඩු කර ගැනීමට තිබූ අවස්ථාව නවතා මද්‍යසාර මිලදී ගන්නා අවස්ථාවේදිම ගෙවීමට කටයුතු සිදු කර ඇත.

**පසුවිපරම :-** යුධ හමුදාපතිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වන නිසා හමුදා සාමාජිකයන්ට අවශ්‍ය දැනුම සහ ඉහළ තීරණවලින් ඒ සඳහා සහය ලබා දිමටද හැකිවිය.

**නිගමනය** :- භාවිතය දිරිගන්වන සේවා ස්ථානයක වුවද නිවැරදි තාක්ෂණය තුළින් වැඩකරන වටපිටාව තුළින්ම භාවිතය දිරිගැන්වීම අවම කළ හැකිය.

OP

15
A

**Implementation of a program to liberate army soldiers from alcohol and tobacco.**

Author :- S. I. A. D. Gunasekara

**Background** :- According to the researches carried out in 2014/2015 in Sri Lanka Army camps, 55% were smokers and 65% were alcoholics. Further, army was identified as a group who spent huge amount of money for alcohol and cigarettes. As an example, an army soldier spends Rs. 600,000.00 – 1,000,000.00 during 15 years for cigarettes.

**Methodology** :- In this background, psychological operation unit of army headquarters identified the severity of this issue and implemented a program with the support of ADIC targeting island wide army camps. This was held in 2015-2017 with seminars, workshops and training programs. 60 programs were carried out during 2015 to July of 2017 and approximately 20,000 army soldiers were participated in awareness programs. Further, 9 training programs were carried out during 2015 to July of 2017 with the participation of 220 soldiers.

**Challenges** :- While the programs carried out, some soldiers asked for guidance from soldiers who are tend to stop consumption of alcohol and cigarettes. It has become a challenge to provide them as instructors as they haven't go through the whole program. Therefore, Army hospital and ADIC supported to provide instructors.

**Results** :- Stopping tobacco and alcohol consumption has increased during 2015-2017, as a percentage it is 36% and 46% respectively. As an example, cigarettes sales have decreased by 50,000 cigarettes per month in Battaramulla army working area. Further, in 2016 cigarettes were sold only two days per week within the camp premises and in 2017 it has completely stopped. The soldiers were able to buy cigarettes on postpaid system from the salary. It has stopped within this period and everybody must pay at the time they buy. Liberated soldiers were appreciated publicly inside the camp. 220 soldiers were trained to conduct island wide programs and to maintain the sustainability of the program.

**Follow up** :- The program is continued and followed up under the supervision of the of the army commander and with the guidance of higher ranking officers.

**Conclusion :-** Eventhough the environment is favorable for alcohol and cigarettes, with a proper plan with better technology can reduce the consumption.

OP

16

අ

## කටාන ප්‍රදේශයේ මද්‍යසාර සිගරට් ඇතුලු අනෙකුත් මත්ද්‍රව්‍ය අවම කිරීම සඳහා පුස්තකාලයේ ඵලදායී මැදිහත්වීම හරහා පාඨක ප්‍රජාවගේ සතුට හා යහ පැවැත්ම දියුණු කිරීම

කතෘ :- එල්. ඩී. ඉන්දුමතී, ලලිතා දේවසුරේන්ද්‍ර, ඩබ්ලිව්. බී. පී. එම් කුමාරිහාමි

**පසුබිම :-** කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සිගරට් භාවිතය මෙන්ම මද්‍යසාර භාවිතය ඉතාමත් සීඝ්‍රයෙන් ප්‍රවර්ධනයක් සිදුවන බවට හෙළිවී ඇත. එමෙන්ම තරුණ පිරිස් හා ළමුන්ද එයට යොමු වී ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුද අඩපණ කරගන්නා ආකාරයත් අපට පෙනෙන්නට විය. එමෙන්ම සමහරක් පවුල් ජීවිතද ගැටළු සහගත තත්වයන්ද ඔවුන්ගේ ආර්ථික ජීවන රටාවේ පසුබෑසීමක් සිදුවෙමින් පවතී. ප්‍රදේශයේ මේ සම්බන්ධව උනන්දුවන පිරිස මෙන්ම සියළු ප්‍රජාවගේ සතුට හා යහපැවැත්ම දියුණු කිරීම සඳහා මද්‍යසාර හා සිගරට් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් ,තොරතුරු විමසිම හේතුවෙන් ඔවුන්ට නිවැරදි තොරතුරු ලබාදීම හා බලගැන්වීම අරමුණ වේ.

**ක්‍රමවේදය :-** කටාන බල ප්‍රදේශයේ අනෙක් ශාඛා පුස්තකාල 2ත් මේ සමග ජාලගත වීම. ඵලදායී මත්ද්‍රව්‍ය නිවාරණ තොරතුරු ඒකකයක් පිහිටුවා තිබීමත් ,තොරතුරු ඇතුලත් බහාලනයක් පවත්වාගෙන යාමත් ,මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ තොරතුරු ඇතුලත් බැනර් හා පෝස්ටර් ප්‍රදේශයේ ව්‍යාප්ත කිරීමත්, මත්ද්‍රව්‍යවලට යොමුවූවන් හමුවී සම්මුඛ සාකච්චා පවත්වා එහි සැබෑ ස්වභාවය හා සමාගම්වල ඇති විවිධ අරමුණු පැහැදිලි කර දීම. ළමුන්, රාජ්‍ය ආයතනවල සේවක හා නිලධාරී පිරිස්ද ප්‍රදේශයේ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම. විවිධ ප්‍රජාවන් තුල අත්පත්‍රිකා බෙදා දීම හා පෝස්ටර් ඇලවීම, විදී නාට්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීම.

**අභියෝග :-** විවිධ ප්‍රජාවන් සඳහා සුදුසු ඇමතීම කිරීමට කාලය වෙන්කිරීම අපහසුවීම මෙන්ම ඔවුන් සමඟ සාකච්ඡා කිරීම සඳහා වැඩි කාලයක් ගතවීම. පෝස්ටර් බැනර් ගැලවීම.

**ප්‍රතිඵලය :-** වෙහෙස නිවීම, විනෝදය, පවුල් තුල වීරත්වය මවා පෑ පුද්ගලයන් ඇතුළු හදුනාගත් පවුල් 45න් 15ක ප්‍රමාණයක් දුම්වැටි භාවිතයෙන් ඉවත්වී ඇති බවත්, සිගරට් අලෙවිකරණ වෙළදසැල් 60කින් 10ක් අලෙවිය නවතා ඇත. වෙළදසල් 20ක් පොසොන් හා වෙසක් සතියන් හි සිගරට් අලෙවිය නැවැත්විය. ප්‍රදේශයේ කාන්තාවන්ට සිදුවූ ගෘහස්ත ප්‍රචණ්ඩත්වය අවම වශයෙන් අඩුවූ බවත් එම පවුල් තුල සතුට උදාවීම, ආර්ථිකය දියුණුවීම, යහපත් පරිසරයක් ඇතිවීම පිළිබඳව කාන්තාවන් ප්‍රකාශ කර සිටීම.

**පසු විපරම :-** තොරතුරු යාවත්කාලීන වීම හා ප්‍රජාව දැනුවත් කිරීමේ නිර්මාණශීලි ක්‍රියාකාරකම් නිසි අයුරින් සිදුවීම ප්‍රජාවගේ හා පවුල් තුල ධනාත්මක ආකල්ප වෙනස්වීම තුලින් ලැබෙන ප්‍රතිඵල නිරීක්ෂණ කිරීම. පාඨක ප්‍රජාව තුලට මත්ද්‍රව්‍ය හා සිගරට් භාවිතය වළක්වා ගැනීම පිලිබඳ තොරතුරු ලබා දීම.

**නිගමනය** :- සාම්ප්‍රදායික පුස්තකාල සේවා සැපයීමෙන් ඔබ්බට ගොස් සමාජ මෙහෙවරක් වෙනුවෙන් කටයුතු කිරීම හා එහි ප්‍රතිඵල තිබීම ඉදිරියටත් මෙවන් ක්‍රියාවල නිරත වීමට හේතුවක් වේ.

**Developing the wellbeing and the happiness of the readers community in Katana through the effective intervention of the public library on minimize alcohol, cigarettes and other narcotics.**

Authors :- L. D. Indumathi, Lalitha Deasurendra, W. B. P. Kumarihami

**Background:-** A rapid increase in alcohol and cigarettes consumption was uncovered in Katana area. School children and young community are easily get addicted and results in breakdown of their education. Further, this has led to develop socioeconomical problems in families.However, there are people who are enthusiastic to involve in prevention of narcotics from the area. This program was conducted to provide accurate information and guidance to build up an effective plan in the means of developing the well being of the community through narcotic prevention.

**Methodology :-** A health promotion program mainly based on awareness was organized by 3 libraries in Katana area. As the first step, an effective information center for narcotics prevention was established. Information container are maintained in the library premises. A poster campaign was conducted with in the area. Simultaneously, street dramas and leaflet distributions were carried out among different communities of the area. School children and government officials actively and effectively contributed to the program. Further, narcotics users including cigarettes and alcohol were separately addressed and reality of narcotics and hidden agendas of the narcotics companies to promote their products was discussed.

**Challenges :-** Addressing different communities in different times was a challenge and had to spend a large time on it. Posters and banners were torn by unknown people.

**Results :-** The health promotion and awareness program has become a relaxing and enjoyable experience for all who participated in organizing, implementing and conducting the program. According to the research data, there is a reduction in using and selling narcotics specially cigarettes. Out of the 45 families, 15 have stopped smoking. Out of the 60 shops 10 has permanently stopped selling cigarettes while 20 has stopped it within Wesak and Poson weeks. Women in the area stated that domestic violence related to alcohol consumption is becoming less and due to the reduction of alcohol and cigarettes consumption socioeconomical stability of families are increasing.

**Follow up :-** Updating information and developing creative events for future programs. Maintaining updates on people who stopped consumption and recoding the changes of their lives after that. Continuing an regularly updated awareness among the community.

**Conclusion :-** It is worth to widen the services provided by a library beyond the regular services to build up a better society.

OP

17

த

## நோர்வூட் தோட்ட மக்களின் சாராயப் பாவனையைக் குறைத்தலும் குடும்ப வன்முறையைக் குறைத்தலும்

எழுத்தாளர் : பெர்னான்டோ பெனடிக்

**பின்னணி :-** நோர்வூட் தோட்டத்தில் மாத்திரம் மாதமொன்றிற்கு சுமார் ரூபாய் 3,409,000.00 சாராயத்திற்காக செலவழிக்கப்படுகின்றது என்பதனை தோட்டத்திலுள்ள மக்களைக் கொண்டே கணிப்பிடக் கூடியதாக இருந்தது. இதனால் குடும்ப வன்முறைகளும், பொருளாதாரப் பற்றாக் குறையும் இப்பிரதேசத்தில் காணப்பட்டது. இந்த நிலைமையை எமது மக்கள் மத்தியில் மாற்ற வேண்டும் என்பதற்காகவும், சாராயத்திற்காக செலவாகும் பணத்தொகையை குறைக்க வேண்டும் என்பதற்காகவும்,குடும்ப வன்முறைகளை குறைத்து பிள்ளைகளின் கல்வி நிலையை அதிகரிக்க வேண்டும் என்பதற்காகவும் இச்செயற்திட்டம் ஆரம்பிக்கப்பட்டது.

**செயற்பாடு :-** நோர்வூட் தோட்டத்தில் வசிக்கும் அனைத்து தாய் மற்றும் தந்தையரை ஒரே இடத்திற்கு ஒன்று திரட்டினோம் அவர்களை வெவ்வேறாக ஒன்று கூட்டி சாராயப் பாவனையினால் ஏற்படும் பொருளாதாரப் பிரச்சினைகள் வன்முறைகள் ஆகியவற்றை மக்களூடாகவே ஆராய்ந்தறிந்தோம். பின் தொடர்தேச்சியாக 06 மாதங்களிற்கு அக்குழுவுடன் மதுசாரம் அருந்துவதனால் ஏற்படும் பாதிப்புக்கள், மதுசாரம் அருந்துபவர்களுக்கு வழங்கப்படும் வரப்பிரசாதங்களை குறைத்தல், சாராயம் குடிப்பவர்கள் மத்தியில் காணப்படும் மூடநம்பிக்கை மற்றும் உண்மைத் தன்மைகள் தொடர்பான திறன் விருத்தி செயற்பாடுகள் ,மட்டுமன்றி தனித்தனியே வீடுகளிற்கு பாதீட்டுமுறை மூலமாக மதுசாரத்திற்கு செலவழிக்கப்படும் பணத்தொகை பற்றிய விபரங்கள் தெளிவூட்டப்பட்டன.கொழுந்து பறிக்கும் இடங்களுக்கு சென்று மக்களுக்கான விழிப்புணர்வு செயற்திட்டங்கள் மேற்கொள்ளப்பட்டன. ஒவ்வொரு மாதமும் மக்கள் மத்தியில் ஏற்படும் சாதகமான மாற்றங்கள் பற்றி கலந்துரையாடப்பட்டது. அம்மாற்றங்கள் வரவேற்கப்பட்டு ஊக்குவிக்கப்பட்டது. இச்செயற்றிட்டத்தில் பங்குபற்றியவர்களின் வீடுகளிற்கு விஜயம் மேற்கொள்ளப்பட்டது, வீட்டிற்கு வீடு மதுசாரத்திற்காக செலவழிக்கப்படும் பணம் தொடர்பில் விழிப்புணர்வடையச் செய்வதற்காக ஸ்டிக்கர்கள் ஒட்டப்பட்டன மற்றும் தோட்டத்தின் பொதுவான இடங்களில் பதாதைகள் காட்சிப்படுத்தப்பட்டன. விஜயத்தின் போது வீடுகளில் பாதீட்டு மீள்பரிசீலனை செய்யப்பட்டதுடன் மதுசாரத்திற்கு எவ்வளவு பணம் செலவாகின்றது மற்றும் அதிலுள்ள மாற்றங்கள் பற்றி ஆராயப்பட்டது. மதுசாரம் அருந்தும் தந்தையருக்கு எவ்வாறு தகுந்த பிரதிபலிப்புக்களை வழங்குவது என்பது தொடர்பில் பங்குபற்றிய பெற்றோர்களின் பிள்ளைகளுடன் கலந்துரையாடப்பட்டது.

**பெறுபேறு :-** எமது இறுதி ஆய்வுகளின் முடிவின் படி 08% ஆன ஆண்கள் மதுசார பாவனையை நிறுத்தியுள்ளனர். 65% ஆன பெண்கள் மதுசாரம் அருந்தும் தனது கணவருக்கு வரப்பிரசாதங்கள் வழங்காமல் சரியான பிரதிபலிப்புக்களை வழங்க ஆரம்பித்துள்ளனர். நோர்வூட் தோட்டத்தில் மதுசாரம் சார்ந்த வன்முறைகள் குறைவடைந்துள்ளன. மதுசாரத்தை விளப்பரப்படுத்தும் நுட்பங்களைக் கண்டறியும் முறைகள் தொடர்பில் பெற்றோர் தமது பிள்ளைகளுக்கு கற்றுக்கொடுக்க ஆரம்பித்துள்ளனர். நோர்வூட் தோட்டத்தில் செயற்றிட்டத்திற்கு பங்குபற்றியோர் மத்தியில் சேமிப்பு அதிகமாகியுள்ளது.

**சவால்கள :-** ஒவ்வொரு மாதமும் அனைத்து மக்களையும் ஒன்றுதிரட்டுவது சிரமமாக இருந்தது. இதனால் அவர்கள் கொழுந்து பறிக்கும் இடத்திற்கே சென்றுஅவர்களுடனான கலந்துரையாடல்களை மேற்கொள்ள வேண்டி ஏற்பட்டது.

**பின்கண்காணிப்பு செயற்பாடு :-** பங்குபற்றிய பெற்றோர்களில் 13 பேர் கொண்ட ஒரு குழுவை நியமித்துள்ளோம். அவர்கள் தொழில் புரியும் இடத்திலும்,வீடுகளிலும் பின்கண்காணிப்பு செயற்பாடுகளை மிகவும் எளிய முறையில் மேற்கொள்கின்றனர்.

**முடிவுரை :-** மக்கள் மத்தியில் மதுசாரத்திற்கு செவாகும் பணத்தொகை தொடர்பிலான விவாதங்கள் எழ வேண்டும். இது சமூக மட்டத்தில் மேற்கொள்ளக்கூடிய சிறந்தவொரு தடுப்பு முறையாகும்.

OP
17
A

## Reducing the alcohol consumption and domestic violence in Norwood estate people

Author: Fernando Benadic

**Background :-** We were able to calculate that around Rs. 3,409,000.00 is spent on alcohol per month in Norwood estate alone and we were able calculate this by using the people of the estate itself. Domestic violence and economic scarcities were seen in this region because of this reason. This activity was started to change this situation among our people; to reduce the money spent for alcohol and to improve the education of the children by reducing the family turmoil.

**Methodology :-** We gathered all the mothers and fathers who live in the Ferlands estate to one place. We gathered them separately and assessed using themselves the economic issues and violence because of alcohol consumption, based on the guidance provided by Alcohol and Drug Information Centre. After that continuously for 6 months we joined with that group and conducted skills development activities regarding effects caused by alcohol consumption, how to reduce the benefits given to alcohol consumers?, and myths existing among the alcohol consumers and the truth behind it. In addition to it, we introduced a budget system to each family and explained them how to calculate separately the amount of money spent for alcohol. Awareness programs were conducted at the places where they pluck tealeaves. Every month we discussed about the positive changes happening among people. Those changes were welcome and encouraged. Home visits were done to each family that participated in this activity. Stickers were pasted on each house to raise awareness regarding the amount of money spent for alcohol. Banners were also displayed in public places of the estate. During the home visits the budget was re analyzed and the amount of money was spent for alcohol and the changes had happened in it were evaluated. The proper methods of providing reflection to alcohol consuming fathers were discussed with the children of the participant parents.

**Challenges :-** It was difficult to gather all the people every month. Therefore, we had to go the places where they pluck tealeaves to carry on our activities.

**Results :-** According to the conclusion of our research, 08% of males have stopped alcohol consumption.65% of females had started to stop the benefits given to their alcohol consuming husbands and to provide proper reflection for them. Alcohol related violence had reduced in Norwood estate. Parents had started to teach their children precisely about the methods used to advertise alcohol. Habit of saving had increased among the people who participated from the Norwood estate.

**Follow up :-** We appointed a group of 13 members among the parents who involved in the activities. They are carrying on the follow up activities in a simple manner at their work places and homes.

**Conclusion :-** An argument should be developed among people to calculate the expenditure on alcohol for t is effective to conduct alcohol prevention activities in their own communities.

OP

18

த

## சாந்தைக் கிராமத்தில் இளைஞர்களின் செயற்பாட்டால் சாரயம்,கள்ளு-பாவனையில் ஏற்பட்டமாற்றம்

எழுத்தாளர் :- ஆறுமுகம் கடம்பன்

**அறிமுகம்** :- இக்கிராமம் வலி தென்மேற்கு பிரதேச செயலா் பிரிவில் 148,149 ஆகிய கிராமசேவையாளா் பிரிவில் உள்ள ஒருகிராமம். இங்குள்ள மக்களின் ஜீவனோபாய தொழிலாக சீவல் தொழில்,கடல் தொழில் காணப்பட்டது. இடப் பெயர்வுகளிற்கு பின்னரான காலத்தில் கிராமத்தவர்களின் மத்தியில் சாராயப் பாவனை,கள்ளுப் பாவனை அதிகமாகக் காணப்பட்டது.இக்கிராமத்தில் சாராயப்பாவனைக்கான ஒருமாத செலவுசுமார் 16 இலட்சமாக காணப்பட்டது.

**செயற்பாடு** :- இளைஞர் குழு, பாவனையாளாகள்,சிறுவர்கள்,பெண்களுடனான கலந்துரையடல்கள் ஊடாக கிராமத்தின் தற்கால நிலைய அறிந்து கொண்டு சாராயம் ,கள்ளுக்கு கிராமத்தில் இருந்து செலவாகும் தொகையைக் கணிப்பிட்டுப் பார்தபோது அதுசுமார் 16 இலட்சத்தை தொட்டது அதன் பிற்பாடு செயற்திறன் மிக்க இளைஞர்களைத் தெரிவுசெய்து தொண்டர் நிறுவனங்களைக் கொண்டு அவர்களிற்கு விசேட பயிற்சிகள் வழங்கினோம்.
சாராயம், கள்ளு குடிப்பவர்களை அவர்கள் குடிக்க செல்லும் கள்ளுக் கொட்டிலுக்கு சென்று அங்கு வைத்து அவர்கள் குடிக்க செலவு செய்யும் காசு பற்றி கலந்துரையாடப்பட்டு அவர்களிற்கு ஓர் ஆர்வத் தூண்டலை ஏற்படுத்தினோம். அவர்கள் குடிப்பதற்குசொல்லும் காரணங்களை கேட்டறிந்து அதுபற்றி அவர்களுடன் கலந்துரையாடினோம் ,வீடுகளிற்குகளிற்கு சென்று அவர்களின் வீட்டு சுழ்நிலைகளை நன்கு அறிந்து அவர்களிற்கு ஆலோசனைகள் வழங்கினோம். சிறுவர்களை ஒருங்கிணைத்து சிறுவர் கழகம் ஒன்று அமைத்து அவர்களை எவ்வாறுபல் தேசியக் கம்பனிகள் ஏமாற்றுகின்றன என்பதை தெளிவுபடுத்தியபின் அவர்கள் ஊடகங்களிற்கு கடிதங்கள் எழுதினார்கள். கிராமத்தில் மக்கள் குடித்து விட்டு நடிப்பதனை பார்த்து கேலிசெய்தனர். இந்தநடிப்புகள் தொடர்பாக சுவரொட்டிகளை எழுதி ஒட்டினார்கள்..

**சவால்கள்** :- கிராமத்தில் அதிகமானசீவல் தொழிலாளிகள் மற்றும் கடல் தொழிலாளிகள் இருப்பதனால் இவர்கள் இடையே சாரயம்,கள்ளு குடிப்பது தொடர்பான நம்பிக்கைகள் அதிகமாக காணப்படுகின்றமை, முன்னைய காலகட்டத்தில் மக்களின் கல்வி அறிவுபோதாமை, இளைஞர்கள் சிலா் தென்னிந்திய நடிகர்களின் தீவிர ரசிகர்களாக இருக்கின்றமை.

**தொடர் கண்காணிப்பு** :- செயற்திறன்,வினைத்திறன்மிக்க இளைஞர் குழு ஒன்றைஉருவாக்கி அவற்றுக்கு ஊடாகசெயற்பாடுகள் மேற்கொள்ளப்படுகின்றமை, கள்ளுக் கடைகயில் தொடர்புகொண்டு முகாமையளரைகள்ளுக்கு செலவாகும் தொகைபற்றிபாவனையாளா் மத்தியில் கலந்துரையாட வைத்தல்.

**மாற்றங்கள்** :- சாரயம், கள்ளு குடிப்பவர்கள் குடிக்கும் போதுதங்களிற்குகிடையே செலவுசெய்யும் தொகையை கணக்கிட்டு பார்க்கின்றனர். 2 போத்தல் குடிப்பவர்கள் 1 போத்தல் காணும் வா என்று சொல்லி எழுந்து செல்கிறார்கள், இளைஞர்கள் கள்ளுகடைக்கு, சாராயக் கடைக்கு செல்வது குறைவடைந்துள்ளது. விடுகளில் குடித்து விட்டு சண்டை செய்பவர்களின் குடும்பங்களில் சண்டை குறைவடைந்துள்ளது. அந்த வீடுகளில் பிள்ளைகள் இப்போது ஒழுங்காக பாடசாலைக்கு செல்கின்றனர், இளைஞர்கள் பல்வேறு பட்ட துறைசார்ந்த தொழில்களிற்கு செல்கின்றனர்,கிராமத்தில் சாராயத்திற்கு செலவாகும் தொகை குறைவடைந்துள்ளது, இப்போது குடித்துவிட்டு நடிப்பவர்களுக்கு இக்கிராமத்தில் இடமில்லை.

**முடிவுரை** :-புகையிலை மற்றும் மதுசார பாவனையில் மாற்றத்தை ஏற்படுத்த வேண்டுமாயின் சமூகத்தின் அனைத்து பாகங்களுக்கும் செயற்திடடங்கள் மேற்கொள்ளப்பட வேண்டும்.

**Changes made in alcohol and toddy consumption due to the intervention of the youth of Shanthai village**

Author :- Aarumugam Kadamban

**Background :-** This village comes under the Gramaseva division J/148,149 of vali south-western divisional secretariat region. Tree tapping and fishing were seen as the main livelihoods of these people. Consumption of alcohol and toddy was seen to be high among the villagers after the period of migration. Around 16 lakhs was spent per month for alcohol consumption in this village.

**Methodology :-** By discussing about the current situation of the village with the youngsters, consumers, children and women, we were able to calculate that around 16 lakhs was spent for alcohol and toddy in this village. After that we selected active youngsters and gave them training via volunteer organizations. We met the alcohol and toddy consumers by directly going to the places where they consume it and discussed about how much they spend on alcohol and toddy, and thereby motivated them. We asked to quit them for what reasons they consume alcohol and toddy, and discussed with them about those reasons. We went to their homes and learned their home situations properly and gave advice to them. We joined with the children and formed a children's club and explained them how multinational companies deceive them; and after that they wrote letters to the media. They humiliated the people who behave inappropriately after consuming alcohol and toddy in their village. They put up posters about these behaviours.

**Challenges :-** As there are many tree tappers and fishermen in the village, beliefs about consuming alcohol and toddy are highly seen among them. Educational level of older generation was poor. Some youngsters are being hardcore fans of South Indian actors.

**Results :-** Alcohol and toddy consumers calculate within themselves their expenditure while they consume. People who usually consume two bottles tell "one bottle is enough, come let's go" and leave the place. There is a reduction in youngsters going to toddy shops and alcohol bars. There is a decrease in domestic violence in the houses where there were fights after alcohol and toddy consumption. Children of those houses now go to school properly. Youngsters are going to jobs in various fields. Money spent for alcohol in the village has reduced. Now there is no place in this village for people who behave inappropriately after consuming alcohol.

**Follow ups :-** A potentially active and effective youth club was formed and activities are done via them. Making the owner/manager of the toddy shop talk to the consumers about the cost spent for toddy.

**Conclusion :-** To change a village with regard to alcohol and tobacco consumption, all the structures should be equally addressed.

OP

19

අ

## කිරින්ද ප්‍රජාව තුල උත්සව අවස්ථාවන් මද්‍යසාරකරණයෙන් නිදහස්ව පැවැත්වීම

කතෘ :- එම්. එම්. රෝහිණි

**පසුබිම** :- තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල කිරින්ද ග්‍රාමසේවා වසමේ ධීවර ප්‍රජාව බහුලව ජීවත් වේ. මෙය සංචාරක හා ධීවරයන්ගෙන් සැදුම්ලත් ගම්මානයක් නිසා තරුණ දූ දරුවන් අඩු වයසින් හිතුවක්කාර විවාහවලට යොමුවීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති අතර විවාහ උත්සව සිදුවන්නේද නැත. එමනිසා දියණියන්ගේ මල්වර උත්සවය ඉතාමත් ආකර්ෂණීය ලෙස සැමරීමට දෙමාපියන් උත්සාහ ගනී. එම උත්සව අවස්ථාවන්වලට අරක්කු ලබාදීම විශේෂයෙන් සිදුකරයි. ඒවාට මුදල් උපයාගන්නේ රටට ණයවෙලා, බැංකුවලින් ලෝන් අරන්, රත්තරන් භාණ්ඩ උගස් කරමිනි. ඉන් වැඩි කොටසක් වියදම් කරන්නේ මද්‍යසාර සඳහාය. එබැවින් ප්‍රජාව තුල උත්සව අවස්ථාවන් මද්‍යසාරකරණයෙන් නිදහස්ව පැවැත්වීම සහ මුදල් ඉතිරි කරදීම, අරක්කුයි සතුටයි අතර සම්බන්ධයක් නැහැ කියලා අවබෝධ කරවීම මාගේ අරමුණු විය.

**ක්‍රමවේදය** :- උත්සව තිබෙන නිවෙස් හදුනාගෙන ගොස් මද්‍යසාර සඳහා යන වියදම පෙන්වාදීම. කලින් තිබූ උත්සවවල සිදුවූ රණ්ඩු, අවසන් ප්‍රතිඵලය පිළිබඳව සාකච්ඡාවට ගැණුනා. සමාග ම්වල උපක්‍රම හදුන්වාදීම හා මිනිස්සු කරන්නේ බොරුවක් බවත්, බොරුවට රැවටිලා ඇති බවත් පෙන්වාදීම. අරක්කු දෙන්නේ නැත්නම් මුදල් ලැබෙන්නේ අඩුවෙන් කියන මත හා විශ්වාසයන් බිද දැමීම. උත්සවයට රස ගුණ ආහාර වේලක් ලබාදීමට කටයුතු සිදුකිරීම සාකච්ඡාවට ගැනුනා.

**අභියෝග** :- මෙම නිවෙස්වල පිරිමි අය ධීවර රැකියාව සහ හෝටල්වල වැඩ කරන නිසා 'ඔවුන්ට අරක්කු දෙන්නම ඕන' හා 'අරක්කු දුන්නෙ නැති වුනාම උත්සවය ඉවරවෙලා යාළුවෝ ළගට යන්න බෑ' යන මතවල ගමේ මිනිසුන් ඉන්නෙ. 'අරක්කු නැතුව නටන්න බෑ' යන මිත්‍යා මත ඔවුන් අතර තිබුණා. ඒවා වෙනස් කිරීම ලොකු අභියෝගයක් විය.

**පසු විපරම්** :- අරක්කු ලබා නොදී පැවැත්වූ උත්සවවල තිබුණු සතුට ගැන, අරක්කු ලබානොදීම නිසා ඉතිරි කරගත් මුදල් පිළිබඳව කතා කළා. මෙවැනි උත්සවයන් පැවැත්වීමේදි සිදුවන අපහසුතා, අභියෝග පිළිබඳ කතා කළා.

**ප්‍රතිඵල** :- 2016 සහ 2017 අවුරුද්දේ ජුලි දක්වා කාලය තුළ කිරින්ද ගමේ පවත්වන ලද උත්සව අවස්ථාවන් 15කින් 8ක් අරක්කු ලබානොදී පවත්වන ලදී. ලක්ෂ 6 කට ආසන්න මුදල් ප්‍රමාණයක් ප්‍රජාවට ඉතිරි කරදීමට මෙමගින් හැකිවූ අතර එම මුදල්වලින් දියණියන්ට අවශ්‍ය රත්තරන් බඩු සාදාදීම හා ඉතිරි කිරීම් සිදුකිරීම. එක් මවක් දියණියකගේ බැංකුවේ රු. 150,000.00ක් තැන්පත් කර ඇත. අරක්කු නැතුව උත්සව අවස්ථාවන් සිදු කිරීමේ වාසි ගැන මිනිස්සු කතා කිරීම. මේ ආකාරයේම වැඩපිළිවෙලක් සිදුකරන මෙන් වෙනත් ගම්වලින්ද ආරාධනා කිරීම. තවමත් අරක්කු ලබාදී පවත්වන උත්සවයන්හි අරක්කු බොන්න විශේෂ තැන් සූදානම් නොකිරීම හා බොන අයට වාසි වරප්‍රසාද ලබානොදීම.

**නිගමනය** :- මද්‍යසාරකරණයෙන් තොරව උත්සව සැමරීම තුලින් මද්‍යසාර භාවිතයේ අවාසිදායක බව පිළිබඳව ප්‍රායෝගිකවම අවබෝධය ලබාදීමට හැකිය

OP
19
A

**Promoting alcohol free celebrations in Kirinda community.**

Author :- M.M. Rohini

**Background** :- Fishery is the major livelihood of Kirinda community which belongs to Thissamaharamaya Pradeshiya Sabha division. It is a well-known place for tourism. Therefore tourism and hotel industry also plays a major role in their livelihood. In this background, teenage marriages are very common in this community. As a result, wedding ceremonies are seen less. Therefore, when a girl attains her puberty, they tend to celebrate it well. As there are financial difficulties, they tend to get loans and pawning jewelries to find money for the party. Majority of this money is spend on alcohol. Alcohol has become an essential part of their celebrations.

**Methodology** :- Houses which will be having celebrations were identified had discussions on alcohol use in celebrations. They believe that if alcohol is not provided then they will not get an enough amount of money as gifts. In the discussion, the unnecessary cost they have to spend for alcohol was pointed out. Further, we discussed the negative out comes of consuming alcohol in celebrations, such as, unnecessary fights and accidents which results in loss of happiness. The marketing strategies of alcohol companies were also discussed. Finally, we discussed and promoted a nutritious and delicious meal to replace alcohol.

**Objective** :- To promote alcohol free celebrations by pointing out the excessive cost and convincing there is no relationship between happiness and alcohol.

**Challenges** :- Changing myths and altitudes regarding alcohol was the hardest challenge faced up. Fishermen and hotel workers were having strong belief that their occupation need alcohol. Majority of the community believes, no alcohol- no fun. There is an altitude that they'll get neglected among friends for not giving alcohol.

**Results** :- In the time period of 2016 to July of 2017, 8 out of 15 ceremonies held in Kirinda village were free of alcohol. The community was able to save about Rs.600 000.00 from that and spend it on effective way. One mother stated that she was able to save Rs.150 000.00 witch she then deposited in a saving account. Other nearby villages were asking for the guidance to establish alcohol free ceremonies in their areas. Further, reserving special places for alcohol consumers and providing special states have stopped.

**Follow up** :- Discussion were held with who have done alcohol free ceremonies. Advantages and challenges of alcohol free ceremonies were widely discussed.

**Conclusion :-** By having functions without alcohol can deliver the message of disadvantages outcomes of alcohol use through practical experience.

OP

20

අ

## ඉපිල්වත්ත ගම්මානය වෙනස් කළ මද්‍යසාර භාවිතා කරන්නෙක්

කතෘ :- කාවින්ද කහවත්ත

**පසුබිම** :- වික්ටර් තබුත්තේගම ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ඉපිල්ලවත්ත ග්‍රාමයේ වෙසෙන තිදරු පියෙකි. වෘත්තියෙන් පෙදරේරුවෙක් වන ඔහු අවුරුදු 15ක් තිස්සේ දිනපතා අරක්කු භාවිතයට හුරුවූ අයෙක් වෙයි. දෛනිකව ලැබෙන රු. 1200 ක වේතනයෙන් රු 700ක් දිනපතා අරක්කු සඳහා වියදම් කරයි. දිනපතා බීමත්ව පැමිණෙන වික්ටර් බිරිදට පහර දෙති. නිවසේ භාණ්ඩ පොළොවේ ගසයි. දරුවන් බියට පත්වෙයි. බිරිද සහ දරුවන් ඉතා අපහසුවෙන් දිවි ගෙවයි. වික්ටර්ගේ නිවස ඉතාම අබලන්ව පැවතියේය. ඔහු ගමේ අන් පිරිසටද කරදරයක්වූයේ මද්‍යසාර භාවිතයෙන් පසු අන් අය සමග රණ්ඩු කිරීමත් බැන වැදීමත් හේතුවෙනි.

**ක්‍රමවේදය** :- මෙම ගම්මානයේ සිදුකළ මූලික විශ්ලේෂණයේ දී ගම්මානයේ වෙනසක් ඇති කිරීමට සුදුසු පුද්ගලයා ලෙස විකටර් හඳුනාගනු ලැබුවේය. එහෙත් වික්ටර් ගම්මානයේ පැවැති කිසිම වැඩසටහනකට සහභාගි නොවිය. නමුත් ඔහගේ බිරිද සීතා අප පැවැත්වූ වැඩසටහන්වලට සහභාගි වූයේ ඒ හරහා විකටර් හොඳ මාර්ගයට ගැනීමට හැකිවේ යන බලාපොරොත්තුවෙනි. ඇය උපක්‍රමශීලීව වික්ටර් අප වැඩසටහනට සහභාගි කරවීය. මුලදි ඔහු කියා සිටියේ ඔහු කවදාවත් අරක්කු බීම අත් නොහරින බවයි. මෙලෙස ක්‍රමිකව ඔහු සමඟ සිදු කළ සාක්ච්ඡා සහ අපගේ සිදු කළ ක්‍රියාකාරකම්වලට ඔහුගෙන් ලබාගත් සහයෝගය තුළ අප කෙරෙහි විශ්වාසයක් ඇති වීමත් සමග ඔහු ක්‍රමයෙන් වෙනස් කිරීමට හැකි විය.

**අභියෝග** :- මුල් අවස්ථාවේ සිදු කළ ක්‍රියාකාරකම් ප්‍රතිඵලදායක නොවන යන අදහස පැමිණියේය. වික්ටර්ගේ අරක්කු භාවිතය නැවැත්විය නොහැකි දෙයක් යන්න බහුතර අදහස විය. මෙම ගම්මානය පිළිබඳ තිබූ අයහපත් ප්‍රතිරූපයත් අභියෝගයක් විය.

**ප්‍රතිඵල** :- කාමර 4කින් යුත් අංග සම්පූර්ණ නිවසක් ඔහු විසින් ඉදි කර තිබේ. මීට අමතරව බිරිද සමග එක්ව ණය මුදලක් ගෙන තවත් ඉඩමක් මිලදී ගෙන ඇති අතර සිමෙන්ති ගල් ව්‍යාපාරයක්ද සිදුකරයි. වික්ටර් ගම්මානයේ ළමුන් මත්ද්‍රව්‍යවලින් ආරක්ෂා කරගැනීමට සමිතියක් ආරම්භ කර ඇත. තබුත්තේගම ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වලට සම්බන්ධ වෙමින් අරක්කු බිමෙන් නිදස්වීම ගැන කතා කරයි. බිරිදගේ වැඩවලට හවුල් වන අතර දරුවන්ගේ අධ්‍යාපනයටද උදව් කරයි. පොලිසියේ සහ රාජ්‍ය නිලධාරින්ගෙන් පිළිගැනීමක් ඔහුට ඇතිවී තිබේ. ඉපිල්වත්ත ගම්මානයේ මත්ද්‍රව්‍ය භාවිතයේ කරදර අඩු වි ඇත.

**පසුවිපරම** :- මුලදි අරක්කු භාවිතය අඩු කළ වික්ටර් පසුව සම්පූර්ණයෙන්ම අරක්කු බීම නවතා දමා මේ වන විට අවුරුදු 7ක් වේ. එම කාලය තුල ඔහුගේ වෙනස්කම ඇති කිරීම සඳහා දායක වූ සියළු පාර්ශවයන් ඔහු පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටියේය.

**නිගමනය** :- උපක්‍රමශිලී මැදිහත්වීමකින් පුද්ගලයන් වෙනස් කිරීමත් ඒ හරහා සමස්ත ප්‍රජාවක් වෙනස් කිරීමට හැකියාව පවතින බවත් මෙම උස්සාහය හරහා පසක් විය.

**An alcohol user who has changed the Ipilwaththa village.**

Author :- Kawinda Kahawatte

**Background :-** Victor is a father of 3 children who lives in the Ipilwatta village in Thambuththegama provincial secretariat division. He is a carpenter and used to drink alcohol for past 15 years. Rs 700 out of 1200 daily income, he used to spend Rs. 700/- for alcohol. Most of the time as a result of the drunkenness he fought with his wife in most of the time. Children had to face many difficulties due this. Wife and the children had to spend the life with more financial problems. Due to the drunkenness, Victor has become a problem to the villagers as well.

**Methodology :-** Following the initial analyze of the village we identified Victor as the person who need our help. But he didn't participate to any program in the village. His wife; Seetha participated to all our programs as she wanted to make a change in Victors life. She was able to join Victor to one of our program. Initially he told that he will never going to stop drinking alcohol. Gradually we discussed with him and explained the effects of alcohol. As a result of our joining him to our activities, he was able to build a trust on our program. So we were able to change him accordingly.

**Challenges :-** Activities done at the initial stages were noticed as ineffective by some people. Majority of the villagers believed that changing of this person cannot be done.

**Results :-** He has able to build a complete house with 4 bedrooms. He has started a cement business with his wife also. He has started a community to protect the children in the village from addictive substances. He participated for drug prevention campaigns. Now he spend more time and money for the education of children.

**Follow up :-** Initially he reduced the alcohol intake and later he was able to stop completely. During the past seven years he was able to live without alcohol. We observed him during the past few years.

**Conclusion :-**Through the correct interventions we can make a change in some-one's' life and through that we can change the whole community.

OP

21

අ

## ගර්භණී කාලයේදී සැමියාගේ මද්‍යසාර භාවිතය හා සිගරට් නතර කිරීමට හෝ අවම කිරීමට නිර්මාණශීලිව මා මැදිහත් වූ ආකාරය

කතෘ :- ඊ. ඩබ්ලිව්. ඉනෝකා ලක්මාලි

**පසුබිම** :- පිළියන්දල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ රත්මල්දෙණිය ගර්භනි මව්වරුන්ගේ සායනය තුළ 2015 වසරේ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සිදුකළ මැදිහත්වීම සම්බන්ධයෙනි. වසරකට මව්වරුන් 300කට ආසන්න පිරිසක් ලියාපදිංචි වේ. සෑම මවක්ම 6 වතාවකට වැඩි වාර ගණනක් සායනයට සහභාගී වේ. මෙම ගර්භනි මව්වරුන් 300ම තම ස්වාමි පුරුෂයා සමඟ ගර්භනී කාලය තුළ පැවැත්වෙන මව්පිය සායන සඳහා තුන් වතාවක් සහභාගි විය යුතුය. වාර්ෂිකව මව්වරුන් පියවරුන් 600කට ආසන්න පිරිසක් වාර කිහිපයකදීම පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය සමඟ සම්බන්ධ වේ. (මෙයින් සිගරට් භාවිතා කරන්නන් 25% සිටි.) ගර්භණී කාලයේදී සැමියාගේ මද්‍යසාර භාවිතය හා සිගරට් නතර කිරීමට උනන්දු කරවීම අරමුණ වේ.

**ක්‍රමවේදය** :- මෙහිදී ඇමතිය යුතු සුවිශේෂී පුද්ගලයා ගර්භණී මවගේ ස්වාමිපුරුෂයාය. ඔහුව සම්බන්ධ කර ගැනීම අසීරු කරුණක් බැවින් මා උපක්‍රමයක් භාවිතා කළෙමි.පළමු පිවිසුම ලෙස ගර්භණී මව ලියාපදිංචිවීමේදී සැමියා සහ බිරිඳ ඉදිරියේදී මත්ද්‍රව්‍ය භාවිතය නිසා කළලයට සිදුවන බලපෑම ගැන අවබෝධය දෙමින් දැනට සැමියා දුම්වැටි , මද්‍යසාර භාවිතා කරන කෙනෙක් ද යන වග පිළිබඳව සාකච්ඡා කරයි. සායනික දිනයේදී උදෑසන 6.00ට සායනයට පැමිණ මවට අදාල නොම්බරයක් ලබා ගැනීමට සැමියාගේ පැමිණීම අනිවාර්යය කළෙමි. 7.30ට ආරම්භවන සායනයට මව පැමිණෙන තෙක් සිගරට්, මද්‍යසාර භාවිතයේ ඇති නිවැරදි හානිය පිළිබඳව වූ වීඩියෝ පටයක් පෙන්වා සාකච්ඡාවන්ට සම්බන්ධ කර ගැනීම සිදු කළෙමි. අවම වශයෙන් එක් අයෙක් 7 වතාවක් පමණ සායනයට සමබන්ධ වේ . එදින සෞඛ්‍ය අධ්‍යාපන කතාවේදී මේ ගැන මව්වරුන් සමග සාකච්ඡා කරයි. ගර්භණී මව සහ සැමියා ප්‍රසව සැසි 3 කට සහභාගි විය යුතුය. ඔවුන්ව නිවාරණය සම්බන්ධ DVD, Power Point Presentation මගින් දැනුවත් කරයි. සැමියාගේ සහ බිරිඳගේ හොඳ නරක පිළිබඳව ලිවීමට තුන්ඩු ලබාදෙමින් භාවිතයේ පෙර සහ පසු ඇගයීම සිදු කරයි.

**අභියෝග** :- සැමියාගේ සිගරට් මද්‍යසාර භාවිතය අවම කිරීමට යාමේදී පසු විපරම් කටයුතු සිදුකිරීමේදී අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවිය

**පසුවිපරම** :- ගර්භණී මව්වරුන් නැවත සායනවලට පැමිණෙන විට ඇගයීම් පත්‍රිකා තුලින් මෙය සිදුකරයි. එයිට අමතරව ගෘහ පිවිසීම්වලදී මේ ගැන විමසන අතර ලබාදෙන ස්ටිකර් දොරේ අලවා තිබීම, අත්පත්‍රිකා කියවන්නට දීම ආදියෙන් මව්වරුන් ක්‍රියාත්මකවී ඇති බව දැනගන්නට ලැබුණි.

**ප්‍රතිඵලය** :- 2015 වසානයේදී සිගරට් භාවිතා කරමින් සිටි ස්වාමිපුරුෂයින් 88% ක් ගර්භණී මව ඉදිරියේදි සිගරට් භාවිතය නවතා ඇත. සිගරට් භාවිතය අඩුකළ / නතර කළ ස්වාමිපුරුෂයින් 63% ක් සිටි අතර මද්‍යසාර භාවිතය අඩුකළ /නතර කළ 12% ක් සිටියහ.

**නිගමනය** :- ගර්භණී කාලයේදී සැමියාගේ මද්‍යසාර භාවිතය ඇමතීම මෙන්ම විවිධ උපක්‍රම භාවිතා කිරිම වඩාත් ඵලදායි බවයි.

**The way I creatively intervened to limit or to stop husband's alcohol consumption and smoking during the pregnancy period.**

Author **:-** E.W. Inoka Lakmali

**Background** With regard to the interference done at Rathmaldeniya Antenatal clinic of Piliyandala MOH for alcohol prevention in 2015. Nearly 300 mothers register per year. Every mother visits the clinic more than 6 times. All 300 pregnant mothers have to participate in the Parents clinics during the pregnancy period, 3 times with their husbands. Every year a crowd of nearly 600 mothers and fathers meet with the mid wife several times. (25% of them are smokers)

**Objective :-** Encouraging to stop the husband's alcohol consumption and smoking during the pregnancy period.

**Methodology :-** In this situation the special person to be addressed is the husband of the pregnant mother. Since contacting him was difficult, I used a tactic. During the registration of the mother, the effect of alcohol use to the embryo was explained to the husband and the wife, and whether the husband consumes alcohol or smokes was discussed as the first approach. Husband coming at 6.00 am to the clinic on clinic days to reserve a number for the mother was made compulsory. Till mothers come for the clinic which starts at 7.30 am, a video on the harm of smoking and alcohol consumption was shown to the husbands and they participated in the discussions. One person participated atleast 7 times. During the health education talk for the day, I discussed about this with the mothers. The pregnant mother and her husband have to participate in 3 sessions. They were educated on alcohol prevention using DVDs and PowerPoint presentations. By giving the husband and wife to write positive and negative points of each other on chits, the evaluation of the use before and after was done.

**Challenges :-** Had to face inconveniences when observing and followup in reducing alcohol and tobacco use of husbands.

**Results :-** At the end of 2015, 88% of the husbands who smoked, stopped smoking in front of the pregnant mother. 63% limited/ stopped smoking and 12% limited/ stopped consumption of alcohol.

**Follow up :-** This was done by evaluation sheets given to the pregnant mothers in subsequent clinic visits. In addition, during home visits it was seen that the mothers actively took part by pasting stickers on their doors and giving leaflets to read.

**Conclusion :-** It is more effective to address the husband's alcohol consumption and smoking during the pregnancy and use various measures.

OP
22
අ

## මහනුවර මුරුතලාව ප්‍රදේශය සිගරට්වලින් නිදහස්වීම

කතෘ :- ගුණරත්න විජේකෝන්

**පසුබිම** :- යටිනුවර ප්‍රා. ලේකම් කොට්ඨාශයට අයත් මුරුතලාව නගරය සහ අවට ග්‍රාම නිලධාරී වසම් 08ක 12,000කට ආසන්න ජනතාවගෙන් පිරිමි ජනගහනයෙන් 28% පමණ සිගරට් භාවිතා කරන බව සිදු කල මුලික සමීක්ෂණයකින් වාර්තා විය. සිගරට් භාවිතය ප්‍රදේශයේ ජනතාවගේ ශාරීරික සහ මානසික යහපැවැත්මට විශාල බලපෑමක් ඇති කරයි. එමෙන්ම එම ගම්මාන තුල සිගරට් අලෙවිසැල් 48ක් හරහා දුම්කොළ සමාග මට වසරකට ඇදීගිය මුදල අවම වශයෙන් රු. ලක්ෂ 435ක් විය. මහනුවර මුරුතලාව ප්‍රදේශය සිගරට්වලින් නිදහස් ප්‍රදේශයක් බවට පත්කරගැනීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- ඉහත පසුබිම් තේරුම්ගත් අප ADIC ආයතනයේද සහය ඇතිව ප්‍රදේශයේ සිවිල් සංවිධාන , වෙළඳ සංගම් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලයේ මැදිහත්වීමෙන් වෙළඳසැල් හිමියන්, පාසල් ළමුන්, ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීම් සිදුකර දුම්කොළ සමාගමට සහයවීමෙන් ගමට, අපේ ජනතාවට සහ ළමුන්ට සිදුවන අවාසිදායක තත්වයන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. වෙළෙඳසල් හිමියන් සිගරට් විකිණීම නතර කිරීමට අකමැත්ත දක්වමින් සිදුකළ තර්ක හා මිත්‍යා මතවල සත්‍ය අසත්‍යතාවය පැහැදිළි කරන ලදී. එසේම සිගරට් විකිණීම නැවැත්වීමේ ක්‍රියාදාමයට සහයවූ වෙළඳසැල් සියල්ලට සහතික ලබාදී ඔවුන්ව ඇගයීමට ලක්කරන ලදී.

**අභියෝග** :- වෙළඳසැල් හිමියන්ගේ තර්කයවූයේ සිගරට් නොමැතිවීමෙන් පාරිභෝගිකයන් පිටතට ඇදීයන බව සහ විශාල ලාභයක් නැතිවන බවයි. ඉහත තර්කයන් දුම්කොළ සමාගම විසින් තම වාසියට නිර්මාණය කළ ඒවා බව ඔවුන්ට අවබෝධ කරවනු ලැබීය.

**ප්‍රතිඵල** :- මුරුතලාව සහ ඒ ආශිත ප්‍රදේශයේ ස්ථාන 43ක සිගරට් අලෙවිය නැවැත්වීමට වෙළඳ සංගමයේද සහය ඇතිව එකඟතාවය පළවිය. 2016 වර්ෂයේ මාර්තු 22 දින සිට සිගරට් අලෙවිය නවතා දමනු ලැබීය. සිගරට් අලෙවිකල ස්ථාන 48ක අලෙවිය නැවැත්වීමෙන් මුරුතලාව ප්‍රදේශයේ වසරක් තුල රු. ලක්ෂ 43ක මුදලක් ඉතිරි කිරීමට හැකිවිය. ජනතාවගේ සුභසිද්ධිය සඳහා සිගරට් භාවිතයෙන් ඉවත්වූ බවට දැක්වෙන දැන්වීම සෑම වෙළඳසලකම ප්‍රදර්ශනය කර ඇත. පවුල්වල ඉතිරිවූ මුදලින් පහසුකම් බුක්තිවිඳින දරු දැරියන් හමුවී ඇත. සිගරට් විකිණීම තම වෙළඳසැල තුල සිදුකළ හැකි පහත්ම ක්‍රියාවක් ලෙස ඔවුන් හඳුනාගෙන ඇත.

**පසු විපරම** :- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ වෙළඳ සංගමය නිරන්තර නිරීක්ෂණ සිදුකරන බැවින් පසුබෑම් ඇතිවීම අවමවී ඇත.

**නිගමනය** :- දුම්කොළ සමාගම් වෙළඳමහතුන් සහ ජනතාව තම අතකොලුවන් බවට පත්කරගෙන සිටින බවට වන අවබෝධය ලබාදීමෙන් විශාල වෙනස්කම් ප්‍රජාවක් තුල සිදුකල හැකි බව.

OP
22
A

## Muruthalawa area in Kandy becoming free of cigarettes

Author :- Gunarathna Wijekoon

**Background :-** According the basic research done, 28% of around 12,000 male population in Muruthalawa town in Yatinuwara divisional secretariat and 8 Grama niladari areas around smoke cigarettes. Smoking greatly affects the physical and mental wellbeing of the people living in the area. There are 48 shops in the villages where cigarettes are sold and minimum of Rs. 435 lakhs was dragged to the tobacco company through them. The aim was to make Muruthalawa area in Kandy district free of cigarettes.

**Methodology :-** We understood the above background and we educated shop owners, school children and members of community based organizations with the support of ADIC and the mediation of civil organizations in the area, trading associations and MOH about disadvantages to the village, our people and children by supporting the tobacco company. The truth and the false behind the myths and the arguments brought about by the vendors showing their dislike to stop selling cigarettes was explained. Certificates were given to the shops which supported the mission of stopping the sale of cigarettes and they were appreciated.

**Challenges :-** The vendors argued that the customers are drawn to other shops and they lose huge profits when cigarettes are not sold. We made them understand that those arguments were formulated by the tobacco company itself for its own benefit.

**Results :-** It was agreed to stop selling cigarettes in 48 places in Muruthalawa and area around, with the help of the trading association. Selling of cigarettes was stopped since 22nd of March 2016. By stopping selling of cigarettes, Rs. 43 lakhs per year was saved in Muruthalawa area. A notice saying that the sale of cigarettes was stopped for the benefit of the public is displayed in every shop. There are children who are benefited from the money saved in the families. They have identified selling of cigarettes as the most degrading thing that can be done in a shop.

**Follow up :-** Since the public health inspectors and trading associations follow up frequently, there are minimum deteriorations.

**Conclusion :-**Huge changes can be made in the community by making the vendors and the people realize that the tobacco companies have made them their slaves.

OP

23

අ

## සිගරට් විකිණීම සම්පූර්ණයෙන්ම නතර කල ගම්මානය

කතෘ :- H.M.T සුහසිංහ

**පසුබිම** :- 1341 ජනගහනයකින් යුතු කැත්තපහුව ගම්මානය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත්ය. ගම්මානයේ සිදුකළ සමීක්ෂණයට අනුව වැඩිහිටි පිරිමි ජනගනයෙන් 3/4 (341) සිගරට් භාවිතයට හුරුවී ඇත. මෙම ගම්මානයේ වෙළඳසැල් 21 ක සිගරට් වෙළදාම් සිදු කල අතර ඒවායේ දිනකට සිගරට් 1550 අලෙවි විය. ඒ අනුව සිගරට් නිසා ගම්මානයෙන් දිනකට පිටට ඇදී යන මුදල රු. 77,500 ට ආසන්න ප්‍රමාණයකි.

**ක්‍රමවේදය** :- මෙම තත්වය තේරුම් ගත් අප විසින් ඒ සඳහා මැදිහත්වීමට සණස බැංකුවේ සහයෝගය ඇතිව ළමා සමාජයක් පිහිටුවනු ලැබීය. මූලිකවම ගම්මානයේ සිගරට් විකිණීම අවම කිරීම සඳහා ළමුන් 16 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් ක්‍රියාත්මක විය.

මුලින්ම මෙම කණ්ඩායම විසින් සිගරට් අළෙවි කරන වෙලඳුන් හමුවී සිගරට් අලෙවියෙන් ගමට සිදුවෙන ආර්ථික හානියත් දුම්කොල සමාගම විසින් ඉතා සුළු ලාභයකට වෙලඳුන් රවටමින් මුදල් හූරා ගන්නා අකාරයත්, එමෙන්ම වෙළදසැල් වලට ගොස් දරුවන් සිගරට් භාවිතයට හුරු කරවීම දුම්කොල සමාගමේ උත්සාහය බවත් ව්‍යාපාරිකයන්ට පැහැදිලි කරදෙන ලදි.

මෙලෙස දිගින් දිගටම සිදුකළ ක්‍රියාත්මකවීම හේතුවෙන් සියලුම වෙළඳසැල් සිගරට් විකිණීම නවතා දැමීමට එකඟ නම් තමන් ද විකිණීම නැවැත්වීමට කටයුතුකරන බව වෙළෙඳුන් කියා සිටියේය. අවසානයේ සියළුම සිගරට් අලෙවි කල වෙළඳසැල් සිගරට් විකිණීම නවතා දැමීමට කැමති විය. පසුව ළමා සමාජය විසින් එම වෙළඳුන් අගය කිරීම සඳහා උත්සවයක් සංවිධානය කර ඔවුන් වෙත සහතිකපත් ලබාදෙන ලදී.

**අභියෝග** :- වෙළඳුන් විසින් අප වෙත එල්ලකල ප්‍රධාන තර්කය වුයේ සිගරට් නැතිවීම නිසා පාරිභෝගිකයන් තම වෙළඳසැලට නොපැමිණෙන බවයි. නමුත් අප විසින් පැහැදිලි කරදුන්නේ වැඩි ප්‍රමාණයක් වෙළඳසැලට පැමිණෙන්නේ සිගරට් මිලට ගැනීමට නොවන බවත් එම තර්කය දුම්කොළ සමාගම විසින් වෙළඳුන්ට උගන්වන මතයක් බවයි.

**ප්‍රතිඵල** :- 2015 දෙසැම්බර් සිට සිගරට් අලෙවිකල වෙළඳසැල් 21 අලෙවිය සම්පූර්ණයෙන් නවත්වා, අද දක්වා ක්‍රියාත්මක වෙමින් පවතී. මෙයින් ගමට ඉතිරි වෙන මුදල් ප්‍රමාණය ආසන්න වශයෙන් රු. 2,325,000 මුදලකි. සිගරට් අලෙවිය නැවත්වීම නිසාම සිගරට් භාවිතය නවතා දැමු බව ප්‍රකාශකරන 15 දෙනෙක් හමු වි ඇත. වෙළඳුන් සිගරට් අලෙවි නොකරන බව ප්‍රකාශ කරන්නේ ආඩම්බරයෙනි. මන්ද ළමුන් සිගරට් සඳහා පෙළඹවීම අපරාදයක් බව කියා සිටියි. අවට ගම්මානවලත් කැත්තපහුව ගම්මානේ සිගරට් නැති බව කියාසිටී.

**පසුවිපරම** :- ළමා සමාජය නිරන්තර පසුවිපරමකින් කටයුතු කරයි. එමෙන්ම ගමේ සියළුදෙනාත් මෙම වැඩසටහන අගය කරන බැවින් වෙළඳුන් නිරන්තරයෙන් පැසසුමට ලක්වීම නිසා වෙළඳුන්ගේ තීරණය තවත් ශක්තිමත් වි තිබේ.

**නිගමනය** :- ළමා සමාජයක අඛණ්ඩ උත්සායක් සහ කැපවීමක් තුළින් සාර්ථක සමාජ වෙනසක් කරා යාමට හැකි බව ඉගෙනීමට හැකිය.

OP

23
A

## A Village which has completely stopped cigarettes selling

Author :- H. M .T. Subasinghe

**Background :-** Keththapahuwa village in Kurunegala district has 1341 population.According to the survey done in this village 3/4 (341) among elderly male population were identified as cigarette users. There were 21 cigarette selling shops in village and 1150 amount of cigarettes have being selling per day. Amount of money cost for this is around Rs. 77,500 per day.

**Methodology :-** According to the current situation we started a children's society with the help of the Sanasa bank. Basically for the prevention purpose in the village was done by group of 16 children. Initially they met the shop owners and explained about the bad outcomes which affect the young generation and financial state of the village. They described about promotion strategies of the tobacco company in detail.

**Challenges :-** Shop owners complained about reduction of their consumer base. We explained them that the most of customers do not come for buy cigarettes and it is a myth that tobacco companies use to promote cigarettes. As a result all the shop owners agreed to stop selling cigarettes in their shops and they were able to stop selling cigarettes completely by the end of December 2015.A small occasion was organized to appreciate the shop owners and certificates were distributed by the group members.

**Results :-** 21 cigarette sellers were able to stop selling cigarettes completely and they were able to continue it up to now. As a result of this, the amount of money that could be able to save is Rs 232,500.There were 3 people who stopped smoking due to unavailability of cigarettes in the shops. Shop owners are proud of being not selling cigarettes and they tell about them to nearby villages.

**Follow up :-** Children's society is still observing the things carefully. Villagers also appreciate the shop owners so they have become more stronger

**Conclusion :-** Through the immense courage and dedication of the children's society would lead to a better change in society.

OP

24

අ

## මුලටියන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශය දුම්වැටියෙන් තොර කලාපයක් බවට පත් කිරීම හා නව යෞවනයන් මත්ද්‍රව්‍ය උදෙසා යොමු වීම වැළැක්වීමේ වැඩපිළිවෙල

කතෘ :- R.H.M. චමින්ද කුමාර

**පසුබිම** :- මුලටියන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය තුල 2014 වසරේ සිදුකළ සමීක්ෂණයෙන් පිරිමි පාසල් සිසුන්ගෙන් 20% ක් දුම්වැටිද 20% මද්‍යසාරද 5% වෙනත් මත්ද්‍රව්‍යයන්ද භාවිතා කොට තිබිණි. වැඩිහිටියන් අතර මෙය ඊට ඉහළ අගයක් ගැනුණි. එහිදී ඉතා අඩු වයසින් දුම්වැටි සඳහා යොමුවීමක්ද අපට නිරීක්ෂණය විය. මුලින්ම දුම්වැටි භාවිතය අරඹන ළමුන් ඉන්පසු සෙසු මත්ද්‍රව්‍ය කරා යොමුවන බව පෙනුණි. එනිසා මද ‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය සඳහා යොමුවීම වළක්වා ගැනීමට නම් දුම්වැටි සඳහා නව යෞවනයන් ආකර්ෂණය අඩු කළ යුතු බව අපගේ නිගමනය විය.

**ක්‍රමවේදය** :- එහි ප්‍රධානම ක්‍රියාමාර්ගය වූයේ සුලභතාවය අඩු කිරීමයි. ඒ සඳහා අප කොට්ඨාශය දුම්වැටි අලෙවි කරන වෙළඳසැල් ඉලක්ක කොට වෙළඳ සම්මන්ත්‍රණ 05ක් පවත්වන ලදි. වෙළෙඳුන් 300ක් පමණ ඊට සහභාගී විය. දුම්වැටි නිසා සිදුවන හානිය පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම දුම්වැටි අලෙවියෙන් ඔවුන්ට කිසිඳු වාසියක් අත් නොවන බව වටහා දීම අපගේ අරමුණ විය. ගරුතර සංඝරත්නය ,විදුහල්පතිවරු හා ගුරුවරුන් , රාජ්‍ය නිලධාරීන් ,පාසල් සිසුන් හා ප්‍රදේශවාසීන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් 100ක් පමණ මේ වන විට පවත්වා ඇත. කොට්ඨාශයේ සියලූ පාසල්වල මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවිණි.

**අභියෝග** :- මාස 3 -4 ක පමණ කාලයක් තුල 25% පමණ ප්‍රමාණයක් නැවත දුම්වැටි අලෙවියට යොමු විය.

**ප්‍රතිඵල** :- මෙම වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස මාස 02 ක පමණ කාලයක් තුල කොට්ඨාශයේ සියම වෙළඳසැල් දුම්වැටි අලෙවියෙන් ඉවත් විය. කොට්ඨාශයේ සියළු පාසල්වල මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සක්‍රීය මට්ටමේ පවතින අතර ඔවුන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව පාසල් සිසුන් අතර දුම්වැටි භාවිතයේ පැහැදිළි අඩුවක් දක්නට ලැබේ. නිවැරදිව දත්ත ලබා ගැනීමට විද්‍යාත්මක සමීක්ෂණයක් මේ වසරේ පැවැත්වීමට අපේක්ෂිතය. මෙම ක්‍රියාමාර්ග වල ප්‍රතිඵල ලෙස අප කොට්ඨාශයේ රන්සෑගොඩ හා මාකඳුර මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශවල සියළු වෙළෙඳසැල් දුම්වැටි අලෙවියෙන් ඉවත්වී ඇත.මුලටියන ,දෙයියන්දර හා රදාවෙල කොට්ඨාශවල වෙළෙඳුන්ගෙන් 80% දුම්වැටි අලෙවිය සිදු නොකරයි

**පසුවිපරම** :- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සහ සෞඛ්‍ය නොවන අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් හරහා වෙළඳසැල් හිමියන් සමග නිරන්තරව සම්බන්ධතා පවත්වා ගැනීම.

**නිගමනය** :- වැඩපිළිවෙල සාර්ථකවීමට නම් නිරතුරු පසු විපරම අවශ්‍ය බව එහිදී පෙනී ගියේය.

OP
24
A

**Converting Mulatiyana MOH division into a smoking -free zone and program for the prevention for youngsters drugs/alcohol.**

Author :– R.H.M.Chaminda Kumara.

**Background :-** According to a research done in Mulatiyana MOH division in 2014, from the students of boy's schools, 20% had consumed cigarettes, 20% had consumed alcohol and 5% had consumed other types of drugs. Among the elders, the values were even higher. It was observed there that there is a tendency for consuming alcohol at a very young age. It was also observed that the children who first start smoking cigarettes also direct themselves in using the other types of drugs in the later life.Therefore,our conclusion was that ,in order to prevent them from consuming alcohol and other drugs, their attraction towards smoking cigarettes should be minimized.

**Methodology :-** The main purpose was to reduce the frequency of consumption. For that, 5 business conferences were held in our division, targeting the shops which sell cigarettes. About 300 venders took part in those. Our objective was explain to them and making them aware of the bad consequences of smoking cigarettes and of the fact that they gain no benefits by selling them.Upto now, about 100 health education programs had been conducted for the reverent clergy, principles, teachers, government officers, school children and residents of the area.Drug Control Communities were established in almost all the schools of the division.

**Challenges :-** Within about 3-4 months, about 25 % again started selling cigarettes.

**Results :-** As a result of these programs, within a period of about 2 months, all the shops in the area stopped selling cigarettes. In all the schools of the area, Drug Control Communities are in action and according to the information obtained from them, there is a sharp reduction in smoking cigarettes among the school children .It is expected to conduct a scientific research in this year in order to obtain the most accurate results. As a result of all these activities, all the shops in Ransegoda and Makandura PHI divisions of our zone have abstained from selling cigarettes.80 % of venders of Mulatiyana, Deiyandara, Randawela divisions do not sell cigarettes.

**Follow up :-** Continuous relationships were maintained with the owners of shops through the public health inspectors and other non-health field officers.

**Conclusion :-** It was observed that frequent post observation is needed for the success of the process.

OP

25

අ

## නිර්මාණාත්මක ලිපියක් භාවිතයෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ දුම්වැටි අලෙවිකරන වෙළඳසැල්වල දුම්වැටි අලෙවිය අඩුකිරීම/නැවැත්වීම

කතෘ :- බුද්ධික විජේගුණරත්න

**පසුබිම** :- වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කය 43.3% බෞද්ධ, 32.8% ක්‍රිස්තියානි හා 20% ඉස්ලාම් දහම අනුගමනය කරන 760,778 ක ජනගහනයකින් හෙබි දිස්ත්‍රික්කයකි. බහුතරයක් කඩහිමියන් සිගරට් අලෙවියට කැමැත්තක් නැති වුවත් අනෙකුත් හේතු රාශියක් නිසා ඔවුහු කර්මාන්තයේ යෙදී සිටිති. අලෙවිය නවතා දැමීම හෝ අලෙවිය අඩුකොට භාවිතය අවම කිරීමට බලපෑම් කිරීම මෙහි අරමුණ වේ.

**ක්‍රමවේදය** :- දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය (MOH) දහතුනේ සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු (PHI) සමග කරන ලද මූලික සාකච්ඡාවෙන් පසු තම ප්‍රදේශයේ සිගරට් අලෙවි කරන වෙළඳසැල් තෝරාගෙන ලිපි යැවීම හා පසු විපරමක් සිදු කිරීමට ඔවුන් එකඟවුනි. ඔවුන්ට ප්‍රාදේශීයව සිටිනා ස්වේච්ඡා සේවකයින් උපකාර කරන ලදී. 2016 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල එක් MOH එකකින් සිගරට් අලෙවි කරන වෙළඳසල් 20 සඳහා තෝරාගත් දුම්වැටි නිවාරණ පත්‍රිකා 3ක් සතියක කාල පරතරයක් සහිතව සති 3ක් නොකඩවා විවෘත තැපෑල ඔස්සේ නිර්ණාමිකව වෙළඳසැල් 245 ක් වෙත ලැබීමට සලස්වන ලදී. 5 වන සතිවල හා 12වන සතිවල එම ලිපි යොමු කරන ලද වෙළඳසැල් හිමියන් දුම්වැටි අලෙවිය නවතන ලද්දේදැයි විමසා බලන ලදී.

**අභියෝග** :- නිර්නාමික පත්‍රිකා යැවීමට සමහර PHI මහතුන් අකමැත්ත ප්‍රකාශ කරන ලදී. පත්‍රිකාවේ මුස්ලිම් ජනයා නිරූපනය කිරීම සඳහා Symbol එකක් නොමැති වීම ගැටලුවක් විය. පුත්තලම, කල්පිටිය, මුන්දලම, හලාවත මුස්ලිම් හා දෙමළ ප්‍රජාව සැලකිය යුතු ප්‍රතිශතයක් වෙසෙන ප්‍රදේශ සඳහා පත්‍රිකා දෙමළ භාෂාවෙන් නොතිබීමත් ගැටළුවක් විය. යවන ලද ලිපි සියලුදෙනා හට ලැබුනේද, ලිපි කීයක් ලැබුනේද, සති 3 දීම එකම දිනයක ලිපි ලැබුනේදැයි සොයා බැලීමට ක්‍රමයක් නොතිබුණි.

**ප්‍රතිඵල** :- ලිපි යවනු ලැබූ වෙළඳසල් 245 න් 5 වන සතිය අවසානයේ 57ක් (23.26%) අලෙවිය නවතා තිබූ අතර මෙයින් 25ක් (10.21%) කලින් සිටම සිගරට් විකිණීම නවතා තිබූ අතර වෙළඳසැල් 16ක් නැවත 12 සතිය අවසානයේ අලෙවිය පටන්ගෙන තිබුණි. අවසානයේ දුම්වැටි නවතා දැමූ වෙළඳසල් ගණන 16කි (6.53%)

**පසුවිපරම** :- ප්‍රතිඵල PHI මහතුන් විසින් ලිපි ,SMS, දුරකථන හා ෆැක්ස් මගින් දන්වන ලදී. මාස 3 අවසානයේ එම ප්‍රතිඵලවල සත්‍යතාව දිස්ත්‍රික්කය පුරා නවතා දමන ලද වෙළඳසල් කරා ගොස් විමසා බලන ලදී.

**නිගමනය** :- ඉතා අවම කාලයකින් නිර්මාණශීලී ප්‍රවේශයන් යොදාගනිමින් වෙළෙඳසල් හිමියන්ට අවබෝධය ලබාදිය හැකි බව හා එය ප්‍රතිඵලදායක වන බව.

**Minimizing/terminating cigarettes selling in Puttalam District through a creative letter.**

Author :– Buddika Gunarathna

**Background :-** Puttalm District formulates the North Western province with a total population of 760 778. People in Puttalam Distric adhere to variety of religions, according to the senses there are 43.3% of Buddhists, 32.8% of Christians and 20% of Islamists. Even though the majority of the salesmen do not interested to sell cigarettes, due to various other reasons they tend to sell. The objective is to reduce tobacco consumption through minimizing/stopping selling cigarettes.

**Methodology :-** The first discussion was held with the participation of Public Health Inspectors of 13 MOH offices. At the discussion they were agreed to identify the places where cigarettes are sold to send letters and to carry out a follow up. Volunteers from each area helped to implement the program. The program was carried out during July to September of 2016 in 20 selected shops from one MOH area that are identified as selling cigarettes. Three selected leaflets on tobacco prevention were sent to 245 shops anonymously by mail within 3 weeks with intervals of one week. Outcome was assessed in the 5th and the 12th weeks to identify whether they have stopped selling.

**Challenges :-** Some PHIs didn't agreed to send anonymous letters. Not having a symbol for Muslims on the leaflet has become a problem. As there is a large number of Muslims and Tamils live in Puttalm, Kalpitiya, Mundalama and Chillaw, not having Tamil medium leaflets was a problem. Further, there was no method to confirm the number of received letters and whether they received on a same date.

**Results :-** At the end of the 5th week 57 shops out of 245 (23.26%) have stopped selling cigarettes. 25 out of the 57(10.21%) have stopped selling even before the letters were sent. At the end of the 12th week 16 shops has started the selling again. However the end the total number of shops that have stopped selling cigarettes is 16(6.53%).

**Follow up :-** Regular follow ups were done by PHIs and reported them via letters, SMSs, faxes and phone calls. At the end of the 3 months all 245 shops of the district were visited to assess the accuracy of the received data.

**Conclusion :-** An effective message can be delivered to the shop owners within a short period by using creative methods.

PP

01

අ

**අරක්කු සිගරට් මත්කුඩු හා දුම්කොළ භාවිතය අවම කිරීම සහ භාවිතය නැවැත්වීම සඳහා මාගත් වෑයම**

කතෘ :- ආර්.පී.ආර්. රාජපක්ෂ

**පසුබිම** :- කුලියාපිටි දීගල්ල ක්ෂේත්‍රයේ 2015 වර්ෂය තුළ ගර්භණී මව්වරුන්ගේ ස්වාමිපුරුෂයින් සහ මා යටතේ සංරක්ෂණය වන පවුල් 510කින් 70%ක් පමණ මත්ද්‍රව්‍ය, දුම්වැටි සහ මත්කුඩු භාවිතයට යොමු වී ඇත. සිගරට් සහ මද්‍යසාර භාවිතයෙන් නිදහස් සුවදායි ගමක් නිර්මාණය කිරීම මාගේ අරමුණයි.

**ක්‍රමවේදය** :- ගර්භණී මව්වරුන්/ස්වාමි පුරුෂයින් සඳහා පවත්වන ලද සැසි 03 තුළදී ස්වාමි පුරුෂයින්ට සිගරට් සහ මද්‍යසාර භාවිතයේ හානිය පැහැදිලි කරදීම, සිගරට් දුම නිසා කුස දරා සිටින දරුවාගේ මොළය වර්ධනය 50% ක් අඩු වන බව, ස්වාමිපුරුෂයා සදාකාලික රෝගියකු බවට පත් වීම හෝ මියයාම පවුලේ පැවැත්මට හානිදායක වන ආකාරය, පවුල් සංස්ථාවේ බිඳ වැටීම හා ලිංගික අප්‍රාණිකත්වය ඇතිවන බව පැහැදිලි කරදීම . එසේම මද්‍යසාර හා දුම්වැටි නැති ප්‍රිය සාදයක් මගේ නිවසේ සාර්ථකව සිදුකර එම ආදර්ශය මා විසින් ප්‍රායෝගිකව ඔවුන්ට සපයන ලදී. සිගරට් අලෙවි කරන වෙළඳ මහතුන් හමුවට ගොස් සිගරට්වලින් ලොකු ලාභයක් නොලැබෙන බවත් වෙළඳසැළ තුලම දුම්වැටිය දැල්වීම නිසා එම දුම ආඝ්‍රහනයෙන් ස්නායු ආබාධ ඇති වූ වෙළඳසැල් හිමියන් උදාහරණ සහිතව පෙන්වාදෙන ලදී.

**අභියෝග** :- "අරක්කු නැත්නම් කිසි ආතල් එකක් නැත" , "බලපත්‍ර ලබා ඇති බාර් වල අරක්කු අපි බොන්නෙ නැත්නම් බොන්නේ කවුද?", "බාර් අරින්නෙ මොකටද?" , "අරක්කු නොබොන පිරිමි ගෑණු වගේ", "ගෑණුත් අරක්කු බොන මේ කාලෙ?" ආදී මිනිසුන් තුළ පැවතුණ ආකල්ප මා විසින් කරුණු සහිතව බිඳ දමන ලදී.

**පසු විපරම** :- මෙසේ මහත් වෑයමකින් යුතුව යොමු කර ගන්නා ලද පුද්ගලයින්ගේ පැවැත්ම එසේම පවතින්නේදැයි මා විසින් නිරන්තර පසු විපරම් කරන ලදී. මා ක්ෂේත්‍රයේ ගෘහ පිවිසීම්, සායන, බර කිරන ස්ථාන ආදිය ඒ සඳහා උපයෝගී කර ගන්නා ලදී.

**ප්‍රතිඵල** :- ක්ෂේත්‍රයේ වෙළඳසැල් 5ක සිගරට් අලෙවිය බොහෝ දුරට සීමා කිරීමට හැකිවිය. නිවෙස තුළ සිගරට් බීම නැති කළ ස්වාමි පුරුෂයින්ගේ බිරින්දෑවරුන් 15 පමණ ප්‍රශංසා කරන ලදී. මත් කුඩු භාවිතයට ඇබ්බැහිවූ ගර්භණී මාතාවකගේ ස්වාමියෙකු පුනරුත්ථාපන කඳවුරකට යොමු විය. මා කළ වෑයමේ තවත් ඵලයක් ලෙස දිනකට සිගරට් 15 - 20ක් පානය කළ විදුලි බල මණ්ඩලයේ සේවක මහතෙකු දිනකට සිගරට් 2 - 3 ක් පමණ භාවිතය අඩු කිරීමට හැකිවිය. මද්‍යසාර නැති උත්සව 3ක් පැවැත්විණි. දිනපතා අරක්කු බී කෑ ගසන පුද්ගලයෙක්ගේ එම හැසිරීම වෙනස් විය.

**නිගමනය** :- ඉතා අවම වෙලාවක් යොදවා වැඩි ප්‍රතිඵල ලබාගැනීමට හැකි බව.

## My attempt to limit and stop the use of alcohol, cigarette, drugs and tobacco

Author :- R. P. R. Rajapaksha

**Background :-** 70% Of 510 families allocated to me including husbands of pregnant mothers in Digalla, Kuliyapitiya in the year 2015 who use alcohol, cigarettes and drugs. My aim was to create a healthy village free from cigarettes and alcohol.

**Methodology :-** Explaining the husbands about harm of smoking and consuming alcohol during 3 antenatal sessions done for pregnant mothers and their husbands.

I explained that the cigarette smoke reduces the growth of the brain of the fetus by 50%, the adverse effects of husband becoming a lifetime patient or dying on the existence of the family, how families collapse and how it can lead to sexual dysfunction. I practically set an example for them by holding a party successfully without alcohol and smoking at my home.

I met vendors who sell cigarettes and explained them that there is no big profit by selling cigarettes and explained them with examples of the vendors who suffered from diseases of the nervous system due to inhaling the cigarette smoke of people who smoked inside their shops.

**Challenges :-** I counter argued with facts and disproved the following attitudes that were there among people. "No fun without arrack", "who else will consume arrack from bars with license if not for us", "why do they open bars", "men who don't drink are like women", "women also drink now"

**Results :-** I could limit the selling of cigarettes in 5 shops in the field. 15 wives whose husbands stopped smoking at home praised. A husband of a pregnant mother who was addicted to drugs was directed to a rehabilitation center. An employee of the electricity board who smoked 15-20 cigarettes per day reduced it down to 2-3 cigarettes per day with my great persuasion. 3 functions were organized without alcohol. One person who behaved aggressively every day after consuming alcohol changed his bahaviour.

**Follow up :-** I followed up the people whom I changed with great effort to see whether they maintained the correct behaviours. I made home visits, clinics, weighing posts an opportunity for that.

**Conclusion :-** Great results can be obtained by spending only a limited time.

PP

02

අ

## සිගරට් භාවිතයෙන් නිදහස් කණ්ඩායම් ගම්මානවල ගොඩනැගීම

කතෘ :- රේණුකා මුදලිගේ

**පසුබිම** :- රන්දුණුවත්ත ජනශක්ති බැංකුවට අයත් ගම්මාන ගණන 4කි. සමිති 7ක සාමාජිකාවන් 677ක ප්‍රමාණයක් ඇත. මෙම සාමාජික පවුල් අඩු ආදායම්ලාභී පවුල් වේ. මම වැඩ කරන ගම්වල පවුල් අතරේ තිබෙන ආර්ථික අපහසුතා, පවුල් අසමගිය, හිංසනයට පත්වීම, දරුවන්ගේ අධ්‍යාපනය අතරමග නැවතීම, තරුණ දරුවන් අනවශ්‍ය ලෙස මුදල් වියදම් කිරීම, මුදල් ඉතිරි කිරීමේ අඩු බව වැනි කරුණු සැලකිල්ලට ගනිමින් අපේ ගම්වල උපයන මුදල් විශාල වශයෙන් බහුජාතික සමාගම්වලට නොදී ඒ මුදල් අපේ ගම්වලට ඉතිරි කරමින්, ඔවුන්ගේ සතුට වෙනුවෙන් යොදවන්න ඕන කියලා මං හිතුවා.

**ක්‍රමවේදය** :- මගේ සාමාජික පවුල්වල ස්වාමිපුරුෂයන් හා තරුණ පිරිමි දරුවන් සමග සංවාදයක් ගොඩනගා ගත්තා. දැනට සිගරට් එකක මිල කීයද, දිනකට සිගරට් කීයක් බොනවද? ආදී වශයෙන් කතා කරමින් ඒ තුලින් තමන්ගේ පවුලට සිදුවන ආර්ථික හානිය, කෙටිකාලීනව සිදුවෙන කායික හානියත් පෙන්වා දුන්නා. සිගරට් භාවිතා නොකරන පවුල් ආදර්ශයට ගනිමින් ඔවුන් දියුණුවී ඇති ආකාරය, ඔවුන් අතර තිබෙන සමගිය පෙන්වා දුන්නා. තමන්ගේ සිගරට් භාවිතය නිසා දරුවන්, බිරිඳ අපහසුතාවයට පත්වන ආකාරය පිළිබඳව අවබෝධකර දුන්නා. ඉතිරි කළ මුදල්වලින් සිදුකිරීමට හැකි දේවල් පෙන්වා දුන්නා.

**අභියෝග** :- මුල් අවස්ථාවේ ඔවුන් මේවා පිළිගැනීමට කැමැත්තක් දැක්වූයේ නැහැ. අපි කරන රැකියාව අනුව අපට සිගරට් බොන එක නවත්තන්න බෑ කිව්වා. යාළුවෝ එක්ක ඉන්න කොට සිගරට් එකක් හරි බොන්න ඕන, නැත්නත් යාළුවෝ තරහා වෙනවා කිව්වා. රජයට පුලුවන්නේ සිගරට් නැතිකරන්න කිව්වා.

**පසු විපරම්** :- නිතර නිතර ඔවුන් හමුවීම. නිවෙස්වලට යාම, අසල්වාසීන්ගෙන් අසා දැන ගැනීම. බිරිදගෙන් සහ ළමයින්ගෙන් අසා දැන ගැනීම. ඉතිරි කරගත් මුදල් ප්‍රමාණය විමසීම. ඔවුන්ව අගය කිරීම.

**ප්‍රතිඵල** :- පුද්ගලයින් වශයෙන් සෘජුවම 150 ක ප්‍රමාණයක් දැනුවත් කර ඇති අතර ඔවුන් හරහා තවත් පුද්ගලයින් 450 -500 අතර ප්‍රමාණයක් දැනුවත් වන ලදී. මේවනවිට සිගරට් භාවිතය නතර කළ ප්‍රමාණය 20 කට ආසන්න ප්‍රමාණයක් ඇත. මෙම 25 දෙනාගෙන් 5 දෙනෙක් වෙනත් අය වෙනස් කරමින් සිටී. සිගරට් භාවිතය නතර කළ පුල්ගලයෙකු යතුරු පැදියක් මිලදීගෙන ඇත. තවත් පුද්ගලයෙකු නිවස සාදා ගනිමින් පවතී. ළමයින්ගේ පොත්වල ඉතුරු කිරීම් සිදුකරයි. නිවසේ වහල සකස් කරගත් පුද්ගලයින්ද ඇත. දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් යොදවයි.

'බිරිද මම ලස්සනයි කියනවා, දරුවන් මගේ ළඟට දැන් එනවා. තාත්තගේ දත් දැන් සුදු පාටයි, බිරිද මගෙත් එක්ක දැන් රණ්ඩු වෙන්නේ නැහැ' කියලා සිගරට් භාවිතය නැවැත්වූ පුද්ගලයින් කියනවා.

**නිගමනය** :- සිගරට් බොන පුද්ගලයන්ට දැනෙන අයුරින් කථා කළාම වෙනස් කරන්න පුළුවන්

**Building up groups of individuals free from smoking in the villages**

Author:- Renuka Mudalige

**Background :-** There are 4 villages under Randunuwattha Janashakthi bank. There are 7 societies with 677 members. Families of these members are low income families. By considering the problems seen in the families in the villages where I work such as financial issues, family conflicts, violence, children dropping out from school, youth spending money unnecessarily and lack of saving money, I thought of saving the money earned by the villagers inside the village and spending for their happiness without giving to multi- national companies.

**Methodology :-** I started a conversation with the husbands and the boys in my member families. After asking them about the price of a cigarette and the number of cigarettes they smoke per day, I showed them the economic loss to the family because of smoking and the short term physical harms. By taking the families free of smoking as an example, I showed them how they developed and the peace they have in their families. I made them realize how the children and their wives are embarrassed because of their smoking. I enlightened their mind about the things they could do with the money that could be saved.

**Challenges :-** At the beginning they were reluctant to admit these. They said that they could not stop smoking due to the jobs they did. They said that they had to smoke when they were with friends otherwise the friends would be upset. They complained that the government could ban cigarettes.

**Results :-** 150 individuals were educated directly and 450-500 individuals were educated through them. About 25 individuals have stopped smoking up to now. 5 people out of them are changing some other people who smoke. One person who stopped smoking has bought a motorcycle. Another person is building a house. And there are people who have built roofs of their houses. They save money in savings accounts of their children. They spend money on children's education. People who stopped smoking said "wife said I look good, children said that my teeth are white, Children come close to me now, wife does not fight with me anymore".

**Follow up :-** Meeting them frequently. Visiting their homes and gathering information from the neighbours. Gathering information from the wife and the children. Asking about the amount of money they saved. Appreciating them.

**Conclusion :-** People who smoke can be changed if we talk to them in a way that they feel.

PP

03

අ

**ප්‍රදේශවාසීන්ට නිවැරදි ක්‍රමවේදයන් හා දැනුවත්කිරීම් හරහා මද්‍යසාර, සිගරට් භාවිතය අධෛර්යමත් කිරීම උදෙසා ක්‍රියාත්මකවීමට බල ගැන්වීම.**

කතෘ :- මල්කාන්ති උඩවත්ත

**පසුබිම** :- තරුණයින් ,පාසල් දරුවන් මත්ද්‍රව්‍ය හා දුම්පානයට යොමු වෙමින් පවතින අවධියක වෙළඳසැල් හරහා මෙන්ම නොයෙක් අයුරින් භාවිතයට යොමු කර ගැනීමට මාන බලමින් සිටින පිරිසක් ඇති බවත් හෙළිවිය. එමෙන්ම අධ්‍යාපන ව්‍යාපෘතීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ තොරතුරු සොයමින් පුස්තකාලය වෙත ඇදී එන්නට වූයෙන් නිවැරදි තොරතුරු පාඨක ප්‍රජාව වෙත ලබාදීමට අවශ්‍ය විය. ඒ අනුව ADIC ආයතනය සමග සම්බන්ධවී සියලුම ප්‍රජාවන් මෙම ගැටළුවෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. ප්‍රදේශවාසීන්ට නිවැරදි ක්‍රමවේදයන් හා දැනුවත්කිරීම් හරහා මද්‍යසාර සිගරට් භාවිතය අධෛර්යමත් කිරීම උදෙසා ක්‍රියාත්මකවීමට බලගැන්වීම මෙහි අරමුණ වේ.

**ක්‍රමවේදය** :- නිවාරණ පණිවිඩ මඟින් පාඨකයන් දැනුවත් කිරීමට ඊටම වෙන්වූ දැන්වීම් පුවරුවක් යාවත්කාලීනව පවත්වාගෙන යාම, බැනර් ප්‍රදර්ශනය, තොරතුරු කුටියක් පවත්වාගෙන යාම, චිත්‍ර/පෝස්ටර් කණ්ඩායම් සාකච්ඡා අතුළු නිර්මාණශීලී ක්‍රියාකාරකම් සිදු කිරීම, බැහැර ගෙන යන පොත්වල රබර් සීල් මඟින් පණිවිඩ ඇතුළත් කිරීම, ලිපි මගින් මාධ්‍ය ජාල දැනුවත් කිරීම, වෙළඳසැල් හිමියන්/ත්‍රිරෝද රථ රියදුරන්/ප්‍රදේශවාසීන් පෝස්ටර්,ස්ටිකර්, අත්පත්‍රිකා හා සාකච්ඡා මගින් දැනුවත් කිරීම ආදී ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**අභියෝගය** :- මෙවැනි දැනුවත් කිරීම් කළද, දුම්වැටි භාවිතය නතර කිරීම කළ නොහැකි බව සමහරුන්ගේ මතය විය. එබැවින් එම පුද්ගලයන් සමග දීර්ඝව සාකච්ඡා කිරීමට ද සිදුවිය. වෙළඳසැල් හිමියන් කිහිපදෙනෙකු ඡායාරූප ලබාදීමට අකමැත්ත ප්‍රකාශ කළ අතර, සමහර වෙළඳසැල් හිමියන් පෝස්ටර් ඇලවීමට අකමැත්ත ප්‍රකාශ කරන ලදී.

**ප්‍රතිඵල** :- පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සිදුකරන ලද වැඩසටහන්වලදී ඔවුන් සියලු දෙනාගේ කලින් තිබූ ආකල්ප වෙනස් වූ බව පවසන ලදී. වෙළඳසැල් හිමියන් 18 කින් 12 ක් සිගරට් වෙළඳාමෙන් ඉවත් වී ඇති බවත් අප විසින් ලබා දුන් පෝස්ටර් අත්පත්‍රිකා වෙළඳසැල තුළ ප්‍රදර්ශනය කර තිබෙන බවත් දැක ගැනීමට හැකිවිය. පුස්තකාලයට පැමිණෙන තරුණ පාඨකයින් 100 ක් යොදා ගෙන කල සමීක්ෂණයකින් 82 මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් ඉවත්වී ඇති බවත් දැන ගැනීමට ලැබුණි. ප්‍රදේශයේ පවුල් 07 ක් යොදා ගෙන කළ සමීක්ෂණයේ ප්‍රතිඵලයන්ට අනුව එම නිවෙස්වල කාන්තාවන් පැවසුවේ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ගේ මෙම වෙනස්වීම නිසා ආදායම් තත්ත්වයද ඉහළ ගොස් ඇති බවයි.

**පසු විපරම** :- බැනර්, පෝස්ටර් ප්‍රදර්ශනය, තොරතුරු අත්පත්‍රිකා, ස්ටිකර් වලින් දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් නිතර සිදු කිරීම, තවමත් ආකල්ප වෙනස් කර ගැනීමට නොහැකිව සිටින්නන් හඳුනාගෙන ඔවුන් මත්ද්‍රව්‍ය නිවාරණයට යොමු කිරීමට උත්සාහ කිරීම.

**නිගමනය** :- පුස්තකාල ක්‍රියාවලිය හරහා ද මත්ද්‍රව්‍ය නිවාරණය ආකර්ෂණීයව හා ඵලදායීව සිදුකල හැකි බව අවබෝධ කරගැනීම.

**Empowering the villagers to discourage alcohol and tobacco use through accurate methods and awareness programs.**

Author :- Malkanthi Udawaththe

**Background :-** School students and youth population of the area has tend to use alcohol and tobacco in a background where businessmen promote the products via various ways. Some members of the readers' community came to the library for seeking information on prevention of alcohol and tobacco for their educational projects. Therefore, requirement of an information center to provide accurate and updated information was needed. On this background, an awareness program was organized with the support and the guidance of the ADIC. The objective of this program is to empower the community to discourage alcohol and tobacco usage via accurate methods and awareness programs.

**Methodology :-** Under the awareness of the library members, an updating notice board with prevention messages was displayed in the library. Further, an information center was maintained and banners were displayed. Creative activities were done such as poster campaigns, group discussions and drawing sessions. Preventive messages were put on the lending books by rubber seals. Media was informed through letters. The community outside the library was educated via posters, leaflets, stickers and discussions.

**Challenges :-**Some people argued that these awareness programs are useless and will not be able to stop smoking. Convincing that kind of persons was a challenge and had to spend a lot of time on it. Some shop owners refused to give photographs and some refused to display posters.

**Results :-** School students stated the awareness programs helped to change their altitudes. 12 shop owners out of 18 has stopped selling cigarettes and display posters in their shops. A research was carried out with the participation of 100 young members of the library and according to the results, 82 have stopped consumption of alcohol and tobacco. Another research was carried out with the participation of 7 families of the area and according to the results, women of these families stated that their husbands have changed after the program and they have able to improve their economy through it.

**Follow up :-** Awareness programs with posters, banners, leaflets and stickers were continued. Regularly researched about the people who were unable to change and educated them.

**Conclusion :-** Prevention of alcohol and tobacco can be done effectively and attractively through the library.

PP

04

අ

## මීගම විද්‍යාලය හරහා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

කතෘ :- දිල්රුක් දර්ශණ

**පසුබිම** :- මීගම විද්‍යාලයේ සිසුන් හා මීගම ප්‍රදේශයේ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹී තිබීම නිසා ඔවුන් ඉන් මුදවා ගැනීමට අවශ්‍ය වූ බැවින් මීගම විද්‍යාලය මූලික කර ගනිමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ඒ සඳහා මීගම කණිෂ්ඨ විදුහලේ ගුරු මණ්ඩලයේත් සහය ඇතිව පාසලේ 7, 8, 9, 10 සහ 11 ශ්‍රේණිවල සිසුන් සමග වැඩසටහන් මාලාවක් සිදු කරන ලදී.

**ක්‍රමවේදය** :- මෙහිදී මූලික වශයෙන් පාසලෙන් කළ ඉල්ලීමකට අනුව පාසලේ ළමුන් සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. එහිදී ළමුන්ගේ මනසේ තිබුනේ සිගරට් භාවිතයේ ගැටළු විවිධ ලෙඩරෝග වැළදීම, මියයාම, සමාජයෙන් කොන්වීම, මුදල් නාස්තිවීම වැනි හානින්ය. නමුත් මෙම වැඩසටහන හරහා එම හානිවලට වඩා බලපාන ආසන්නතම හානි පිලිබඳව හා මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් කළහැකි ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කරන ලදී. ඉන් අනතුරුව ගුරු මණ්ඩලය හා ළමුන් එක්ව පා ගමනක් සංවිධානය කර සිදුකරන ලදී. මෙම පා ගමන මීගම නගරය තෝරාගනිමින් සිදු කල අතර මේ සඳහා පාසල් සිසු සිසුවියන් 200 ක් පමණ සහභාගීව සිදු කරන ලදී. පා ගමන් යාම ප්‍රතිඵලදායක ක්‍රියාවක් නොවුනද මෙම පා ගමන හරහා '' කවුරු බිව්වත් සිගරට් බොනකොට මෝඩ පාටයි '' කියන පාඨය සමාජගත කිරීමට උත්සාහ කරන ලදී. එමෙන්ම මෙහිදී නගරයේ කඩහිමියන්, රථවාහනවල පැමිණෙන පිරිස් දැනුවත් කිරීම හා පෝස්ටර්, ස්ටිකර් ඇලවීමද මීට සමගාමීව සිදු කරන ලදී.

**අභියෝග** :- මෙම පා ගමනේදී රැගෙන යාමට සුදුසු පාඨයන් නිර්මාණය කිරීමේදී බහුතරයක් මත් රකුසා පන්නමු, අපට මත්ද්‍රව්‍ය එපා, මත් දුමෙන් තොර සමාජයක් බිහිකරමු වැනි පාඨයන් වැඩි වශයෙන් නිර්මාණය වීම.

**ප්‍රතිඵල** :- මෙම වැඩසටහන ප්‍රදේශයේ කාගේත් කතාබහට ලක්විය. දැනුම ලබාදීමෙන් පසුව මුහුණ කළුවෙලා, තොල් කළුවෙලා, චූ කරන්න විතරයි, කට ගඳ ගහනවා වැනි නිවැරදි පාඨයන් නිර්මාණය විය. වැඩසටහනට සහභාගී වූ ළමුන්ගේ හොඳ දැනුමක් ඇතිවීම හා මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් කලහැකි එලදායී දෑ තේරුම් ගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් හැකි පිරිසක් බිහිවීම. මෙය ජනයුගය හා මව්බිම පුවත්පත්වල පළවිනි.

**පසුවිපරම** :- මෙම වැඩසටහනෙන් මසකට පමණ පසු නැවත වතාවක් පාසලට ගොස් ක්‍රියාකාරී සිසු සිසුවියන් සමග වැඩසටහන් මාලාවේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙහිදී ඔවුන් විසින් මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාවක් ලබාදුනි.

**නිගමනය** :- නගරයේ සිසු සිසුවියන් විසින් අලවන ලද ස්ටිකර් අදටත් දැක ගැනීමට ඇති අතර, ක්‍රියාකාරකම් මගින්ම සිසු පිරිස මත්ද්‍රව්‍ය භාවිතයේ ආසන්නතම හානිය පිළිබඳව නිවැරදිව අවබෝධමත් වූ බව සඳහන් කළ හැකිය.

**Implementing a community awareness program through students of Meegama Vidyalaya.**

Author :- Dilruk Darshana

**Background :-** As the community in Meegama including students of Meegama vidyalaya tend to use cigarettes, an awareness program on prevention of tobacco was organized at Meegama Vidyalaya. A series of program was organized to liberate the community from tobacco with the support of the teachers and with the participation of the students of Grade 7, 8, 8, 9, 10 and 11 of Meegama Vidyalaya.

**Methodology :-** As the first step, a basic awareness program was done at the school according to a request form the school. Students had the basic knowledge about adverse effects of smoking such as, health impacts, social rejection and economical issues. Further, during the program they were educated widely regarding short term impacts of smoking and prevention. After that a walk was organized by the teachers and student at Meegama town with the participation of 200 students. Even though the walk was not effective as wished, they tried to socialize the theme 'kawru biwwath cigarette bonakota moda paatai' (when smoking anyone looks stupid). Simultaneously, an awareness was done aiming shop owners and passengers with a poster and sticker campaign.

**Challenges :-** Creating appropriate slogans for the walk has become a challenge as the students came out with common slogans such as, 'math rakusa pannamu', 'apata mathdrawya epa' and 'math dumen thora samajayakmbihi karamu'.

**Results :-** Student's knowledge and understanding have improved through the program. They tend to create new slogans such as, 'muhuna kalu wela', thol kalu wela', 'chuu karanna vitharai' and 'kata ganda gahanawa'. Further, they tend to develop effective and creative prevention programs with a better understanding and a wide knowledge. The program was appreciated by the community of the area and it was published on 'Janayugaya' and 'Maubima' newspapers.

**Follow up :-** Follow up was done after a month from the basic program to evaluate the progress and to discuss about the prevention programs organized by students.

**Conclusion :-** The stickers and posters that are displayed can be still seen in the area. Students have become well educated regarding short term adverse effects of smoking through the activities.

PP

05

අ

## හම්බන්තොට මහජන පුස්තකාලය මගින් සමගිපුර ගම්මානයේ වැසියන් මද්‍යසාර හා දුම්වැටි භාවිතයෙන් නිදහස් කර ගැනීම.

කතෘ :- ඩබ්ලිව්.ඒ. අප්සරා ලසන්ති

**පසුබිම** :- මහජන පුස්තකාලය මගින් පාඨකයින්ට දැනුම ලබාදීම පමනක් නොව ඉන් ඔබ්බට ගොස් පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ගේ නෙත ගැටෙන ලෙස එලදායී මත්ද්‍රව්‍ය නිවාරණ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමත් පුස්තකාලයේ වෙනමම තොරතුරු අංශයක් පවත්වාගෙන යාමත් තුළින් පුස්තකාල පාඨකයන්ගේ මද්‍යසාර හා දුම්වැටි භාවිතය අධෛර්යමත් කිරීම අප පුස්තකාලයෙන් සිදු කරනු ලබයි. එම ක්‍රියාවලියේ ඉදිරි පියවරක් ලෙස පුස්තකාලය ආසන්නයේ ඇති ධීවර ගම්මානයක් තෝරාගෙන එම ප්‍රජාවේ දුම්කොළ හා මද්‍යසාර භාවිතය අධෛර්යමත් කිරීමට වැඩසටහන් සංවිධානය කිරීම. පුස්තකාලය හරහා අවට ගම්මානයේ වැසියන් මද්‍යසාර හා දුම්වැටි භාවිතයෙන් නිදහස් කර ගැනීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- පුස්තකාල පාඨක සමාජ රැස්වීම්වලින් අදහස් ලබාගෙන එය පුස්තකාල උපදේශක කමිටුව හරහා මහා නගර සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර මෙවැනි වැඩසටහන් පැවැත්වීමට අනුමැතිය මුලින්ම ලබාගැනීම. තෝරාගත් ගම්මානයේ පුස්තකාල කාර්ය මණ්ඩලයත් පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකුත් පාඨක සමාජයේ සාමාජිකයින් ඇතුලුව ADIC ආයතනයේ කාර්ය මණ්ඩලය එක්ව ගෙයින් ගෙට යෑමේ වැඩසටහන පැවැත්වීම. ඒ සඳහා අංශ කිහිපයකට වෙන්ව ප්‍රදේශයක් ආවරණය වන පරිදි කණ්ඩායම් ලෙස සකසා මත්ද්‍රව්‍ය නිවාරණ ස්ටිකර් හා දැන්වීම් අත් පත්‍රිකා බෙදාදිම හා එම නිවාස වල මත්ද්‍රව්‍ය සඳහා යොමුව ඇති අය පිළිබදව සංගණනයක් සිදු කිරීම හා ඔවුන්ගේ භාවිතය අවම කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

**අභියෝග** :- මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විවිධ අභියෝගයන්ට මුහුණදීමටද සිදුවිය. මුල්‍ය පහසුකම් සලසා ගැනීමේදී මහා නගර සභාවේ විවිධ අනුමැතියන්ට යටත්වීමට සිදුවීම. එවැනි ප්‍රදේශ කරා යෑමේ අවධානම හමුවේ අප හට එය තනිව සිදු කිරීමට නොහැකි වු අතර මිනිසුන්ගෙන් ඇතිවු තර්ජන හමුවේ පොලිස් නිලධාරීන්ගේ සහය පැතීමටත් සිදුවිය.

**ප්‍රතිඵලය** :- පුස්තකාලය අවට ප්‍රජාවගේ මද්‍යසාර හා දුම්වැටි භාවිතයේ ඇති ආසන්නතම හානි, ආර්ථික හානි අවබෝධ කරදීම හා මේවන විට ගම්මානයේ කාන්තාවන් හා තරුණයන් තමාගේ මද්‍යසාර හා දුම්වැටි භාවිතය අවම කරගැනීමට අවශ්‍ය උපදෙස් ලබාගැනීමට පුස්තකාලයට පැමිණීම. ගම්මානයේ ප්‍රචණ්ඩකාරී හැසිරීම් යම් පමණකට අඩුවී ඇති බවක් පෙනීයාම.

**පසු විපරම** :- සය මසකට පසු නැවත එම ගම්මානයේ වැඩසටහනක් දියක් කොට ඔවුන්ගේ භාවිතයේ වෙනසක් ඇතිවී ඇතිදැයි සොයා බැලීම හා ගම්මානයේ මද්‍යසාර හා දුම්වැටි අධෛර්යමත් කිරීමට ක්‍රියාකාරී කණ්ඩායමක් සෑදීම.

**නිගමනය** :- මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා පුස්තකාලයටද මැදිහත්විය හැකි බව. සෘජුවම ගමේ පුද්ගලයන් මුණගැසීමට අවස්ථාව ඇති බැවින් ඔවුන්ට නිවැරදි අවබෝධය ලබාදීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට පුස්තකාලයට ද දායක විය හැකි බව.

**Liberating the villagers of Samagipura village from alcohol and tobacco through the intervention of Public Library of Hambanthota.**

Author :- W. A. Apsara Lasanthi

**Background :-** The library has gone beyond its regular duties and already implemented a program to discourage smoking and alcohol consumption. It includes a separate information section and notices with effective preventive messages which are displayed in library premises. As the next step, programs were organized to minimize the alcohol and tobacco consumption among the community of a selected nearest fishery village. Objective of the program is to liberate the nearby community from tobacco and alcohol through the intervention of the library.

**Methodology :-** Initially, to organize and to implement a proper program, ideas and suggestions were gathered during readers' society meetings. The program proposal which was approved by the advisory board was sent to the municipal council to get approval and for the grants allocation. Field visits were done in the selected village with the participation of library staff, library members, police officers and staff of the ADIC. The area was divided in to several sections to make the process easier. Stickers, notices and leaflets were distributed to the houses of the area and people were educated regarding minimizing and prevention of alcohol and tobacco. Further, a senses study was carried out to identify the number of people who get addicted to alcohol and tobacco.

**Challenges :-** We had to face to several challenges during the program. Allocating funds under the municipal council was not easy. As there was less security to do the field visit alone in the area, had to get the support of the police.

**Results :-** There is an improvement of the knowledge in the nearby community regarding short term impacts and economical impacts of alcohol and tobacco. Women and young population tend to seek information and guidance from the library regarding prevention. A reduction of violence related to narcotics is noticed.

**Follow up :-** A follow up was done after a month to assess the changes of alcohol and tobacco consumption. An active team of villagers were allocated for future activities and monitoring.

**Conclusion :-** The library can play an effective role in alcohol and tobacco prevention. As the library is able to maintain direct contacts with villagers, it can create a proper environment to educate the community in an effective way.

PP

06

අ

**සතුට සපිරි තරුණ පිරිසක් මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්කවල සියළුම ජාතික යොවුන් සේනාංක තුලින් බිහිකිරීම.**

කතෘ :- එම්. ජී. තරුන් ගුණරත්න

**පසුබිම** :- ජාතික යොවුන් සේනාංකවල අධ්‍යාපනය ලබන තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය සඳහා යොමුවීමට වැඩි අවධානමක් ඇති කණ්ඩායමකි. එමෙන්ම බහුතරයක් තරුණයින් මේ වන විටත් විවිධ මත්ද්‍රව්‍ය භාවිතා කරයි. තරුණියන් මත්ද්‍රව්‍ය භාවිතා නොකලත් ඔවුන්ගේ මනසේ මත්ද්‍රව්‍ය පිලිබඳ ධණාත්මක චින්තනයක් පවතී. මේ සියළු කරුණු නිසා මොවුන් සමග මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මගින් මත්ද්‍රව්‍යට යොමුවීමට ඉඩකඩ ඇති තරුණයින් එයින් මුදවා ගැනීමටත්, තරුණියන්ගේ මනස හරි මගට ගැනීම හා තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ක්‍රියාත්මක වන පිරිසක් කරගැනීම වැනි අරමුණු ඇතිව මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්ක වල යොවුන් සේනාංක 06ක මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ක්‍රමවේදය** :- මූලික වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන තුලින් ක්‍රියාකාරී කණ්ඩායමක් තෝරා ගන්නා ලදී. එම ක්‍රියාකාරී කණ්ඩායමට මුල් තැන ලබා දෙමින් අනෙකුත් තරුණ තරුණියන්ද සම්බන්ධ කරගනිමින් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම සියළුම යොවුන් සේනාංක අවට ගම්මානය හෝ නගරය මේ සඳහා යොදාගන්නා ලදී. ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම, කඩහිමියන් දැනුවත් කිරීම, රථවාහන වල පැමිණෙන පිරිස් දැනුවත් කිරීම හා පොස්ටර්, ස්ටිකර් ඇලවීමද මීට සමගාමීව සිදු කරන ලදී. මෙම වැඩසටහනෙන් මසකට පමන පසු නැවත වතාවක් යොවුන් සේනාංකයට ගොස් තරුණ තරුණියන් සමග මෙම වැඩසටහන් මාලාවේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙහිදී ඔවුන් විසින් මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් සිදු කළ ක්‍රියාකාරකම් පළිබඳ අදහස් දැක්වීමට අවස්ථාවක් ලබාදුනි. යොවුන් සේනාංක නිලධාරීන් ගෙන්ද ලමුන්ගේ වෙනස පිළිබඳ විමසා තොරතුරු ලබා ගන්නා ලදී.

**අභියෝග** :- දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමේදී ශබ්ද විකාශන යන්ත්‍රවල නොමැතවීම් නිසා ළමුන් 200-300 පමණ පිරිසක් ඇමතීමේදී ගැටළුවලට මුහුණදීමට සිදුවිය. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී කඩහිමියන් හා නිවෙස් හිමියන්ගෙන් නොසන්සුන් ප්‍රතිචාර වැනි අභියෝගවලට මුහුණදීමට සිදුවිය.

**ප්‍රතිඵල** :- ක්‍රියාකාරී කණ්ඩායම් නිර්මාණය කිරීමට හැකිවීම. එම කණ්ඩායම වයස අවු. 16 - 25ත් අතර වූ නිසා ඔවුන් හරහා අනෙකුත් භාවිතා කළ තරුණයින් විශාල ප්‍රමාණයක් අතර භාවිතය විහිලුවකට හා උපහාසයකට ලක්වීම. අවට ප්‍රජාව විශාල වශයෙන් මත්ද්‍රව්‍ය හා මද්‍යසාර පිළිබඳ හානිය හා මිත්‍යාවන් තේරුම් ගැනීම. ගම්මානවල සහ නගරවල තරුණ තරුණියන් විසින් අලවන ලද ස්ටිකර් අදටත් දැක ගැනීමට ඇත.

**පසු විපරම** :- ක්‍රියාකාරී කණ්ඩායම් සමග ඉදිරියටත් ක්‍රියාත්මකවෙමින් පවතී.

**නිගමනය** :- භාවිතයට වැඩි අවදානමක් දරන කණ්ඩායම මත්ද්‍රව්‍ය නිවාරණයට ක්‍රියාකාරීව යොදා ගැනීම එම වයසේ පිරිස් අතර මත්ද්‍රව්‍ය භාවිතය මෝඩ වැඩක් යන අදහස ගෙන යාම පහසුය.

**To make a happy young generation through the national youth corps in Matara, Galle and Hambanthota districts.**

Author: M.A.Tharun Gunarathne

**Background :-** Students of the national youth corps are very vulnerable to use substances. Many of the male students are used to various substances by now. Even though the female students do not use any substance, they have a positive idea regarding the substance use. So there was a huge need of a awareness and drug prevention program for these students. Our aim was to protect the youth from getting addicted to substances and to make a group of people who actively interfere to drug prevention.

**Methodology :-** Primarily we held an awareness program to the students. Through the program we were able to select active participants for the future programs. Providing a priority for that group we were able to conduct an awareness program. We got the support from the other students as well. During the awareness program we tried to cover the villages and towns around the institute. We went to houses, shops and explained them. We displayed posters and stickers have been pasted. After one month of the completion of this program members of the youth corps went to the same places to get a review and ideas regarding the program. The people in the community were given a chance to share their ideas about the whole program done by youth corps. We got the information from the officers of the youth corps.

**Challenges :-** Due to the lack of physical sources like loudspeakers, it was difficult to aware a big crowd. There were objections from the villagers and shop owners during the awareness program.

**Results :-** We were able to build an active group for the program. Majority of them were between 16-25 years, so it has become more effective during the prevention program. Most of the people in the community also got a clear idea of the harmful effects of substances. There are some stickers remaining even after several months.

**Follow up :-** Tried to continue the programs actively.

**Conclusion :-** Using a correct and appropriate group for the prevention programs will be more effective to convey the messages.

PP

07

අ

## වසර 20 කට ආසන්න කාලයක් ඵලදායී ලෙස මත් නිවාරණය වෙනුවෙන් තරුණ කණ්ඩායමක් ක්‍රියාත්මක කරවීම.

කතෘ :- ආර්.ඒ. වසන්ත රවිචන්ද්‍ර, එස්.ඒ. උපුල් ඉන්දික

**පසුබිම** :- පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේව වසම් 87 කි. එහි පවුල් සංඛ්‍යාව 35371 කි. මුළු ජනගහනය 133933 කි. එහි අඩු ආදායම්ලාභී ජනතාව ගොවිතැන්, කොහුමෝල්, ගඩොල් කර්මාන්ත වැනි රැකියාවල නියුතු දිනක වැටුප රු. 800 ත් 1200 ත් අතර ලබන පිරිසකි. කොට්ඨාසයේ සිගරට් අලෙවි කරන වෙළඳසැල් 150 වඩා වැඩි අතර ප්‍රධාන අලෙවිසැල් 03 ක් පමණ ඇත. නීති විරෝධි කසිප්පු අලෙවිසැල් 50 කට වඩා වැඩි අතර රජයේ අනුමත අරක්කු අලෙවිසැල් 10 ක් පමණ ඇත. එමෙන්ම අරක්කු භාවිතා කර හිරිහැර කිරීම්ද ඇත.

**ක්‍රමවේදය** :- සමෘද්ධි වැඩසටහන් තුළින් ක්‍රියාශීලී තරුණ පිරිස් හඳුනාගෙන. ප්‍රාදේශීය මට්ටමට ඒකරාශී කර, "මත් නිවාරණ කමිටුව" ලෙස ස්ථාපිත කිරීම. මසකට වරක් තරුණ තරුණියන් හමු වී ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම. ක්‍රියාත්මක තරුණ පිරිස් මත් නිවාරණ කමිටුව තුළ රඳවා ගැනීම සඳහා වාර්ෂික විනෝද චාරිකා, පැදුරු සාජ්ජයන් හා එල්ලේ, ක්‍රිකට් වැනි අභියෝගාත්මක ක්‍රීඩා තරඟ පැවැත්වීම. එමෙන්ම සාමාජිකයන්ගේ පවුල්වල දුක්මුසු හෝ සතුටු අවස්ථාවන් සඳහා සහභාගී වී දුක සැප බෙදා ගනිමින් තමන්ගේම අයෙකු මෙන් කටයුතු කිරීම. මත් නිවාරණ කමිටුවේ තරුණ තරුණියන් සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යයාලයේ ඉහළම නිලධාරීන්ගේ සිට පහළම නිලධාරියා දක්වා සුහදත්වයට හා ඇගයීමට ලක්වීම මෙන්ම තමන්ගේම තැනකට පැමිණි බවක් දැනීම. වැඩසටහන් සඳහා මුදල් උපයා ගැනීමට වාහන සේදුම් වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**අභියෝග** :- කාලයක් තිස්සේ මෙම මත් නිවාරණ කමිටුව ක්‍රියාත්මකවීමේදී සාමාජිකයින් විවිධ හේතු මත සාමාජිකත්වයෙන් දුරස් වීම. දිගින් දිගට හමුවීමට ස්ථානයක් නොමැතිවීම හා සමහර වැඩසටහන් සඳහා මූල්‍යමය ගැටලු ඇතිවීම.

**ප්‍රතිඵලය** :- වසර 20ක කාලයක් මත් නිවාරණය සඳහා උනන්දුවෙන් කටයුතු කරන ක්‍රියාශීලී තරුණ කණ්ඩායමක් නිර්මාණය වීම. මත් නිවාරණය වෙනුවෙන් ඔවුන්ගේ දායකත්වයෙන් ප්‍රදේශයේ සිගරට් අලෙවිකරණ වෙළඳසැල් 75කට වඩා අඩු කිරීම, ප්‍රධාන අලෙවිසැල් එකක් දක්වා පහත දැමීම, නීති විරෝධි කසිප්පු අලෙවිසැල් 20 දක්වාද , රජයේ අනුමත බාර් 08ක් දක්වා අඩුවීම. අරක්කු භාවිතයෙන් සිදු කරන බොරු රඟපෑම්ද දක්නට නැති තරම්ය. මත්ද්‍රව්‍ය වලින් නිදහස් වී ජීවිතය සතුටින් විඳින පවුල් බොහොමයක් සමාජයේ දක්නට ඇත.

**පසු විපරම** :- දුරස්වන සාමාජිකයන් මාසික ව පවත්වන කමිටුවට සහභාගී නොවන බැවින්, මාස 06 කට වරක් පමණ විශේෂ හමුවක් පැවැත්වීම හා වාර්ෂික ව සිදුකරන විනෝද චාරිකා සඳහා ද ඔවුන් සම්බන්ධ කරගනිමින් අළුතින් පැමිණෙන පිරිසගේ අවබෝධය දියුණුවීම.

**නිගමනය** :- දිර්ඝකාලීනව වැඩසටහන පවත්වා ගැනීම සඳහා නිරන්තර පසුවිපරමක් සහ නව වැඩසටහන් අවශ්‍යවේ.

**Fruitfully engaging youngsters in action for sustainable prevention of consumption of drugs/alcohol for a period of about 20 years.**

Author :– R.A.Wasantha Ravichandra, S.A.Upul Indika.

**Background :-** There are 87 grama sewa divisions in Pannala divisional secretariat. The number of families there is 35371.The total population is 133933.The low income population in there is engaged in farming, working in coir mills and brick industry and earn a daily wage of about 800-1200 rupees. There were more than 150 cigarette selling shops in the area and about 3 large shops. There were more than 50 shops which sell illicit alcohol and about 10 shops selling alcohol under government licence.Cases of misbehavior after alcohol consumption had also been reported there.

**Methodology :-** Identifying the active young population through Samurdhi programs ,gathering them together regionally and naming it as "Drugs and Alcohol Prevention Committee", the youngsters gathering together once a month and discussing about the progress among them, conducting annual trips, musical programs and challenging games like elle and cricket with the purpose of retaining the active participation of the youngsters within the committee, sharing the good and bad situations of the families of its members and maintaining the bond , complimenting all the members of the committee when they visit the divisional secretariat office ,by all the officers there, ranging from its highest position to the lowest position and making them feel that they had visited a place of their own and conducting programs like car washes with the purpose of collecting money for the activities of the committee.

**Challenges :-** Losing the membership due to many reasons when this committee is in action for a very long period of time, Lack of a suitable place for the gatherings with the lapse of time, financial difficulties for some programs.

**Results :-** Formeden active youngsters who work effectively for the prevention of consumption of drugs/alcohol sustainably for a period of about 20 years. With their support, reducing the number of shops which sell cigarettes to 7, the number of large shops to 1, the number of shops selling illicit alcohol to 20 and the number of bars with the government license to 8.The misbehavior due to alcohol consumption is hardly seen there. There are many families in the area which are relieved from the nuisance of drugs/alcohol and enjoying their lives.

**Follow up :-** Since the members who loss the contact do not participate in the monthly meetings of the committee, conducting a special gathering once in every 6 months, getting them involved in the annual trips and increasing the awareness of the new members.

**Conclusion :-** For the sustainable maintenance of the program, frequent post observation and new programs are essential.

PP

08

අ

**ප්‍රජාවේ මද්‍යසාර විකුණන හා භාවිතා කරන ස්ථාන අවම කරමින් නිදහසේ සතුටින් ජීවත්විය හැකි පරිසරයක් නිර්මාණය කිරීම**

කතෘ :- ජී එච් එන් කුමුදු කුමාරි

**පසුබිම** :- හොරණ, වැල්මිල්ල සායනය සඳහා අවුරුද්දකට ගර්භණී මව්වරු 30 කට ආසන්න පිරිසක් ලියාපදිංචි වේ. මෙම ප්‍රදේශය ගත් කළ කසිප්පු අනෙක් ප්‍රදේශවලට බෙදා හැරීම බහුලව සිදු කෙරේ. එම නිසාම 60% කට ආසන්න පිරිමි අය අරක්කු භාවිතයට පුරුදු වී ඇති අතර දුම්වැටි භාවිතයද සාමාන්‍ය එකක් සේ සැලකේ.

මේ හේතුවෙන් ගර්භණී මව්වරුන් හිංසනයට ලක්වීම , දරුවන්ගේ පෝෂණ ගැටළු, ආර්ථික ගැටළු ආදිය බහුලය.

**අරමුණ** :- මද්‍යසාර සුලභතාවය අවම කරමින් කාන්තාවන් සහ ළමුන්ට සතුටුමත් පරිසරයක් උදා කරලීම.

**ක්‍රමවේදය** :- ගර්භණී මව්වරුන් සහ ස්වාමි පුරුෂයන්, පෙර පාසැල් දරුවන් සහ දෙමාපියන් මාගේ ඉලක්ක කණ්ඩායම විය. පියාගේ සිගරට් , මද්‍යසාර භාවිතය කළලයට ඇති කරන බලපෑම පිළිබඳව සායනය තුලදී මෙන්ම මව්පිය සැසි වලදී ද සැමියා සහ බිරිඳට අවබෝධය ලබා දුනි.

සිගරට්/මද්‍යසාර භාවිතා කරන අයගේ බාහිර ස්වරූපයට වෙන හානිය පෙර පාසැල් දරුවන්ට පෙන්වා දෙමින් දරුවන් හරහා දෙමාපියන් ඇමතීම මා ගත් තවත් උත්සාහයකි. ප්‍රජාවේ කාන්තාවන්ට ඇති ගැටළු සාකච්ඡා කරමින් ඔවුන් බලගන්වමින් සිගරට් , මද්‍යසාර සුලභතාවය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරවුයෙමි. සිගරට් අළෙවි සැල් සමග කතිකාවතක්ද ආරම්භ කළෙමි.

බර කිරන ස්ථානවලදී දරුවාගේ බර අඩුවීමට පියාගේ සිගරට් , මද්‍යසාර භාවිතය හේතු වන අයුරු පැහැදිලි කරමින් අවබෝධය ලබා දුන්නෙමි.

**අභියෝග** :- සිගරට් විකුණන මුදලාලි සමග සාකච්ඡා කිරීමේදි ගැටළු ඇතිවීම.

**ප්‍රතිඵල** :- ළමුන් ඉදිරියේ සිගරට් භාවිතා කිරීම 30%ක් අඩුවී ඇති අතර කාන්තාවන් සූක්ෂම ලෙස දුරකතන ඇමතුම් දෙමින් කසිප්පු විකුණන සහ භාවිතා කරන නාන තොටුපලට වරින් වර පොලීසිය ගෙන්වීම.අරක්කු බෝතල් කඩා දමා ඒ අවට අපිරිසිදු කිරීම නතර වී ඇත. කාන්තාවන්ට, ළමුන්ට නාන තැනට පහසුවෙන් යාමට හැකිවීම සහ විනෝදවීමට හැකිවීම පෙර පාසැල් දරුවන් තම පියාට සිගරට් බිව්වම ගඳයි, කැත වෙනවා කියලා කියන නිසා පියවරු 5ක් ළමයි ඉදිරියේ භාවිතා කරන එක නවත්වා ඇත.එක පවුලක් සිගරට් භාවිතය අඩුකරමින් මුදල් කැටයකට එකතු කිරීමට පටන් ගැනීම.

**පසු විපරම** :- පෙර පාසැල් දරුවන් මාසයකට වරක් මුණ ගැසීම පවුල් සංවිධාන වැඩසටහන් වලදී ගෘහ පිවිසුම් වලදී සහ තුන්වන සැසියේදී මෙය සිදු කරයි.

**නිගමනය** :- මත්ද්‍රව්‍ය නිවාරණයට ඵලදායි ලෙස මැදිහත්වීම දීර්ඝ කාලින ප්‍රතිඵල ලබාදෙයි.

**Building an environment where living is possible happily and freely by minimizing the consuming and selling places of drugs/alcohol in the community.**

Author :– P.H.N.Kumudu Kumari.

**Background :-** About 30 pregnant mothers get registered in the clinic in Welmilla in Horana district, annually. There is frequent distribution of illicit alcohol from this area to the other areas. As a result, 60% of the male population has get used for alcohol consumption. Cigarette smoking is also considered normal in this area. As a result, there were frequent cases of pregnant mothers being subjected for violence, existence of nutritional problems among the children and presence of many economic problems. Objective is building a desirable environment for women and children by minimizing the consumption of drugs/alcohol.

**Methodology :-** The target population included pregnant mothers, their husbands and pre –school children and their parents. The knowledge on how the alcohol consumption and cigarette smoking of the father effects on the fetus was provided to the husbands and wives during the clinic sessions as well as parental sessions. Another activity undertaken was making the pre-school children aware of how the consumption of alcohol and smoking effects on the external appearance of the consumers and addressing their parents through the children. By discussing about the problems faced by the women in the community, they were motivated to reduce the frequency of consumption of drugs/alcohol in their community. A discussion series was also started along with the participation of the shops which sell cigarettes. At the weighing posts, the effect on the consumption of alcohol and cigarettes by the father on the low weight of the children was explained and made them aware on that regards.

**Challenges :-** Problems arosed when discussing with the cigarette seller.

**Results :-** Smoking cigarettes in front of children has reduced by 30 %.The women have used to give telephone calls secretly to the police informing about the places of selling illicit alcohol including the bathing areas, allowing them present on time. Environmental pollution by breaking the used arrack bottles has been largely reduced. Women and children have got the freedom of going to the bathing areas without any risk.5 fathers of pre-school children have quitted smoking cigarettes in front of the children after they were told by their children that due to smoking, they become ugly and are smelly. One family has reduced the consumption of cigarettes and started to collect that money into a till.

**Follow up :-** Meeting the pre-school children once a month .This was done during the family planning programs, home visits and during the 3 rd session.

**Conclusion :-** Fruitful intervention for quitting the consumption of drugs/alcohol provides with long -term benefits.

PP

09

අ

**සිගරට් / මද්‍යසාර භාවිතා කරන පුද්ගලයන්ට එම හැසිරීම් පහසුවෙන් කරගෙන යාමට නොහැකි පරිසරයක් සෑදීම.**

කතෘ :- එච්. ඩී. කරුණාසේන හෙට්ටිආරච්චි

**පසුබිම** :- හොරණ කුඹුක දකුණ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනි කොට්ඨාශය තරමක අර්ධනාගරික ස්වරූපයක් ගනී. කෘෂිකර්මාන්තය, ගල්කොරි ආශ්‍රිත රැකියා සහ රජයේ රැකියාවල නිරත ප්‍රජාවන් මෙහි ජීවත්වේ. වැඩසටහන කුඹුක දකුණ ගර්භණී මව්වරුන්ගේ සායන තුළ ක්‍රියාත්මක කළ අතර මසකට මව්වරුන් 60ක් - 70ක් සම්බන්ධ වේ. ගර්භණී මව්වරුන්ගෙන්ගේ ස්වාමිපුරුෂයින්ගෙන් 40% ක් සිගරට්ද 45%ක් මද්‍යසාරද භාවිතා කරයි. 20%ක් සැමියාගේ මද්‍යසාර භාවිතය නිසා පීඩාවට පත්වන කාන්තාවන්ය. අඩු බර සහිත දරුවන් බිහිවීම, විවිධ අසනීප සහිත දරුවන් බිහිවීම දක්නට ලැබේ. ගර්භණී මව ඇතුළුව අවට මත්ද්‍රව්‍යවලින් තොර යහපත් පරිසරයක් ගොඩ නැගීම අරමුණවේ.

**ක්‍රමවේදය** :- මෙය මා ආරම්භ කරනුයේ යෝග්‍යතා පවුල් සහ නව විවාහපත් යුවල් ලියාපදිංචියේදිය. මසකට ලියාපදිංචි වන පවුල් 2-3කි . සිගරට් භාවිතය සහ මද්‍යසාර භාවිතය නිසා කළලයට වන හානිය පිළිබඳව සාකච්ඡාවට ගනු ලැබේ.

සායනය තුල පැවැත්වෙන සෞඛ්‍ය අධ්‍යාපන කතාවේදී, පූර්ව - ප්‍රසව සැසි වලදීද සාකච්ඡා කරයි. සහභාගී වන දෙමාපියන් 200කට දරුවා වෙනුවෙන් සකස් වුනු නිර්මාණාත්මක පොත් පිංචක් ලබා දුන්නෙමි. බර කරන ස්ථානවලදීද සාකච්ඡා කළෙමි.

ගර්භණී මව මෙන්ම ප්‍රජාවද මෙයට දායක කර ගත යුතු හෙයින් යොවුන් වයසේ දරුවන් උදෙසා අඛන්ඩ වැඩමුළු කිහිපයක් පැවැත්වීමි. එහිදී මාධ්‍ය හරහා තරුණ ළමුන් ඉලක්ක කරන ආකාරය සාකච්ඡා කළෙමි. එමෙන්ම සෞඛ්‍ය ප්‍රවර්ධන ගම්මානයකට මෙම වැඩසටහන අදාල කරගත් අතර පවුල් 25ක් සමඟ දිගටම මේ සම්බන්ධ සාකච්ඡා ගනිමින් යන කාර්ය දියත් කළෙමි. පෙර පාසල් ළමුන් සහ දෙමාපියන් සමග ද මෙම වැඩසටහන ආරම්භ කළෙමි.

**අභියෝග** :- "රජයට කම්පැනි වහලා දැම්ම නම් ඉවරනේ . තහනම් කලා නම් ඉවරයිනේ." යනුවෙන් විවිධ අය ප්‍රකාශ කළහ

**පසුවිපරම** :- ප්‍රජා පිවිසීම්වලදී මෙන්ම ප්‍රජාව එක්රැස්වන සෑම සමිති සමාගමකදී ම අවධානය යොමු කිරිම.

**ප්‍රතිඵල** :- වයස අවු. 20- 35 අතර පිරිමි පුද්ගලයින් 4 දෙනෙකු වෙනදා මෙන් නොව හොරෙන් සිගරට් භාවිතා කරනු දුටුවෙමි. අරක්කු භාවිතා කරන අයද භාවිතා කර උජාරුවට කියවන එක අඩු කළ පුද්ගලයන් 3 දෙනකු ඇත. අරක්කු භාවිතා කළද වෙනදා මෙන් ප්‍රචණ්ඩකාරී හැසිරීම් සහ බොරු රගපෑම් නොකරන පුද්ගලයින් දෙදෙනකු දක්නට ලැබේ.

**නිගමනය** :- සිගරට් භාවිතය , අරක්කු භාවිතය නැවැත්වීම සඳහා ප්‍රජාව බලකරණය කිරීම සැලසුම් ගත ලෙස සිදුකිරීම සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි බවයි.

**Creating an environment where the individuals who smoke/ consume alcohol cannot carry out those behaviours comfortably**

Author :- H.D. Karunasena Hettiarachchi

**Background :-** Horana, Kubumka South mid wife division is somewhat semi-urban area. Communities which engage in agriculture, jobs associated with quarries and government employments live there. The activity was implemented in the Kubumka South antenatal clinic in which 60-70 mothers participate per month. 40% and 45% of the husbands of the pregnant mothers smoke and consume alcohol respectively. 20% of the women are burdened by husband's alcohol consumption. Births of babies with low birth weight and babies with various diseases are seen. Objective is building a better environment without narcotics around the pregnant mother.

**Methodology :-** Programe was started with registration of the eligible couples and newly wedded couples. 2-3 families registered per month. The harm caused by smoking and consuming alcohol to the embryo is discussed. It is discussed in the health education talks in the clinics and antenatal sessions as well. A creative booklet for the child was distributed among 200 parents who participated. I conducted discussions at the weighing posts as well. I conducted continuous workshops for the adolescents, as the community also has to take part along with the pregnant mothers. There I discussed how the youth is targeted in the media. This programme was included the theme towards a health promoted village. Continuous discussions on this matter were held with 25 families. The same programme was started with pre-school children and their parents.

**Challenges :-** Different people argued that if the company was closed or banned the problems would be over.

**Results :-** Identified 4 individuals who are 20-35 years smoke in clandestine unlike other days. 3 people limited consuming arrack and boasting after consuming arrack. 2 people stopped acting violently and doing fabricated acts after consuming arrack unlike other days.

**Follow up :-** Focusing the attention in home visits and every meeting where the community gathers.

**Conclusion :-** Successful results can be achieved by empowering the community to stop smoking and alcohol consumption according to a plan.

PP

10

අ

## ඌරුබොක්ක මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශය තුල දුම්වැටි නිවාරණ වැඩසටහන

කතෘ :- එච්.කේ. සමීර ගුණසේන

**පසුබිම** :- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතේ බලයලත් නිළධාරියෙකු ලෙස දුම්වැටි හා මද්‍යසාර භාවිතය අවම කිරීමේ අවශ්‍යතාවය නිරන්තරයෙන් පැන නගින්නට විය. 2016 වර්ෂය අවසන් වනවිට ඌරුබොක්ක මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ 26% ක් පවතින දුම්වැටි අළෙවි නොකරන වෙළඳසැල් ප්‍රමාණය 75% දක්වා වාර්ධනය කිරීම.

**ක්‍රමවේදය** :- ක්ෂෙත්‍රයේ වෙළඳසැල් 154 සඳහා සමීක්ෂණයක් සිදු කළ අතර දැනට දුම්වැටි අලෙවි කරන වෙළඳ සැල් ගනන හා දිනකට අලෙවි කරන දුම්වැටි ගණන (13000ක් පමණ) සොයා ගන්නා ලදී. එම තොරතුරු ප්‍රදේශයේ වෙළඳ සංගම් දෙකෙහි නිළධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන ඉලක්ක කණ්ඩායම ලෙස වෙළඳසැල් හිමියන්ද, තවද පාසල් ළමුන්, ඇබ්බැහි වූවන්, මව්වරුන් හා අනෙකුත් ප්‍රජාව තෝරා ගන්නා ලදී. මුල් අදියරේදී සියළු වෙළඳසැල් දැනුවත් කර ඔවුන්ගේ සහය පතන ලදී. වෙළඳ සංසදය සමග එක්ව පස්ගොඩ නගරයේ සිට බෙරලපනාතර දක්වා 20Km පමණ දුරකට වාහන 50කට ආසන්න ගනනක් සහභාගීත්වයෙන් දුම්වැටි විරෝධී රථවාහන පෙළපාලියක් 2016.10.26 දින පවත්වන ලදි. මේ සඳහා තාක්ෂණික සහය ADIC ආයතනය සපයන ලද අතර 2016.11.27 දින දහම් පාසල් සිසුන් සහභාගීත්වයෙන් දුම්වැටි විරෝධී පා ගමනක් පවත්වන ලදී. වෙළඳසැල් සදහා දැනුවත් කිරීමේ පත්‍රිකා, ස්ටිකර් ආදිය ලබාදී ප්‍රදේශයේ දැනුවත් කිරීමේ පෝස්ටර් හා විශාල ප්‍රමාණයේ පුවරු 5 ක්ද ස්ථාපනය කරන ලදී. තවද වෙළඳසැල් තුල දුම්වැටියෙන් ඉවත්වීම දිරිගැන්වීම සදහා විශේෂ ස්ටිකරයක් අලවන ලදී.

**අභියෝග** :- දුම්වැටි සමාගම් වලින් ප්‍රචාරය කරන ලද සෘණාත්මක ආකල්ප, වෙළඳසැල් හිමියන්ට දිරිගැන්වීම්, සමාගම දේශපාලන අධිකාරිය හමුවීම හා විවිධ බාධාකාරී පුද්ගලයින්ගෙන් එල්ල වූ බාධා මෙන්ම මූල්‍යම අගහිගකම්, ප්‍රවාහන අපහසුතා, රාජකාරීමය අධික කාර්යයබහුලත්වය ආදී බාධාවන් මධ්‍යයේ ආගමික නායකයින්, ප්‍රජා නායකයින්, දේශපාලන අධිකාරියේද සුහදත්වය පවත්වා ගනිමින් සාර්ථකව වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙහිදී සියළුම දෙනාගේ විශ්වාසය දිනා ගැනීම මාගේ කාර්යය කිරීමට රුකුලක් විය.

**ප්‍රතිඵල** :- වෙළඳසැල් 98% ක් දුම්වැටි අලවියෙන් ඉවත්වී ඇති අතර, දුම්වැටි සමාගම නැවත සිගරට් විකිණීමට කොතෙක් උත්සාහ කලද ඔවුන් අසාර්ථක වී ඇත. වැඩ බලන කැකුන්දෙනිය ක්ෂෙත්‍රයේ 90% ක්ද අනෙකුත් ක්ෂෙත්‍ර 4 ක් තුළද දුම්වැටි අලවිය අවම වී ඇත.

**පසුවිපරම** :- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී අධීක්ෂණය යටතේ අපගේ නිරන්තර පසුවිපරම් කිරීම්, වෙළඳ සංසදයට වගකීම් පැවරීම, ප්‍රජාව තුලින් තොරතුරු ගලා ඒම සිදුවීම හා වෙළඳසැල්, පාසල් හා ප්‍රජාව නිරන්තර දැනුවත් කිරීම සිදුකෙරේ.

**නිගමනය** :- ප්‍රජාව සමග සුහදව විශ්වාසනීයව ඔවුන් තුලින්ම ගැටළුව හදුනාගෙන ඔවුන් සමගම විසදුම සෙවීමේදී හා ක්‍රියාත්මක කිරීමේදි මනාව ගැටළුව පහසුවෙන් විසදාගත හැක.

**Drug prevention program in Urubokka PHI area.**

Author :- H.K.Sameera Gunasena.

**Background :-** As an authorized officer of the National Act on Tobacco and Alcohol, there was a continuous need of a drug prevention program in our area. At the end of the year 2016 the percentage of cigarettes selling shops have increased from 26% up to 75%.

**Methodology :-** survey was done for the 154 shops in the area. We collected the data of cigarettes selling shops and the number of cigarettes being sold per day (about 13000 cigarettes). We presented the details we collected from the shops to the officers of the 2 trade unions in the area. As the main targeted groups we select was the shop owners, school children, drug abusers, mothers and the community. At the initial step we conducted a awareness program to all the shop owners and requested their support. With the help of the two trade unions we were able to organize a vehicle parade by using around 50 vehicles. We started at Pasgoda town and travelled about 20km to Beralapanathara on 26th of October, 2016. ADIC institute provided the technical support to the walk. On the 27th of November, 2016 we were able to conduct a walk with the students of the Dhamma schools. They distributed the leaflets and stickers to aware the community. Posters and banners were used to display the messages. They tried to paste stickers inside the shops to discourage the use of cigarettes.

**Challenges :-** There were so many challenges such as promotion strategies of the tobacco companies, encouraging the shop owners, meeting of the officials and politicians, financial difficulties, transport problems and lack of time. But we could able to conduct the program successfully with the help of religious leaders, community leaders and politicians.

**Results :-** 90% of shops have stopped selling cigarettes even with the promotion strategies of tobacco companies. Selling of cigarettes has reduced about 90% in Kekundeniya area and in other 4 areas.

**Follow up :-** With help of the MOH we observed the areas. Some responsibilities were handed over to the trade unions. Awareness programs will be organized continuously.

**Conclusion :-** We can identify the problems within the community by working as a team with them.

PP

11

த

## உடல் நலம் பற்றிய 80% சுகாதார எச்சரிக்கை படம் இல்லாமல் புகைத்தல் பொருட்களை விற்பனை செய்தலை தடுத்தல் உட்பட புகையிலை மற்றும் மதுபானம் அற்ற சிறந்த ஆரோக்கியமான சுற்றாடலை உருவாக்குதல்.

எழுத்தாளர் :- மரியதாஸ் ராஜமேனகன்

**நோக்கம் :-** தனியாகவோ அல்லது சிறுதுண்டுகளாக புகைத்தல் பொருட்களை விற்பனை செய்வதை தடுப்பதன் மூலம் சிறுவர்களை மற்றும் பெரியவர்களுக்கு இலகுவாக கிடைப்பதை தடுத்தல். இவ் ஒழுங்கு விதியின் நோக்கம் பாவனையாளருக்கு உடல் நலம் பற்றிய 80% சுகாதார எச்சரிக்கை கிடைக்க வேண்டும் என்பதே தனியாகவோ அல்லது துண்டுகளாக விற்பனை செய்வதால் பாவனையாளருக்கு இவ் எச்சரிக்கை கிடைக்காது

**செயற்பாடு :-** சனத்தொகை 8851 உள்ளடக்கிய பொது சுகாதார பரிசோதகர் பிரிவு தெல்லிப்பழையில் ஆரம்பிக்கப்பட்டு பின்னர் சனத்தொகை 38000 உள்ளடக்கிய சுாகாதார வைத்திய அதிகாரி பணிமனை பிரிவு முழுவதும் நடைமுறப்படுத்தப்பட்டது. புகையிலை பொதியோ அல்லது சிகரட் பொதியை வேண்டி பயன்படுத்தவேண்டிய சூழ்நிலை உருவாக்குவதனால் விற்பனையார்கள் அதிக முதலீடு செய்ய வேண்டும்,பாவனையாளர்கள் வீட்டுக்கு கொண்டு சென்று பயன்படுத்தல் வேண்டும். எனவே மாணவர்கள் மற்றும் பொது மக்களுக்கு கடந்த 05 வருடமாக கடுமையாக விழிப்புணர்வு ஏற்படுத்தப் பட்டுள்ளமையால் பாவனையாளரால் அல்லது பாவிக்க முனைவர்களால் களஞ்சியபடுத்த முடியாத நிலை அல்லது பயன்படுத்த முடியாத சூழ்நிலையால் இவ் பழக்கத்தில் இருந்து குறுகியகாலத்தில் விடுபடுவர், வீடுகள் மற்றும் பொது இடங்களில் புகையிலை மற்றும் மதுபானம் அற்ற சுற்றாடல் என பிரகடனப்படுத்தி முன் மதில்களில் ஒட்டி உள்ளார்கள். பொது இடங்களில் அல்லது வெளி இடங்களில் பயன்படுத்த முடியாது ஏன் எனில் சட்ட நடவடிக்கை தயவு இன்றி எடுக்கப்படும் என்பது மக்கள் நன்கு அறிவர். உடல் நலம் பற்றிய 80% சுகாதார எச்சரிக்கை படம் இல்லாமல் புகைத்தல் பொருட்களை விற்பனை செய்த விற்பனையாளர்களுக்கு சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றமை குறிப்பிடத்தக்கது.

**சவால்கள் :-** ஆரம்பத்தில் மக்கள் ஆதரவு தரவில்லை உயர் மட்ட அதிகாரிகள் அடைய முடியாத இலக்கு எமக்கு உளநோய் என்றார்கள் அரசியல் தலையீடு சகோதர உத்திேயார்கள் ஏனைய திணைக்கள மற்றும் பாதுகாப்பு அமைச்சு உத்தியேகத்தர்கள் தலையீடு புகையிலை கம்பனியின் ஆழமான ஊடுருவல் விற்பனையாளருக்கான சகல சட்ட உதவிகள் மனவலிமையை வழங்குதல் எமக்கு சலுகை வழங்க முன்வருதல்.

**பின்தொடரல் :-** எம்முடன் மக்கள், கடை உரிமையாளர்கள் பலர் ,சமூக தலைவர்கள் ஆர்வலர்கள்,கிராம உத்தியோகத்தர்கள் என பலரும் இணைந்து செயற்படுகின்றனர் மற்றும் போதிய தகவல்களும் வழங்கி வருகின்றனர்.

**மாற்றம் :-** 98% வீதமான விற்பனையாளர்கள் நிறுத்தி உள்ளனர் மேலும் புகைப்பிடிப்பதை அதிக எண்ணிக்கையானவர்கள் நிறுத்தி உள்ளனர்.

**முடிவுரை :-** சிகரட் நிறுவனத்தின் வியாபார தந்ரோபாயங்களை தகரத்தெறிவதற்கு கடை உரிமையாளர்களை சிகரட் விற்பனையிலிருந்து விடுதலையாக்குவதும் சிறந்ததொரு முறைாகும்.

**Creating a good healthy environment free of tobacco and alcohol, including prohibiting the sale of tobacco products without the 80% warning picture regarding physical health hazards**

Author :- Mariyadhas Rajamenagan

**Background :-** The main aim of the project was to shut down the easy access for tobacco for children and adults, by prohibiting the sale of single or small junks of tobacco products. The aim of this regulation is to make the consumers receive the 80% warning of physical health hazards. This warning will not reach the consumers if it is sold singularly or in small junks.

**Methodology :-** The implementation was started in the Theellipalai Public Health Inspector area containing a population of 8851 and expanded fully to the Medical Officer of Health area containing a population of 38000. By creating a situation where tobacco or cigarettes should be bought in packs in order to use them; the sellers have to invest more and the consumers have to use these products by taking them home. Since the students and the public have been made aware for the last five years, consumers or new beginners face the situation where they cannot store or use these products and hence will refrain from this habit in a short period. Houses and public places have put up on the front walls, declaring themselves as tobacco and alcohol free environment. People know well that they cannot smoke in public places or outside as they will be charged by the law without any mercy. It is worthwhile to note that legal steps are being taken against the businessmen who sold tobacco products without the 80% warning picture regarding physical health hazards.

**Challenges :-** People did not provide their support at the beginning. High ranking officials told that these are unachievable targets and that we are having psychiatric disorders. Political involvement. Involvement of fellow officials, other departments and defense ministry officials. Deep involvement of tobacco companies, providing all legal support and mental strength to the sellers, and trying to bribe us.

**Follow up :-** Several parties including the public, several shop owners, community leaders, volunteers, Grama sevaka etc. have joined and are working with us. They are providing adequate information.

**Results :-** 98% of the sellers have stopped, and a large number of smokers also have stopped smoking.

**Conclusion :-** Encouraging shop owners to stop selling tobacco in their shops is an effective method to counterforce the tobacco industry strategies in tobacco promotion and selling.

PP

12

த

## யுத்தத்தினால் பாதிக்கப்பட்ட பிரதேசங்களில் அதிகரித்த புகைப்பொருள் பாவனை கட்டுப்படுத்தப்பட்ட முறை.

எழுத்தாளர் :- ஆறுமுகம் கோடீஸ்வரர்

**பின்னணி :-** உண்மையிலேயே மூன்று தசாப்த காலமாக எமது நாட்டிலே ஏற்பட்ட யுத்த சூழ்நிலையானது மக்கள் மத்தியில் ஒரு கசப்பான உணர்வை ஏற்படுத்தியுள்ளது. இந்த காலகட்டத்தில் புகைப்பொருள் பாவனையினால் ஏற்படக்கூடிய விளைவுகள், அதன் பின்னனி தொடர்பில் மக்கள் போதுமான அளவு அறிந்திருக்கவில்லை. 2009ம் ஆண்டின் பின்னர் மக்களின் இயல்பு வாழ்கை மீண்டும் திரும்ப ஆரம்பித்தது. இந்த அமைதிச் சூழலை பல்தேசியக் கம்பனிகளும் குறிப்பாக புகையிலைக் கம்பனியானது தனக்கு சாதகமாக பயன்படுத்திக் கொண்டது. இலங்கையில் புகையிலைக் கம்பனிகளினால் சமூகத்திற்கு எந்தவித அனுசரனையும் வழங்கமுடியாது என்ற சட்டம் இருந்தும் கூட கிளிநொச்சி, மாங்குளம் பகுதியில் பொலிஸ் நிலையம் அமைக்க அரசாங்கத்திற்கு நிதி உதவி வழங்கினர். கடை உரிமையாளர்களுக்கு கடன் உதவிகள் வழங்கி, கடைகளை மேம்படுத்த உதவிகள் செய்து 2010, 2011ம் ஆண்டில் தந்திரோபாயமான முறையில் தமது வியாபாரத்தை ஆரம்பித்தனர். இதனால் 2010 மற்றும் 2011ம் ஆண்டு காலப்பகுதியில் இலங்கையில் அதிகமாக புகைப்பிடிப்போரின் எண்ணிக்கை நாட்டின் ஏனைய பகுதிகளைக் காட்டிலும் வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் அதிகரித்தது. மக்களை புகைப்பொருள் பாவனையில் இருந்து விடுபட வைப்பதும், கம்பனிகளின் தந்திரோபாயங்களை தகர்தெறிவதுமே எமது நோக்கமாக இருந்தது.

**செயற்பாடு :-** பொது சுகாதார பரிசோதகர்கள், பிரதேச செயலக உத்தியோகத்தர்கள் மற்றும் இளைஞர் குழுக்களையும் உருவாக்கி அவர்களுக்கு துரைசார் அறிவினைப் பெற்றுக்கொடுப்பதற்காக பயிற்சிகள் வழங்கப்பட்டடு சமூகமட்டத்திலான நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டன.மக்கள் மத்தியில் இதன் பாதிப்புகள் தொடர்பில் அறிவை மேம்படுத்தவும் மூடநம்பிக்கையை கலைப்பதற்காகவும் விழிப்புணர்வு செற்பாடுகள், விஷேட பிரச்சார நடவடிக்கைகள் மேற்கொண்டதோடு ஊடகங்களையும் பயன்படுத்தினோம். அதேநேரம் உத்தியோகத்தர்கள் மற்றும் மக்களுக்கு சட்டம் தொடர்பிலும் அறிவூட்டல் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டன.

**பெறுபேறுகள் :-** யாழ்ப்பாண மாவட்டத்தில் மட்டும் 2011ம் ஆண்டு தொடக்கம் இன்று வரை 600 கடைகளில் புகைப்பொருள் விறபனையை தவிர்த்துள்ள்மை பிராந்திய சுகாதார திணைக்களத்தின் ஊடாக அறியக்கூடியதாக உள்ளது. மதுபானம் மற்றும் போதைப்பொருள் தகவல் நிலையத்தின் ஆய்வின்படி 2011ம் ஆண்டைக் காட்டிலும் 2014ம் ஆண்டு யாழ்ப்பாண மாவட்டத்தில் சிகரட் பாவனையானது 2மூ வீதவீழ்ச்சியைக் கண்டுள்ளது. அதே நேரம் வடக்கு மற்றும் கிழக்கு மாகாணத்தில் திறமையான வளவாளர்கள் உருவாகியிருப்பதோடு அவர்கள் பயன்மிக்க புகைப்பொருள் தடுப்பு செயற்திட்டங்களையும் திட்டமிட்டு செயற்படுத்தி வருகின்றனர் புகையிலைக் கம்பனிகளினால் பாவனையை மேம்படுத்த மேற்கொள்ளப்படும் தந்திரோபாயங்களை தகர்தெறிய இதனை பயன்தகு அணுகு முறையாகக்கொள்ளலாம்.

**முடிவுரை :-** சிகரட் நிறுவனங்களின் நுட்பங்களை அறிந்து கொள்வதற்கும், அவற்றை தகர்த்தெறிவதற்கும் நாம் மேற்கொண்ட செயற்பாடுகள் சிறந்தவொரு வழிகாட்டியாக அமையும்.

PP

12

A

## The method used to control the increased tobacco use in regions affected by the war

Author :- Aarumugam Kodeshwarar

**Background :-** The war which lasted for three decades in our country has actually made a bitter impression among the people. During this time, people did not know enough regarding the effects caused by tobacco use and its background. Normal regular life of people started to reappear after the year 2009. Many multinational companies, especially the tobacco company, used this conflict-free situation for their advantage. Although there is a law in Sri Lanka that tobacco companies cannot sponsor anything for the society, yet they financially helped the government to build the police stations of Kilinochchi and Maankulam. They trickily expanded their business in the year 2010 and 2011 by providing financial loan facilities to shop owners to develop their shops. Thus during the time of year 2010 and 2011 the number of smokers in North and East increased relatively more than the rest of the country. Our aims were to rescue the people from tobacco use and to demolish the tricky ideas of the tobacco companies.

**Methodology :-** Community level activities were initiated by training the Public Health Inspectors, divisional secretariat officers, and forming youth clubs in order to provide them knowledge related to the field. We used awareness programs and special campaigning activities to improve the knowledge among public regarding the effects of tobacco use and to clear the myths. We used the media too. In the meantime, activities were proceeded to educate the officers and the public regarding the law.

**Results :-** We were able to get to know via the regional health department that since 2011 until now 600 shops have stopped selling tobacco products in Jaffna district alone. According to the research results of Alcohol and Drug Information Centre, there has been a 2% reduction in number of smokers in Jaffna district in the year 2014 compared to the year 2011. In the meantime, in Northern and Eastern provinces, talented resource persons have been produced and they are planning and conducting useful tobacco prevention activities.

**Conclusion :-** This can be considered as an useful approach to destroy the tricky ideas of the tobacco companies to improve their business.

PP

13

අ

**දුම්වැටි හා මද්‍යසාර භාවිතය අවම කිරීමට මත්ද්‍රව්‍ය ප්‍රචලිත ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද සමීක්ෂණය.**

කතෘ :- ටී.එම්. නවරත්න මැණිකේ, වරුණ සමරදිවාකර, අසංක බක්මීවැව, නෙරංජන් පටබැඳි

**පසුබිම** :- කුරුණෑගල දිස්ත්‍රික්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 න් ද ග්‍රාම නිළධාරී වසම් 1610 කින් ද පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක් ද ග්‍රාම නිලධාරී වසම් 548 ක් ද වේ. වයඹ පළාතේ මත්ද්‍රව්‍ය භාවිතය හා එහි ප්‍රවණතාවය පිළිබඳව කාලීන ඇස්තමේන්තුවක් සකස් වී නොමැති නිසා කාලීන දත්ත ඇතුළත් ඇස්තමේන්තුවක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මත්ද්‍රව්‍ය ප්‍රචලිත ප්‍රදේශ හදුනාගැනීමත් මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් බහුල ප්‍රදේශ හඳුනාගෙන මත්ද්‍රව්‍ය ප්‍රචලිතවීම වළක්වාලීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා අදාල පාර්ශව වෙත ලබාදීමටත් අපේක්ෂිතය.

**ක්‍රමවේදය** :- කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි මත්ද්‍රව්‍ය නිවාරණ දිස්ත්‍රික්ක කමිටු පිහිටුවීමෙන් පසු දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු ප්‍රාදේශීයව සිදු කිරීමට මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි වැඩි ප්‍රවණතාවයක් දක්වන ප්‍රාදේශීය මට්ටමින් හදුනාගත් තොරතුරු වයඹ පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයයෙන් විමසන ලදී.

අදාල දිස්ත්‍රික්ක දෙකේ මත්ද්‍රව්‍ය භාවිතය හා ප්‍රවණතාවය පිළිබඳව සමීක්ෂණයක් සිදුකරන මෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය වෙත පළාත් කමිටුව විසින් පවරන ලදී. මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය විසින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් තොරතුරු ලබාගැනීමට ප්‍රශ්නාවලියක් සකස් කර දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් සමීක්ෂණය පිළිබඳව දැනුවත් කරන ලදී. අනතුරුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක ග්‍රාම නිලධාරී වසම් 2158 ක ප්‍රශ්නාවලිය වසම භාර ග්‍රාම නිලධාරී සමෘද්ධි නිලධාරී සහ වසම භාර පොලිස් නිලධාරී විසින් සම්පූර්ණ කර දත්ත විශ්ලේෂණය සඳහා වයඹ මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය වෙත භාරදෙන ලදී.

**අභියෝග** :- නියමිත දිනට සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලිය නොලැබීම. සමහර වසම්වලින් ලැබුණ දත්ත පිළිබඳ විශ්වාසනීයත්වයක් නොමැති වීම. දත්ත විශ්ලේෂණයට තාක්ෂණික සහයෝගය ප්‍රමාණවත් නොවීම. මේ සම්බන්ධයෙන් අදාළ මාණ්ඩලික නිලධාරීන්ගේ අවශ්‍ය සහයෝගය නොලැබීම.

**ප්‍රතිඵල** :- කුරුණෑගල දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් 257,935 ක්ද පුත්තලම දිස්ත්‍රික්කයේ 111,699 ක් හඳුනාගැනීම. මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරුවූවන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 114,038 ක් ද පුත්තලම දිස්ත්‍රික්කයෙන් 38,429 ක් ද හඳුනාගැනීම.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය භාවිතයේ වැඩි ප්‍රවණතාවයක් පන්නල කොට්ඨාශයෙන් ද පුත්තලම දංකොටුව ප්‍රදේශයෙන් ද හඳුනාගැනීම. අවුරුදු 40 - 50 වයස් කාණ්ඩය, පහළ මට්ටමේ අධ්‍යාපනයක් ලැබූවන්, කම්කරු වෘත්තිකයන් මත්ද්‍රව්‍ය භාවිතයට වැඩි නැඹුරුවක් දක්වන බව හඳුනාගැනීම. මෙම පිරිසට විශේෂ අවධානයක් යොමුකරමින් වැඩසටහන් සැලසුම් කිරීම.

**පසු විපරම** :- පළාත් කමිටුව හා දිස්ත්‍රික්ක කමිටුවල සාකච්ඡා කිරීම.

**නිගමනය** :- සමීක්ෂණ දත්ත පදනම් කරගනිමින් මත්ද්‍රව්‍ය භාවිතයට වැඩි නැඹුරුවක් ඇති ප්‍රදේශ හා පුද්ගලයන් ඉලක්ක කරගනිමින් වැඩසටහන් සැලසුම් කිරීම ප්‍රතිඵලදායකවේ.

PP

13

A

**A survey to identify the common areas of substance use to minimize the use of drugs and alcohol.**

Author :- T.A Nawarathna Menike, Waruna Samaradiwakara,
Asanka Bakmeewewa, Neranjan Patabendi

**Background :-** There are 30 Secretariat Divisions, 1610 Grama Niladhari Divisions in Kurunegala district and 16 Secretariat Divisions, 548 Grama Niladhari Divisions in Puttalam District. Due to the lack of a realistic estimate of the use of drugs and its transparency in the North Western Province, there was a need to formulate an estimate of timely data. The expected aims of the survey were to identify drug addictions, abuser areas in Divisional Secretarial level and provide the preventive measures to the relevant authorities.

**Methodology :-** As drug prevention became a major provisional topic in national level, drug prevention district committees were established. Details about the common drug abuser areas which have identified by above committees were presented to the drug prevention committee of North Western province. In addition, information on the prevailing situation in the area was discussed within the drug prevention unit of North Western Province .The provincial committee was tasked with the Drug Prevention Unit to carry out a survey on the use of drugs in the two districts. The drug Preventive Unit formulated a request for information on the level of Grama Niladari Divisions with the help of questionnaires. District Secretaries, Provincial secretaries and administrative officers were informed about the survey. Finally the questionnaires of 2158 of Grama niladari divisions under 46 provisional secretariat level were handed over to the drug prevention Unit of North Western Province by Grama niladhari, samurdhi and police officers of the particular area. Finally the collected data were analyzed by the committee.

**Challenges :-** Data collection could not have be done on the due date. Lack of credibility in some areas Technical support was not sufficient for data analysis. Support from the relevant staff officers were not adequate

**Results :-** 257935 drug users in the Kurunegala district and 111699 drug users in the Puttalam district were identified.114038 of drug addictors in Kurunegala district and 38429 of drug adductors in Puttalam district were identified. The highest proportion of drug users in Kurunegala district was identified in Pannala area and Dankotuwa area in Puttalm district. Most of the drug addictors were identified as people of the age group of 40-50 years, people with low levels of education and manual labors .So the methods of prevention and the further programs need special attention towards these groups.

**Follow up :-** Discussions of provincial and district committees.

**Conclusion :-** Planning programmes in the areas where high risk for drug addiction, found based on statistical data is much effective.

PP

14

අ

## උත්සව අවස්ථාවන් සඳහා අරක්කු සහ සිගරට්වලට වැඩි වටිනාකමක් ලබා නොදෙන බඳගිරිය ගම ආදර්ශමත් ගමක් ලෙස නිර්මාණය කිරීම

කතෘ :- ඒ.එච්.කේ.ඉන්දිකා සුදර්ශනි

**පසුබිම** :- බඳගිරිය ගමේ නිතර නිතර උත්සව අවස්ථාවන් ඇති අතර එම සෑම උත්සව අවස්ථාවකදීම අරක්කු සහ සිගරට් ලබාදෙයි. එම මුදල් සොයා ගන්නේ වෙනත් ආයතනයකින් ණයක් අරගෙන නැත්නම් ගිනිපොලි කරුවෙකුගෙන් මුදල් අරගෙන. ඔවුන් සතු වටිනා කනකර (රත්තරන්බඩු) උගස් කිරීමෙන්ද මුදල් සොයා ගනි. අරක්කු සහ සිගරට් උත්සවයට ලබාදීමෙන් මිනිසුන්ගේ සතුට නැතිවෙනවා, රණ්ඩු සරුවල් ඇති වෙනවා, බඩුමුට්ටු කැඩෙනවා පවුල්වල සතුට නැතිවෙනවා. උත්සව අවස්ථාවන් සඳහා අරක්කු සහ සිගරට් ලබානොදෙන පරිසරයක් නිර්මාණය කිරීම අරමුණයි.

**ක්‍රමවේදය** :- උත්සවයන් තිබෙන නිවෙස්වලට ගොස් සාමාජිකාවන් හමුවී උත්සවය සැලසුම් කර ඇති ආකාරය කතා කළා. අරක්කු හා සිගරට් ලබාදෙන උත්සවවලට ඒ සඳහා යන වියදම ගනන් හදලා පෙන්නලා දුන්නා. අරක්කු සහ සිගරට් ලබාදීමෙන් තමන්ගේ මුදල් ලක්ෂ ගනනින් වියදම් වන බවත් සතුට නැතිවෙන ආකාරය පිළිබඳවත් පැහැදිළි කළා. රණ්ඩු ඇතිවෙන එක,ගෙදර බඩුමුට්ටු කැඩෙන එක, පිළිබඳව පැහැදිළි කර දුන්නා. අපේ සතුට විනාශ කරගන්නේ ඇයි කියලා ඇහුවා.

**අභියෝග** :- පිරිමි අයගෙන් බැනුම් අහන්න සිදුවුනා. ''කරන්න පුලුවන් දෙයක්ද ඔය කරන්න හදන්නේ'' කියලා. අරක්කු දුන්නේ නැතිවුනොත් මිනිස්සු මගුල් ගෙදර එන ප්‍රමානය අඩුවෙනවා කිව්වා. සල්ලි දෙන්නේ අඩුවෙන් කිව්වා. ඔයාලා වග කියනවද ඇහුවා. එක් උත්සව අවස්ථාවකදී කාන්තාවක් ඇවිත් කිව්වා"අන්න දාහේ කෑලි පන්සීය වෙනවා, ඉක්මනට අරක්කු ගෙනත් දෙන්න" කියලා.

**ප්‍රතිඵලය** :- අරක්කු සහ සිගරට් ලබා නොදී පැවැත්වූ උත්සව ගණන 10ක් පමණ වේ.අරක්කු හා සිගරට් සමාගම්වලට යන්න තිබූ ලක්ෂ එකොළහක් පමණ මුදල් ප්‍රමාණයක් ගමට ඉතිරි කරගත හැකිවිය. උත්සවවලින් පසු අරක්කු හා සිගරට් ලබානොදීම පිළිබඳව මිනිස්සු ප්‍රශංසා කර යාම. අරක්කු සිගරට් ලබානොදී උත්සවයක් ගන්නා එකේ වාසිය ගැන ගමේ කතා කිරීම. බඳගිරිය ගමේ අරක්කු විකුණන තැන් මේවන විට නොමැත. අරක්කු සහ සිගරට් ලබානොදී උත්සව පැවැත්වීම රැල්ලක් බවට බඳගිරිය ගම පත්ව ඇත. දැන් කලින්ම කාන්තාවන් කියනවා"අපි අරක්කු දෙන්නේ නැහැ උත්සවයට"කියලා. වෙනත් ගම්වලිනුත්, අරක්කු සහ සිගරට් ලබානොදී උත්සව ගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡා කරන ලෙස ආරාධනා ලැබීම.

**පසුවිපරම්** :- උත්සව අවස්ථාව තිබෙන අවස්ථාවේදි අරක්කු සිගරට් ලබාදෙනවද කියලා පසුවිපරම් කළා. උත්සවයෙන් පසුව ඉතිරිවූ මුදල් ප්‍රමාණය ගැන හා එම මුදල් ප්‍රතිඵලදායක විදිහට යොදවාගන්නා ආකාරය අරක්කු සහ සිගරට්වලින් නිදහස් පරිසරයක උත්සවය පැවැත්වීමේ වාසිය ගැන කතා කළා.

**නිගමනය** :- පුද්ගලයන්ගේ භාවිතය අවම කර හා ප්‍රජාවේ අවබෝධය දියුණු කිරීමට අරක්කු නොමැති උත්සව අවස්ථා යොදාගත හැකි බව.

**Create a model village in the area of Bandagiriya**

Author :- A.H.K.Indika Sudarshani

**Background :-** There were many special functions and occasions in Bandagiriya area. Villagers used to give alcohol and cigarettes in almost all the occasions. They used to get loans to buy alcohol and cigarettes. Due alcohol and cigarettes villagers were unable to get the true happiness of the functions. There were many unpleasant situations and experiences as the results of alcohol use. So, our aim as to make alcohol and cigarettes free environment in Bandagiriya area.

**Methodology :-** We went to the houses, asked about the functions and the way they were planned. For the families who were going to bring alcohol and cigarettes for their occasion, we calculated and explained the amount of money that they will have to pay for the alcohol and cigarettes. We explained them the way that alcohol ruins the true happiness of a special occasion and the wasting of their hardly earned money. We requested them to stop using alcohol and cigarettes for their occasion and not to get ruined their own happiness.

**Challenges :-** There were many objections from the males. They argued with us that the things we are going to do will affect their social connections. They complained that they would lose many relations due to this. They complained that they would not get enough money as presents.

**Results :-** Villages were able to hold 10 functions successfully without alcohol and cigarettes. Villagers could save about Rs 1,100,000 from money absorbed by tobacco and liquor companies. Many villagers appreciated the achievements they had and they have started to discuss about the good outcomes. Now there are no any alcohol and cigarettes selling shops. Organizing functions without alcohol and cigarettes have become a new trend among the villagers. Now they have started to tell that they are not going to provide alcohol, cigarettes in their functions. Villagers get invitations from nearby villagers to help them to make alcohol, cigarettes free occasions in their villages.

**Follow up :-** Functions of the village were observed. We encourage them to save and to use their money in an effective way. We continued to discuss the advantages of organizing functions without alcohol and cigarettes in more detail.

**Conclusion :-** With the correct explanation to the people and with correct interventions we can encourage people to organize functions without alcohol and cigarettes.

PP

15

අ

**තරුණ පරම්පරාව මත්ද්‍රව්‍ය හා දුම්වැටි කෙරෙහි ආකර්ෂණය කරවන පරිදි විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරණය කරන දර්ශන අවම කිරීමට ක්‍රියාත්මක වීම.**

කතෘ :- බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලයෙහි මත්ද්‍රව්‍ය නිවාරණ සංගමය

**පසුබිම** :- තරුණ පිරිස දුම්වැටි මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයට හුරුකිරීම හා ආකර්ශණය කරගැනීමට විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සමාජයේ ප්‍රසිද්ධ පුද්ගලයන් හා නළු නිලියන් යොදා ගනිමින්, ටෙලි නාට්‍ය චිත්‍රපටි හා කාටූන් ආදි වැඩසටහන් මඟින් ආකර්ශණීය දර්ශන සමාජයට මුදා හරින බව නිරීක්ෂණය විය. මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතා කරන දර්ශන විකාශය කිරීම අවම කිරීමට පාසල් ළමුන් හරහා බලපෑම් කිරීම මෙහි අරමුණවේ.

**ක්‍රමවේදය** :- විවිධ මත්ද්‍රව්‍ය සමාගම් මඟින් ප්‍රචාරණය සඳහා ඉලක්ක කරගෙන මාධ්‍ය වෙත මුදාහරින ටෙලිනාට්‍ය දර්ශනවලට එරෙහිව අප සංගමයේ සාමාජිකයන්ගේ අදහස් අනුව ඉදිරිපත් වූ පෙත්සමක් නිර්මාණය කිරීමට සැලසුම් කෙරිණි. අප සංගමය භාර ගුරුභවතා සමඟ කතාකර අපේ යෝජනාව විදුහල්පතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව විදුහල්පතිතුමාගේ යෝජනා හා අදහස් අප සංගමය කැඳවා දැනුවත් කිරීමෙන්ද, ඉන්පසුව විදුහල්පතිතුමා විසින් අචාර්ය මණ්ඩලය රැස්කරවා දැනුවත් කිරීම හා ගුරුමණ්ඩලයෙන් උපකාර ගෙන සංගමයේ සමාජිකයින් විසින් ක්‍රියාපිළිවෙල සැලසුම් කෙරෙනි. එම සැලසුම් අනුව දෙමාපිය රැස්වීම් අවස්ථාවලදී දෙමාපියන් දැනුවත් කර ඔවුන්ගේ අත්සන් මේ සඳහා ලබා ගන්නා ලදී. පසුව පන්ති මට්ටමෙන් සිසු සිසුවියන් දැනුවත් කර සංගමයේ සාමාජිකයන් යොදවා අත්සන් ලබා ගැනීම හා අප විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය දැනුවත් කර අත්සන් ලබාගෙන පෙත්සම සකස් වුණි.

**අභියෝග** :- මෙම යෝජනාව විදුහල්පතිතුමා වෙතට ඉදිරිපත් කිරීමේදී එකවර අනුමැතිව ලබා නොදීම. එසේම ගුරු මණ්ඩලය මේ පිළිබඳව අවධානයෙන් නොදැක්වීම හා මෙයට අකමැති පුද්ගලයන්ගෙන් විවධ තර්ජන හා ගැටළු ඇතිවු අතර සමහර සිසුන් උනන්දුවක් නොදැක්වීම හා දෙමව්පියන්ගෙන් අකමැත්තද මෙයට බලපෑවේය.

**ප්‍රතිඵල** :- අප බලාපොරොත්තු වූ අත්සන් සංඛ්‍යාව 1000කි. නමුත් නොසිතූ ලෙස අපට අත්සන් 2000ක් ලබා ගැනීමට හැකි විය. අවසානයේදි විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලය ද, දෙමව්පියන්ගේ ද සහයෝගය නොමඳව ලැබුණි. මෙම ක්‍රියාකාරකම හේතුවෙන් පාසලේ සිසු සිසුවියන්ගේ ආකල්පවල වෙනසක් ඇති වූ අතර, මේ ගැන නිතරම කතාබහට ලක් විය. එමෙන්ම තවත් සමහර සිසුන් අළුත් ප්‍රචාරණ දර්ශන දුටුවිට ඒවා සටහන් කරගෙන අප සංගමයේ සාමාජිකයන් වෙත ලබාදෙයි. මේ ආකාරයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ සම්බන්ධයෙන් ළමුන්ගේ තිබූ අලස බව ඉවත්වී ඉතාමත් උනන්දු උද්යෝගයක් ද ඇති වී තිබේ.

**පසු විපරම** :- මෙම පෙත්සම ජනාධිපතිතුමාට සහ මාධ්‍ය ආයතනවලට දීමට බලාපොරොත්තුවක් ඇත. මේ වන විටත් විවිධ නාලිකාවල විකාශය වන වැඩසටහන් පිළිබඳව සංගමයේ සාමාජිකයින් විසින් විමසිලිමත්වීම හා අවධානයෙන් සිටීම සිදුවේ.

**නිගමනය** :- එමෙන්ම වැඩසටහන තුළින් දැනුවත් කිරීමකින් අවබෝධය ලබාදීමට නොහැකි පිරිසට පවා දැනුමක් ලබාදීමට හැකිවීම.

**Minimize the youth targeted promotion of alcohol and cigarettes through electronic media**

Author :- Drug prevention committee, Bomiriya Central College.

**Background :-** Alcohol and tobacco companies try to target mainly the young generation by their promotions. So they try to use various promotion strategies to attract, such as using famous actors, tele dramas and films. Via those routes they try to show more and more attractive video clips containing smoking and drinking alcohol. Our aim was to make an effect on the promotion through the school children.

**Methodology :-** According to the idea of our committee members, we decided to create a petition against the promotion strategies of alcohol and cigarettes. Then we shared our ideas with the school principle and the school teacher in charge of our committee .We were able to conduct a meeting with the whole teaching staff with the help of the principle. We planned the program with the assistance of teachers. Our aim was to explain the current situation to the parents and get the petition signed during the parents meetings. Finally we were able to educate the school children and get their participation to our program.

**Challenges :-** We were unable to get the permission from the principle at the initially. Some of the parents, teachers and students didn't like to pay their attention to the program. There were few objections from some parties.

**Results :-** Though we expected to have 1000 signs, we were able to get 2000 signs. We got the support from parents, students and parents. We were able to change the attitude of the children and they have started to discuss among themselves regarding the drug prevention. When they notice new advertisements, they try to hand over the message to our members. We were able to encourage the students to actively participate in drug prevention

**Follow up :-** The petition will be handover to the president and the media.
Observe the TV advertisements and programs by committee members.

**Conclusion :-** We were able to educate the people more effectively through this program.

PP

16

අ

## දුම්වැටි භාවිතය හා ප්‍රචාරණය අධෛර්යමත් කිරීමට කඩුවෙල නගරය කේන්ද්‍ර කරගනිමින් ආකර්ෂණීය වැඩසටහනක් අප්‍රේල් 1 වෙනිදා සිදුකිරීම.

කතෘ :- බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලයේ මත්ද්‍රව්‍ය නිවාරණ සංගමය

**පසුබිම** :- දුම්වැටි භාවිතය ප්‍රචාරණය කිරීම සඳහා දුම්වැටි සමාගම් මගින් විවිධ ආකර්ෂණීය සාධක අධෛර්යමත් කිරීමට අප සංගමය මගින් විවිධාකාරයේ දුම්වැටි නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. එවැනිම ආකර්ෂණීය ක්‍රියාකාරකමක් කඩුවෙල නගරය පාදක කරගනිමින් ක්‍රියාත්මක කරන ලදී. අපි මේ සඳහා අප්‍රේල් 1 වෙනිදා යොදා ගැනීමට හේතුව අප්‍රේල් 1 වෙනිදා යනු 'මෝඩයන්ගේ දිනය' ලෙස සලකන නිසාය. තාමත් සිගරට් බොන ඔබ කිහිපදෙනාට සුබ උපන්දිනයක් යන තේමාව යටතේ අපි මෙම වැඩසටහන සංවිධානය කළේය.

**ක්‍රමවේදය** :- ප්‍රථමයෙන් විදුහල්පතිතුමාගේ, කඩුවෙල නගර සභාවේ අනුමැතිය ඇතිව අප පළමු අදියර ලෙස තෝරාගත් කඩුවෙල නගරයේ ජනතාව අප විද්‍යාලයේ මත්ද්‍රව්‍ය නිවාරණ සංගමයේ සාමාජිකයන් හා ඇඩික් ආයතනයේ නිලධාරින්ගේ පැමිණීමෙන් වැඩසටහන ආරම්භ කරන ලදී. අප්‍රේල් 1 වෙනිදා දුම්වැටි භාවිතාකරන පුද්ගලයින්ගේ උපන්දිනය ලෙස සඳහන් කරන ලද උපන්දින සුබ පැතුම්පත් දුම්වැටි භාවිතා කරමින් සිටි පුද්ගලයින්ගේ අතට දෙන ලදී. නගරයේ සිටි සියලුම ජනතාවට හා වෙළඳසැල් හිමියන්ටද දුම්වැටි භාවිතයේ හාස්‍යට ලක්කරන අත්පත්‍රිකා ලබාදුනි. මේ වෙනුවෙන් සකස් කළ කේක් ආකෘතියක් හා පඹයෙක් නිර්මාණය කර නගරය විසිතුරුව සකසන ලදී. දුම්වැටි නිවාරණ පාඨ ඇතුලත් කර සැදු අත් පළඳනා බෙදාදීම වැනි ක්‍රියාකාරකම් මගින් ජනතාවගේ දුම්වැටි භාවිතය මෝඩ ක්‍රියාවක් බව දැනෙන්ට සැලැස්සුවෙමු.

**අභියෝග** :- මූල්‍යමය අපහසුතාවලට මුණදීමට සිදු වූ අතර විවිධ පුද්ගලයන් සමග කතා කිරීමට යාමේදී ඔවුන්ගේ දෝෂාරෝපණ ඇසීමට සිදු විය. ඇතැම්විට මිනිසුන් අප මඟහැර යන ලදී.

**ප්‍රතිඵල** :- ආරම්භයේදී අපගේ වැඩසටහන් පිළිබඳ ඍණාත්මක අදහස් ඉදිරිපත් කළ අය මෙන්ම අපට සහයෝගය දැක්වීමට මැලි වූ පුද්ගලයින් වැඩසටහන අවසානයේ යහපත් අදහස් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම වැඩසටහනේ, දුම්වැටි භාවිතා කරන පුද්ගලයින් සමග ඍජුවම අදහස් හුවමාරු කරගනිමින් ඔවුන්ගේ භාවිතය අධෛර්යමත් කිරීමට තරම් සිසුන්ගේ හැකියාව වර්ධනය වී තිබීම ඉතාමත් වටිනා ප්‍රතිඵලයක් විය. කඩුවෙල නගරයේ සිටි බොහෝමයක් ජනයා අපගේ වැඩසටහන සාර්ථක මෙන්ම ප්‍රයෝජනවත් යැයි පැවසුහ. ඒ තුළින් දරුවන්ගේ ද කුසලතාවයන් වර්ධනයක්ද දක්නට ලැබුණි. මෙම වැඩසටහන මගින් මෝඩයන්ගේ දිනය හා තවමත් දුම්වැටි භාවිතා කරන පුද්ගලයින්ගේ උපන්දිනය අතර ඇති සබඳතාව ස්ථාපිත කිරීමට හැකි විය.

**පසු විපරම** :- වෙළඳසැල් හිමියන්ට ලබාදුන් අත්පත්‍රිකා, ස්ටිකර් හා දැන්වීම් පිළිබඳ ඔවුන්ගේ අදහස් විමසා බැලීමට සෑම මසකටම වරක් යාම.

**නිගමනය** :- මෙවැනි විනෝදජනක වැඩසටහන් හරහා මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සිදු කිරීම අප වැනි සිසුන්ගේ සහභාගිත්වය වැඩිවේ.

**Conduct a program to discourage cigarettes smoking and the promotion in Kaduwela town.( April 1st )**

Author :- Bomiriya Central Collage, drug prevention committee

**Background :-** Tobacco company use variety of creative and more attractive promotion strategies. Our aim was to discourage those marketing strategies through this drug prevention program. We organized a more attractive program to target the people in Kaduwela area. We thought of selecting April 1st to our program because it is considered as the 'Day of fools". Our theme was 'HAPPY BIRTHDAY TO ALL THE SMOKERS "

**Methodology :-** As the initial step we took the permission from the principle of the school and from the Kaduwela municipal council. With the participation of the members of ADIC organization and school children we started the program. We had a collection of birthday cards including our theme, happy birthday to the all smokers. We distributed those cards to the people who were smoking in the town area. We distributed the leaflets to all the shop owners and people in the town area. We kept a cake structure and a dummy in the town to get more attraction to the program. We were able to distribute wrist bands which included drug prevention texts. From each and every step we tried to show the bad effects of the smoking.

**Challenges :-** We had financial difficulties there were some objections from some parties.

**Results :-** Those who discourage us at the beginning of the program have changed their attitude towards the program and they have given their maximum support to us. They appreciated the program at the end. Students have gained courage and the ability to talk directly to the smokers. People in the Kaduwela town area expressed their gratitude towards the committee. School children have improved their attitudes as a result of the program. Through this program we were able to consolidate the connection between smokers and the April 1st.

**Follow up :-** We continued to visit the shop owners and got their ideas regarding the leaflets, stickers and notices that we distributed to them.

**Conclusion :-** Conducting the programs in a more attractive way would increase the students' participation.

PP

17

අ

**දුම්වැටි, මත්පැන් භාවිතා කිරීම හා ඒ සඳහා වූ ප්‍රචාරණයන් අවම කරගැනීමට වත්තල නගරයේ සිදුකළ වැඩසටහන**

කතෘ :- සාන්ත ආනා බාලිකා විද්‍යාලයීය මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය

**පසුබිම** :- වත්තල නගර මධ්‍යයේ දුම්වැටි හා මත්පැන් භාවිතය හා අලෙවිය බහුලව සිදුවන අතර මේ නිසා පාසල් ළමුන් ඒයට නැඹුරුවීමට ඇති ඉඩකඩ ද වැඩිය. එම නිසා වත්තල ප්‍රධාන කාන්තා පාසලක් වශයෙන් දුම්වැටි, මත්පැන් භාවිතය හා අලෙවිය පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකිරීමට අවශ්‍ය බව වටහා ගන්නා ලදී. දුම්වැටි හා මත්පැන් අලෙවිය අඩු කර ගැනීමටත්, ඒවායින් තමාට, තම පවුලට හා සමාජයට වන හානිය පෙන්වා දීමෙන් සාමකාමී සමාජයකට අඩිතාලම දැමීමත් මෙම කර්තව්‍යයේ ප්‍රධාන අරමුණයි.

**ක්‍රමවේදය** :- මේ සඳහා අප යොදා ගත්තේ ඔක්තෝම්බර් 01 වන දිනයයි. එහි තේමාව "දුම්වැටි, මත්පැන් හා නිවස" විය. විදුහල්පතිතුමියගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් දෙවන සතියේ දී දුම්වැටි, මත්පැන් හා මත්ද්‍රව්‍ය නිවසට, සමාජයට බලපාන ආකාරය පිළිබඳ පෝස්ටර් නිර්මාණය සඳහා සිසුවියන්ව දැනුවත් කර ඒවා සැප්තැම්බර් 29 වන දින Youth Zone සාමාජිකයන්ට භාර දෙන ලෙස දන්වන ලදී. තමන් නිර්මාණය කළ නිර්මාණශීලි පෝස්ටර් නගරයේ ප්‍රදර්ශනය කළේ පාගමනකිනි. හොඳම පෝස්ටර් තුන තෝරා ත්‍යාග ලබාදුන්නෙමු. පාගමන තුළදී දුම්වැටි හා මත්පැන් භාවිතා කරන පුද්ගලයන්ට තම දියණිය, සොහොයුරිය ඒවා දකින ආකාරය ඉදිරිපත් කරන ලදී. එමෙන්ම වෙළඳ ව්‍යාපාරිකයින් සමග අත් පත්‍රිකා බෙදා දෙමින් හා අදහස් හුවමාරු කර ගනිමින් දුම්වැටි අලෙවියේ ඇති ආදීනව පිළිබඳ දැනුවත් කරන ලදී.

**අභියෝග** :- මෙම වැඩසටහන සඳහා පාසලේ ශිෂයාවන් දැනුවත් කිරීමේදි 9 හා 10 ශ්‍රේණිවල ශිෂ්‍යාවන් මෙයට දැක්වූ සහයෝගය අවම විය. එමෙන්ම වෙළඳ ප්‍රජාවගෙන් නිවැරදි තොරතුරු ලබාදීමට මැලිකමක් දැක් වූ අතර සමහරුන්ගේ දෝෂාරෝපණ ද එල්ල විය. අප ශිෂ්‍යාවන් මෙම පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමේදි අසල පාසල්වල ළමුන් විසින් අපහසුතාවයට පත් කිරීම.

**ප්‍රතිඵල** :- බොහෝමයක් ජනතාව එම පෝස්ටර් අගය කළ අතර හැකිනම් වසරක් පාසා මෙවැනි දැනුවත් කිරීම් සිදු කරන ලෙස ඉල්ලූහ. එමෙන්ම ශිෂ්‍යාවන්ගේ නිර්මාණශිලි හැකියාවන් දියුණු විය. එමගින් සිසුන් නිවැරදි හානිය සහිත නිවාරණ පණිවිඩ නිර්මාණය කිරීමටද හැකියාවන් දියුණු වි ඇත. මෙම පෝස්ටර්වල තිබූ පණිවිඩ හේතුවෙන් පාසලේ අනික් සිසුවියන් ද දුම්වැටි, මත්පැන් සම්බන්ධයෙන් ගොඩනගා ගෙන තිබූ ආකල්ප වෙනස්වූ බවක් ද ඔවුන්ගේ කතාබහෙන් අවබෝධ විය.

**පසු විපරම** :- පාගමන තුළදී වෙළඳසැල් කිහිපයකින් මාසිකව අලෙවිවන දුම්වැටි පිළිබඳව තොරතුරු දැනගත හැකිවීම.

**නිගමනය** :- පාසල තුළ කළ දැනුවත් කිරීම්වලදී දරුවන් තුළ දුම්වැටි, මත්පැන් කෙරෙහි ඇති ආකල්ප වෙනස් කිරීමට හා එයින් වන හානි පිළිබඳ නිවැරදි අවබෝධය ලබාදීමට නිර්මාණය කරන ලද පෝස්ටර්වල ඇති පණිවිඩ උපයෝගී විය.

**A program to minimize the use, promotion of cigarettes and alcohol in Wattala town**

Author :- Drug prevention committee, St Anne's girls 'school

**Background :-** There are many places to sell alcohol and cigarettes in Wattala area. As a result many people used to smoke and drink alcohol. Most importantly there is a risk of school children getting attracted to the substance use. So there was a need of an awareness program in this area. Our main aims were to reduce the availability of cigarettes and alcohol through minimizing the selling, to make the people aware about the harmful effects of substance use to the health, family and to the society.

**Methodology :-** We planned to do our program on 1st of October. The theme was "cigarette, alcohol and the home". We got the permission from the school principle and in the 2nd week we explained the effects to the students and they made the posters .We advised them to handover the posters to the Youth Zone on 29th of September. Posters were displayed during the walk organized by us. We selected the best 3 posters and gave them prizes. During our walk, we presented the way that the family members see the smokers and alcoholics. We distributed the leaflets to the shop owners and we shared our ideas with them.

**Challenges :-** Students of grade 9 and 10 were not interested about the program it was difficult to take their support. Shop owners and sellers didn't like to give the details to us. Some people expressed their objection towards the program. Students had to face some unpleasant experiences.

**Results :-** Majority of the people did appreciate the posters and they requested us to conduct a same type program in each and every year. Students have improved their creativity and the attitudes have changed. Other students in the school also started to discuss among themselves.

**Follow up :-** During the walk we were able to get the number of cigarettes in each month.

**Conclusion :-** We can use creative methods such as posters to change the attitudes of school children towards the cigarettes and alcohol.

PP

18

අ

## මත්ද්‍රව්‍යවලින් නිදහස් ළමුන්ට යහපත් පරිසරයක් නිර්මාණය කිරීම

කතෘ :- එකමුතු ළමාසමාජය, කඩුවෙල

**පසුබිම :-** අපේ ගෙදර සාමාජිකයන් 4 ක් ජීවත්වන අතර තාත්තා රාජ්‍ය ආයතනයක රියදුරෙකු ලෙස සේවය කරයි. අපේ පවුලේ මුදල් උපයන්නේ තාත්තා පමණයි. තාත්තා සිගරට්, අරක්කු භාවිතා කිරීම නිසා අපට අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය මුදල් අඩුවන සමහර අවස්ථා තිබෙනවා. තාත්තා දවසකට සිගරට් 5කටවඩා බොනවා. තාත්තාගේ සිගරට් හා අරක්කු භාවිතය නවත්ත ගන්න අම්මා කොපමණ උත්සාහ කළත් එය කරගැනීමට ඇයට නොහැකිවුණා. තාත්තා සිගරට්, අරක්කු භාවිතාකරන එක නවත්තගන්න එක තමයි මගේ අරමුණ වුණේ.

**ක්‍රමවේදය :-** ADIC ආයතනයත් එක්ක එකතුවෙලා අපි අපේ ගමේ ළමා සමාජයක් පිහිටෙව්වා. සිගරට්, අරක්කු බිව්වම ලෙඩවෙන බව අපි දැනන් හිටියා. සිගරට් බිව්වම තොල් කැතවෙනවා, හකු බහිනවා, ගඳ ගහනවා, අරක්කු බිව්වම වයසට වඩා කැත වයස පෙනුමක් ඇතිවෙනවා, බඩ ඉදිරියට නෙරා එනවා කියලා ADIC ආයතනයෙන් අපට කියාදුන්නා. අපි මේ ඉගෙන ගත්ත දේවල් අම්මටත් තාත්තටත් කිව්වා. අම්මා හොඳින් ඒවා අහන් හිටියත් තාත්තා එයට වැඩි කැමැත්තක් දැක්වූයේ නැහැ. ඒ වුනාට මමත් මල්ලිත් ඒ දේවල් නිතරම තාත්තට කිව්වා. අපට ලැබුණ ස්ටිකර් අපේ ගෙදර දොරේ ඇලෙව්වා. අපේ ත්‍රීවීල් එකෙත් ඇලෙව්වා.

**අභියෝග :-** තාත්තා මේ දේවල්වලට මුලින් කැමතිවුනේ නැහැ.

**ප්‍රතිඵල :-** තාත්තා සිගරට් බොන එක අඩුකළා. දැන් දවසටම සිගරට් 2ක් තමා බොන්නෙ. අරක්කු බොන එක නතර කළා. පාටියකට ගියත් අරක්කු නොබී ගෙදර එනවා. අපට අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය මුදල් අඩුවක් නැතිව දැන් ලැබෙනවා. පවුලේ සතුට වැඩිවුනා. අවශ්‍ය දේවලට මුදල් ඉතිරිවී තිබෙනවා.

**පසුවිපරම** :- අපි දිගින් දිගටම තාත්තට කිව්වා. තාත්තා හොඳ පැත්තට හැරෙනකොට අපි තාත්තාව අගය කරන්න ගත්තා. TV එකේ බොන අවස්ථා පෙන්නන විට 'ඔය අරක්කු බීලා කරන්නෙ බොරුවක්' කියලා ගෙදර අයත් එක්ක සංවාද ගොඩනැංවූවා.

**නිගමනය :-** උත්සාහය අත්හරින්නෙ නැතිව දිගින් දිගටම අරක්කු හා සිගරට් භාවිතය නිසා සිදුවන හානි ගැන කතා කිරීමත් ඉන් වෙනස්වන විට ඔහුව ප්‍රශංසාවට ලක්කිරීමත් ප්‍රතිඵලදායක වේ.

## Creating a healthy environment free from alcohol for children

Author :- Ekamuthu Children's Society, Kaduwela

**Background :-** There are 4 members in my family and my father works as a driver in the government sector. Father is the sole breadwinner of our family. There are instances where we do not have enough money for our educational purposes since our father smokes and consumes arrack. Father smokes more than 5 cigarettes per day. Although mother tried her best to stop father from using alcohol and cigarettes, she could not succeed. My aim was to stop my father from using alcohol and cigarettes.

**Methodology :-** We started a children's society in our village with the help of ADIC. We knew that smoking and alcohol consumption make people ill. ADIC taught us that smoking causes dark lips, gauntness, smelling and consuming arrack causes looking old for age and protrusion of tummy. We told our parents about these things we learned. Although mother listened to them eagerly father did not like it much. But me and my brother told these things repeatedly to our father. We received stickers on prevention and we pasted them on our door. We pasted them on our three wheeler as well.

**Challenges :-** Father did not like these things at the beginning.

**Results :-** Father limited smoking. Now he smokes only 2 cigarettes per day. He stopped consuming alcohol. He comes home without consuming liquor even after a party. Now we have enough money for our educational purposes. Happiness of the family increased. We have saved money for our needs.

**Follow up :-** We talked to the father again and again. We started appreciating him when he started changing towards the positive side. When we saw scenes where alcohol is consumed in the TV, I started and built up conversations with the family members telling "Consuming alcohol is a deception".

**Conclusion :-** Talking continuously about harm of smoking and alcohol without giving up and appreciating him once he started changing are effective.

PP

19

අ

## මත්ද්‍රව්‍යවලින් නිදහස් ළමුන්ට යහපත් පරිසරයක් නිර්මාණය කිරීම

කතෘ :- මුතුකැට ළමා සමාජය, කිරුළපන

**පසුබිම** :- කොළඹ දිස්ත්‍රික්කයේ තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කිරුළපන නම් වන අර්ධ නාගරිකවූ අපේ බොහොමයක් මංසංන්දිවලින් හා නිවාස 80ක් හා සිගරට් අලෙවි කරන කඩවල් 2කින් යුතුවේ. මෙහි ළමුන් සෙල්ලම් කිරීමට ගමේ තිබෙන මංසංදි යොදාගනී. නමුත් මෙම මංසංදිවල තරුණ පිරිස් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට යොදාගෙන ඇති නිසා එම ස්ථානවලට ළමුන් එවීම දෙමව්පියන්ට මහත් ගැටළුවක් පැවතින. මංසංදිවලට මුහුණලා ඇති නිවෙස්වලට දොරවල් විවෘතව තබාගැනීමට නොහැකි පරිසරයක් තිබුණි. මිනිස්සුන්ට සිගරට් අරක්කු භාවිතා කිරීම නිසාත් නිවෙස්වල රණ්ඩු ඇතිවන නිසා ළමුන්ට සවස් කාලයේ නිදහසේ ඇවිදයාමට අනාරක්ෂිත පරිසරයක් ගොඩනැගී තිබුණි. ළමුන්ට සතුටින් සිටිය හැකි මත්ද්‍රව්‍යවලින් නිදහස් පරිසරයක් නිර්මාණය කරගැනීම අරමුණ වේ.

**ක්‍රමවේදය** :- අපේ ගමේ ළමුන් 15දෙනෙකු පමණ ADIC ආයතනය සමග එකතුවී ළමා සමාජයක් පිහිටුවන ලදී. සිගරට්, අරක්කු භාවිතය නිසා සිදුවන හානි සහ දුම්කොළ හා මද්‍යසාර සමාගම් ළමුන් ඉලක්ක කර සිදුකරන උපක්‍රම පිළිබඳවත් ඔවුන් අපට පැහැදිළි කරදෙන ලදී. සිගරට් බිව්වම වෙන හානි ගැන කියැවෙන පෝස්ටර් අපි විසින්ම නිර්මාණය කරලා කඩවල් අසල සහ මන්සන්දිවල ඇලෙව්වා. මෙවැනි පණිවිඩ යොදා අත්පත්‍රිකා නිර්මාණය කර නිවෙස්වලට බෙදුවා. මෙම ක්‍රියාකාරකම් සිංහල හා දමිළ භාෂා දෙකෙන්ම සිදුකරනු ලැබුවා. මෙම ක්‍රියාකාරම් දැක ගමේ අනික් අයත් අපට සහයෝගය දක්වන්න පටන්ගත්තා. තවද සිගරට් බොන අය දුටුවම ඔවුන්ගේ නම විමසීම හා නහය වසාගැනීම යන ක්‍රියාකාරකම්ද සිදුකළා. නිවෙස්වල රණ්ඩු ඇතිවීම අඩුකරගැනීම සඳහා ක්‍රියාකාරකම් ලෙස හොදම නිවස තේරීම හා රගපාන අය සොයනවා කියා කටකතාවන් පැතිරෙව්වා. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා වැයවන වියදම පිළිබඳව පොතක් නිර්මාණය කර ගමේ අයව දැනුවත් කළා.

**අභියෝග** :- මුල් දවස්වල ඇලවූ පෝස්ටර් ඉරා කුණු බක්කිවලට දමා තිබීම. අලවන්න එපා කිව්වා.

**ප්‍රතිඵල** :- සිගරට් අලෙවිය අවමවීම. දිනකට පැකට් 8 සිට 3 දක්වා අඩුවිය. මංසංන්දි සියල්ලම සිගරට්, අරක්කු භාවිතයෙන් නිදහස්වීම. ළමයින්ට සෙල්ලම් කිරීමට අවස්ථාව ලැබීම සහ අනාරක්ෂිත බව නැතිවීම. පවුල්වල සතුට වැඩිවීම. මත්ද්‍රව්‍ය භාවිතය අඩුකළ නිසා ඒ සඳහා වැයකළ මුදල් නිවසේ අවශ්‍යතාවලට යෙදවීම. දිනපතා ගමේ තැන තැන එකතුවූ බියර් කෑන් දකින්නට නොමැතිවීම.

**පසුවිපරම** :- මාසෙකට වතාවක් ළමුන් එකතුවී නව පෝස්ටර් නිර්මාණය කර ප්‍රජාව ගැවසෙන තැන්වල ඇලෙව්වා. දෙමව්පියන් එකතුකර ඔවුන්ටද දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. ඇතිවන වෙනස්කම් මැනබැලීම. ගමේ ඇතිවූ වෙනස්කම් ගමේ අන්අයට පැවසීම.

**නිගමනය** :- බාධක ගැන නොසිතා දිගින් දිගටම ක්‍රියාකාරකම්වල නිරතවීම මගින් හා කණ්ඩායමක් ලෙස නිර්මාණශීලීව වැඩ කිරීම තුලින් ළමයින්ට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කර ගත හැක.

## Establish a addictive substances free environment for the children

Author :- Muthuketa children's' society, Kirulapone.

**Background:-**Kirulapone is a semi urbanized area which is situated in Thimbirigasyaya provincial secretariat level in Colombo district. Most of the areas near to the junctions were used by children to play. But these places were occupied by some groups of people to smoke and to use other addictive substances. So it was a big problem to the parents of the area because they were afraid of sending their children to play there. People in the houses near to the roads were unable to open their doors due to the unsuitable environment. Due to the use of substances and unsafe situation children in the area were unable to step out from the houses in the evenings. So our aim was to make safe environment, free of substances in our village.

**Methodology :-** ADIC organization and the students in our village were able to establish a children's society. They educate us regarding the harmful effects of substance and alcohol use. They explained the promotion strategies of tobacco and alcohol companies to target younger population. We made posters including the bad effects of substance use to display them within the village. We distributed the leaflets to the houses in the area. When included these messages in both Sinhala and Tamil languages. Gradually the villagers started to support us. To minimize the family problems due to alcohol us, we started a campaign to select the best house in the village. We included the cost and the amounts of money spent on substance use in to a small booklet and improved the awareness of the villagers.

**Challenges :-** At the initiation of the program some posters were destroyed by some people.

**Results :-** we were able to minimize selling of cigarettes from the 8 to 3 packets. Now all the junctions are free of alcohol and other substance users. Safety of the children has improved and they can use more area of the village to play. Family happiness and harmony have improved. Villagers were able to save more and more money. Now there are no any empty beer cans along the roads of the village.

**Follow up :-** children continued to make posters in every month and display them again and again. We try to gather more and more parents to one place and make them aware. Villagers have started to tell the results of our program other villagers as well.

**Conclusion :-** It is important to work as a team to get through the barriers successfully. Creative interventions can make a safer and suitable environment for the children.

PP

20

අ

## දුම්වැටි ,අරක්කු,බියර් පිළිබඳව ළමයින් තුළ ඇතිවිය හැකි ආකර්ෂණය අවමවීම සඳහා පෙර පාසල් ළමයින් තුළ ප්‍රතිශක්තිකරණය ඇතිකිරීම.

කතෘ :- යූ. දයාකාන්ති, තමරා නානායක්කාර, ගීතා පතිරාජ

**පසුබිම** :- දුම්කොළ හා මද්‍යසාර සමාගම් ළමයින් ඉලක්කකර විවිධ උපක්‍රමයන් සිදුකරයි. එම නිෂ්පාදනවල ලාංඡන සහිත සෙල්ලම් බඩු නිර්මාණය කිරීම, රූපවාහිය යොදාගනිමින් ළමුන් සඳහා නිර්මාණය වු කාටූන්වලට දුම්වැටි හා මද්‍යසාර දර්ශන ඇතුළත් කිරීම සිදුකරනු ලබයි. පෙර පාසල් වයසේ ළමුන් කාටූන් ඉතා ආසාවෙන් නැරඹීමට පුරුදුවී ඇති අතර මව්වරුන් ඔවුන්ගේ වැඩකටයුතු කරගැනීමේ පහසුව සඳහා ළමුන් කාටූන් බැලීමට යොමුකරවීම සිදුකරයි. මේ හේතූන් නිසා මෙම වැඩසටහන පෙර පාසලතුළ 2016 වසරේ ක්‍රියාවට නංවන ලදී. කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පහළ බෝමිරිය ග්‍රාමයේ ගෝල්ඩන් කිඩ්ස් පෙර පාසල සහ පොතු අරාව ග්‍රාමයේ සිතුමිණ පෙර පාසල යන පෙර පාසල්වල ඉගෙනුම ලබන වයස අවුරුදු 2 1/2ත් 5ත් අතර ළමුන් තුළ දුම්වැටි, අරක්කු, බියර් පිළිබඳ ආකර්ෂණය අවම කිරීම සඳහා ප්‍රතිශක්තිකරණය ඇතිවීම අපගේ අරමුණ විය.

**ක්‍රමවේදය** :- මෙම පෙර පාසල් දෙක තුළ ළමුන් 75ක් ඉගෙනුම ලබයි. මෙම ළමුන් සඳහා අධ්‍යන කටයුතු කිරීමට විවිධ ක්‍රියාකාරකම් සිදුකරයි. එම ක්‍රියාකාරකම්වලටම නිවාරණ පණිවිඩ ඇතුළත් කර ළමයින් තුළ ප්‍රතිශක්තිකරණය ඇතිකිරීම උදෙසා අපි ක්‍රියාත්මකවිය. උදා:- සිගරට් බිව්වම, අරක්කු බිව්වම මූණ කැතවෙනවා, ගඳයි, තොල් කැතවෙනවා වැනි හානි ළමුන්ට කියාදීම සඳහා, ගීත, කංකංබූරු ක්‍රීඩාව ,පින්තූර යොදාගත්තේය.

**අභියෝග** :- කුඩා ළමුන් සමග මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකරන ආකාරය පිළිබදව අවබෝධයක් සහ හැකියාවක් නොතිබීම. ඒ සදහා ADIC ආයතනයෙන් මේ සදහා තාක්ෂණික පුහුණුව ලබමින් ක්‍රියාත්මක විය. ළමුන්ගේ දෙමව්පියන්ගෙන් පැමිණි ප්‍රතිරෝධය වෙනස් කිරීම- ADIC ආයතනයෙන් නිළධාරීවරියක් ගෙන්වා දෙමව්පියන් සදහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකිරීම.

**ප්‍රතිඵල** :- සිගරට් බිව්වම, අරක්කු බිව්වම මූණ කැතවෙනවා, ගඳයි, තොල් කැතවෙනවා වැනි හානි ප්‍රකාශ කළහැකි ළමුන් සිටීම. (65/75) සිගරට් බොන අය දුටුවම ප්‍රතිචාර දක්වන ළමුන් සිටීම. (45/75) රූපවාහිය බලන කාලය අවමකළ පවුල් සංඛ්‍යාව (මව්වරු රැකියාවට නොයන පවුල් 50/60) පෙර අවුරුදුවලදී දරුවන්ගේ උපන්දින සාදවලට අරක්කු ලබාදුන් පවුල් 5/5 ක්ම අරක්කු ලබානොදී දරුවන්ගේ උපන්දින සාද පවත්වා ඇත.

**පසු විපරම** :- සතියකට දෙවතාවක් ළමුන් සමග නිවාරණ ගීත ගායනා කිරීම සහ ඉන්පසු සිගරට් බිව්වම, අරක්කු බිව්වම සිදුවෙන්නෙ මොනවද කියා ළමුන්ගෙන් ප්‍රශ්න ඇසීම, කංකංබූරු ක්‍රීඩාව කිරීම සහ රැස්වීම්වලදී දෙමව්පියන් දැනුවත් කිරීම ADIC ආයතනය සමග දිගින් දිගටම එකතුවී අවශ්‍ය උපදෙස් ලබාගැනීම.

**නිගමනය** :- දරුවන්ට දුම්වැටි, මද්‍යසාර හා බියර් භාවිතය ආකර්ෂණය නොවීමට කුඩා කාලයේ සිටම ඉන්වන හානි සහ නිශ්ඵල බව පිළිබඳව සරල ක්‍රියාකාරකම් අනුසාරයෙන් කියාදිය යුතුය. ඒ හරහා ඔවුන්ගේ ප්‍රතිශක්තිකරණය වර්ධනය කළ හැක.

**Improve the immunity against cigarettes, alcohol and beer within the preschool children through the teachers.**

Authors :- U. Dayakanthi, Thamara Nanayakkara, Geetha Pathiraja

**Background :-** Alcohol and tobacco companies target the children for their promotion. They make toys with the logos of tobacco companies. They try to include more and more video clips containing smoking and drinking alcohol to the cartoons. Children of the preschool age used to watch cartoons in most of the time. So there is a risk of attracting towards these products. So we implemented this program in 2016 within the preschools. Golden kids preschool in Bomiriya and Sithumina preschool in Pothuarawa in the Kaduwela provincial secretariat division were selected as the places to implement the program. Target group was kids aged between 2 ½ years to 5 years.

**Methodology :-** There were 75 children within these 2 institutes. We included the messages regarding drug prevention in to the activities of the preschool. For this we used picture cards, songs and some games. We tried to give the harmful effects of substance use through those activities.

**Challenges :-** We haven't had any idea about the prevention programs to the preschool age children. ADIC organization provided us the technical support and members of ADIC conducted an awareness program to the parents. So we were able to change the resistance arrived through the parents.

**Results :-** 65 out of 75 children were able to list the harmful effects of substance use. 45/75 of families were able to reduce the time spent to watch TV.65 out of 75 children were able to respond to a smoker. 5 families which were used to give alcohol for their children's birthday parties have decided to stop giving alcohol.

**Follow up :-** We went to the preschools in each 2 weeks time and we joined with them to do some activities. We asked them question about the bad outcomes of alcohol and cigarettes. We continue to gather the parents and make them aware about the current situation.

**Conclusion :-** Children must be taught about the harmful effects of substance use at the small age. It will help to improve their immunity towards the substance use.

PP

21

ඇ

**මත්ද්‍රව්‍ය පිළිබඳව ආකර්ෂණය ඇතිවීම අවමවීම සඳහා පෙර පාසල් ගුරුවරුන් හරහා පෙර පාසල් ළමුන් තුල ප්‍රතිශක්තිකරණය ඇතිකිරීම.**

කතෘ :- ඇන්ජලා පෙරේරා

**පසුබිම** :- මම පෙරපාසල් සංවර්ධන නිලධාරීවරියක් ලෙස සේවය කරමි. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල් ඒකකය මගින් බස්නාහිර පළාත තුල පෙර පාසල් අධීක්ෂණය කිරීම හා ලියාපදිංචි කිරීම සිදුකරනු ලබයි. කොළඹ කලාපයට කොට්ඨාශ හතරක් අයත්වන අතර ඉන් එක කොට්ඨාශයක් වන මැද කොළඹ මගේ සේවා කොට්ඨාශයයි. මෙම කොට්ඨාශයේ පෙර පාසල් 80ක් පමණ ඇත. මෙහි 2500ක ළමුන් පිරිසක් ඉගෙනුම ලබයි. මැද කොළඹ කොට්ඨාශයේ ඇති පොදු ගැටළුවලින් ප්‍රධානතම ගැටළුව නම් පවුල් බොහෝමයක කුමන හෝ මත්ද්‍රව්‍ය වර්ගයක් භාවිතා කරන පිරිස් සිටීමයි. පෙර පාසල් දරුවන්ගේ පවුල්වලත් මෙවැනි තත්වයක් පවතින හෙයින් මෙම කොට්ඨාශයේ පෙර පාසල් ළමුන් මත්ද්‍රව්‍යවලට විවෘතවන පරිසරයක් නිර්මාණයවී තිබීම ඉමහත් ගැටළුවකි. මෙවැනි පරිසරයන් තුල දරුවන් ජීවත්වීමේදී දරුවන්ට මුහුණපෑමට සිදුවන ගැටළු බොහෝමයකි. එබැවින්, මැද කොළඹ කොට්ඨාශය තුල පෙරපාසල් දරුවන්ට මත්ද්‍රව්‍යවලින් නිදහස් පරිසරයක් නිර්මාණය කරදීම අරමුණවේ.

**ක්‍රමවේදය** :- මැදකොළඹ කොට්ඨාශය තුල වයස අවුරුදු 3-5ත් අතර පෙර පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළේය. ප්‍රථමයෙන් ADIC ආයතනය මගින් බස්නාහිර පළාත් පෙරපාසල් ඒකකය හා සම්බන්ධව පෙරපාසල් සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් සිදුකරන ලදී. මෙම පුහුණු වැඩසටහනේ අරමුණවූයේ මත්ද්‍රව්‍ය පිළිබඳව පෙරපාසල් වයසේ දරුවන් තුල ඇතිවිය හැකි ආකර්ෂණය අවමවීම සඳහා මැදිහත්වීමට අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේද සහ ඒ සඳහා නිලධාරීන්ට හැකියාව ඇතිකරවීමයි. ඒ සඳහා අවශ්‍ය ආධාරක එම ආයතනය හරහා ලැබුණි. ඒවා පෙරපාසල් ළමුන් සඳහා කරන ක්‍රියාකාරකම් සමග එකතුකර ළමුන් තුල ප්‍රතිශක්තිකරණය ඇතිකිරීම සඳහා දරුවන් දැනුවත් කිරීමේ ක්‍රමවේදය ලෙස භාවිතාකරන ලදී. තවද ADIC ආයතනයෙන් නිලධාරීන් ගෙන්වා පෙරපාසල් ගුරු සංගම් හරහා ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**අභියෝග** :- පෙරපාසල් ගුරුවරුන් දරුවන් සමග මෙම වැඩසටහන පටන්ගැන්මේදී ළමුන් මත්ද්‍රව්‍ය ගැන දන්නා බව වැඩි නිසා ප්‍රශ්න අසන නිසා ගුරුවරුන් අපහසුතාවයට පත්වීම. ළමුන් කුඩා වැඩියි කියා සමහර දෙමව්පියන් පැවසීම සහ දෙමව්පියන්ගේ අවබෝධ මට්ටම අවමවීම.

**Methodology :-** We started national level modern campaigning methods targeting the Valentine's Day which is welcome by the youth. We implemented this campaign on 1st of February 2014, with the theme "present day young girls do not prefer to love boys who smoke." Competitions were held 15 private educational centres in two districts based on this theme. 28 advertisements were published for free in two Tamil news papers requesting creative reasons for the slogan "present day young girls do not prefer to love boys who smoke." This theme was advertised 40 times on radio and 25 times on television. Banners based on this theme were displayed at common places where young boys and girls gather. "Present day young girls do not prefer to love boys who smoke" was spread in websites used commonly by young boys. Two electronic media broadcast special competitions on February 14th Valentine's Day, as their morning programme. Live competitions were held on Valentine's Day at places where lovers, young boys and girls gather.

**Challenges :-** Some people made disputes at the beginning saying that this theme looks like advertising love.

**Results :-** We got around 1000 creative answers from the youth for the question "why present day young girls do not prefer to love boys who smoke?" According to the analysis, 65% of youth from the selected regions were made aware about short term and obvious effects of cigarette smoking. Young boys and girls eagerly participated in these activities. Around 10,000 youngsters were made aware by the contribution of the media.

**Follow up :-** Our group continues this activity since 2014 up to now. Some textile shops provide some sponsorship for this, and media outlets also give their full support.

**Conclusion :-** To make people aware of industry strategies where the tobacco company use vivid activities using media, it is necessary to have reliable information and studies to convince community regarding it.

PP

32

අ

**දුම්වැටි ,අරක්කු, බියර් පිළිබඳව දරුවා තුළ  අසාව ඇතිවීම අඩුකිරීම සඳහා දරුවා ශක්තිමත් කිරීම**.

කතෘ :- රුවනි තරංගා

**පසුබිම :-** මම ඉන්නෙ තලවතුගොඩ. මගේ මහත්තයා රියදුරෙක්. ඔහු සිගරට්, අරක්කු, බියර් යන සියල්ලම භාවිතයට පුරුදුවී සිටියා. මහත්තයාගේ පවුල් පරිසරයෙන් ඔහුට එයට බාධාවක් නොවූ නිසා මම විවාහ වී වසර 6ක් වුවත් මහත්තයාගේ මෙම පුරුදුවලින් ඔහු නිදහස් කරගැනීමට මට අවශ්‍ය වුවත් එය නොහැකිව තිබුණා. මගේ මහත්තයා දවසකට සිගරට් 10කටත් වඩා බොන නිසා අපේ ආර්ථිකයට ද බලපෑමක් වූ නිසා මේ බව පැවසීමට යාමෙන් පවුලේ ප්‍රශ්න ඇතිවූ අවස්ථාද නැතුවාම නොවේ. මගේ පුතාද කෙදිනක හෝ මෙම පුරුදුවලට යොමුවීම වළක්වාග ැනීම හා මහත්තයා මෙම පුරුදුවලින් නිදහස් කරගැන්ම මගේ අරමුණ විය.

**ක්‍රමවේදය :-** මගේ පුතා ඉගෙනුම් කටයුතු කළේ තලවතුගොඩ උන්රියුන් පෙරපාසැලේයි. 2015 වසරේ ADIC ආයතනයෙන් පැමිණ මෙම පෙර පාසැලේ දෙමව්පියන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය වැඩසටහනක් කළා. මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් සිදුවන හානි ලෙස දරුවන්ට කියලා දිය යුතු දේවල් හා ඒවා කියලා දෙන්නේ කොහොමද කියලා ඔවුන් අපට පැහැදිළි කර දුන්නා. අපේ දරුවන් අනාගතේදී සිගරට්, අරක්කු, බියර්  භාවිතා නොකරන අය බවට පත්කර ගැනීමට දෙමව්පියන්ටම හැකියාව ඇතිකිරීම මෙම වැඩසටහනේ අරමුණ බව ඔවුන් අපට පැහැදිළි කළා. මගේ අවශ්‍යතාවයත් මෙය නිසා මම දිගටම මෙම වැඩසටහනට සහභාගිවුණා. සිගරට්, අරක්කු, බියර් නිසා සිදුවන හානි ලෙස තොල් කළු වෙනවා, මූණ කැතවෙනවා, ගඳ ගහනවා කියලා ළමයින්ට කියලා දෙන්න කිව්වා. සිගරට් බොන අය දැක්කාමත් මේ ගැන කියලා දෙන්න කිව්වා. මම ඒ කිවූ ආකාරයටම දිගින් දිගටම පෙර පාසලට යන එන අතරේ සිගරට් බොන අය දැක්කම දරුවාට කියලා දුන්නා.

**අභියෝග** :- නැත

**ප්‍රතිඵල:-** මගේ මහත්තයා සිගරට්, අරක්කු,බියර් භාවිතය නැවැත්වීම. සිගරට්, අරක්කු, බියර් බිව්වම වෙන දේවල් පිළිබඳ අවබෝධය මගේ පුතාට ඇතිවීම. දරුවා ඉන්පස්සේ එයාගෙ තාත්තා සිගරට් බොනවා දැක්කාම එයාට කියනවා, "ඔයා කැතවෙයි. සිගරට් බොන්න එපා" කියලා. දිගින් දිගටම දරුවා මහත්තයාට එහෙම කියන නිසා මහත්තයා සිගරට් බොන එක ක්‍රමයෙන් අඩුකරලා නතරම කරලා දැම්මා. සිගරට් බොන්න වැයවූ මුදල් පුතාගෙ අධ්‍යාපන වැඩවලට ගන්න බැංකු පොතට දාන්න දුන්නා. අපේ ආර්ථිකය හොඳවුණා. පවුලේ සතුට වැඩිවුණා.

**පසුවිපරම** :- පුතා එක්ක මම දිගටම මේ දේවල් කතා කළා.  මම මහත්තයාව අගය කළා. 'පුතා කියන දේ අහන එක හොඳයි, නැත්නම් පුතා අපි කියන දේ අහන්නෙ නැතිවෙයි' කියලා.

**නිගමනය :-** දරුවන්ද යොදාගනිමින් එදිනෙදා ජීවිතයේදී සාකච්ඡා ගැනීම තුලින් ස්වාමිපුරුෂයාගේ සිගරට් භාවිතය නවත්වාගත හැක. පවුල තුලම විවෘතව මේ ගැන කතා කිරීම තුලින් දරුවන් ද අනාගතයේදී සිගරට් බොන්නන් බවට පත්නොවේ.

**Strengthen the child to refuse the use of alcohol and other substances following a clear understanding.**

Author :- Ruwani Tharanga

**Background :-** I live in Thalawathugoda. My husband is a driver and he used to smoke cigarettes and to drink alcohol for years. There was no any objection from his family towards smoking and drinking alcohol. So, he continued to use cigarettes and alcohol even years after the marriage. Usually he smokes 10 cigarettes per day and it affected our family economy as well.When I try to explain him about the bad effects it has led to family problems as well.

**Methodology :-** At that time my son was going to a preschool in Thalawathugoda. in 2015 members of the ADIC institute came to the preschool to address the parents of the preschool children. They held a drug prevention program as the main aim of them was to educate about the bad effects of substance use and alcohol. They explained the way that we should educate our children regarding this. Their ultimate target was to make alcohol and cigarettes free future generation and they explained about the importance of parents' contribution. They educated us about the effects of the alcohol and how they cause physical changes. So, I explained it to my son whenever I got a chance.

**Challenges :-** No

**Results:** My son has got a clear idea about the bad outcomes of smoking and alcohol. My son has started to tell those bad effects to his father whenever he tried to smoke or use alcohol. Now my husband has stopped smoking and drinking alcohol completely. he has able to save more money in a bank account. So the family economy and happiness have improved.

**Follow up :-** I appreciate the courage and the decisions of my husband and try to talk with my son regarding this as possible as I can.

**Conclusion :-** Support of the children for the drug prevention is very important. We can protect our children from alcohol and substance use through the family interventions.

PP

33

අ

**සිගරට්, අරක්කු, ගංජා, හෙරොයින් භාවිතය අවමවීම තුළින් පවුලේ ආර්ථිකය දියුණුවීම හා පවුලේ සතුට වර්ධනයවීම.**

කතෘ :- චමිලා ප්‍රභානි පල්ලියගුරු

**පසුබිම** :- සැමියාගේ සිගරට්, අරක්කු, ගංජා, හොරොයින් භාවිතාව නිසා පවුලේ සතුට නොමැතිව බිරිඳ තම ජීවිතය නැති කරගන්න උත්සාහ දැරූ, ළමයින්ගේ ජිවිතයද අක්‍රමවත්ව වැඩෙමින් තිබූ , ආර්ථික අපහසුතා සහිත පවුලක් හම්බන්තොට, සිරිබෝපුර ජීවත්විය. අවුරුදු 37 වන සැමියා ධීවර රැකියාව කරයි. ඉහත මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඔහු දිනකට රුපියල් 3000 ත් 4000 ත් අතර මුදලක් වියදම් කරයි. දිනපතා අරක්කු බාගයකට වඩා සහ සිගරට් 10 ක් පමණ භාවිතා කර ඇත. එම පුද්ගලයා සිගරට්, අරක්කු, ගංජා, හොරොයින් භාවිතයෙන් නිදහස් කරගැනීම සහ පවුලේ සතුට ළඟා කරදීම මෙහි අරමුණයි.

**ක්‍රමවේදය** :- මෙම පුද්ගලයා හමු වී මත්ද්‍රව්‍ය භාවිතය නිසා 'තොල් තැම්බිලා', 'හකු බැහැලා', 'ඇස් යට ගිහිල්ලා', 'මූණ කැත වෙලා', 'ගඳ ගහන' බව ඔහුට පවසන ලදී. 'වයස අවුරුදු 37 වුණාට 50ක පෙනුමැති බවද පැවසුවා'. 'මහන්සි වෙලා හම්බ කරන සල්ලි පිටරටට යනවා යැයිද' පැවසුවා. 'දරුවන්, බිරිඳ දුකෙන්, අසතුටින් සිටින බව පැවසුවා'. 'දරුවන්ට ඒ සල්ලි වලින් ආහාර,පළතුරු,සෙල්ලම් බඩු ගෙනත් දෙන්න පුලුවන්' බව ද පැවසුවා.

**අභියෝග** :- මා එම පුද්ගලයා හමුවීමට යන අවස්ථාවේදීත් ඔහු අරක්කු සහ සිගරට් බොමින් සිටි අතර, එම අවස්ථාවේදී ඔහුගේ උපහාසයට හා විහිළුවකට ලක්වීම. ධීවර රැකියාව කරන නිසා 'නිදිමරන්න වෙනවා,' 'වතුරේ ඉන්න වෙනවා' ඒනිසා නතර කිරීමට නොහැකි බව පැවසීම. නතර කළොත් යහලුවන්ගෙන් කොන්වන බව ප්‍රකාශ කිරීම. සමහර අවස්ථාවලදී මා යනවිට මාව මඟහැරීම.

**ප්‍රතිඵල** :- දවසට සිගරට් 10 ක් භාවිතා කල පුද්ගලයා සිගරට් 3ක් දක්වා අඩුකර ඇත. අරක්කු කාලක් දක්වා අඩුකර ඇත. වසයක පෙනුම තිබුණ මූණ දැන් වයසක පෙනුම අඩු වෙලා. ඇඟේ තිබුණ තුවාල හොඳ වෙලා. ඇඟ කසන එක අඩුවෙලා. ඔහු දැන් දිනකට රුපියල් 100 ක් ඉතුරුම් ගිණුමක මුදල් තැම්පත් කරයි. බිරිඳ පැවසුවේ නිවසේ ආර්ථිකයත් දැන් පෙරට වඩා දියුණු බවයි. ඔහුගේ වැටුප දැන් බිරිදට ගෙනත් දෙයි. බිරිද,දරුවන් සතුටින් ඉන්න බව පැවසීය. ඔහුගේ දරුවන් මා වැඩ ඇරී යන විට මට පැවසුවේ තාත්තා හවසට පළතුරු, සෙල්ලම් බඩු ගෙනත් දෙන බවයි.

**පසුවිපරම්** :- නිතරම ඔහුගේ පවුලේ සාමාජිකාවන්ගෙන් තොරතුරු විමසා පසුව ඔහු හා සම්බන්ධවී ඔහුගේ ප්‍රතිචාර ගැන සොයා බලන ලදි. ඔහු සැබෑ ලෙස වෙනස් වී ඇති බව මගේ හැඟීමයි. ඔහුට සිදුවී ඇති වෙනස්කම්ද පැවසීය. ලස්සන වෙලා, සල්ලි ඉතුරු කරනවා, පවුලම සතුටින් ඉන්නවා බවත් පැවසීය.

**නිගමනය** :- මත්ද්‍රව්‍ය භාවිතයේ ආසන්නතම හානිය පිළිබඳව පැවසීමෙන් විශාල වෙනසක් කළ හැකි බව

PP

33

A

**Improvement of the family harmony and the financial state through the reduction in substance use and alcohol**

Author :- Chamila Prabhani Palliyaguru

**Background :-** There was a family in Hambanthota, Siribopura and the husband of this family was a fisherman. Husband used to drink alcohol, smoke cigarettes and also to use other substances like heroine. He was used to spend around Rs 3000-4000 money per day for alcohol and cigarettes. He used to drink a half a bottle of arrack and 10 cigarettes per day. The children's lives were also accompanied by economic hardships. Due this addiction and economical hardships, his wife has tried to commit suicide. To improve the happiness in this family by stopping the use of alcohol and other substance use was my objective.

**Methodology :-** Met the person and explained about the harmful effects of alcohol and cigarette use with examples such as facial changes and appearance. Explained about the diseases occur due to smoking and alcohol. It was explained that the most of the family income end up in foreign companies.

**Challenges**

1.Avoidance by him and his alcohol addicted friends
2.Getting mocked and ridiculed
3.He believed that he needs to take alcohol to do his job.

**Results :-** He has able to reduce his daily consumption of cigarettes from 10 to 3 and alcohol from ½ a bottle to ¼ a bottle. His facial and other physical changes have disappeared. He used to save Rs 100 in a saving account daily. According to his wife their family economy has improved. Now he hands over his daily income to his wife. Family harmony has improved completely.

**Follow up :-** We asked the details of him from his family members. Later we got the feedback from him and we got to know that he has changed his thinking pattern completely. We told him about the physical and facial changes that he has achieved.

**Conclusion :-** By making aware the immediate harm of drug use can do major changes in their habit.

PP

34

අ

**නිවැරදි මැදිහත්වීම් හරහා කෑගල්ල නගරසභා සුළුසේවක ප්‍රජාවේ මද්‍යසාර සිගරට් භාවිතය අවම කරමින් එයින් නිදහස් වීම.**

කතෘ :- ඊ. එම්. එස්. කේ. චන්ද්‍රදාස

**පසුබිම** :- නගර සභා ආයතනයක ක්‍රියාකාරී රදාපැවැත්ම තිබෙන්නේ නගර සභා කාර්යය මණ්ඩලයෙනි. එයිනුත් සුළු සේවක කාර්යය මණ්ඩලය සුවිශේෂීය. මන්ද නිලධාරීන්ගේ සේවය ආවරණය කිරීමට බොහෝ පිරිස් වෙතත්, සුළු සේවක කාර්යයභාරය ආවරණය කිරීමට එසේ නොවෙති. මොවුන්ගේ සේවය දිනකට අහිමි වුවහොත් නගරයේ බොහෝ කටයුතු එදිනට ඇන හිටින බැවිනි. කරන ලද විමසීම් අනුව පෙනීගියේ මෙම සේවකයින්ගෙන් බහුතරයක් කුමන හෝ මත්ද්‍රව්‍යක් භාවිතා කරන බවයි. සුළුසේවක ප්‍රජාවේ මද්‍යසාර සිගරට් භාවිතය අවම කරමින් ඔවුන්ට එයින් නිදහස්වීමට අවශ්‍ය සහයෝගය ලබාදීම ඔස්සේ කාර්ය ශක්තිය වැඩිකරලමින් ඵලදායී ශ්‍රමබලකායක් සංවර්ධනය කිරීම අරමුණයි.

**ක්‍රමවේදය** :- මුද්‍රිත හා මුද්‍රිත නොවන විවිධ ප්‍රකාශ මාධ්‍ය, තුළින් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව නිවැරදි තොරතුරු ලබාදීම, පෝස්ටර්, බැනර් ප්‍රදර්ශනය කිරීම. මත්ද්‍රව්‍ය නිවාරණ දැන්වීම් පුවරුවක් සවිකිරීම, පාඨකයින්ගේ අධ්‍යයන ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු මාර්ග සලසාලීම, සාකච්ඡාමය වැඩසටහන් කිරීම, සුළු සේවක ජීවිත තුළට මිත්‍රශීලී මැදිහත්වීම සිදුකිරීම, ලබාග න්නා සුළු වැටුප ඵළදායි ලෙස යෙදවිය හැකි අයුරු වීඩියෝ දර්ශන මගින් නැරඹීමට අවස්ථාව ලබාදීම. භාවිතයෙන් වන හානිය වීදි නාට්‍ය මඟින් පෙන්වාදීම, තවමත් සිගරට් උරන්නන් අප්‍රේල් 01වන දින මෝඩයා ගේ උපන් දිනයට සම්බන්ධ කරමින් සුභ පැතීමේ වීදි වැඩසටහන් කිරීම, ත්‍රීරෝද රථ, බස් රථ රියදුරන් දැනුවත් කිරීම නගරයේ හෝටල් හිමියන් දැනුවත් කර දුම්වැටි අලෙවිය අඩපණ කිරීමට කටයුතු කිරීම, සුළු සේවක සේවය අගය කර එනම්, අඩු නිවාඩු ගැනීම, නිසි වේලාවට රාජකාරියට වාර්තා කිරීම වැනි සාධක පදනම් කරගෙන "ශ්‍රම අභිමානී" ත්‍යාග ලබාදීම.

**අභියෝග** :- ඉතා කෙටි කාලයක් තුලදී පෝස්ටර්,ස්ටිකර් ගලවා දැමීම,ඔවුන් රැස්කිරීමේ අපහසුව,විශේෂයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ප්‍රකෝපකාරීව අපේ උත්සාහය හාස්‍යට ලක් කිරීම,භාවිතා කරන්නන්ගේ පුහු තර්ක විතර්ක,උදාසීන,හීනමාන ආකල්ප,විටින් විට රජය මඟින් ගනු ලබන තීන්දු වෙනස්වීම,මත්ද්‍රව්‍ය බහුජාතික වෙළෙඳුන් මත්ද්‍රව්‍යවලට ලබා දීමට දරණ පුහු ආරෝපණ ප්‍රචාරක කටයුතු හිස් මිනිසුන් වැළඳ ගැනීම.

**ප්‍රතිඵල** :- වෙළඳ සැල් 2ක් සම්පූර්ණයෙන්ම දුම්වැටි අලෙවිය නැවැත්වීම සුළු සේවක පිරිසෙන් 3 සිගරට් භාවිතය නැවැත්වීම. 8දෙනකු භාවිතය අවම කිරීම. පුස්තකාලය අවට සිගරට් භාවිතා නොකිරීමඔවුන්ගේ නිවාඩු ගැනීම අවමවීම රාජකාරිය උද්යෝගයෙන් ඉටු කිරීම.මද්‍යසාර භාවිතයෙන් සේවක මහතුන් 3දෙනෙකු නිදහස්වීම හා 8 දෙනෙකු භාවිතය අවම කිරීමපාඨක ප්‍රජවා ජාවාරම්කරුවන් පිළිබඳ අවබෝධයෙන් සිටීම පවුලේ වියපැහැදම සැහැල්ලු වීම,පවුලේ සතුට වැඩිවීම ගැටුම් අඩුවීම ලෙස පවුල් 6ක් වාර්තාවීම.

**පසු විපරම** :- භාවිතයෙන් ඉවත්වූවන්ගේ වෙනස්වීම් හා විවිධ ක්‍රියාකාරකම් ප්‍රතිඵල සාකච්ඡාවට බඳුන් කිරීම.

**නිගමනය** :- ඵලදායී හා නිවැරදි තොරතුරු යාවත්කාලීන කිරීම තුලින් හරහා සහ එම ප්‍රවේශයන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම තුලින් අරමුණු දිනාගත හැකිබව.

**Minimizing the consumption of alcohol and cigarettes in the labor community of Kegalle urban council and relieving them from it through appropriate intervention.**

Author :- E.M.S.K.Chandradasa.

**Introduction :-** The active survival of an urban council depends solely on the staff of the institute, among whom the labor community is special, because even though there is ample amount of staff to occupy as management staff, it is not same as in the case of the minor staff. When the service of the labours not received even for a single day of the year, most of the activities and tasks of the town become disturbed .In inquiry, it was observed that the majority of these minor staff consume any kind of a drug/alcohol. The objective was to develop a fruitful and effective working force by increasing their working capacity by the means of supporting the minor staff to minimize the consumption of alcohol and cigarettes and making them completely abstaining from it.

**Methodology :-** The activities conducted were; providing them with the accurate information by way of printed or non- printed statements via mass media regarding abstaining from drugs/alcohol, exhibiting posters and banners, setting up of a notice board regarding abstaining from drugs/alcohol ,arranging ways for the readers to obtain information for their academic projects, conducting discussion programs, making friendly interventions to the lives of the employers, providing them with the opportunities to watch videos explaining how to fruitfully spend their simple wages, displaying the bad consequences of using drugs/ alcohol by organizing street dramas, conducting street programs showing the connection between the people who still smoke cigarettes and the world fools 'day on April 1 st and hence wishing them, conducting awareness programs for the bus and three- wheel drivers, making the owners of the hotels of the town aware of the facts and hindering the sale of cigarettes and complimenting the services of the labours such as for obtaining the least number of work-offs, being punctual etc. and providing them with incentives like "Shrama Abhimani".

**Challenges :-** Removal of the posters, stickers etc. within a very short time period, the difficulty in gathering them for the activities, the drug dealers becoming arrogant and humiliating our activities, the irrelevant logics presented by the consumers of drugs / alcohol and their attitudes of low self-esteem downgrading them, the frequent changes of the decisions taken by the government at different times and the un-educated public believing in and following the unimportant and meaningless advertising tricks of the multinational drug venders.

**Results :-** Two shops completely stopped the sale of cigarettes,3 people from the employer community stopping cigarette smoking, and 8 of them minimizing the consumption, refraining from cigarette smoking in the vicinity of the library, taking work-offs by them becoming minimum, performing their duties with enthusiasm,3 employers refraining from alcohol consumption and 8 employers minimized their consumption, the community being aware of the illicit drug venders, the family expenditures being minimum and the family happiness being maximum and reporting of the minimizing of the family disputes in 6 families.

**Follow up :-** Conducting discussions about the results of various activities and the changes encountered in the consumers who refrained from drugs/alcohol.

**Conclusion :-** By updating the fruitful and accurate information and by practically putting them into action, objectives can successfully be reached.

PP

35

අ

**පුස්තකාලයේ හරහා සිදුකරන ඵලදායී මැදිහත්වීම තුළින් ගල්නෑව බල ප්‍රදේශයේ මද්‍යසාර සහ දුම්වැටි භාවිතය හා එයට යොමුවීම අධෛර්යමත් කිරීම.**

කතෘ :- ශ්‍යාමලී නිරූපා සමරනායක

**පසුබිම** :- භාවිතය දිරිගන්වන සුලු වටපිටාවක් මෙම පරිසරය තුළ දක්නට ලැබුණි. එමෙන්ම ග්‍රාමීය ජනතාවට මෙය පිළිබඳ නිවැරදි තොරතුරු ගලායාමේ දුර්වලතාවයක් ඇත. මෙම ගැටලුව අවම කිරීම සඳහා නිවැරදි මාධ්‍යයක් ලෙසට පුස්තකාලය උපයෝගී කරගත හැකිවනුයේ මෙකී පාඨක ප්‍රජාව කුඩා දරුවාගේ සිට මහලු පුද්ගලයා දක්වා විවිධාකාර බැවිනි. මෙම ප්‍රදේශයේ ඇති රාජ්‍ය ආයතන, වෙළඳසැල්, ජනතාව නිතර ගැවසෙන ස්ථාන ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා භාවිතය හා එයට යොමුවීම අධෛර්යමත් කරන පරිසරයක් සංවර්ධනය කරගත හැකිවීම. ඵලදායී මැදිහත්වීම තුළින් ගල්නෑව බල ප්‍රදේශයේ මද්‍යසාර සහ දුම්වැටි භාවිතය හා එයට යොමුවීම අධෛර්යමත් කරන පරිසරයක් සංවර්ධනය කිරීම අරමුණය.

**ක්‍රමවේදය** :- මෙකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට පුස්තකාලයේ දැන්වීම් පුවරුවක් හා බහාලනය මත්ද්‍රව්‍ය නිවාරණ පෝස්ටර් ප්‍රදර්ශණය කිරීම, විශේෂ උත්සව අවස්ථාවන්වලදී සභාවේ ප්‍රදර්ශණය කිරීම, පුස්තකාල පාඨක කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම සහ අත් පත්‍රිකා බෙදාදීම, පාසැල් ළමුන්ට ව්‍යාපෘති සහ විවිධ තරගාවලි සඳහා අවශ්‍ය දැනුම ලබාදීම, පෞද්ගලික පන්ති සිසුන්ට පත්‍රිකා බෙදාදීම, නෑගම්පහ විදුහලේ සිසුන් 223කට මත්ද්‍රව්‍ය නිවාරණ සාකච්ඡා පැවැත්වීම, අත් පත්‍රිකා ආශ්‍රතව ගම්මානවල 450කට අධික ජනතාවට බෙදා හැර දැනුවත් කිරීම, සිරිකත සහ නවලිය පුවත්පත්වල නිවාරණ ප්‍රචාරණ සමීක්ෂණයක් සිදු කිරීම, පාඨකයන් සහ සභා නිළධාරීන් එක්ව පා ගමනක් දියත් කිරීම. වෙළඳසැල් 300කට පමණ දුම්වැටි වෙළඳාම වැළැක්වීමට පොලීසිය,සභාව, පුස්තකාලය, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය එක්ව පත්‍රිකා බෙදා දී දැනුවත් කිරීම. කියවීමේ මාසයට සමගාමීව ගල්නෑව මධ්‍ය මහා විද්‍යාල සිසුන්ට අත් පත්‍රිකා බෙදාදීම.

**අභියෝග** :- මත්ද්‍රව්‍ය නිවාරණය අභියෝගාත්මක වැඩසටහනකි. වෙළඳ මහතුන් ප්‍රචාරක පුවරු ඉවත් කිරීමට එකඟ නොවීම, දුම්වැටි විකිණීමෙන් ඉවත්වීම ව්‍යාපාපාරයට බාධාවක් වීම, මත්ද්‍රව්‍ය නිවාරණ පෝස්ටර් සහ ස්ටිකර් ඉතා ඉක්මනින් ඉවත් කිරීම,ග්‍රාමීය ජනතාව උපදෙස් ප්‍රතික්ෂේප කිරීම.

**පසු විපරම** :- දිගින් දිගටම ක්‍රියාත්මකවීම තුළින් තරුණ සහ වැඩිහිටි සිත් තුළ ධනාත්මක ආකල්ප ඇති කිරීමට කටයුතු කිරීම. ඔවුන්ගේ දෛනික ක්‍රියාකාරකම් තුළ මේ සඳහා නිවැරදි ප්‍රතිචාර දැක්වීම සාමාන්‍ය ක්‍රියාකාරකමක් බවට පත්කරවීමට ක්‍රියාකාරකම් කිරීම.

**ප්‍රතිඵල** :- අප ආයතනය තුළ සිගරට් භාවිතා කළ දෙදෙනෙක් එයින් ඉවත්වීම. වෙළඳ මහතුන් 35ක් වෙළඳාමෙන් ඉවත්වීම හා 20 ප්‍රචාරක පුවරු ඉවත් කිරීමට එකඟවීම. ජනතාව මේවා භාවිතයේ හානිය පිළිබඳව සාකච්ඡා කරයි. ග්‍රාමීය කාන්තාවන් දැනුවත් කිරීමෙන් පවුල් 50ක් මේවායින් නිදහස්වී යහපත්ව ජීවත්වීම. සභාවේ තරඟාවලියට මත්ද්‍රව්‍ය නිවාරණ තරඟයක්, නිවාරණ තොරතුරු එළි දැක්වීමට සභාව යෝජනා ඉදිරිපත් කිරීම.

**නිගමනය** :- තොරතුරු යාවත්කාලීන කිරීමට පමණක් සීමානොවී ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීම ප්‍රතිඵලදායකය.

PP
35
A

**Discouraging the use of alcohol and tobacco and the attraction towards it through effective interventions via the library**

Author - Shyamalee Nirupa Samaranayaka

**Background :-** In this environment there was an atmosphere which encouraged the use of alcohol and tobacco. And also there was a weakness in flowing of correct information regarding this matter to the rural population. Therefore in order to minimize this, the library can be used as a correct medium, since the readers of the library are diverse starting from a small child to an elder. By conducting programmes covering government offices, shops and crowded public places in the area, an environment which discourages the use and the attraction towards alcohol and tobacco can be developed.

**Objective :-** Developing an environment which discourages the use of alcohol and tobacco and attraction towards it in Galnaewa region through effective interventions.

**Methodology :-** To achieve the above objective following interventions were done. Displaying posters on alcohol prevention on the library notice board, displaying them in the hall during special functions, conducting discussions among the groups of readers from library, distributing leaflets, giving the knowledge required for projects and competitions for the school children, distributing leaflets among the students from tuition classes, conducting discussions for 223 students of Naegampaha school on alcohol prevention, raising awareness among nearly 450 people from nearby villages by distributing leaflets, doing a survey on preventive publications in 'Sirikatha' and ' Nawaliya' newspapers and both the readers and officers organizing a walk. Raising awareness in 300 shops by distributing leaflets by the Police, Council, Library, MOH office aiming to prevent tobacco sale. Distributing leaflets among the students of Galnaewa Central College in parallel with the month of readig.

**Challenges :-** Alcohol prevention is a challenging programme. Vendors did not agree on removing advertising boards, refraining from selling tobacco affecting the industry, posters and stickers on alcohol prevention being removed quickly, rural population rejecting the advices.

**Results :-** Two people from our institution stopped smoking. 35 vendors stopped tobacco trade and 20 agreed on removing advertising boards. Since the short term harm is more, people discuss about harm of tobacco use. By making rural women aware, 50 families have become free from these and lead good lives. Council proposed on adding a competition for alcohol prevention in the competitions of the council and exposing information on prevention.

**Follow up :-** Positive attitudes were created among the young and the old by working constantly. Responding correctly towards this was made a normal activity in their daily routine.

**Conclusion :-** It is effective to work actively on drug prevention without limiting to updating information.

PP

36

අ

## අරක්කු , සිගරට්, දුම්කොළ හා මත්කුඩු භාවිතය අවම කිරීමට මා ගත් වෑයම

කතෘ :- වයි.එම්. නන්දනී කුසුමලතා

**පසුබිම** :- ජනගහනය 3109ක් පමණ වන බිංගිරිය මානෙලෙම්බුව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී කොට්ඨාසය තුළ කසිප්පු, දුම්කොළ හා ගංජා භාවිතය 75% ක් පමණ වන දිළිඳු ජනතාවක් වාසය කරන ප්‍රදේශයකි. මත්ද්‍රව්‍ය භාවිතය නිසා ප්‍රදේශයේ කාන්තාවන් හා දරුවන් නිරන්තරයෙන් මානසිකව හා කායිකව පීඩනයට පත් වේ. අරක්කු , සිගරට්, දුම්කොළ හා මත්කුඩු භාවිතය සඳහා ඇබ්බැහි වූවන් හා එම කර්මාන්තය නිසා ඇති වන හානිය අවම කිරීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- ගර්භණී මව්වරුන්ගේ පියවරුන් හා අවුරුදු 5ට අඩු දරුවන්ගේ පියවරුන් ඉලක්ක කර පූර්ව ප්‍රසව සැසි වලදී සිගරට් භාවිතය කළලයේ බුද්ධි වර්ධනය 50% අඩු වන බව අවධාරණය කිරීම. සිගරට් හා අරක්කු සඳහා යන මුදල ගණන් හදා පෙන්වීම.නිවසේදී කාර්යාලයේදී, සායනයේදී හමුවන පුද්ගලයින් සමග සාකච්ඡා කිරීම. සිගරට් මිල දී ගන්නා පුද්ගලයින්ට එම පෙට්ටියේ පින්තූර පෙන්වා එහි ඇති සැගවුණ අවදානම පෙන්වා දීම. බිරිඳ එහි ආදීනව දක්වන ස්ටිකර් නිවසේ හා සැමියා සහ යහළුවන් නිතරම ගැවසෙන බස් නැවතුමේ ඇලවීම. කසිප්පු මුදලාලිට කසිප්පු විකිණීමේදී පැකට් කරන පොලිතීන් නිසා ඇති වන විනාශය පැහැදිලි කිරීම. මාගේ පුතු බස් වල රියදුරු සහයකයින් සමඟ සුහද වී "අරක්කු බිව්වාම ගඳයි" , " සිගරට් බිව්වාම මෝඩ පාටයි" යන ස්ටිකර් බස් වල ඇලවීම. සැසි වලදී මත්ද්‍රව්‍ය හා සිගරට් භාවිතය නිසා නිවසේ ඇතිවන අඩ දබර හා දරුවන් හා පියා අතර, සැමියා හා බිරිඳ අතර දුරස්ථ බව ඇති වන ආකාරය සාකච්ඡා කිරීම.

**අභියෝග** :- " බොන්න නරක නම් තහනම් නොකරන්නේ ඇයි ? " , " මිස් කීවට ඒක කරන්න පුළුවන් වැඩක්ද? " , අපි බිව්වට ගෙදරට අඩු පාඩු නැහැ " ආදී අභියෝග පැවතුණි.

**ප්‍රතිඵල** :- දරුවා ඉදිරිපිට සිගරට් නොබීම 50%, ක් වීම ,මද්‍යසාර භාවිතය 20% ක්අඩු වීම, කඩයේදී සිගරට් මිලදී ගන්නා අය අඩු බව. එසේම සිගරට්වලින් ලැබෙන ලාභය ඉතා සුළු නිසා එය අලෙවි කිරීම නතර කළ හැකි බව වෙළඳසැල් හිමියන් 06 ක් පැවසීය. වෛද්‍ය ප්‍රතිකාර ගන්නා ස්ථානයේදී ප්‍රතිචාර දැක්වූ පසු පුද්ගලයා සිගරට් භාවිතා නොකිරීම. කසිප්පු මුදලාලි විසින්ම කසිප්පු පැකට් කරන පොලිතීන් අහුලා දැමීමට පෙළඹීම ආදියයි .

**පසු විපරම** :- බරකිරන ස්ථාන , සායනවලදී . ගෘහ පිවිසීම්වලදී බිරින්දෑවරුන්ගෙන් හා දරුවන්ගෙන් කිරිඅම්මා වරුන්ගෙන් නිවසේ මෙම ද්‍රව්‍ය, භාවිතය අවමවීම පිළිබඳ විමසුවෙමි

**නිගමනය** :- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක ලෙස ප්‍රාථමික සෞඛ්‍යට අදාලව මත්ද්‍රව්‍ය නිවාරණයට මැදිහත්වීම ප්‍රතිඵලදායකවේ.

**The effort done by me for minimizing the consumption of alcohol, cigarettes, tobacco and drugs.**

Author :- Y.M.Nandanee Kusumalatha

**Introduction :-** The PHM division of Manelembuwa of Bingiriya district consists of a low-income population of about 3109, of whom 75% consume illicit alcohol, tobacco and cannabis. The women and the children of the area are frequently being subjected for physical as well as mental harassments as a result of drugs/alcohol. The objective was to minimize the harm caused to the people addicted to the consumption of alcohol, cigarettes, tobacco and drugs by those industries.

**Methodology :-** Emphasizing the fact that smoking cigarettes results in 50 % reduction of mental development of the fetus, during the antenatal clinic sessions, targeting on the husbands of pregnant mothers and the fathers whose children are below 5 years of age, Calculating the total cost spent on the cigarettes and alcohol and discussing with the people met at the houses, office and the clinic. Showing the pictures of boxes of cigarettes to the people who use to buy them and explaining them on the hidden risks of it. Making the wives to display stickers which explain of the bad consequences of them at their homes as well as at the bus stops where their husbands and the friends frequently are present. Explaining to the alcohol vendors about the consequences of polythene used for packaging illicit alcohol for sale. My son becoming friendly with the drivers and the conductors of buses and pasting the stickers saying, "Taking alcohol makes you smelly, cigarette smoking makes you look like a fool"etc. Discussing at the sessions about the family disputes and the unfamiliarness and the distance created between the father and children and between the husband and wife as a result of the consumption of drugs and cigarettes.

**Challenges :-** It was inquired at the weighing posts and the clinics about the reduction of consumption of these substances at their homes from the wives, children and their grand mothers.

**Results :-** Reduction of the percentage of people smoking in front of their children to 50 % and reduction of the percentage of alcohol consumption to 20 %. 6 owners of shops mentioned that the number of people buying cigarettes from shops has reduced. They also mentioned that selling them could be completely stopped since the profit obtained from those is low. People who responded at the medical center quitting smoking cigarettes and the illicit alcohol vendor himself taking actions to collect the polythene packets used to package alcohol dropped on the ground.

**Follow up :-** inquired about the inmprovements at weighing centres, clinics, home visits and discussions with wives and grandmothers.

**Conclusion :-** It yields results when taking part for alcohol and drug prevention related to the basic health as a Public Health Midwife.

PP

37

අ

## මදුරාවල ප්‍රාදේශිය සභාවේ සුළු සේවකයින්ගේ සිගරට් හා මද්‍යසාර භාවිතය අවම කිරීම හා නතර කිරීම

කතෘ :- ඩබ්.රූපා ලිලානි

**පසුබිම** :- මදුරාවල ප්‍රාදේශීය සභාවේ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් දුම්කොළ හා මද්‍යසාර භාවිතයට නැඹුරුවීම නිසාවෙන් ආයතනයේ දෛනික කටයුතු නිසි ආකාරයෙන් සිදු කරලීමට නොහැකි තත්වයක් උද්ගත වීම මෙන්ම එම පවුල්වල සාමාජිකයන් ඔවුනගේ භාවිතය හේතු කොට ගෙන මුහුණ පාන්නාවූ දුෂ්කරතා මඟ හරවා ගැනීමේ අවශ්‍යතාවය දැඩිව දැනුනි. නිවැරදි මැදිහත්වීමෙන් දුම්කොළ හා මද්‍යසාර භාවිතය අවම කිරීම සහ භාවිතය නැවැත්වීම,පවුලේ සතුට සංවර්ධනය කිරීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- අප ආයතනය තුළ සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලයේ සේවක මහතුන් අතුරින් මත්ද්‍රව්‍ය හා දුම්පානය භාවිතය පිළිබඳව සොයා බැලීමක් සිදු කරන ලදී. මෙහිදී අනාවරණය වූ තොරතුරු අනුව දැඩි ලෙස ඒ සඳහා යොමුවී ඇති පිරිස ලෙස ආයතනයේ සුළු සේවක මහතුන් බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව විවිධ අධ්‍යාපන මට්ටම්වල හෙඹි ඔවුන් මද්‍යසාර හා දුම්පානයෙහි සැබෑව නිවැරදිව දැනුවත් කොට ඔවුන් ඒ සඳහා යොමුවීමට බලපෑ හේතු සාධක, ඉන් ඉවත්වීමට යම් අවශ්‍යතාවයක් ඇත්ද, යනාදිය පිළිබඳව තොරතුරු රැස් කළ අතර අනතුරුව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා සාකච්ඡාවන් සඳහා ඉලක්කගත කණ්ඩායම යොමු කරලීමට කටයුතු සම්පාදනය කරන ලදී.

**අභියෝග** :- මෙහිදී හදුනාගත් යොමු වූවන් මෙම වැඩසටහන වෙත යොමු කරලීමට අපහසුවීම මෙම පිරිස රජයේ සේවකයන් බවින් මාසික වේතනය ඔවුන් අතට පත්වීම සමග ඔවුන් එම මුදල් මත් ද්‍රව්‍ය භාවිතය සඳහා මුළුමනින්ම පාහේ යොදා ගැනීම පාලනය කිරීම අපහසුවීම.

**ප්‍රතිඵල** :- හදුනාගත් භාවිතා කරන 62 දෙනෙකු අතරින් 06 දෙනෙකු දුම්වැටි භාවිතයෙන්ද 04 දෙනෙකු මත්ද්‍රව්‍ය භාවිතයෙන්ද මුළුමනින්ම ඉවත් විය. ඒ බව සනාථ කර ගැනීමට අප හට පහත සඳහන් නිර්ණායකයන් උපයෝගී විය. එසේම අනෙකුත් සේවකයින් ද මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය අඩු ප්‍රවණතාවයක් දක්නට ලැබුණි. සේවකයන්ගේ සේවයට වාර්තා කිරීමේ ප්‍රවණතාවය ඉහළ අගයක් ගනී. ඔවුන්ගේ හැසිරීමේ හා භාෂා විලාසය වෙනසක් ඇත. කාර්යාල පරිශ්‍රය තුළ සිගරට් දුම අවම වීම. වැඩ කරන පරිසරය තුළ වෙනදාට වඩා උද්යෝගීමත් ව පැවතීම.

**පසු විපරම** :- මෙලෙස සේවක මහතුන් පිළිබඳව නිරන්තර සෝදිසි කිරීම් සිදු කරනු ලබයි. ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගෙන් හා වෙනත් මාර්ගයන් මගින් තොරතුරු ලබාගැනීම කරනු ලබයි. නිතර නිතර පණිවිඩ යාවත්කාලීන කරයි. ඔවුන්ගේ ධනාත්මක වෙනස්කම් අන් අය සමග සාකච්ඡා කරයි.

**නිගමනය** :- නිරන්තර පසු විපරම් තුලින් හා නිවැරදි දැනුවත් කිරීම් හරහා සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය

PP 37 A

## Limiting and stopping of smoking and consumption of alcohol among minor staff of the Madurawala Pradeshiya Sabha.

Author :- W. Roopa Lilani

**Background :-** There was a great necessity to rectify the situation of the Madurawala Pradeshiya Sabha where the daily activities of the institution were not done properly due to the trend of the employees towards smoking and alcohol consumption and to limit the difficulties faced by their family members due to smoking and alcohol consumption.

**Objective :-** Limiting and stopping of smoking and alcohol use and developing the happiness of the family by correct interventions

**Methodology :-** It was searched about the smoking and alcohol consumption of the employees of our institution. According to the information revealed here, minor staff of the institution was found to be the group with the greater adherence. They were having different educational levels and they were educated accordingly about the truth of smoking and alcohol consumption. Data was collected about the reasons which led them to consume alcohol and tobacco and whether they want to stop using them. Target group was directed to alcohol prevention programmes and discussions after that.

**Challenges :-** It was difficult to direct the target groups to this programme. This group being government servants getting a monthly salary, it is difficult to prevent them from spending the whole salary on alcohol.

**Results :-** 6 and 4 out of 62 individuals identified, completely stopped smoking and consuming alcohol respectively. To confirm that following criteria were used. And also there was a trend to limit smoking and alcohol consumption among other employees. Reporting for work is high among the employees  There is a change in their behavior and vocabulary There is less cigarette smoke within the office premises More delightful working environment

**Follow up :-** Frequent inspections are done about the employees. Information is gathered from family members and other sources. Messages are updated constantly. Positive changes of the employees are discussed with others.

**Conclusion :-** Successful results can be achieved by frequent follow up and correct awareness.

PP
38
த

## பேர்லன்ட்ஸ் தோட்ட மக்களின் சாராயப் பாவனையைக் குறைப்பதனுடாக குடும்ப நல்வாழ்வை மேம்படுத்தல்

எழுத்தாளர்: ஆறுமுகம் பாலகுமார்

**பின்னணி :-** பேர்லன்ட்ஸ் தோட்டத்தில் மொத்தமாக 565 குடும்பங்கள் வசிக்கின்றன. அதில் 949 ஆண்கள் மற்றும் 1363 பெண்கள் உள்ளடங்குகின்றனர். 18 வயதிற்கும் மேற்பட்ட ஆண்களை மட்டும் வெவ்வேறாக கணக்கிட்டதில் மொத்தமாக 560 ஆண்கள் இருக்கின்றனர் அதில் 470 ஆண்கள் மதுசாரம் அருந்துபவர்களாக இணங்காணப்பட்டனர். பேர்லன்ட்ஸ் தோட்டத்தில் மாத்திரம் மாதமொன்றிற்கு சுமாராக ரூபா 1,450,000.00 எனும் பெருந்தொகை சாராயத்திற்கு செலவழிக்கப்படுகின்றது என்பதனையும் தோட்டத்திலுள்ள மக்களைக் கொண்டே கணிப்பிடக்கூடியதாக இருந்தது. இதனால் குடும்ப வன்முறைகளும்,பொருளாதாரப் பற்றாக்குறையும் எமது பிரதேசத்தில் காணப்பட்டது. இந்த நிலையில் சாதகமான மாற்றங்களைக் காணவேண்டும் என்ற நோக்கத்தில் நாம் இச் செயற்பாட்டை ஆரம்பித்தோம்.

**செயற்பாடு :-** பேர்லன்ட்ஸ் தோட்டத்தில் வசிக்கின்ற அனைத்து தாய் மற்றும் தந்தைமாரை ஒரே இடத்திற்கு ஒன்று கூட்டினோம். அவர்களை வெவ்வேறாக ஒன்று திரட்டி,மதுசாரம் மற்றும் போதைப்பொருள் தகவல் நிலையத்தின் வழிகாட்டல்களுக்கு அமைய மதுசார பாவனையினால் ஏற்படும் பொருளாதாரப் பிரச்சினை,வன்முறைகள் ஆகியவற்றை அவர்களைக் கொண்டே கணிப்பிடப்பட்டது. பின் தொடர்த்தேர்ச்சியாக 06 மாதங்களிற்கு அக்குழுவுடன் மதுசாரம் அருந்துவதனால் ஏற்படும் பாதிப்புக்கள்,மதுசாரம் அருந்துபவர்களுக்கு வழங்கப்படும் வரப்பிரசாதங்களை எப்படி குறைப்பது?, சாராயம் குடிப்பவர்கள் மத்தியில் காணப்படும் மூடநம்பிக்கை மற்றும் உண்மைத் தன்மைகள் தொடர்பான திறன் விருத்தி செயற்பாடுகள் மேற்கொள்ளப்பட்டன.அத்துடன் தனித்தனியே வீடுகளிற்கு பாதீட்டுமுறை அறிமுகப்படுத்தப்பட்டு அதில் மதுசாரத்திற்கு செலவழிக்கப்படும் பணத்தொகையினை தனித்தனியே கணக்கிட தெளிவூட்டப்பட்டது. ஒவ்வொரு மாதமும் மக்கள் மத்தியில் ஏற்படும் சாதகமான மாற்றங்கள் பற்றி கலந்துரையாடப்பட்டது. அம் மாற்றங்களை வரவேற்கப்பட்டு ஊக்குவிக்கப்பட்டது. இச்செயற்றிட்டத்தில் பங்குபற்றியவர்களின் வீடுகளுக்கு வீட்டு விஜயம் மேற்கொள்ளப்பட்டது, வீட்டிற்கு வீடுமதுசாரத்தினால் செலவழிக்கப்படும் பணம் தொடர்பில் விழிப்புணர்வடையச் செய்வதற்காக ஸ்டிக்கர்கள் ஒட்டப்பட்டது மற்றும் தோட்டத்தின் பொதுவான இடங்களில் பதாதைகள் காட்சிப்படுத்தப்பட்டன. வீட்டுத்தரிசிப்பின் போது வீடுகளில் பாதீட்டு மீள்பரிசீலனை செய்யப்பட்டதுடன் மதுசாரத்திற்கு எவ்வளவு பணம் செலவாகின்றது மற்றும் அதிலுள்ள மாற்றங்கள் பற்றி ஆராயப்பட்டது. மதுசாரம் அருந்தும் தந்தைமாருக்கு எவ்வாறு தகுந்த பிரதிபலிப்புக்களை வழங்குவது என்பது தொடர்பில் பங்குபற்றிய பெற்றோர்களின் பிள்ளைகளுடன் கலந்துரையாடப்பட்டது.

**பெறுபேறு :-** எமது இறுதி ஆய்வுகளின் முடிவின் படி 11%ஆன ஆண்கள் மதுசார பாவனையை நிறுத்தியுள்ளனர். 37%மான பெண்கள் மதுசாரம் அருந்தும் தனது கணவருக்கு வரப்பிரசாதங்கள் வழங்காமல் சரியான பிரதிபலிப்புக்களை வழங்க ஆரம்பித்துள்ளனர். பேர்லன்ட்ஸ் தோட்டத்தில் மதுசாரம் சார்ந்த வன்முறைகள் குறைவடைந்துள்ளன. மதுசாரத்தை விளப்பரப்படுத்தும் முறைகள் தொடர்பில் பெற்றோர் தமது பிள்ளைகளுக்கு நுட்பமாகக் கற்றுக்கொடுக்க ஆரம்பித்துள்ளனர். பேர்லன்ட்ஸ் தோட்டத்தில் செயற்றிட்டத்திற்கு பங்குபற்றியோர் மத்தியில் சேமிப்பு பழக்கம் அதிகமாகியுள்ளது,தங்க ஆபரணங்கள் கொள்வனவு செய்வதற்கு ஆரம்பித்துள்ளனர்,பிள்ளைகளிற்கு போசனை மிக்க உணவு வழங்க ஆரம்பித்துள்ளனர்.

**சவால்கள் :-** ஒவ்வொரு மாதமும் அனைத்து மக்களையும் ஒன்று திரட்டுவதில் சிரமமாக இருந்தது. இதனால் அவர்கள் கொழுந்து பறிக்கும் இடத்திற்கே சென்று அவர்களுடனான செயற்பாடுகளை மேற்கொள்ள வேண்டி ஏற்பட்டது. ஆரம்பத்தில் பங்குபற்றிய அனைத்து பெற்றோர்களும் இறுதிவரை பங்குபற்றவில்லை.

**பின் கண்காணிப்பு செயற்பாடு :-** பங்குபற்றிய பெற்றோர்களில் ஒரு குழுவை நியமித்துள்ளோம். அவர்கள் தொழில் புரியும் இடத்திலும், வீடுகளிலும் பின்கண்காணிப்பு செயற்பாடுகளை மிகவும் எளிய முறையில் மேற்கொள்கின்றனர்.

**முடிவுரை :-** ஒரு செயற்பாடுடன் மாத்திரம் நிறுத்திவிடாமல், பயனள்ள மற்றும் எளிமையான செயற-பாடுகளை மேற்கொள்ளும் போது மக்கள் மத்தியில் மாற்றங்களை அவதானிக்கலாம்.

**Improving the family life of Ferlands estate people by reducing their alcohol consumption**

Author :- Aaumugam Balakumar

**Background :-** A total of 565 families live in Ferlands estate. It includes 949 males and 1363 females. There are 560 males who are above 18 years when it was calculated separately. Among them 470 males were identified as alcohol consumers. A big sum of money, around Rs. 1,450,000.00 is spent on alcohol per month in Ferlands estate alone and we were able to calculate it by using the people of the estate itself. Domestic violence and economic scarcities were seen in our region because of this reason. We started this activity with the purpose of seeing some positive changes in this situation.

**Methodology :-** We gathered all the mothers and fathers who live in Ferlands estate to one place. We gathered them separately and assessed using themselves the economic issues and violence caused by alcohol consumption, based on the guidance provided by Alcohol and Drug Information Centre. After that, continuously for 6 months, we joined with that group and conducted skill development activities on effects of alcohol consumption, how to reduce the benefits given to alcohol consumers, and myths existing among the alcohol consumers and the truths behind it. In addition to that, we introduced a budget system to each family and explained them how to calculate separately the money spent for alcohol. We discussed the positive changes happening among people every month. Those changes were welcomed and encouraged. Home visits were done to each family that participated in this activity. Stickers were pasted on each house to raise awareness regarding the amount of money spent for alcohol. Banners were displayed in public places of the estate. During the home visits the budget was re analyzed and the amount of money spent on alcohol and the changes that had happened in it were evaluated. The proper methods of providing reflection to alcohol consuming fathers were discussed with the children of the participant parents.

**Challenges :-** It was difficult to gather all the people every month. Therefore, we had to go to the places where they pluck tealeaves to carry on our activities. Not all the parents who participated at the beginning remained until the end.

**Results:** According to the conclusion of our research, 11% of males have stopped alcohol consumption. 37% of females had stopped the benefits given to their alcohol consuming husbands and to provide proper reflection for them. Alcohol related violence had reduced in Ferlands estate. Parents had started to teach their children precisely about the methods used to advertise alcohol. The habit of saving has increased among the people of Ferlands estate who participated in the programme. They have started to buy gold jewellery and to provide nutritious food to their children.

**Follow up :-** We appointed a group among the parents who involved in the activities. They are carrying on the follow up activities in a simple manner at their work places and homes.

**Conclusion :-** Without limiting to few activities, by continuously carrying out them with will field positive results.

PP

39

த

## மதுசார பாவனையைக் குறைப்பதன் மூலம் தனிமனித பொருளாதாரத்தை மேம்படுத்தல்

எழுத்தாளர் :- V.ரவிச்சிந்திரன்

**பின்னணி :-** தங்ககல்லை கீழ்பிரிவை சேர்ந்த குமார் 03 பெண்பிள்ளைகளின் தந்தை. இவர் தினக்கூலிக்கு வேலை செய்யும் தொழிலாளி. குமாரின் மனைவி தோட்டத்தொழிலாளியாக தொழில் புரிந்துவிட்டு வெளியிலும் மாத வருமானத்திற்காக தொழில் புரிந்து வருகின்றார். தினமும் மதுசாரம் அருந்தும் குமார் ஒவ்வொரு நாளும் தனது வருமானத்தில் 400.00 ரூபாவை மதுசாரத்திறகாக செலவழிப்பார். இவரின் மூத்த மகள் (க.பொ.த சதாரண) தரத்தில் சிறந்த பெறுபேற்றை பெற்ற போதிலும் உயர்தரம் கற்பிக்க முடியாது என்றும், அதற்கேற்ற வருமானம் தன்னிடமில்லையென்றும் கூறினார்.

**செயற்பாடு :-** குமாரின் மகளுடன் குடும்பச் சூழ்நிலை தொடர்பில் கலந்துரையாடினேன். குறித்த நபருடனான தனிப்பட்ட கலந்துரையாடல்களை மேற்கொண்டேன். எதற்காக சாராயம் குடிக்க வேண்டும் என்றும், சாராயம் குடிப்பதற்கு செலவழிக்கும் பணத்தொகை தொடர்பிலும், அவற்றை சேமித்தால் செய்யக்கூடிய செயல்களைப் பற்றியும் கலந்துரையாடினேன். தொடர்ந்தும் அவருடனான கலந்துரையாடல்கள் தொடர்ந்ததுடன் அவரின் மகள் மூலமாகவும் தந்தையின் நடவடிக்கைகள் கண்காணிக்கப்பட்டது. தொடர்ந்து மேற்கொண்ட கண்காணிப்பின் பிறகு தனது சாராயப் பாவனையை நிறுத்துவதற்கும் அந்த பணத்தை தனது பிள்ளைகளின் படிப்பிற்காக செலவழிப்பதற்கும் குமார் இணக்கம் தெரிவித்தார்.

**பெறுபேறு :-** குமார் முற்றாக சாராயப் பாவனையை நிறுத்தியுள்ளார்.தனது மூத்த மகளை உயர்தரம் கற்க வைத்து சிறந்த ஒரு தொழிலை பெற்றுக்கொடுத்துள்ளார்.தனது இளைய மகள்மாருக்கும் சிறந்த கல்வியைப் பெற்றுக்கொடுக்க முயற்சி செய்கிறார்.

**சவால் :-** முதற்தடைவ அவரிடம் இது தொடர்பில் பேசும் போது அவர் ஏற்றுக்கொள்ளவில்லை. தனது மகளை ஏதேனும் ஒரு வேலைக்கு அனுப்ப வேண்டும் இனிமேலும் பாடசாலைக்கு அனுப்ப முடியாது என்றே தெரிவித்தார். அவரின் இந்த மனப்பாங்கை எப்படி மாற்றுவது என்பதே எனக்கு சவாலாக அமைந்தது.

**பின்தொடரல் செயற்பாடு :-** குமாரின் பிள்ளைகள் மூலம் அவரின் நடத்தைகளை கண்காணிக்கின்றேன் மறறும் எனது நேரடிக் கண்காணிப்பு வேலையின் ஒரு பகுதியாக மேற்கொள்ளப்படும்.

**முடிவுரை :-** தனிப்பட்ட ரீதியிலான ஆலோசனை வழங்குதல் சமூக மாற்றத்திற்கு வித்திடும்

## Uplifting the economy of individuals by reducing alcohol consumption

Author :- V.Ravichandran

**Background :-** Kumar, who lives in Thankakalle lower division, is the father of three girls. He is a labourer who works for daily wages. Kumar's wife works as an estate labourer and works outside of it also for monthly income. Kumar consumes alcohol everyday and he spends Rs. 400.00 out of his income each day on alcohol. He told that even though his eldest daughter got good results in G.C.E. ordinary level examination, she is unable to continue her studies in advanced level as he does not have enough income.

**Methodology :-** I discussed with Kumar's daughter about the family situation. I had personal discussions with the relevant person. I discussed about why he wants to consume alcohol, the amount of money spent on alcohol and what things he can do by saving that money. Discussions with him were continued and his activities were monitored via his daughter too. Following continuous supervision, Kumar agreed to stop his habit of alcohol consumption and to spend that money on his children's education.

**Results :-** Kumar has totally stopped alcohol consumption. He has made his eldest daughter to study advanced level and found a good job for her. He is trying to provide good education to his younger daughters also.

**Challenges :-** He did not agree when spoken with him for the first time. He told that he should send his daughter to some kind of job and cannot let her go to school anymore. How to change his attitude was the challenge to me.

**Follow up :-** I supervise/monitor the activities of Kumar via his daughters, and my direct supervision will be done as a part of the job.

**Conclusion :-** Personal counselling is an effective approach to initiate change in the community.

PP

40

த

## மதுசார பாவனையைக் குறைத்தலும் வருமான மூலங்களை அதிகரித்தலும்

எழுத்தாளர் :- திருமதி. இருதயசாமி

**பின்னணி** :- தங்ககல்லை கீழ்பிரிவை சேர்ந்த முருகையா தினக்கூலிக்கு தொழில் புரிபவர். இவருக்கு 04 பெண்பிள்ளைகள் உள்ளனர். இவரின் மனைவி தோட்டத்தொழிலாளி. முருகையா தினமும் பெறும் வருமானத்தில் ரூபா 1000 இற்கு சாராயம் குடிப்பார். கிடைக்கும் முழுத்தொகையிலும் சாராயம் குடித்து விட்டு வரும் சந்தர்ப்பங்கள்தான் அதிகம். சாராயம் குடித்துவிட்டு வந்து மனைவி, பிள்ளைகளுடன் சண்டையிடுவதும் அவர்களுக்கு பெரும் துன்புறுத்தலாகவிருந்தது.

**செயற்பாடு** :- முருகையாவின் பிள்ளைகள் மூலமாகவே அவரிற்கு பிரதிபலிப்புக்கள் வழங்க எத்தணித்தேன். அதனால் பிள்ளகளுடன் தந்தையின் செயல்கள் பற்றியும் சாதகமான மாற்றத்தின் நன்மைகள் பற்றியும் கலந்துரையாடினேன். மதுசாரத்திற்கு செலவழிக்கப்படும் பணத்தொகை தொடர்பிலும் சேமிப்பில் இருக்கும் அனுகூலம் பற்றியும் தெளிவூட்டப்பட்டது. மனைவியின் வாயிலாகவும் பொருளாதா வீண்விரயம் முருகையாவிற்கு எடுத்துறைக்கப்பட்டது. வீட்டுத்தோட்டம் செய்வதற்கு முருகையாவிற்கு ஊக்கமளித்தேன்.

**பெறுபேறு** :- காய்கறி தோட்டத்தினால் பெறும் இலாபத்தை முருகையாவின் குடும்பம் ஈட்டிக்கொண்டது. பிள்ளைகளின் கல்விக்கு தேவையான செலவீனங்களை தாராளமாக மேற்கொள்ள முடிகின்றது. தினமும் சாராயம் குடித்தவர் இப்போது மிக அரிதாக எப்போதாவது மட்டுமே குடிக்கின்றார். மனைவியையும், பிள்ளைகளையும் அன்பாக கவனித்துக்கொள்வதோடு வீட்டினில் சாராயம் குடித்த பின்னர் ஏற்பட்ட சண்டைகள், சத்தங்கள் இப்போது இல்லை.

**சவால்கள்** :- இவ்வகையான செயற்பாடுகளை மேற்கொள்ளும் நபர்கள் முருகையாவிடம் சென்று பேசினாலே கோபப்படும் சுபாவம் கொண்டவர். ஆரம்பத்தில் அவருடன் பேசுவது மகவும் கடினமாக இருந்தது.

**பின் கண்காணிப்பு செய்பாடு** :- முருகயாவின் பிள்ளைகள் மற்றும் மனைவி மூலமாக அவரின் செயற்பாடுகளை கண்காணிக்க முடியும் அதே வேளை எனது வேலையின் ஒரு பகுதியாகவும் இதனை இணைத்துள்ளேன்.

**முடிவுரை** :- உணர்வுப்பூர்வமான விடயங்களை மையமாக வைத்து மதுசார பாவனை தொடர்பில் கலந்துரையாடும் போது மாற்றங்களை அவதானிக்கலாம். ள

**Reducing the alcohol consumption and increasing the sources of income**

Author :- Mrs. Iruthayasaami

**Background :-** Murugaiyya, of Thankakalle lower division is a labourer who works for daily wages. He has four daughters. His wife is an estate labourer. Murugaiyya drinks alcohol worth of Rs. 1000.00 out of his daily income. In most instances, he comes home after drinking alcohol for all of his income. Fighting with his wife and children after consuming alcohol was a big harassment for them.

**Methodology :-** I tried to give proper reflections to Murugaiyya through his own children. So I discussed with the children about their father's activities and the benefits of positive changes. It was clarified regarding the amount of money spent on alcohol and the benefits of the habit of saving. Murugaiyya was told regarding economic wastages, through his wife also. I encouraged Murugaiyya to make a home garden.

**Results :-** Murugaiyya's family earned the profit from the vegetable plot. They can afford well for their children's educational expenses. The person who drank daily now drinks very rarely once in a while. He takes good care of his wife and children; there are no more fights and quarrels which used to happen at home after consuming alcohol.

**Challenges :-** Murugaiyya had the attitude of becoming angry even when someone who involved in these activities spoke with him. So at the beginning it was very difficult to talk with him.

**Follow up :-** I can supervise the activities of Murugaiyya through his wife and daughters. In the mean time I have affiliated this as a part of my job.

**Conclusion :-** By using sensitive approaches to explain the benefits of minimizing alcohol use for users, alcohol expenditure can be drastically reduced.

PP

41

ඇ

## පුස්තකාලයේ ඵලදායී මැදිහත්වීම හරහා පාඨක ප්‍රජාව මද්‍යසාර හා සිගරට් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම අවම කිරීම

කතෘ :- ඒ.ජී.එන්.පී.මංගලිකා

**පසුබිම** :- ප්‍රදේශය තුළ මද්‍යසාර සිගරට් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවී ඇති පිරිසක් මෙන්ම ඒ සඳහා අලුතින් පිරිසක් යොමු කරවා ගැනීමට විවිධ උපක්‍රමයන් සිදුවන බව හෙළිවිය. එමෙන්ම මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ඇති තොරතුරු සොයා එන පාඨකයන් ද සිටී. එබැවින්, නිවැරදි තොරතුරු පාඨක ප්‍රජාව වෙත ලබාදෙමින් ඔවුන්ට මත්ද්‍රව්‍ය භාවිතයේ සැබෑ ස්වරූපය හඳුනාගෙන එයින් නිදහස් වීමට අවශ්‍ය සහයෝගය ලබාදීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- පුස්තකාල පරිශ්‍රය තුළ ඵලදායී මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ ඇතුළත් බැනර් ප්‍රදර්ශනය කිරීම, යාවත්කාලීන තොරතුරු ඇතුළත් තොරතුරු බහාලනයක් පවත්වාගෙන යාම, විශේෂිත උත්සවවලදී බැනර් ප්‍රදර්ශනය කිරීම, ඇඩික් ආයතනය හා සක්‍රීයව සම්බන්ධවෙමින් දුරකතන ඇමතුම්, ලියුම්, ප්‍රශ්නාවලි සඳහා පිළිතුරු ලබාදීම, භාවිතයට යොමුවූවන්ට මෙන්ම නිදහස්වීමට සහයෝගය අවශ්‍ය අය අදාල අංශ වෙත යොමුකරලීම, සම්මුඛ සාකච්ඡා මගින් විසඳුම් ලබාදීම සිදුකරන ලදී. පුස්තකාලය භාවිතා නොකරන ත්‍රීරෝද හා බස් රථ රියදුරන් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාවද දැනුවත් කිරීම, ප්‍රචාරක රථ යොදාගනිමින් දැනුවත් කිරීම් සිදුකිරීම.

**අභියෝග** :- මෙම ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේදී විවිධ පුද්ගලයන්ගේ තර්ක විතර්ක ආකල්ප වෙනස් කිරීමට සාකච්ඡා කිරීමට වැඩි කාලයක් ගත කිරීමට සිදුවීම. විවිධ සමාජතල හා අත්දැකීම් ඇති තරුණ පිරිස් කාන්තාවන් ඇතුළු ප්‍රජාව එකවර දැනුවත් කිරීම ප්‍රතිඵලදායක නොවන බැවින් ඒ සඳහා ඔවුන්ව වෙන් වෙන්ව එක්රැස් කිරීම අපහසු වීම. කෙටි කාල සීමාවක් තුළදී පෝස්ටර් ස්ටිකර්ස් ගලවා දැමීම.

**ප්‍රතිඵල** :- වීරත්වය, වින්දනයක්, ආශාවක් ජනිතවන බව, වෙහස නිවිය හැකි බව, තාවකාලික විනෝදයක් අත්විඳිය හැකි බව පැවසූ තරුණ තරුණියන් 102 කින් 78 දෙනෙකු පමණ මත්ද්‍රව්‍ය දුම්වැටි භාවිතයෙන් ඉවත්වී ඇති බව, සිගරට් අලෙවිකරණය නවතා දැමීමට එකග වූ වෙළඳසැල් 21න් 13ක් සිගරට් අලෙවිය නවතා ඇති බවට සමීක්ෂණයකින් තහවුරු කර ගැනීම. මෙම ගැටලුවට මැදිවූ කාන්තාවන්ට එය විසඳා ගැනීමට හැකිවූ බව, ස්වාමි පුරුෂයාගේ භාවිතයේ වෙනසක් දකින්නට ලැබුනු බව ප්‍රකාශ කර සිටීම.

**පසු විපරම** :- තොරතුරු යාවත්කාලීන කිරීම නිසි ආකාරයකින් සිදුවිය යුතු වීම, නව නිර්මාණශීලි ක්‍රියාකාරකම් ඔස්සේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුවීම, භාවිතයෙන් ඉවත්වන්නන් සහ ධනාත්මක වෙනස්වීම මෙන්ම ක්‍රියාකාරකම් ඔස්සේ ලැබෙන ප්‍රතිඵල අන් අය සමග සාකච්ඡා කිරීම.

**නිගමනය** :- තොරතුරු යාවත්කාලීන කිරීම, නිවැරදි තොරතුරු පාඨකයාට ලැබෙන්නට සැලැස්වීම හා ඉලක්ක කණ්ඩායම් වෙන වෙනම ඇමතීම මගින් වඩාත් ඵලදායක ප්‍රතිඵල ලබාගත හැකිබව.

**Minimizing the usage of narcotics including alcohol and tobacco among the Library Members through the effective intervention of Public Library.**

Author :- A. G. N. P. Mangalika

**Background** – We have identified there is a group of community around the near-by are using narcotics including alcohol and tobacco. Further, we revealed there are hidden agendas that are carried out to divert the community to use narcotics. However, there is a group of library members who are enthusiastic in prevention of alcohol and tobacco which lead them to do researches and projects on this issue. They are seeking information and data from the library for their projects.

**Objective** – To support the readers' community to prevent and stop narcotics consumption by identifying the reality of narcotics usage by providing accurate information.

**Methodology** – In view of the objective, banners contain prevention messages were displayed in the library premises and they were updated regularly. Further the banners were displayed in special occasions. An information container was maintained in the library for the community who seek information regarding narcotics. Problems emerged through the community were discussed and resolved with active involvement of the ADIC. Further, people who needed help to get free from narcotics were referred to the relevant institutes with the help of ADIC. The group of people who are unable to join with the library were made aware separately through leaflets, posters, stickers and advertising chariot.

**Challenges** – To change the altitudes and wrong believes of the community consumed a big period of time throughout the implementation of the program. The community was composed of various categories of people. Therefore, we realized that it will be ineffective to approach them as one group. But, gathering separately was not become easy. Further, posters and banners were removed within a short period.

**Results** – The narcotics consumers were in an altitude regarding it as it is for heroism, fun, addictive, relaxant and temporary amusement. According to the results, 78 out of 102 young consumers have stopped consuming alcohol and tobacco. 21 shops have agreed to stop selling cigarettes. 13 out of it have already stopped. Women who were suffered from their husband's alcohol consumption stated that they were able to see a difference of them after the program.

**Follow up** – Updating the information in an effective and accurate manner. Continuing the awareness through new creative programs and activities. Follow up the people who stop consumption and make the community aware about the benefits they received via organizing discussions.

**Conclusion :-** Fruitful results can be obtained through updating of information, delivering correct information to readers and addressing the target group seperately.

PP

42

අ

## සිගරට් දුමෙන් නිදහස් පොදු ස්ථානයක් ඇතිකිරීම

කතෘ :- ඩබ්.ඒ. වී.එල්. අයේෂා ප්‍රියන්ති

**පසුබිම** :- හොරණ කිදෙල්පිටිය ක්ෂේත්‍ර තුළ  දුම්වැටි භාවිතා කරන පුද්ගලයින් 50%-60% ක්, මද්‍යසාර භාවිත කරන්නන් 75%ක් වේ. දෛනික වැටුප ලබන මොවුන්  සිගරට්, ගංජා, කසිප්පු හෝ අරක්කු භාවිතා කරයි. මේ නිසා ගර්භණී මව්වරුන් සහ දරුවන් සහිත පවුල් 50%ක් පීඩාවට පත්වේ. මෙම පරිසරයේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට මැදිහත්වීම අසීරු කරුණකි. ක්‍රියාකාරකම සඳහා තෝරාගත් ස්ථානය සැලූන් එකක් වන අතර දිනකට පිරිමි පුද්ගලයින් 10 -15 ත් අතර ප්‍රමාණයක් කොණ්ඩා කැපීමට එතැනට පැමිණේ. පැමිණෙන පිරිමි අයගෙන් 7-8ක් දුම්වැටි භාවිතා කරයි. මාගේ දරුවාගේ කොණ්ඩය කැපීම සඳහා සැලූන් එකට යන සෑම අවස්ථාවකදීම දෙතුන් දෙනෙකු සිගරට් උරමින් සිටියි. වැඩිපුර සේවාලාභීන් පැමිණෙන නිසා තම කාර්යය සිදු කර ගැනීමට වැඩි වෙලාවක් එහි රැඳීමට සිදුවේ. එමනිසා සැලූන් එක සිගරට් දුමෙන් නිදහස් පරිසරයක් බවට පත් කිරීම අරමුණු විය.

**ක්‍රමවේදය** :- වැඩි වෙලාවක් සිගරට් දුමෙන් අපිරිසිදු වූ පරිසරයක ජීවත්වීම සිගරට් භාවිතා නොකරන අයටද හානියකි. මෙම තත්වය මඟහරවා ගැනීමට මා ''අපේ තාත්තා අරක්කු බොන්නේ  නැත්තේ මට ආදරෙ හින්දයි'' ''ඒ නිසා අපේ ගෙදර සිගරට් දුමෙන් නිදහස්'' යන ස්ටිකර් දෙක සැලූන් එක තුල ඇලවීම. සිගරට් දල්වාගත් දෙදෙනකු සිගරට් උරන්නට පටන් ගත්විට තවත් අයෙක් ඉහත වැකි ශබ්ද නගා කියවන්නට පටන් ගත්හ. එවිට ඔවුන් සිනාසී සිගරට් එක නිවා ගනිමින් එතනින් ඉවත් විය. එසේම මෙම පණිවිඩ එතැනට පැමිණෙන වැඩි දෙනාගේ කතාබහට ලක් විය. සැලූන් හිමිකරු ද මෙම තත්වය නිසා දැඩි අපහසුතාවයට ලක්ව සිටි අතර මෙම තත්වය නැවැත්වීමට ඔවුට ගත හැකි පියවරක් නොමැතිව සිටියේය. ඉහතින් සඳහන් කල ස්ටිකර් දෙකද උපයෝගි කර ගනිමින් හිමිකරු සිගරට් භාවිතා කරන අය සමග  සාකච්ඡාව ආරම්භ කළහ. මා විසින් සිගරට් භාවිතයේ  සහ මද්‍යසාර භාවිතයේ හානිය පිළිබඳව අත්පත්‍රිකා වරින් වර එන අයට කියවීම සඳහා සැලූන් එකේ හිමිකරු හරහා ලැබෙන්නට සැලැස්වීම.

**අභියෝග** :- "අපිට සිගරට් එකක්වත් බොන්නට බැහැනේ නිදහසේ ඇයි අපි එක්ක තරහයි ද" යනුවෙන් සමහර  පුද්ගලයින් මෙම කටයුත්තට අප්‍රසාදය පළ කළහ.

**ප්‍රතිඵලය** :- මේ වන විට මෙම සැලූන් එක හා අවට පරිශ්‍රය සම්පූර්ණයෙන්ම සිගරට් දුමෙන් නිදහස් පරිසරයකි. නිකරුණේ කාලය ගත කරන අය මත්ද්‍රව්‍ය පිළිබඳව ඇති අත්පත්‍රිකා කියවීම, පුවත්පත් කියවීම ආදියට යොමුවී ඇත.

**පසුවිපරම** :- දරුවාගේ කොණ්ඩය කැපීමට යන අවස්ථාවලදී මෙන්ම එම ස්ථානයෙන් යන අවස්ථාවලදී පවතින තත්වය සොයාබලයි.

**නිගමනය** :- නිර්මාණාත්මක ක්‍රම හරහා සුළු මැදිහත්වීමකින් පවා අක්‍රිය දුම්පානයෙන් බොහෝ පිරිසක් මුදවාගත හැකි බවයි.

PP
42
A

## Establish a smoke free common area

Author :- W.A.V.L Ayesha Priyanthi

**Background :-** 50-60% of the people used to smoke cigarettes and 75% of people drink alcohol. majority of them have low income. Due to this alcohol and substance use in families including pregnant mothers and children have faced to many difficulties. It was really difficult to interfere to this community to conduct a drug prevention program. We selected a saloon in the area as the place to conduct the program. 10-15 people come to the saloon per day. Out of them 7-8 people used to smoke cigarettes. When I took my son to the saloon to have a hair cut there were 2-3 smoking people. Sometimes we had to wait for hours due to the queue. So the ultimate target of my program was to make this salon a smoke free area.

**Methodology :-** Spending more time in an area with smokers will affect the nonsmokers as well. So I displayed stickers including statements discourage smoking. When 2 people started to smoke inside the saloon another one started to read the statements loudly, so the 2 smokers stopped smoking and left the area immediately. Majority of the customers came to the saloon have started to discussing the messages given by the stickers. Saloon owner also have faced too many difficulties due to the smokers, so he started to discuss with the people who smoke inside the saloon. It was provided some leaflets which include the harmful effects of smoking to the customers.

**Challenges :-** Some smokers have expressed their censure to us.

**Results :-** Now the salon area has completely become a smoke free area. People have started to read leaflets, newspapers regarding drug prevention in their leisure time.

**Follow up :-** I continued to observe the area as possible as I can.

**Conclusion :-** We can protect people from passive smoking through creative and small interventions.

PP

43

අ

## අරක්කු සහ සිගරට් භාවිතය අවමවීම තුලින් ප්‍රචණ්ඩත්වයට ලක් වූ ළමුන් හා කාන්තාවන් සතුටින් සිටීම

කතෘ :- පී. එස්. උද්ධිකා

**පසුබිම** :- හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කහඳමෝදර ග්‍රාමසේවක වසමට අයත් කහඳමෝදර ගම්මානයේ වැඩිපුර ජීවත්වෙන්නේ ධීවර කර්මාන්තයෙනි. ළමා ලෝකය නිදහසේ භුක්ති විඳීමට නොහැකිවීම සහ සැමියා ගෘහමූලික වූ පවුල් සංස්ථාව තුල කාන්තාව අසරණ තත්වයට පත්වීම, තම සැමියාගේ මුදල්වලින් වැඩි ප්‍රමාණයක් අරක්කු සහ සිගරට් භාවිතයට යෙදවීම නිසා ආර්ථික අපහසුතාවයන්ට ලක්වීම ප්‍රධාන ගැටළුවේ. ගමේ පවුල් 280කට ආසන්න ප්‍රමාණයක් ඇත. මෙම පවුල්වලින් වැඩි ප්‍රමාණයක් පිරිමි අරක්කු හා සිගරට් භාවිතයට ඇබ්බැහිවී සිටින අතර ඔවුන් නිසා දරුවන් බිරින්දෑවරුන් ප්‍රචණ්ඩත්වයට ලක්වීම සුලභය. කහඳමෝදර ගම්මානය මත්ද්‍රව්‍යවලින් තොර ගම්මානයක් බවට පත්කිරීම අරමුණ විය.

**ක්‍රමවේදය** :- ගමේ නායක ස්වාමීන් වහන්සේලාද, ග්‍රාම නිලධාරිතුමාද, පෙර පාසල් හා පාසල් ගුරුවරුන්ද, පවුල් සෞඛ්‍ය නිලධාරීතුමියද, විවිධ සංවිධානවල නිලධාරින්ද සම්බන්ධ කරගෙන ළමා සමාජයේ ළමුන් 100ක් පමණ සහභාගිත්වයෙන් වැඩසටහනක් පවත්වන ලදී. එහිදී අරක්කු සහ සිගරට් භාවිතා කළොත් සිදුවන කෙටි කාලීන හා දිගුකාලීන හානි ගැන පිරිස දැනුවත් කරන ලදී. තරුණ ළමයි වැව ළග ගහක් යට අරක්කු බීමට පුරුදුවී සිටි අතර එම ගහ වටේට 'අරක්කු බිව්වම මෝඩ පාටයි' යන පෝස්ටරය අලවන ලදී. අරක්කු සහ සිගරට් බොන අයගේ බිරින්දෑවරුන් හමුවී ඒ සඳහා යන වියදම පෙන්වාදෙන ලදී. අරක්කු භාවිතය සම්බන්ධයෙන් තිබෙන මිත්‍යා මත පිළිබඳ සාකච්ඡා කරන ලදී.

**අභියෝග** :- දෙමාපියන් විසින් ළමුන් ළමා සමාජයට එවන එක නතර කිරිමට උත්සහ කලා. කාන්තාවන් බලගැන්වී සිටි පවුල්වල සමහර සැමියන් අපට ඇවිත් කිව්වා "පුලුවන්නම් බොන එක නතර කරලා පෙන්නන්න" කියලා. 'බැරි වැඩ කරන්න යන්න එපා' කියලා ගමේ මිනිස්සු කිව්වා. බොන අය 'බොනවාමයි' කිව්වා.

**ප්‍රතිඵල** :- කාන්තාවන් සහ ළමයින් සතුටින් සිටින පවුල් 10 ක් තිබීම. වැව ළග අරක්කු බොන එක නතරවීම. අරක්කු සහ සිගරට් භාවිතය නැවැත්වූ පුද්ගලයින් 25 කට ආසන්න ප්‍රමාණයක් ඇත. ප්‍රචණ්ඩත්වය අවම වූ පවුල් 6 ක් ඇත. දෙමාපිය රැස්වීම්වලට අරක්කු බීලා ගිය තාත්තා කෙනෙක් දැන් අරක්කු නොබී යාම. නිලධාරින් , දරුවන් ඉදිරියේ සිගරට් බොන එක අවමවීම. පිරිමි අය අරක්කු බීලා ඇවිත් බිරිද සමග රණ්ඩුවෙන එක, ළමයින්ට බනින එක ගැන ගමේ අනික් පිරිමි අය පසු දින කියන්න ගත්තා. ඔවුන්ව අපහාසයට ලක් කළා.

**පසුවිපරම්** :- නිතර ළමයි හමුවී සාකච්ජා කිරිම. නිවෙස්වලට ගොස් කතා කිරිම. ගෘහ පිවිසීම්වලදී, කාන්තා සමිතිවලදී කාන්තාවන් සමග කතා කිරිම. අනෙක් නිලධාරින් හරහාද සොයා බැලීම.

**නිගමනය** :- නිරන්තර ගෘහ පිවිසීම් වඩා ප්‍රතිඵලදායකවේ.

**Minimizing alcohol and cigarette consumption to prevent domestic violence.**

Author :- P. S. Uddhika

**Background :-** Kahandamodara village in Thangalla Divisional Secretariat of Hambanthota District is a fishery village. There are 280 families live in this village. Husband is the head of the family and most of them have addicted to alcohol and cigarettes. They spend a lot of money on cigarettes and alcohol which leads to financial problems in families. Further, domestic violence is another major issue faced by the women whose husbands addicted to alcohol. Therefore alcohol and cigarettes have made the lives problematic and difficult for the children and women in the village.

**Methodology :-** An awareness program was organized with the participation of the head Thero of the village, Grama sewa officer, teachers, public health midwife and representatives from several associations. Apart them 100 children from Children's society participated. Short and long term damages of alcohol and cigarettes was the main topic of the program. Along with that expenses for alcohol and cigarettes calculated with the participants. Further, myths regarding alcohol and cigarettes were discussed. A poster campaign was done at a place where young people gathered to use alcohol, titled ''arakku biwwama mooda paatai''.

**Objective :-** To develop the Kahandamodara village in to narcotic free area

**Challenges :-** While implementing the awareness program, some parents stopped their children's attendance to the Children society. We were threatened and discouraged by the villagers who addicted to alcohol and cigarettes.

**Results :-** 10 families stated that they live happily without alcohol and cigarettes. There are 25 people who have stopped the consumption of alcohol and cigarettes. Further, domestic violence has get reduced in 6 families. Smoking in public and in front of children is becoming less. Alcoholics who are victims of domestic violence are criticized by the villagers.

**Follow up :-** Regular visits were done to the Children's society and. Discussed the current situation in their families. Further, follow up done through the Women societies and official personals of the village.

**Conclusion :-** Frequent home visits for make people aware on alcohol and tobacco issue is very effective.

PP

44

අ

## අරක්කු සිගරට් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍යවලට වටිනාකමක් ලබා නොදෙන ගමක් නිර්මාණය කිරීම

කතෘ :- චන්ද්‍රලතා ද සිල්වා

**පසුබිම** :- එකමුතුගම ගම සිගරට් සහ අරක්කු භාවිතය බහුලව පැවති ගමකි.එයට හේතුව තිස්ස නගරයට ආසන්නව පිහිටා ඇත.එදිනෙදා වැඩ කරමින් මුදල් උපයා ගනී. මෙම මුදල් අරක්කු සමාගම් වලට, සිගරට් සමාගම් වලට යනඑක නවතා ආර්ථිකය ශක්තිමත් කිරීම මගේ අරමුණ විය. එමෙන්ම සමගිය ඇති කිරීම,පවුලේ සුරක්ෂිතභාවය ඇති කිරීම මාගේ අවශ්‍යතාවයක් විය.

**ක්‍රමවේදය** :- ක්‍රමවේදයන් කිහිපයක් භාවිතා කරන ලදී. ප්‍රථමයෙන් ළමා සමාජය දැනුවත් කරන ලදි.කාටූන් හරහා කොහොමද ළමයින් අල්ල ගන්නේ,අරක්කු සිගරට් බොන කෙනා කොහොමද වීරයෙක් වගේ පෙන්නන්නේ කියලා කියලා දුන්නා.එසේ මාධ්‍යයෙන් පෙන්නුවට අරක්කු සිගරට් බොනකෙනා සැබෑ වීරයෙකු නොවන බව පැහැදිළි කර දුන්නා. අරක්කු සිගරට් බිව්වාම සිදුවන හානිය තොල් කළු වෙන එක,දත් කහ පාට වෙනවා,ගඳ ගහනවා,ඇස් බොර පාට වෙනවා, වයසට වඩා වයස පෙනුම ලැබෙනවා මේ ගැනත් කියලා දුන්නා. යෞවන යෞවනියන් සමග කතා කළා. සිගරට් බොන අයට ලිංගික අප්‍රාණිකත්වය ඇති වෙනබව පැවසුවා. එමනිසා කවදා හරි කසාද බඳිනවානම් සිගරට් බොන කෙනෙක් බඳින්න එපා කිව්වා. ගර්භණී මව්වරුන්ද දැනුවත් කලා. ගර්භණී මව සිගරට් දුමට නිරාවරණය වුනොත් උපදින දරුවාට වන හානිය පැහැදිළි කර දුන්නා. කාන්තා සමිතිවලදී ආර්ථික හානිය ගැන පැහැදිළි කළා.සැමියා සිගරට් බොනවානම් කොපමන මුදල් ප්‍රමානයක් වියදම් වෙනවාද? ගනන් හදලා පෙන්නන්න කිව්වා. අරක්කු භාවිතය හා තිබෙන මිත්‍ය මත පිළිබදව කතා කලා. අරක්කු සිගරට් භාවිතා කරන අයට නිවැරදි ප්‍රතිචාර දක්වන අකාරය මේ සියළු කණ්ඩායම්වලට පැහැදිළි කර දුන්නා. පෝස්ටර් ගසන ලදී. උපකාර පංතිවලටද ගොස් දැනුවත් කරන ලදී.

**අභියෝග** :- ගමේ පුද්ගලයන්ගෙන් බැනුම් අහන්න සිදු වුනා. ඔවුන් හිනා වුනා පුලුවන් වැඩක් කරන්න කියලා.මුලින්ම කාන්තාවන් කිව්වා මත්ද්‍රව්‍ය නිවාරණය කාන්තාවන්ට කරන්න බැහැ කියලා. "පිරිමි අය ඕවා අහන්නේ නැහැ" කිව්වා. අපට පිරිමින්ගෙන් බැනුම් අහන්න වෙයි කිව්වා. යෞවන යෞවනියන් ප්‍රතිචාර දැක්විමට අකමැති වුනා.

**ප්‍රතිඵල** :- උත්සව අවස්ථාවන්වලට අරක්කු ලබා නොදීම. අරක්කු සිගරට් භාවිතා කරන පුදුගලයන් අවම විම.කාන්තාවන් නිවැරදි ප්‍රතිචාරයන් දැක්වීම. ළමා සමාජයේ ගැහැණු ළමයි තමන්ගේ මල්වර උත්සවයට අරක්කු ගේන්න එපා කියලා දෙමාපියන්ට පැවසීම. ළමා සමාජයේ ළමයි සිගරට් භාවිතා කරන අයට ප්‍රතිචාර දැක්විම.

**පසුවිපරම්** :- නිතර නිතර මෙම කණ්ඩායම් හමු වී සාකච්ජා පැවැත්විම. සිගරට් විකුනන්නේ නැති වෙළඳසැල් වෙත ගමේ නොවන අය යවා සිගරට් ඉල්ලා සිටිම. වෙනස් වන පුද්ගලයින්,මත්ද්‍රව්‍ය නිවාරණය සිදුකරන අය අගය කිරිම. වාසි තත්වයන් කතා කිරිම

**නිගමනය** :- නිවැරදි ප්‍රතිචාර දැක්වීම තුලින් හා ප්‍රායෝගිකව කරුණු පහදාදීම තුලින් ප්‍රජාවක් වෙනස් කළහැක.

**Make a village with no added values to the alcohol, cigarettes and to other substances**

Author :- Chandralatha de Silva

**Background :-** Ekamuthugama is a well known area of alcohol and cigarette users. As it situated closed to Thissa town is a major reason for that. Majority of the community used to work in the same area and almost all of them are daily income earners. My aims were to stop the wastage of the money due the cigarette and alcohol and strengthen the economy. Improvement of the family harmony and ensure security of the families were other targets of this survey.

**Methodology :-** We used several methods to implement the program. First we educate the children society. We explained them about the promotion strategies of tobacco and alcohol companies. We explained them that there are so many myths regarding substance use and using those substances will not make a hero as they show it in the media. Ultimate results of using alcohol and cigarettes such as darkening of the lips, smelling were described to them in details.

We spoke to the young group of the village and make them aware regarding the sexual problems caused by smoking. We told them not to marry a smoker. We educate the pregnant mothers regarding the harmful effects which could happen to the unborn child. In women societies we calculated and showed them the money spent for the cigarettes. We discussed about the myths related to alcohol use. We were able to conduct a poster campaign and awareness program in tuition classes.

**Challenges :-** some villagers scolded to us. They try to discourage us by saying that the drug prevention cannot be done by women. Some people could not pay attention to respond to us.

**Results :-** Some villagers have decided not to give alcohol in functions and special occasions. We could able to reduce the number of alcohol, cigarettes users, women and the children in the village have started to respond to the substance users.

**Follow up :-** Having the discussions frequently, observe the shops and appreciate the ones who actively participate to drug prevention campaign and discuss about the advantages were done as follow up.

**Conclusion :-** Correct responses and practical explanations can lead to possitive change in a community.

PP

45

අ

**දුම්වැටි හා මද්‍යසාර භාවිතය අවම කිරීම තුළින් සතුටු පවුල් ගොඩනැංවීම සඳහා ප්‍රජාව සවිබල ගැන්වීම.**

කතෘ - ටී.එම්. නවරත්න මැණිකේ, ඩබ්.පී. නිමල් කරුණාතිලක, ඩී.එම්. කරුණාරත්න

**පසුබිම** :- අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ග්‍රාම නිළධාරි වසම් 661 ක් සහ සමෘද්ධි වසම් 05 ක් අයත් වේ. මුළු ජනගහනය 64357 ද ඉන් 9484 ක් දුම් පානයට හා මද්‍යසාර භාවිතයට නැඹුරු වී ඇත. (සමීක්ෂණය - 2015) ප්‍රදේශයේ වැඩි පිරිසක් අඩු ආදායම්ලාභීන් ය. මේ ප්‍රදේශයේ අග්බෝව, යත්තල්ගොඩ, උඩගන්කන්ද, මිරිහෙළිය, දමුණුපොළ, කන්දෙගෙදර, නෑබඩවතුර, වසම්වල මත්ද්‍රව්‍ය භාවිතය බහුලව පවතින බවත්, මේ ප්‍රදේශයේ තරුණ පිරිස් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි නැඹුරුවීමෙන් ගැටලුකාරී තත්වයක් උග්‍රවෙමින් පවතින බව රාජ්‍ය නිළධාරිගෙන් හා ප්‍රජාවෙන් වාර්තා විය.

**ක්‍රමවේදය** :- අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තුළ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි විශාල නැඹුරුවක් ඇති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කමිටු රැස්වීමක දී සාකච්ඡා වී ඇත. එහි දී ප්‍රාදේශීය ලේකම් විසින් සමෘද්ධි මහා සංගමයේ කළමණාකාර අධ්‍යක්ෂට මේ පිළිබඳව සොයා බලා වැඩපිළිවෙළක් සකසන ලෙස දන්වා ඇත. ඒ අනුව සමෘද්ධි මහා සංගමයෙන් මේ සඳහා මැදිහත් වී මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. ඒ අනුව පළමු සාකච්ඡාව සමෘද්ධි මහා සංගමයේ නිළධාරීන් සමග පවත්වා සමෘද්ධි වසම් පහ යටතට බහුලව ගැටළුකාරී තත්වයන් තිබෙන වසම් සඳහා මූලික දැනුවත් කිරීමේ සහ ප්‍රජාව නිවාරණය සඳහා සවිබල ගැන්වීමේ වැඩමුළු 05 ක් සිදු කිරීමට තීරණය විය. ඒ අනුව වඩුවාව, වැලිකරය, බෝයවලාන, වැරැල්ලගම, තුඹුල්ල, යන වසම් වල ප්‍රජාමූල සමිති නායකයින් 40 බැගින් තෝරාගෙන වැඩසටහන් 05ක් සිදුකරන ලදී. ඉහත වැඩසටහන් තුළින් මත්ද්‍රව්‍ය නිවාරණයට ප්‍රජාව සවිබල ගැන්වීම මූලික අභිප්‍රාය විය. දෙවන අදියර ලෙස ප්‍රජාවගේ මැදිහත්වීමෙන් දුම්වැටි අලෙවිය නතර කිරීම. තෙවන අදියර දුම්වැටි සහ මද්‍යසාර භාවිතයට යොමු වූ තරුණ සහ වැඩිහිටි ප්‍රජාව සඳහා දින 05 ක ප්‍රජාමූලික කඳවුරු පැවැත්වීම.

**අභියෝග** :- දැනුවත් කිරීම සඳහා ප්‍රජාව රැස් කර ගැනීමේ අපහසුතාවය. මෙවැනි සාකච්ඡාවන්ට මිනිසුන් මැලිකමක් දක්වයි.

**ප්‍රතිඵල** :- මත්ද්‍රව්‍ය නිවාරණය කෙරෙහි ප්‍රජාව සවිබල ගැන්වීම වැඩසටහනේ මූලික අභිප්‍රාය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ තරුණ පිරිස් මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කර ගැනීම කෙරෙහි ප්‍රජාවම යොමුවීම. වසම් මට්ටමින් දුම්වැටි අලෙවිය නතර කිරීමට ව්‍යාපාරික ස්ථාන වෙත ගොස් දැනුවත් කිරීමට ප්‍රජාව මැදිහත්වීම.

**පසු විපරම** :- වසම් මට්ටමින් ප්‍රජා මූල සමිති මාස්පතා රැස්වන අතර රැස්වීම්වලදී පවතින තත්වය පිළිබඳවත්, මතුවී තිබෙන ගැටළු පිළිබඳවත්, සාකච්ඡා කරමින් අවශ්‍ය මැදිහත්වීම් සිදුකෙරේ.

**නිගමනය** :- ප්‍රජා නායකයින් වෙනුවෙන් කළ වැඩසටහන මත්ද්‍රව්‍ය නිවාරණයට පමණක් නොව වෙනත් ප්‍රජා කටයුතු සඳහාද ප්‍රයෝජවත් ආයෝජනයක් විය.

**Empowering the family to improve the family happiness through minimizing of cigarette and alcohol.**

Authors :- T. M. Nawarathna Menike, W.P.Nimal Karunathilake, D.M.Karunarathne

**Background :-** The Alawwa Divisional Secretary's Division consists of 661 Grama niladhari divisions and 05 Samurdhi Divisions. The total population is 64,357 of which 9484 are used to smoke and alcohol (research -2015) with most in the low-income region. Areas of Agbowa, Yatthalgoda, Udagankanda, Miriheliya, Damunupola, Kandegedara and Neebodawathura are reported as areas with high incidence of substance use. Mainly there was a problematic situation among the youth in this area .State officials and the community complain that the situation is getting worsen and worse as the youth involve in this.

**Methodology :-** Discussions have been held with the committee of the Divisional Secretariat on increasing the use of narcotics drugs in the Alawwa Divisional Secretary Division. It was decided to initiate the first discussions with the officers of the Samurdhi and to deliver awareness on the problem. Samurdhi officers were asked to organize a drug prevention campaign Therefore they have decided to conduct 5 workshops for empowerment of the community. Accordingly, 40 community leaders were selected from Waduwawa, Welikaraya, Boyawalana, Werellagama and Thumbulla areas. The main objective was to strengthen the community for drug eradication in the above programs. In the second stage stopping the sale of cigarettes by the intervention of the community was done.

**Challenges :-** The people are reluctant to raise awareness among the community and gathering of the community was difficult.

**Results :-** The main aim was to empower the community on prevention of drug abuse. As a result the community directed to the drug prevention campaign. The community intervened to go to business premises to stop smoking libation at the domain level.

**Follow up :-** At the community level, the community unions meet regularly once a month. At the assemblies they discuss the issues that arise during the program and make approtpriate interventions.

**Conclusion :-** The programme conducted for community leaders was affective for other activities in addition to drug prevention.

PP

46

අ

## ගර්භණී මවගේ ස්වාමිපුරුෂයා ඇමතීම තුළින් ගර්භණී මවට දුම්වැටි, මද්‍යසාර වලින් තොර සුරක්ෂිත සුවදායී පරිසරයක් නිර්මාණය කිරීම

කතෘ :- පී.එච්.චන්දිමා ජයවීර

**පසුබිම** :- පිළියන්දල, පැලැන්වත්ත නැගෙනහිර සායනය තුළ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කලෙමි. වාර්ෂිකව ගර්භණී මව්වරුන් 250කට ආසන්න ප්‍රමාණයක් මෙහි ලියාපදිංචි වේ. ගර්භණී මව්වරුන්ගේ සායනය මාසයකට දෙවතාවක් පැවැත්වෙන අතර දිනකට මව්වරුන් 60-70ත් අතර ප්‍රමාණයක් සහභාගී වේ. මෙම මව්වරුන්ගේ ස්වාමිපුරුෂයින්ගේ සිගරට් භාවිතය 23%ක් වන අතර මද්‍යසාර භාවිතය 60%කි. පාටිවලට අරක්කු ගෙන ඒම ප්‍රබලව ඇත. ළමුන්ට මෙය සාමාන්‍ය දෙයක් වීම සහ එයට කාන්තාවන් සහයෝගයදීම තවත් හේතුවකි. ගර්භණී මව්වරුන්ගේ ස්වාමිපුරුෂයන් මාගේ ප්‍රධානතම ඉලක්ක කණ්ඩායමයි. දුම්වැටි මද්‍යසාරවලට අනුබල නොදෙන පරිසරයක් නිර්මාණය කිරීම ප්‍රධාන අරමුණයි. මෙම කාලය තුළ ස්වාමිපුරුෂයා ඇමතීම තුළින් ගර්භණී මවට දුම්වැටි, මද්‍යසාරවලින් තොර සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කල හැකි බව මාගේ හැඟීමයි.

**ක්‍රමවේදය** :- ගර්භණී මවට සැමියාගේ සිගරට්, මද්‍යසාර භාවිතයේ බලපෑම් කෙසේ සිදුවන්නේ ද යන්න සායනයේදී මෙන්ම සැමියා සහ බිරිඳ සහභාගි වන පූර්ව ප්‍රසව සැසිවලදී අවබෝධය ලබාදුනි. එහෙත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට එක්වරක් ඇමතීම ප්‍රමාණවත් නොවන බව මාගේ හැඟිමයි. සැමියාගේ භාවිතයේ වෙනසක් ලබා ගැනීම උදෙසා ක්‍රම කිහිපයකින් සම්බන්ධ වියයුතු බව මා උගත්තෙමි. එය ක්‍රියාවට නංවමින් ගර්භණී මව මුල්කර ඇයගේ නිවස අවට ප්‍රජාව සිගරට්, මද්‍යසාර භාවිතයට දෙන වටිනාකම් අවම කිරීමේ අරමුණින් කුඩා කාන්තා කණ්ඩායම් නිර්මාණය කරන ලදී. එමෙන්ම ගර්භණී මව්වරුන්ගේ කණ්ඩායම් සඳහා පැවැත්වෙන පෝෂණ ආහාර සකස් කිරීමේ වැඩසටහන්වලදී මෙන්ම ඉපදුනු දරුවාගේ බර කිරන අවස්ථාවලදී ද නැවත මතක් කළෙමි. දරුවා පෙර පාසලට ගියවිට පියාගේ භාවිතය නැවැත්වීමට උනන්දු කරවීම සඳහා අවශ්‍ය පරිසරය දරුවා තුළ නිර්මාණය කළෙමි.

**අභියෝගය** :- 'කොම්පැනිය වහන්න රජයට බැරිද?' 'ඕවා කරලා වැඩක් තියෙනවද' යන්න ප්‍රශ්න කළහ. මාගේ සහෝදර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 'ඔන්න ලකුණු දාගන්න හදනවා' ආදී ප්‍රකාශ වලින් මා අක්‍රිය කිරීමට උත්සහ කළද, මා ඒවාට ඉතා සාර්ථකව මුහුණ දුන්නෙමි.

**ප්‍රතිඵලය** :- පෙර පාසැල් දරුවන් 150න් 35ත් -40ත් ප්‍රමාණයක් සිගරට භාවිතයේ ආදීනව අන් අයට ප්‍රකාශ කිරීම. උදාහරණ වශයෙන් සිගරට් භාවිතා කරන කෙනෙක් වඩා ගත්විට ඔහු ළඟ ගඳ ගසන බව පැවසීම. 22.2% සිගරට් භාවිතය අඩු වීම. මද්‍යසාර භාවිතය 19.1% කින් අඩුවීම.

**පසුවිපරම්** :- පසු විපරම් කටයුතු ගෘහ පිවිසීම්වලදී සිදු කළ අතර මඟ තොටේදී හමුවන විට ද මේ පිළිබඳ විමසීම් සිදු කළෙමි.

**නිගමනය** :- විවිධ ක්‍රම මගින් ප්‍රජාව බලගැන්වීම හරහා සැමියාගේ භාවිතයේ වෙනසක් ඇතිකිරීම වඩාත් සාර්ථක ක්‍රමයක් වේ.

**Addressing husbands of pregnant mothers to build up alcohol and tobacco free, safe and healthy environment for mother and child.**

Author :- G. H. Chandiama Jayaweera

**Background :-** The program was held in Piliyandala, Palanwaththa east maternity clinic. Annually approximately 250 mothers get registered in the clinic. The clinic is conducted twice a month with the participation of 60-70 mothers. According to the information gathered, 23% of husbands of these mothers smoke and 60% consume alcohol. Alcohol has become a much needed thing in parties. Gradually it has become normalized among children and even women tend to promote it. The husbands of pregnant mothers were my targeted group for the program. Main objective was to build up alcohol and tobacco free environment for pregnant mothers. I thoroughly believed that addressing husbands will help to succeed the objective.

**Methodology :-** Both husbands and mothers were educated during regular clinics and specially in antienatal health talks, regarding effects of alcohol and tobacco on pregnant mother. As awareness alone cannot give an effective outcome, I drew my attention on several aspects. Small women groups were established to minimize the value given to cigarettes and alcohol among their nearby community. Mothers were educated and keept updated during nutritious food preparation programs and Child Welfare Clinics. Preschool children were educated at the preschool to create an environment where the child is able to motivate the father to stop narcotics.

**Challenges :-** People around me including other Public Health Midwives tried to discourage me with words such as, ''this is a useless thing, why government do not abolish the companies, and you are trying to put marks on yourself ''. However, I was able to overcome every challenge successfully.

**Results :-** Tobacco consumption has reduced to by 22.2% while alcohol consumption reduced by 19.1%. 35-45 out of 150 preschool children tend to deliver the adverse effects of alcohol and tobacco. Further, they tend to refuse to go near the smokers and alcoholics by saying they are stink.

**Follow up :-** Follow up is done during home visits and whenever meets at the village.

**Conclusion :-** Empowering the community through multiple approaches is an effective way to make a change in husband's alcohol and cigarette consumption.

PP

47

ඈ

**අලුත උපන් බිළිදාට නිවස සිගරට් භාවිතයෙන්  මද්‍යසාර භාවිතයෙන් තොර සුවදායි පරිසරයක් ගොඩනැගීම.**

කතෘ :- ඩී. බී. කේ වැලිකල

**පසුබිම** :- පාදුක්ක පින්නවල අර්ධ නාගරිකරණ ප්‍රදේශයකි. මව්වරුන් රබර් ආශ්‍රිත කර්මාන්ත, ගොවිතැන්, කුලී වැඩ ආදිය තුලින් ජීවිකාව ගෙනයනු ලැබේ. මෙම ප්‍රදේශයේ දුම්වැටි සහ මද්‍යසාර භාවිතය බහුලව ඇත. අලුත උපන් බිළිදා නිවසට එන විට නිවස සිගරට් ,මද්‍යසාර භාවිතයෙන් තොර සුවදායි පරිසරයක් ලෙස සකස්වීම අරමුණයි.

**ක්‍රමවේදය** :- සිගරට් භාවිතයෙන් නිවසේ වාතය අපිරිසිදු වන ආකාරය සහ සැමියාගේ මද්‍යසාර භාවිතය මවගේ මානසික අසහනයට හේතුවන  ආකාරය සාකච්ඡා කළෙමි. දරුවාගේ උපන් බර අඩුවීමට මෙය ප්‍රබල හේතුවක් බව නිතර සිහිපත් කළෙමි. පළවෙනි සැසියේදී බිරිද සහ සැමියා යන දෙදෙනාටම පොඩි කොල කැබැල්ලක බිරිඳ සැමියාගේ හොඳ නරකත්, සැමියා බිරිඳගේ හොඳ නරකත් ලියා ගනිති. සිගරට්, මද්‍යසාර භාවිතා කරන්නන් හඳුනාගැනීමට මෙම ක්‍රමය භාවිතා කළෙමි. ග්‍රහ පිවිසිම් සිදුකරන අවස්ථාලදී, සිගරට් කොට, අරක්තු බෝතල් ආදීය නිවසේ හෝ ඒ අවට දක්නට ලැබුනොත්  ඒ ගැන සාකච්ඡා  කළෙමි. ප්‍රජාවේ ඇති මව් හවුල් හරහා සිගරට් ,මද්‍යසාර භාවිතය අවම කිරිමට කටයුතු කළෙමි. උත්සව අවස්ථාවලට මද්‍යාසාර ගෙන ඒමේ අවාසිය ගම්මුන්ට මව් හවුල්   හරහා අවබෝධ කරවූවෙමි.

**අභියෝග** :- කාන්තාවන්ට පිරිමින්ගේ අරක්කු බොන එක නැවැත්විය හැකිද යන්නයි.

**ප්‍රතිඵල** :- අරක්කු භාවිතයේ  බොරුව පිළිබඳව සායනයට සම්බන්ධ  මව්වරුන්ගෙන් 60% ට අවබෝධ විය. සිගරට් දුම් නිසා දරුවාට වන හානිය  72%ක් පියවරුන්ගේ අවබෝධය දියුණුවූ අතර පවුලේ සතුට ගිලිහි යන ආකාරය 58% ක් අවබෝධ කර ගත්හ. පවුල් බොහොමයක් මද්‍යාසාර භාවිතයෙන් ඈත්විය . උදාහරණයක් ලෙස කුමාරි නම් ගර්භණී කාන්තාවගේ වැඩිමල් දරුවාට අවු. 4කි. සැමියා කුලී වැඩ කරයි. සෑමදිනම සැමියා කසිප්පු භාවිතා කරයි. නිවසේ අඩ දබර සහ ආර්ථික ප්‍රශ්න තිබිණි. බිරිඳ නිවස අතහැර දමා යාමට තීරණය කර තිබුණි. සැසියේදී මද්‍යසාර භාවිතය පිළිබඳව ගැඹුරින් දැනුවත් කළෙමි. ගෘහ පිවිසිම්වලදී ද මේ ගැන කතා කළෙමි. මේ වනවිට  සැමියා දිනපතා මද්‍යසාර භාවිතය අඩුකර මාසයකට 2 වරක් පමණ භාවිතා කිරිමට යොමුවිය. වැඩිමහල් දරුවා මුලදී ඔහු ප්‍රතික්ෂේප කළ අතර දැන් දරුවා සුරතල් කරමින් හවසට දරුවා සමග කල් ගෙවයි. හවසට ගෙවත්තේ එළවළු වගා කරයි. නිවස කපරාරු කිරිම, නිවසට අලුත් ගෘහ භාණ්ඩ ගැනීම, නිවසේ තිබූ  රණ්ඩු නැතිවීම. බිරිඳගේ ප්‍රබෝධය, දරුවා සතුටින්  සිටීම. සිදුවූ වෙනස්කම්ය.

**පසුවිපරම** :- මව් හවුලේ සාමාජිකාවන් ගර්භණී මව්වරුන් හරහා නිවෙස්වල වෙනස්කම් පිළිබඳව සොයා බලමින් එය පවත්වාගෙන ගියහ.

**නිගමනය** :- මද්‍යසාර භාවිතය හා පවුලේ සතුට අතර ඇති සම්බන්ධතාවය නිවැරදිව අවබෝධ කරවීමෙන් ප්‍රජාවේ පැහැදිලි වෙනසක් ළගා කර ගත හැක.

PP

47

A

**Creating a comfortable environment in the house for the new born free of cigarettes and alcohol.**

Author :- D.B.K. Welikala

**Background :-** Pinnawala of Padukka district is a semi-urbanized area. Mothers of the area earn their living by engaging in rubber-related industries, farming and simple chores for daily wages. The frequency of consumption of cigarettes and alcohol in this area is high. The objective was to create the condition of house where it is free of cigarettes and alcohol comfortable for the newborn when he/she reaches home.

**Methodology :-** It was discussed with them about the pollution of air of the house caused by cigarette smoking and how the alcohol consumption of the husband affects the mental status of the mother. I made them aware of the fact that this is a main reason for the low birth weight of the new born.In the 1 st session, both the husband and the wife noted down the good and bad aspects of each other on a small piece of paper. This method was used in order to identify the consumers of cigarettes and alcohol.During the visits to the houses, if used cigarettes, alcohol bottles were found inside or in the vicinity of the house, I discussed with them about it. I also took steps to minimize the consumption of cigarettes and alcohol of the area through various mothers' communities of the area. Through these communities, they were made aware of the disadvantages of serving alcohol during various functions and occasions.

**Challenges :-** Will women be able to make their men refrain from taking alcohol.

**Results :-** 60 % of the mothers who attended the clinic became aware of the uselessness of alcohol consumption.72 % of fathers became aware of the bad consequences of cigarette smoke on the health of the baby and 58 % understood how the family happiness is faded as a result. Most of the families refrained from alcohol. As an example, Kumari is a pregnant woman, the age of whose elder child is 4 years. The husband is engaged in doing day to day chores for daily wages. He consumed alcohol (kasippu) daily. There were family disputes and economic problems in their family. The wife had decided to leave the house. During the session, they were thoroughly made aware about alcohol consumption. Those matters were also talked with them during the visits to their house. Currently. The husband has stopped the daily alcohol consumption and is used to consume them only twice a month. The elder child who initially refused the father is now used to him and he spend the evenings with the child, playing with him. He also has cultivated vegetables in the home garden and works there in the evenings. The changes encountered in the house were repairing of the house, buying new furniture to the house, disappearance of the disputes within the family, upliftment of the mental status of the wife and the child being happy.

**Follow up :-** The members of the mothers 'community continued the task through the pregnant mothers by inquiring into the changes encountered in their houses.

**Conclusion :-** By making the public aware of the relationship between alcohol consumption and the family happiness in an appropriate manner, a positive change can be observed within the community.

PP

48

අ

## ස්වාමිපුරුෂයාගේ දුම්වැටි /මද්‍යසාර භාවිතය අවම කිරීම හා එම මුදල් පවුලේ ආර්ථිකය දියුණු කිරීමට යොදා ගැනීම

කතෘ :- කේ. පී. දුසිතා අමරාවතී, එච්. ඩී. දර්ශිකා

**පසුබිම** :- පාදුක්ක පිටුම්පේ සායනයේ වසරකට ගර්භණී මව්වරු 250ක් ලියාපදිංචිවේ. ගර්භණී මව සායනයට සම්බන්ධවීම නිසා සම්පව කටයුතු කරන්නෙමු. 40% කට ආසන්න මව්වරුන් ආර්ථික ගැටළුවලින් සහ අවශ්‍යතා නොසැපිරෙන කොටසට අයත්ය. අඩුබර සහිත දරුවන් 30% පමණ සිටි. ඒයට හේතු බැළිමේදී ගර්භණී මව්වරුන්ගේ 75% කට වැඩි පිරිසකගේ ස්වාමිපුරුෂයින් දුම්වැටි, මද්‍යසාර හෝ වෙනත් මත්ද්‍රව්‍යන් භාවිතා කරයි. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ගර්භනි මව්වරුන් තුළ අවබෝධයක් ඇති කරමින් සැමියාගේ භාවිතය අවම කිරීම අවශ්‍යතාවයයි. මාගේ ඉලක්කය ස්වාමිපරුෂයාගේ දුම්වැටි /මද්‍යසාර අවම කිරීම හා එම මුදල් උපදින දරුවාට අවශ්‍ය කරන භාණ්ඩ සියල්ල ඒ මුදලින් ලබා ගැනීම අරමුණයි.

**ක්‍රමවේදය** :- ගර්භණී මවක් 7 වාරයක් සායනයට පැමිණේ. සැමියා මව්පිය සැසි සඳහා 3 වරක් සම්බන්ධවේ. දුම්වැටි භාවිතය නිසා කළලයට සිදුවන බලපෑම සහ මද්‍යසාර භාවිතය නිසා මවගේ පෝෂණයට මෙන්ම මානසික අසහනය ඇතිවන ආකාරය සායන තුලදී මව්පිය සැසිවලදි සාකච්ඡාවට ගැණුනි.

**අභියෝග** :- බොහෝ රාජකාරි අතරින් මෙම වැඩසටහන සිදුකිරීමට අමතරව ප්‍රතිඵල සොයා බැලීම සහ වාර්ථා කරගැනීම අපහසුවක් විය. ඒ සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කළෙමි. මාසයක් තුළ අප ගන්නා ප්‍රතිඵල මාසික රැස්වීමට සහභාගීවීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ප්‍රගති පුවරුවක සටහන් කළෙමු.

**ප්‍රතිඵල** :- 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සායනයට පැමිණි ගර්භණී මව්වරුන්ගෙන් ස්වාමිපුරුෂයන්ගෙන් දුම්වැටි භාවිතා කරමින් සිටි ප්‍රමාණය 35% අඩුවූ අතර මදසාර භාවිතය අඩුවීම 13%කි. මාගේ ඉලක්කය සැපිරු මව්වරුන් බොහොමයකි. පහත ඊට උදාහරණයකි. ගර්භණී ඇය ලෙස හඳුන්වමි.ඇගේ සැමියා මාසයකට රු.9,000.00 ආසන්න මුදලක සිගරට් භාවිතා කළේය. ආර්ථික ගැටළු නිසා දරුවාට අවශ්‍ය නිසි පෝෂණය ලබාග ැනීම පවා අපහසු විය. දරුවා ලැබෙන අවස්ථාවේ මිලදි ගැනීමට අවශ්‍යවූ බඩු පවා ගැනීම අසීරු විය. ඇය සැමියා මෙම මත්ද්‍රව්‍ය නිවාරණ සාකච්ඡාවට සම්බන්ධ කරගන්නා ලදී. සැමියා සමග නිතර නිතර මේ ගැන කතා කරන්නට පටන් ගත්තාය. සිගරට් භාවිතය අඩු කිරීමෙන් ඉතිරිවන මුදල් හිස් සීනි බෝතලයකට එකතු කළහ. මාසයක් අවසානයේ බෝතලය විවෘත කල විට රු. 9,000/-ක මුදලක් තිබිණි. එමගින් දරුවාගේ අවශ්‍යතා මිලදීගත්හ. සම්පූර්ණයෙන්ම සිගරට් භාවිතය නතර කළේය. මේ ඉතුරුවූ මුදල් දරුවාගේ ගිණුමට තැන්පත් කළහ.

**පසු විපරම** :- සායනය තුළ 7 වතාවක් ගර්භණී මව හමුවනවිට ඇගයීම් පත්‍රිකා මගින් වෙනස්කම් සටහන් කරමින් මතකය අලුත් කරමි. ගෘහ පිවිසුම්වලදී ද පසු විපරම් සිදුකළෙමි.

**නිගමනය** :- ප්‍රජාවේ දුප්පත්කම අවම කිරීම සඳහා සිගරට්, මද්‍යසාර භාවිතය අවම කිරීම ප්‍රබල සාධකයකි.

**Minimizing the consumption of cigarettes and alcohol of the husband and usage of that money for the economic development of the family.**

Authors :- K.G. Dusitha Amarawathie, H.D. Darshika

**Background :-** 250 pregnant mothers get registered annually in the clinic in Pitumpe of Padukka.Since the pregnant mother attends the clinic, she works in close association with us. About 40 % of pregnant mothers belong to the category of those having economic difficulties and not getting their requirements fulfilled. About 30 % of the children have low body weight. When inquiring about the reasons, the husbands of more than 75 % of the pregnant mothers consume either cigarettes, alcohol or other types of drugs.in order to change this situation, it is essential to minimize the consumption of them by the husbands by making the pregnant mothers aware of alcohol and drugs prevention.

**Objective :-** My objective is to minimize the alcohol and cigarette consumption of the husbands and make them utilize that money for buying all the items and goods for the child.

**Methodology :-** A pregnant mother attends the antenatal clinic 7 times. Her husband attends the parental session 3 times. During the parental sessions in the clinic, the bad effects of smoking cigarettes on the fetus and how alcohol consumption effects on the nutritional status and the mental health of the pregnant mothers were discussed.

**Challenges :-** It was difficult to assess the results and report them in addition to carrying out the program amidst of multiple tasks. Several methods were followed for that. The results obtained through out a month was noticed in a notice board in the MOH office showing the progress of the program during the monthly meetings.

**Results :-** The percentage of cigarette smoking husbands of the pregnant mothers who visited the ante-natal clinics during the time period from January to December in 2016 dropped to 35 % and the percentage of reduction of alcohol consumption is 13 %. There are many pregnant mothers who fulfilled my target. The below is an example for it. I will introduce her who is pregnant as A. Her husband spent about 9000 rupees per month for cigarettes. It was even difficult to provide the child with proper nutrition due to the economic problems. It was even difficult to buy the goods necessary during the delivery of the child. Her husband was made to participate in this discussion about alcohol and drug prevention by her. She also talked with him frequently about this. They started to save the money obtained by reducing the consumption of cigarettes into an empty sugar bottle. When they opened the bottle at the end of the month, there was a total of 9000 rupees in it. They bought the items required for the child by that money. He completely quitted smoking cigarettes. They deposited the saved money in a bank account opened in the name of the child.

**Follow up :-** When meeting with the pregnant mother 7 times in the clinic, they were updated by making them to note down the changes in the assessment papers. Post observations were done in the home visits.

**Conclusion :-** Minimizing the consumption of cigarettes and alcohol is a major leading factor in minimizing the degree of poverty in the community.

PP

49

අ

## අරක්කු, සිගරට්, ගංජා ඇතුළු සියළුම මත්ද්‍රව්‍ය අවම කිරීම සඳහා මා ගත් උත්සාහය

කතෘ :- එච්. ඒ. ප්‍රියංකා රෝහිණී

**පසුබිම** :- කුලියාපිටිය වීරඹුව කොට්ඨාශය. කොහු මෝල් ආශ්‍රිතව රැකියා කරන පවුල් මෙන්ම රජයේ සහ විවිධ පුද්ගලික සමාගම්වල රැකියා කරන ප්‍රජාවක් ජීවත්වේ. ගර්භණී මව්වරුන්ගෙන් 40% කගේ ස්වාමිපුරුෂයන් කුමක් හෝ මත්ද්‍රව්‍යක් භාවිතා කරයි. කාන්තාවන් විවිධ ගැටළු රැසකට මුහුණ දෙයි.මෙම තත්වය අවම කර ගැනිම සඳහා නිර්මාණශීලී ක්‍රම උපයෝගී කරගෙන මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මැදිහත්වීමට උත්සාහ කළෙමි. එහිදී කළලයට වන බලපෑම, ලිංගික අප්‍රාණිකත්වය, අවලස්සන වීම යන කරුණු ගැන විශේෂ අවධානයක් යොමු කළෙමි. එම පණිවිඩය එක් අයෙකුට අනිවාර්යයෙන් අවස්ථා 5 කදී ඇහීමට සැලැස්වීය. ගර්භණී කාලය තුළ මෙම පණිවිඩ දීමට ලැබීම සංවේදී අවස්ථාවක මව්පිය දෙපළට සම්පවීම වඩාත් පහසු විය. මෙම පිරිසට අමතරව මගේ ඉලක්ක කණ්ඩායම ලෙස ස්වේච්ඡා සේවකයින් හා මද්‍යසාර භාවිතයට හවස් කාලයේ කඩපිලට රොක්වන තරුණ පිරිස ද යොදා ගත හැකි විය.

**අභියෝග** :-"පොලිසීයට කරන්න බැරි වැඩ මිස් කරන්නෙ කොහොමද?", "මගේ කඩේ බඩු ටික විකුණ ගන්නත් බැරිවෙයි සිගරට් නැවැත්තුවොත්" ආදී දේ මා වෙත ගලා ආවත් විවිධ උපක්‍රම යොදාගනිමින් එම කණ්ඩායම් වෙත සමීප වූවා. මුහුණු පොතේ යහළුවන් කර ගැනීම එක් උපක්‍රමයකි.

**ප්‍රතිඵල** :- නිවස තුළ සිගරට් භාවිතය 75%ක් නැවතීම, පවුලේ සමඟිය, දියුණුව, ආර්ථිකය සැකසීම ආදී දේ සිදුවිය .කසිප්පු විකුණු ගර්භණී කාන්තාවක් සම්පූර්ණයෙන්ම එය නැවැත්විය. සාර්ථක ප්‍රතිඵලයන්ගෙන් එක් උදාහරණයක් මෙසේය. නීතිඥ මහත්මයකු මසකට රු. 12,000.00 ක් තරම් වූ රක්ෂණාවරණයක් මගේ ස්වාමිපුරුෂයා වෙතින් ලබාගෙන සිටි අතර, වසරකට පමණ පසු එය අක්‍රීය වී තිබු බැවින්, මා හට කතා කිරීමට අවස්ථාවක් ලැබුණි. ඒ අනුව එම නීතිඥ මහතා දිනකට සිගරැට් 15ක් පමණ භාවිතා කරන බව දැනගන්නට ලැබුණ අතර ඒ පිළිබඳව ඔහු දැනුවත් කර, එම සිගරට් සඳහා වියදම් කරන මුදල කැටයක් ලබාදීදැමීමට පෙළඹවිය. දැන් යළිත් රක්ෂණය ඉදිරියට කරගන යයි. සිගරට් භාවිතය නවතා ඇත. 2016 වසර අවසන් වන විට වයස අවුරුදු 16-50ත් අතර ගර්භණී මව්වරුන් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් ඇතුළු තවත් අය 800කට පමණ දැනුවත් කිරීම් කර 75%කින් තරම්වූ මත්ද්‍රව්‍ය අවභාවිත කිරීමට හැකිවීම මා ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

**පසු විපරම** :- මුහුණු පොත හරහා දුරකතනය ඔස්සේ හා සජීවී ලෙස මුණගැසීම හරහා මා ඔවුන් සමග නිතර සිටියා.ඔවුන්ගේ බිරින්දෑවරුන් හැමවිටම මා දැනුවත් කළා. ඔවුන් මා හට අනේක වාරයක් ස්තූති කළා.

**නිගමනය** :- ගර්භණී කාලයේ මව්පිය දෙපල ඇමතීම හා බොහොමයක් සමග ඉතාමත් කුළුපඟවීම තුළින් චර්යාවන් වෙනස් කරගතහැකි බව හැඟී ඇත.

**The effort done by me for minimizing the consumption of alcohol, cigarettes, cannabis and all other types of drugs.**

Author :- H.A. Priyanka Rohini.

**Background :-** The community of Weerambugedara division of Kuliyapitiya consists of families engaged in occupations related to coir industry and others working in various institutions in state and private sectors. The husbands of 40 % of pregnant mothers are used to the consume whatever kind of a drug/alcohol. The women face many kinds of difficulties. In order to minimize this situation, I made an effort to intervene in the prevention of alcohol and drugs using active strategies.

**Methodology :-** In there, special attention was directed towards the bad consequences on the fetus, sexual dysfunction, bad effects on the external appearance. Each individual was made to listen to that information in 5 occasions as a must. Providing this information during the period of pregnancy made it easier for getting close with the parents during a sensitive period of their life. In addition to this group of people, I was able to use volunteer workers and the youngsters who gather at the shop in evening times for taking alcohol also as my target group of people.

**Challenges :-** Even though it was told by many people as," Miss, how will you be able to perform a task which was impossible even by the police", 'I will not even be able to sell the goods in my shop if I stop selling cigarettes there" and so on, I was able to get along with those people by using various strategies. One such strategy was the collection of many fakebook friends.

**Result :-** Reduction of cigarette smoking inside the house by 75 %. Improvement of the harmony, development and economy of the family. A pregnant woman who used to sell illicit alcohol completely quittied it. Among many successful results, one example is as follows. A lawyer had obtained an insurance of about 12000 rupees per month from my husband and it had become inactivated after a period of about 1 year and I got the opportunity of talking with him. By that means, I came to know that the particular lawyer smokes about 15 cigarettes daily. I advised him about that and made him to save his daily expenditure on cigarettes every day, by providing him with a till. Now, he is continuing with his insurance again. He has quitted smoking cigarettes. At the end of year 2016, being able to reduce the consumption of alcohol and drugs by 75 % by advising the pregnant mothers of the age 16-50, their husbands and about 800 others is a special victory achieved by me.

**Follow up :-** I met with them and maintained connections with them frequently by fakebook either by calling them or online chatting with them. I was informed about the situation frequently by their wives. They thanked me enormously.

**Conclusion :-** It was understood that the habits can be changed by addressing the two parents during their pregnancy and becoming friendly with most of the people.

PP
50
த

## பெருந்தோட்டப் பகுதியில் இடம்பெறும் மேதினக் கூட்டங்களில் மதுசாரம் வழங்குவதை தடுத்தல்

எழுத்தாளர் :- மகாலிங்கம் சுசாந்தன்

**பின்னணி :-** பெருந்தோட்டத்தில் இடம்பெறும் மே தின நிகழ்விற்குஅனைத்துக் கட்சிகளாலும் மதுசார போத்தல்கள் வழங்கப்பட்டே மக்கள் ஒன்று திரட்டப்பட்டனர். இதனை ஒரு தொடர் செயற்பாடாக அனைத்து அரசியல் கட்சிகளும் செயற்படுத்தி வந்தன. குறிப்பிட்ட அரசியல் கட்சிகளை பிரதிநிதித்துவப் படுத்தும் பெருந்தோட்டங்களிலுள்ள தலைவர்களும் இதனை எதிர்பார்த்தே அந்நிகழ்வுகளுக்கு மக்களை ஒன்று திரட்டினர்.

**செயற்பாடு :-** "நாம் சம்பாதிக்கும் பணத்தில் சந்தோஷமாக வாழ்வதும் எமது உரிமையே அதனை மதுசாரக் கம்பனிகள் சுரண்ட இடமளிக்கவேண்டாம்;" என்பதனை மையமாகவைத்து அரசியல் கட்சிகளைப் பிரதிநிதிததுவப் படுத்தும் பெருந்தோட்டங்களிலுள்ள தலைவர்கள் மத்தியில் விழிப்புணர்வூட்டப்பட்டது, மதுசார போத்தல்களை வழங்கி மக்களை ஒன்று திரட்டுவது தமது கட்சியின் பலவீனமான செயலென விளங்கும் வகையில் தெளிவூட்டப்பட்டது. மக்களை ஒன்று சேர்ப்பதற்கு மதுசார போத்தல்கள் எமக்கு தேவையில்லை என பரிந்துரைக்கும் அளவிற்கு பெருந்தோட்ட தலைவர்கள் வலுவூட்டப்பட்டனர். "இம்முறை மதுசாரம் கொடுத்து ஏமாற்றப் போகும் கட்சித் தலைவர் யார்? ஏமாறப் போகும் கட்சித் தொண்டர் யார்?" என்ற தொணிபொருளின் கீழ் பத்தரிகைகளில் கட்டுரைகள் பிரசுரிக்கப்பட்டது. அதே தொணிப்பொருளை மையமாக வைத்து பெருந்தோட்டப் பகுதியின் பிரதான நகரங்களில் பதாதைகள் காட்சிப்படுத்தப்பட்டன. தொழிலாளர் தினக்கொண்டாட்டங்களுக்கு வரும் மக்களுக்கு இது தொடர்பில் துண்டு பிரசுரங்களும் வழங்கப்பட்டன. "இம்முறை மதுசாரம் கொடுத்து ஏமாற்றப் போகும் கட்சி எது?"என கட்சிகளின் பெயர்களும், சின்னங்களும் பொறிக்கப்பட்டு சமூக வலைத்தளங்களின் வாயிலாக வெளிக்கொண்டு வரப்பட்டது.

**பெறு பேறு :-** 2015ம் ஆண்டு முதல் அரசியல் கட்சிகளால் நேரடியாக மதுசார போத்தல்களை வழங்கி மக்களை ஒன்று திரட்டும் மனப்பாங்கு அரசியல் கட்சித்தலைவர்கள் மத்தியில் அற்றுப்போனது. பெருந்தோட்டத்தில் இருக்கும் பிரதான 02 அரசியல் கட்சிகள் 2015ம் ஆண்டு முதல் மதுசார போத்தல்களை வழங்கி தொழிலாளர் தினத்திற்கு மக்கள் கூட்டம் சேர்ப்பதைக் கைவிட்டன. மக்களை ஒன்று திரட்டிவரும் பேருந்து வண்டிகளுக்கு பொறுப்பான தலைவர்களிடம் வருகை தந்தோரின் உணவு செலவுகளிற்காக மாத்திரமே பணம் வழங்கப்பட்டிருந்தது. நாம் இம்முறை எமது மேதினக்கூட்டத்தில் மதுசாரம் வழங்கமாட்டோம் என அரசியல் தலைவர்கள் பத்திரிகைகளுக்கு தெரிவித்திருந்தனர். "மலையக மக்களின் பணத்தை மதுசாரக் கம்பனிகள் சூறையாடுகின்றன, அவற்றை பாதுகாக்க வேண்டும்,மக்கள் கஷ்டப்பட்டு உழைக்கும் பணத்தில் அவர்கள் சந்தோஷமாக வாழ வேண்டியதும் அவர்களின் உரிமையே" என 2017ம் ஆண்டு இடம்பெற்ற மேதினக்கூட்டத்தின் மேடையில் கட்சியைப் பிரதிநித்துவப்படுத்தும் பதுளை மாவட்ட பாராளுமன்ற உறுப்பினர் தெரிவித்திருந்தார்.

**சவால்கள் :-** கட்சியைப் பிரதிநிதத்துவப்படுத்தும் பெருந்தோட்ட தலைவர்களை சந்திக்கும் போது"கட்சித் தலைவர்கள் வழங்குவதனால்தான் நாம் மதுசாரப் போத்தல்களை பெறுகின்றோம்" என கூறினர். அதே வேளை கட்சித்தலைவர்களை சந்திக்கும்போது "தோட்ட தலைவர்களின் வேண்டுகோளினால் எமக்கு வழங்க நேரிடுகிது"என்றும் கூறினர். இதனால் ஆரம்பத்தில் இவர்களுடனான சந்திப்புக்கள் மந்தமாக இருந்தமை குறிப்பிடத்தக்கது.

**பின் கண்காணிப்பு :-** ஒவ்வொரு பெருந்தோட்டத்திலும் வசிக்கும் கட்சித்தலைவர்கள் இதனை தொடர்ந்தும் செயற்படுத்தி வருகின்றனர். இது தொடர்பில் மிகவும் சுவாரஸ்யமாக கட்டுரைகளையை பிரசுரிப்பதில் மலையகத்தின் பிரதான பத்திரிகை இயங்கி வருகின்றமையும் எமக்கு பெரும்பலமாகவும், தொடர்ந்தும் இவற்றை செயற்படுத்துவதற்கான ஆர்வத்தையும் அதிகரிக்கன்றது.

**முடிவுரை :-** அரசியல் தலைவர்கள் மத்தியில் ஏதேனும் ஒரு நடத்தை மாற்றத்தை ஏற்படுத்த வேண்டுமாயின் பல்வேறு பாகங்களிலிருந்தும் அழுத்தங்களை மேற்கொள்ள வேண்டும்.

## Stopping the distribution of alcohol during May Day rallies in the plantation sector

Author: Magalingam Susanthan

**Background :-** May Day rally in plantation sector is an event organized by different political parties of the region by gathering people with the purpose of winning their labour rights. It is a habit of all plantation sector people to participate in the May Day rally organized by the political party to which they support. It is worthwhile to mention that showing the people power of their party by using the people who attend this event is an inner aim of the politicians. All the political parties gathered people for the particular event by providing bottles of alcohol to the participants. All the political parties carried on this as a continuous activity. Regional leaders in the plantation sector who represent the particular political parties gathered people for the rallies with these same expectations. We initiated some attempts in order to change this situation of providing bottles of alcohol to gather people.

**Methodology :-** We created awareness among the regional leaders in the plantation sector who represent different political parties, with the theme of "We have the right to live happily with the money we earn; do not let alcohol companies rob it from us." We explained in a way to make them realize that gathering people by giving bottles of alcohol is a lame act done by their party. We personally met leaders and representatives of each political party and pointed out to them that giving bottles of alcohol is actually a betrayal to their followers. Plantation sector leaders were reinforced to the level of advocating that they do not need to give away bottles of alcohol in order to gather people. Articles were published in newspapers with the theme "Which political party leader is going to deceive this time by giving bottles of alcohol? Which party followers are going to be deceived?" Banners carrying the same theme were displayed in important cities of the plantation sector. Handbills were also distributed to the people who came to the May Day rally/ celebrations. The names and symbols of political parties under the title "Which political party is going to deceive this time by giving bottles of alcohol?" were revealed and published via social web sites.

**Challenges :-** When we met the plantation sector representatives of the political parties, they told, "We are getting bottles of alcohol because our political party leaders provide us." In the meantime, when we met the political party leaders they told, "We had to give upon the request of the representatives in the plantation sector." Our initial meetings with them were going dull because of this issue.

**Results :-** The attitude of political party leaders about gathering people by giving bottles of alcohol had significantly suppressed since 2015. Since 2015, two main political parties in the plantation sector quit providing bottles of alcohol to gather people for Labourer's Day. Money for food expenses only was given to the leaders who were responsible to bring people for the rallies by bus. Political leaders had told the newspapers that this time they would not provide bottles of alcohol in their May Day rallies. On the stage of 2017 May Day rally, a Member of Parliament from Badulla district representing a political party told, "Alcohol companies are robbing the money of hill country people. We have to protect their money. It is the right of the people to live happily with their hard earned money."

**Follow up :-** Regional political leaders living in each plantation sector are continuously implementing this. A major hill country newspaper publishes interesting articles regarding this issue, thereby providing great support and encouragement for us to carry on these activities continuously.

**Conclusion :-** To make in politicians, variety of strategies should be used to influence them.

PP

51

த

## பொதுவான நிகழ்வுகளில்∴வைபவங்களில் மதுசாரம் வழங்கும் கலாசாரத்தை மாற்றுதல்

எழுத்தாளர் :- சுப்ரமணியம் ரமேஷ்குமார்

**பின்னணி :-** பெருந்தோட்ட பகுதிகளில் இடம்பெறும் நற் காரியங்களுக்கும், இதர காரியங்களுக்கும் மதுசாரம் வழங்குவதை ஒரு கலாசாரமாகச் செய்து வருகின்றனர். திருமண வீடுகள், பூப்பெய்தல் நிகழ்வுகள், பிறந்த நாள் வைபவங்கள், மரண வீடுகள், பண்டிகைகள் சில நேரங்களில் கலாசார நிகழ்வுகளிலும் மதுசாரம் வழங்குவதை ஒரு கலாசாரமாகவும், அதிலொரு மூட நம்பிக்கையினையும் கொண்டுள்ளனர். சிலர் ஏனையவர்கள் வீட்டில் வழங்கிய மதுசார அளவை விட எமது வீட்டில் அதிகமாக வழங்க வேண்டும் என போட்டியிலும் வழங்குகின்றனர். ஒரு நிகழ்விற்கு செல்லும் போது பிரதான விடயமாக மதுசாரம் இருக்கும் என எண்ணும் மனப்பானமையும் பெருந்தோட்ட மக்கள் மத்தியில் ஆழப்பதிந்துள்ளது.

